



★

# දිනමිණ


The Dinamina | 1909 ඇරැඹි ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත | தினமின

ශ්‍රී බුද්ධ වර්ෂ 2564ක් වූ බක් අව ජලවක ලත් කිවි දින | කාණ්ඩය 112 | පත්‍රය 114 | පිටු 40 | මිල රු.30 | web: www.dinamina.lk | ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කළ පුවත් පතකි | 2021 අප්‍රේල් 30 සිකුරාදා




දේශයේ තාලය මවන දේදුනු අද පත්‍රය සමඟ



## තැබූ පියවර ආපස්සට ගන්නේ නෑ
# රසායනික පොහොර ඉවත් කළ ප්‍රථම රට බවට ශ්‍රී ලංකාව පත් කරනවා

මහින්ද අලුත්ගෙදර

ඉදිරියට තැබූ පියවර ආපස්සට නොගෙන රසායනික පොහොර භාවිතය මුළුමනින්ම ඉවත් කළ ලෝකයේ ප්‍රථම රට බවට ශ්‍රී ලංකාව පත් කිරීමේ අභියෝගය භාර ගන්නා බව ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා අවධාරණය කරයි.

පිට 6

## ආබාධිත - මියගිය
# රණවිරු පවුල් 30,000කට වැටුප් සහ දීමනා

භක්ති ධර්මප්‍රිය මෙන්ඩිස්

යුද්ධයේදී මියගිය සහ ආබාධිත රණවිරුවන්, පොලිස් නිලධාරීන්ගේ පවුල් 30,000කට වැටුප් සහ දීමනා දීමට ආණ්ඩුව පියවර ගත් බව ආරක්ෂක ලේකම් ජෙනරාල් කමල් ගුණරත්න මහතා පැවසීය.

පිට 6



## තෙවැනි බැඳුම්කර වෙන්දේසිය
# අර්ජුන් - පුංචිහේවා නැතිව නඩුව විභාගයට අවසර

රෝෂන් තුෂාර

යහපාලන ආණ්ඩු සමයේ කළ තෙවැනි මහ බැංකු බැඳුම්කර වෙන්දේසි මගින් රජයට රුපියල් බිලියන 15ක අලාභයක් කරමින් සාපරාධි සාවද්‍ය පරිහරණය කළේ යැයි හිටපු මුදල් ඇමැති රවි කරුණානායක මහතා ඇතුළු පිරිසට එරෙහි නඩුවේ හිටපු මහ බැංකු අධිපති අර්ජුන් මහේන්ද්‍රන් විත්තිකරු හා ගාර්දිය පුංචිහේවා විත්තිකරුවන් නොමැතිව නඩුව විභාග කිරීමට ත්‍රිපුද්ගල විනිසුරු මඬුල්ල ඊයේ (29) අවසර දුන්නේය.

පිට 6

## මනිලාල් 6 වැනි දා කෝප් කමිටුව හමුවට කැඳවයි

පිට 6

පිට 6

## දිස්ත්‍රික්ක 9ක වසම් 6ක් හුදෙකලා කරයි



## එන ඡන්දයෙදිත් උතුරේ මහ ඇමැති අපේක්ෂකයා මමයි

මාවෙයි සේනාධිරාජා

## ශානිගේ ඇප පෙත්සම මැයි 13 දා විභාගයට

## එජාප මැයි සැමරුම පිටකෝට්ටේ
### සහභාගිත්වය 100යි

ශිරෝමි අබයසිංහ

නිරෝධායන නීතිවලට අනුව 100ගේ සහභාගීත්වයෙන් පමණක් මෙවර මැයි දින සැමරුම පිටකෝට්ටේ පිහිටි ජාතික සේවක සංගම් මූලස්ථානයේදී පැවැත්වීමට එජාපය තීරණය කර තිබේ.

පිට 6

### අඩු ආදායම්ලාභීන්ට ගෙයක්
## මාදම්පිටිය නිවාස සංකීර්ණයේ වැඩ අද අරඹයි

චන්දිමා කරුණාරත්න

මූලික පහසුකම්වත් නොමැති සහ වාසයට නුසුදුසු නිවෙස්වල ජීවත් වන වතු නිවැසියන් සඳහා සියලු පහසුකම්වලින් සමන්විත නව නිවෙස් නොමිලේ දීමේ රජයේ වැඩපිළිවෙළ යටතේ තොටළඟ, මාදම්පිටිය හන්දියේ මහල් නිවාස සංකීර්ණයක් ඉදි කිරීම ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ සහ අගමැති මහින්ද රාජපක්ෂ මහතාගේ උපදෙස් පරිදි සෞඛ්‍ය ආරක්ෂිත උපදෙස්වලට අනුකූලව අද (30) ආරම්භ කෙරේ.

පිට 6




### ජනාධිපති මාධ්‍ය ප්‍රකාශක
## කිංස්ලි රත්නායක



පිට 6

## බැංකුවල වැඩ අද වරුවයි

පිට 6

## ටෝකියෝ ඔලිම්පික් යන මැටිල්ඩාට ඇමැති නාමල් සුබ පතයි



පිට 10

### කොවිඩ්

පිට 6

## ගාල්ල-කළුතර ආසාදිතයන්ටත් එංගලන්ත ප්‍රභේදය වැළඳිලා

ආචාර්ය චන්දිම ජීවන්දර

## AC කාමරවල වයිරසය පැතිරීම වේගවත්

## ගැබිනි මව්වරුන් අවදානම් කාණ්ඩයට

## ආගමික ස්ථානවල එක්රැස් වීම් තහනම්

## මගීන් වැඩියෙන් ගෙන යන බස්වලට නීති දැඩි කරයි







# පෞද්ගලික බස් රියක් මහතුඩුගලදී අඩි 30ක බෑවුමකට පෙරළී 15කට තුවාල



**අසේල කුරුළුවංශ**

නුවරඑළිය හයිෆොරස්ට් ප්‍රදේශයේ සිට රාගල නගර දක්වා ධාවනය වෙමින් තිබූ පෞද්ගලික බස් රථයක් මහතුඩුගල ප්‍රදේශයේදී මාර්ගයෙන් ඉවතට පැන අඩි 30ක පමණ බෑවුමක තිබූ එළවළු කොටුවක් මතට පෙරළීමෙන් එහි ගමන් ගත් මගීන් 15ක් තුවාල ලබා ඇත.

අනතුර ඊයේ (29) පෙරවරු 11.30ට පමණ සිදු වී තිබේ. තුවාලකරුවන් ප්‍රතිකාර සඳහා නුවරඑළිය මහ රෝහලට සහ හයිෆොරස්ට් ප්‍රාදේශිය රෝහලට ඇතුළත් කර තිබේ.

තුවාලකරුවන් කීපදෙනකුගේ තත්ත්වය බරපතළ බව පොලීසිය පවසයි.

බස් රථයේ රියැදුරුට හදිසියේ ඇති වූ අසනීප තත්ත්වයක් හේතුවෙන් බස් රථය ඔහුගේ පාලනයෙන් මිදී මාර්ගයෙන් ඉවතට පැන බෑවුමට පෙරළී තිබෙන බව මූලික පරීක්ෂණවලින් හෙළිවී තිබේ.

අනතුර සම්බන්ධයෙන් රාගල පොලීසිය වැඩිදුර පරීක්ෂණ පවත්වයි.

# ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස් අගමැති හමු වෙයි



ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස් ගෝපාල් බාග්ලේ මහතා අරලියගහ මන්දිරයේදී අගමැති මහින්ද රාජපක්ෂ මහතා ඊයේ (29) හමු විය. මේ එහි අවස්ථාවකි.

# අවුරුදු 12 පාසල් සිසුවියක පැහැරගෙන ගිය දහඅටේ සිසුවා අත්අඩංගුවට

**උතුරු පළාත් විශේෂ**
**රසුල දිල්හාර ගමගේ**

මුලතිව් ප්‍රදේශයේ වයස අවුරුදු 12ක පාසල් ශිෂ්‍යාවක් පැහැරගෙන යෑමේ සිද්ධියක් සම්බන්ධයෙන් වයස 18 ක තවත් පාසල් සිසුවකු පෙරේදා (28) මුලතිව් පොලීසිය විසින් අත්අඩංගුවට ගෙන තිබේ.

මේ දෙදෙනාම පාසල් පෙම්වතුන් වන අතර එම සම්බන්ධය ශිෂ්‍යාවගේ නිවෙසට ආරංචි වීම නිසා ශිෂ්‍යාවට මව්පියන් පහර දී තරයේ අවවාද කර තිබේ.

ඒ බව දැනගත් පාසල් ශිෂ්‍යයා ශිෂ්‍යාවගේ නිවෙසේ කිසිවකු නොමැති අවස්ථාවක පැමිණ ශිෂ්‍යාව පැහැර ගෙන ගොස් තිබේ. මේ සම්බන්ධයෙන් ශිෂ්‍යාවගේ මව්පියන් මුලතිව් පොලීසියට පැමිණිලි කිරීමෙන් පසු සැකකාර සිසුවා අත්අඩංගුවට ගෙන පරීක්ෂණ ආරම්භ කර තිබේ.

සිසුවිය වෛද්‍ය පරීක්ෂණයක් සඳහා මුලතිව් රෝහලට ඇතුළත් කොට ඇති අතර පොලීසිය ඇයගෙන් ප්‍රකාශයක්ද සටහන් කරගෙන තිබේ.




# යාපනය - සිල්ලාලෙයි මුදු තීරයෙන් කිලෝ 240කට වැඩි කේරළ ගංජා හමු වෙයි

**භක්ති ධර්ප්‍රිය මෙන්ඩිස්**

ශ්‍රී ලංකා නාවික හමුදාව යාපනය, සිල්ලාලෙයි ප්‍රදේශයට ඔබ්බෙන් වූ මුහුදු තීරයේ පෙරේදා (28) සිදු කළ විශේෂ මෙහෙයුමකදී කිලෝග්‍රෑම් 240 කට අධික කේරළ ගංජා තොගයක් නාවික හමුදා භාරයට ගැනීමට කටයුතු කෙරිණි.

ඒ අනුව පෙරේදා(28) උතුරු නාවික විධානය මගින් යාපනය, සිල්ලාලෙයි ප්‍රදේශයට ඔබ්බෙන් වූ මුහුදු තීරයේ සිදු කළ විශේෂ මෙහෙයුමකදී මලු 07ක පාර්සල් 105ක් වශයෙන් ජාකොටුවක සූක්ෂම ලෙස සඟවා තිබූ කේරළ ගංජා කිලෝග්‍රෑම් 240.95 ක පමණ තොගයක් සොයා ගන්නා ලදි.

නාවික හමුදාව ප්‍රදේශයේ සිදුකරන නිරන්තර මෙහෙයුම් හේතුවෙන් ජාවාරම්කරුවන් විසින් මේ කේරළ ගංජා ප්‍රමාණය ගොඩබිමට රැගෙන ඒමට නොහැකිව මෙලෙස ජාකොටුවක සඟවා තබන්නට ඇතැයි සැක කෙරෙන අතර, මේ මෙහෙයුම මගින් නාවික හමුදා භාරයට ගන්නා ලද කේරළ ගංජා තොගයේ වීථි වටිනාකම රුපියල් මිලියන 72ට අධික වන බවට විශ්වාස කෙරේ.

කොවිඩ් -19 ව්‍යාප්තිය වැළැක්වීමේ සියලු සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සිදු කළ මේ මෙහෙයුම මගින් නාවික හමුදා භාරයට ගත් කේරළ ගංජා තොගය ගිනි තබා විනාශ කිරීමට කටයුතු කෙරිණි.

## ගිනිකාෂ්ඨ

ලෙඩ වූ හරින්ගේ සුවදුක් බලන — නියා
නොතකා අමනාප කඩතොලු රනිල් — ගියා
මොනවා වුණත් ලෙඩ දුකකදී ඉවත — නොයා
පෑ යුතු තමයි තම ළඟ නෑයන්ට — දයා

ගස්මන් තොග

## ඇඳ නැත්තා

සිරිකොත නායකත්වෙට විත් දිගු — කල්ය
රනිල් සොයනුයේ දැන් අනුනගෙ — පැල්ය
ඉතිරිව තිබෙන්නේ යෑමට — රෝහල්ය
පාස්කුවේ බැලුවොත් ඔය — හුරතල්ය

හරින් බලන්නට ගිය එක නරක — නැත
තැන කොතැනක වුණත් එක තැනකමය — හිත
වියපත් වෙනකල්ම පෙරළා පුරුදු — පොත
නොසැලී ඉන්න කවදාහරි පුටුව — ඇත!

රටේමුල්ලේ මුදන්නායක



දිනමිණ
The Dinamina

35, ඩී. ආර්. විජයවර්ධන මාවත,
ලේක්හවුස්, කොළඹ.
දුරකතන - 2429429, 2331181, 2421181
ෆැක්ස් - 2429240
(කර්තෘ මණ්ඩලයට පමණයි)
2449069 (පොදු)
ඊ මේල් - editor.dinamina@lakehouse.lk
දැන්වීම් කළමනාකරු - 2429341

2021 අප්‍රේල් 30 සිකුරාදා

# සමාජ මාධ්‍ය දන්න ඉටිගෙඩිය

නීති විශාරදයකු ද ලෝක ප්‍රකට කලා විචාරකයකු ද වන මහාචාර්ය ස්ටැන්ලි ෆිෂ්ගේ කියමනකින් මේ ලියවිල්ල ආරම්භ කරන්නට කැමැත්තෙමු. එම කියමන නම්; අර්ථදායක වාක්‍ය පෙළ ගැස්වීමට දන්නා තැනැත්තා මුළු ලෝකයම හොඳින් වටහාගත් පුද්ගලයකු බවය. එම වාක්‍යයෙහි යටි අර්ථය වන්නේ ලෝකය ගැන හරිහැටි නොදන්නා තැනැත්තන් ලියන්නට හා කියන්නට නොයනු යන්නය. අපේ රටේ සමාජ මාධ්‍ය හසුරවන්නන් සම්බන්ධයෙන් ඉහත කියමන මනාව ගළපා ගත හැකිය. ඇතැම් සමාජ මාධ්‍යවල පළ වන දේවල් දකින විට ඔවුන් ලෝකය ගැනවත්, තමන්ගේ රටේ ඉතිහාසය ගැනවත්, දේශපාලනය ගැනවත් කිසිවක්ම නොදන්නා බව හොඳ හැටි පැහැදිලි වෙයි. ගමේ භාෂාවෙන් කිව හොත් ඒවා ගොන් කතාය. නැතහොත් හරක් කතාය.

චීනයේ ආරක්ෂක අමාත්‍ය ජෙනරාල් වෙයි පින්ග්හී මහතා දෙදින නිල සංචාරයක් සඳහා ශ්‍රී ලංකාවට පැමිණියේය. මෙය චීන - ශ්‍රී ලංකා මිත්‍රත්වය තහවුරු කරන වැදගත් හා ඓතිහාසික අවස්ථාවකි. එහෙත් ඇතැම් සමාජ මාධ්‍ය එය විහිළුවකට ගෙන ඇති බව පෙනෙයි. ජෙනරාල්වරයාට දුන් ආරක්ෂාව ඇතැම් සමාජ මාධ්‍යවල විවේචනයට ලක් වී ඇත. ජෙනරාල්වරයාගේ සංචාරයේදී මාර්ග කිහිපයක් සුළු වේලාවකට වසා තැබීම තවත් සමාජ මාධ්‍යවල විවේචනයට ලක් වී ඇත. චීන ආරක්ෂක අමාත්‍යවරයා යනු ලොව බලවත්ම තනතුරක් දරන තැනැත්තෙකි. ඔහුට සපයන ආරක්ෂාව ගැන විවේචන එල්ල කරන්නේ ලෝක දේශපාලනය ගැන අබමල් රේණුවක තරම් දෙයක් නොදන්නා හිස් මිනිසුන්ය. රටේ මාර්ගයක් විනාඩි කිහිපයකට වසා තැබීම ගැන විවේචනය කරන්නේ ඉතිහාසය නොදන්නා පුද්ගලයන්ය.

ඉහත සිද්ධිය පාදක කරගෙන ආණ්ඩුවට ද ජනාධිපතිවරයාට ද මඩ ප්‍රහාරයක් එල්ල කර තිබේ. මෙය යුක්තිසහගත ද? රට පුරා පැවැති මුර පොළවල් ඉවත්කොට නිදහස් ගමනාගමනයකට ඉඩ-ප්‍රස්ථා ලබා දුන්නේ ජනාධිපතිවරයාය. විරෝධතාකරුවන්ට පොලිස් ප්‍රහාරවලින් තොරව ස්වකීය විරෝධතා දැක්වීමට අවස්ථාව දී ඇත්තේ ජනාධිපතිවරයාය. දේශපාලකයන් මහා මාර්ගවල ගමන් කරන විට මහජනයාට අවහිර නොවන ලෙස ගමන් කළ යුතු යැයි උපදේශන දී ඇත්තේ ද ජනාධිපතිවරයාය. මේ සියල්ල පසෙක දැමුව ද ත්‍රස්තවාදයෙන් රට මුදාගෙන ශ්‍රී ලාංකිකයාට නිදහස් ජීවිතයක් දීමට මූලික වූ පුද්ගලයකු හැටියට ද සමාජ ගෞරවයක් ජනාධිපතිවරයාට හිමි විය යුතුය. සමාජ මාධ්‍ය හැසිරෙන්නේ මේ කිසිවක් සැලකිල්ලට ගනිමින් නොවේ.

කොටි නායක වේළුපිල්ලේ ප්‍රභාකරන් ජීවත්ව සිටින තාක් කියා සිටියේ සිංහලයා ඉතා ඉක්මනින් ඉතිහාසය අමතක කරන බවය. ඔහු එය කියා සිටියා පමණක් නොව; න්‍යායක් ලෙස භාවිත කළේය. සමාජ වෙබ් අඩවි හසුරවන තැනැත්තන්ට ඉතිහාසය මතක නැත. ඔවුන් ක්‍රියා කරනුයේ මේ දැන් ඉපදුණු ළදරුවන් හැටියටය. විදේශීය රාජ්‍ය නායකයන්ගේ සංචාරවලදී පාරවල් වසා තැබීම අද ඊයේ සිදු වූවක් නොවේ. එය වත්මන් ජනාධිපතිවරයා අලුතින් හඳුන්වා දුන් නීතියක් ද නොවේ. මහා බ්‍රිතාන්‍යයේ රැජන ශ්‍රී ලංකාවේ සංචාරය කරන විට පාරවල් වැසුවේය. පාකිස්ථානයේ හිටපු අගමැති සුල්පිකාර් අලිභූතෝ එන විටත් පාරවල් වැසුවේය. එය අමුතු දෙයක් නොවේ. ජාතික උත්සව පවත්වන ඇතැම් අවස්ථාවල ද පාරවල් වසා දමන්නට සිදුවේ. එය සාමාන්‍ය තත්ත්වයකි.

චීන ආරක්ෂක ඇමැති ශ්‍රී ලංකාවේ නිල සංචාරයක නිරත වීම හා අපේ නායකයන් සමඟ සාකච්ඡා කිරීම ජාතික වශයෙන් පමණක් නොව; කලාපීය වශයෙන් ද අතිශය වැදගත් අවස්ථාවකි. කලාපීය ආරක්ෂාව, කොවිඩ් මර්දනය හා ශ්‍රී ලංකාවට නව ආයෝජන දීම වැනි විෂයයන් සම්බන්ධයෙන් සාකච්ඡා පවත්වා ඇත. ජෙනරාල්වරයා ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරයා සමඟ මෙන්ම අගමැතිවරයා සමඟ ද සාකච්ඡා පැවැත්විය. මෙහි දී කොවිඩ් මර්දනය සඳහා තවදුරටත් චීන ආධාර දීමට ද, නව ආයෝජන ලබාදීමට ද චීනය කැමැත්ත පළ කර ඇත. චීනය යනු අපේ හොඳම මිතුරකු ලෙස සැලකීම වඩා නිවැරැදිය. චීන - ශ්‍රී ලංකා මිත්‍රත්වයට දීර්ඝ ඉතිහාසයක් තිබේ. ජාත්‍යන්තර වෙළෙඳාම අතින් පමණක් නොව සංස්කෘතික කටයුතු අතින් ද චීනය ශ්‍රී ලංකාවට බෙහෙවින් සමීපය.

චීනය සැලකිය හැක්කේ ආසියාවේ මහා සංස්කෘතික නිධානය හැටියටය. ලෝක ශිෂ්ටාචාරය සොයා යන කෙනකුට ග්‍රීක ශිෂ්ටාචාරය කෙතරම් වැදගත් වන්නේද ආසියාවේ ශිෂ්ටාචාරය සොයන කෙනකුට චීන ශිෂ්ටාචාරය මූලික වන්නේය. චීන සංස්කෘතියේ අක් - මුල් ජපානය වැනි රටකදී වුව දැකගත හැකිය. චීනයේ ජාත්‍යන්තර වෙළෙඳාම, චීන ඉදි කිරීම් තාක්ෂණය, පමණක් නොව චීනයේ දර්ශනවාද පවා ලොව පුරා ප්‍රකට වූයේ සියවස් ගණනකට පෙර සිටය. ග්‍රීක ශිෂ්ටාචාරය, රෝම ශිෂ්ටාචාරයෙන් යටපත් වූ සේම යුරෝපයේ කාර්මිකකරණයෙන් චීන තාක්ෂණය හා චීන ආර්ථික කටයුතු යම් පසුබෑමකට ලක් විය. එහෙත් දැන් එය වෙනස් වී ඇත. චීනයේ ජාත්‍යන්තර සබඳතා මෙන්ම ආර්ථික කටයුතු මේ වන විට ලොව අංක එකට පැමිණ තිබේ. එහි අර්ථය වන්නේ ආසියාව අළු ගසා නැගී සිටින බවය. ඒ ගැන අප ආඩම්බර විය යුතුය.

චීන ආරක්ෂක අමාත්‍යවරයා ශ්‍රී ලංකාවේ නිල සංචාරයක් සඳහා පැමිණ ඇත්තේ දෙරටේ මිත්‍රත්වය තවදුරටත් තහවුරු කරමින්ය. චීන නායකයන් සෑම රටකම සංචාරයෙහි යෙදෙන්නේ නැත. විශේෂයෙන් චීනයේ ආරක්ෂක අමාත්‍යවරයා විදේශ සංචාරයක නිරත වන්නේ වැදගත්ම අවස්ථාවක පමණි. මේ සංචාරය ශ්‍රී ලංකාවට ද ගෞරවයකි. මෙබඳු අවස්ථා විවේචනයට ලක් කළ හැක්කේ ලෝක දේශපාලනය ගැන නොදන්නා හිස් මිනිසුන්ට පමණි.

**දිල්රුගෙ සීවිදි**

රැල්ලක් නිමවෙන්න පෙර තව රැළි එනවා
හෙල්ලෙන්නට නොහැකි තරමට හිර වෙනවා
ඉල්ලන් කන්න ඕනෑ අය දඟලනවා
සෙල්ලම් කළොත් දැන් නම් වැඩ වරදිනවා

# කම්කරුවන් අතට පත් වූ මැයි දිනය



කොළඹ විශ්වවිද්‍යාලයේ ජනමාධ්‍ය ඒකකයේ හිටපු මහාචාර්ය
**අජන්තා හපුආරච්චි**

මැයි දිනය කම්කරුවන්ගේ දිනය ලෙස නම් කොට ගෙන 'කම්කරු දිනය' ලෙස සමරන්නට අප පුරුදු වූයේ විශේෂයෙන් රුසියානු විප්ලවයත් සමඟ "ලෝකයේ කම්කරුවනි එක්වව්" යන තේමා පාඨය පෙරදැරි කොට ගෙනය. එහෙත් අප කිසි දිනෙක එය ආගමික මෙන්ම වසන්ත උත්සවයක් ලෙස පැරණි යුරෝපීය රටවල පැවති, පසුව ආගමික උත්සවයක් ලෙස පැවති, ඉන් පසු අහම්බයක් ලෙස 'මැයි දිනය' කම්කරුවන් අතට පත් වූ ආකාරය පිළිබඳව කතා කර නැත. එහෙත් මැයි දිනය සැබැවින්ම අපට ආගමික, වසන්ත හෝ කම්කරු දිනයක් ලෙස පැවැත්වීමට මුල් වී නැති අතර විදේශ රටවලින් ගත් කොටස් මත අපූරුවට අපේ කරගැනීමට හැකි වී තිබේ. එය අනෙක් සෑම කරුණක් සේම අපට උරුම විදේශ බලපෑම් පිළිගැනීමේ අපූරු හැකියාව මත සිදුවන්නකි.

ජර්මනිය ප්‍රමුඛ උතුරු යුරෝපීය රටවල මැයි දිනයට සමාන ආගමික උත්සවයක් ලෙස දේව ඇදහිල්ල මුල් කොට ගත් උත්සවය ජර්මන් භාෂාවෙන් Walpurgis Night ලෙස නම් කොට පැවැත්වූයේ නොවැම්බර් 01 වැනිදාට පසුව අඩ වසරක් ගෙවුණු මැයි මාසයේදීය. එය රෝම දෙවඟනක් වන ෆ්ලෝරා සැමරීමට මැයි 01 වැනි දා යොදා ගත් අතර, යුරෝපා රටවල් එහිදී May pole නමින් නර්තනයක් ද පැවැත්වීය. එකල එම රටවල් විවිධ චාරිත්‍ර ක්‍රම ඊට එක් කොට තිබිණි. රෝමානු කතෝලික පැරණි සම්ප්‍රදායට අනුව මැයි මාසය මරියතුමියගේ මාසය ලෙස හඳුන්වන අතර ඇයගේ ආශිර්වාද ලබා ගැනීමට මැයි රැජන ලෙස නම් කොට මල් ඔටුන්නකින් ඇය පුදනු ලැබීය.

## ලෞකික උත්සවයක්

යුරෝපය ක්‍රිස්තියානිකරණය වීමත් සමඟ එතෙක් පැවති දේව ඇදහීම ඉවත්ව ලෞකික උත්සවයක් වශයෙන් මැයි දිනයත් සමඟ නත්තල් උත්සවය හා සියලු ශාන්තුවරයන්ගේ දිනය වශයෙන් ද පාස්කු සමය ඊට එක්ව ඇත.

20 වැනි සියවසේදී හා 21 වැනි සියවසේදීත් නව දේව ඇදහිල්ලක් වශයෙන් හා ආගමික උත්සවයක් ලෙස ප්‍රතිව්‍යුහගතවීමක් දැක ගත හැකිය. ජර්මනිය එය ස්වදේශීයත්වයට පත් කර ගත්තේ ශාන්ත වැල්බර්ගා (St. Walburga) යන ශාන්තුවරයා ජර්මනියට ක්‍රිස්තියානි ධර්මය හඳුන්වා දීමක් ලෙස විශ්වාස කරමිනි. 20 වන සියවසේදීත් යුරෝපා රටවල මැයි දිනය අසල්වැසි නිවෙස්වල දොරකඩ කැවිලි සහිත බාස්කට් එකක් හොරෙන්ම තැබීම තවත් සිරිතක් විය. සාම්ප්‍රදායික එංගලන්තයේ මොරිස් නමින් නර්තන විශේෂයක් පැවැති අතර මැයි රැජනට මල් ඔටුනු පැලැන්ඳවීමත් සිදු කෙරිණි. දේව ඇදහීම ඔවුන්ගේ එක් අභිප්‍රායක් විය. එසේම පැරණි යුරෝපා රටවල ගම්වල හා නගරවල වසන්ත උත්සවයක් ලෙස මැයි දිනය පැවැත්වුණු අතර, කතෝලික කැලැන්ඩර් ක්‍රමයට අනුව යළි මැයි 01 වැනිදා ශාන්ත ජෝසප්තුමාගේ වැඩ කරන දිනය ලෙස පවත්වන්නට විය. එය කම්කරු දිනයට සමපාත වන කිට්ටුම කාරණය ලෙස හඳුනාගත හැකිය.

මැයි දිනය බැංකු නිවාඩු දිනයක් ලෙස මෑත ඉතිහාසයේ වසරින් වසර මැයි මස පළමුවැනි සඳුදා දිනට යෙදී තිබුණු අතර මහ සිකුරාදා හා පාස්කු ඉරිදා මුල්කොට ගත්තේ ද පළමු වැනි සඳුදා දිනය සමඟය. එය එංගලන්තයේ 1978 වන තෙක්ම පැවැති බව වාර්තා වේ. එහෙත් ඊට පෙර එම උත්සව තහනම් කොට තිබූ බවත් වාර්තා වේ.

විශේෂයෙන් එංගලන්තයේ විවිධ පළාත්වල මෑතක් වන තෙක්ම සාම්ප්‍රදායික සිරිත් විරිත් මැයි දිනයට පැවැත් වූ බව වාර්තා වේ. මැග්ඩලීන් කොලීජියේ මහා කුලුන අසල ගීතිකා කණ්ඩායම් ගී ගයා මැග්ඩලීන් පාලමෙන් ගඟට පැනීමේ චාරිත්‍රයක් පැවැති අතර, එය 1970 වන තෙක්ම තිබිණි. පසුව එය තහනමට ලක් විණි.

## සාම්ප්‍රදායික සිරිත් විරිත්

ඩර්හැම් විශ්වවිද්‍යාලය අසල ඇති prebend's පාලමට රැස් වන ජනයා ජන ගී ගයමින් උදේ ආහාරය ද ගෙන නර්තනයේ යෙදීම 2001 වන තෙක්ම තිබී ඇත. ශාන්ත අන්ඩෘස් විශ්වවිද්‍යාලයේ මුහුද අසල නිරුවතින් හිරු උදාව නැරඹීම මැයි දින සැමරුමක් වී තිබිණි. Cornwall-Hobby Horse යනුවෙන් පැරණිම සම්ප්‍රදායක් ලෙසින් ජනයා උද්‍යානවල මැයි දින ගීත ගයමින් රතු, නිල් පැහැති ඇඳුම් ඇඳ නර්තනයේ යෙදීම සිදු විණි. Millbrookවල flower boat පූජාවක් ලෙස කෙරෙන්නේ කළු කුමාරයා මල්වලින් වසා පෙරහරේ ගෙන යෑමයි. එඩින්බරෝ ග්ලාස්ගෝවල කාල්ටන් කඳු මුදුනේ ඇති ආතර්ගේ ආසනය වෙත යන බැතිමතුන් එහි ඇති පිනිවලින් මුහුණ සෝදා ගන්නේ සදාකාලිකව රුව රැක ගැනීමක් වශයෙනි.

පින්ලන්තයේ ද මැයි දිනය සමරන ලද්දේ මල් ඔටුන්න පැලැඳවීමෙනි. ස්වීඩනයේ එය Vappu නමින් හඳුන්වා විවිධ වර්ණවත් ඇඳුම් ඇඳීමත්, තොප්පි පැලඳීමත් සිදු විය. පැරණි ප්‍රංශයේ මැයි දිනය දා බද්දෙන් නිදහස් කොට ලිලී මල් විකිණීම සඳහා වැඩ කරන මිනිසුන්ට පවරන ලදී. ජර්මනියේ කාන්තාවෝ රෝස මල් දී තම හිතවතුන් සැමැරීම කරන ලදී. වාර්තා වන අන්දමට 1933 වන තෙක්ම මැයි දිනය නිවාඩු දිනයක් වූ බවට නිල වාර්තා නොවීය.

අයර්ලන්තයේ දිගු ශීත සෘතුවට පසුව එන ග්‍රීස්මය සමඟ යෙදෙන මැයි මාසයේ පළමු සඳුදා දිනය මැයි දිනය ලෙස පිළිගත් අතර ඊට පෙර දිගු කලක් සාම්ප්‍රදායික උත්සව පවත්වා තිබේ. බල්ගේරියානුවෝ මැයි දිනය සමරන ලද්දේ දේව ඇදහිල්ලක් ලෙසය. යෙරමියා නම් ශාස්තෘවරයා සර්පයින්ගෙන් රටවැසියා බේරා ගැනීමට පැමිණීමේ දිනය ලෙස ඔවුහු මැයි දිනය සමරූහ. එදිනට ගොවි බිම්වලට ගිය හොත් සර්පයින් පැමිණ දෂ්ඨ කරන නිසා එදින නිවාඩු ගෙන එය උත්සවයක් ලෙස පවත්වා ඇත. එසේම බටහිර බල්ගේරියානුවෝ ගිනිමැලයක් දල්වා ඊට උඩින් මහත් ශබ්ද නඟා සර්පයින් බිය ගන්වා ඇත. රොමේනියානුවෝ ද යෙරමියාගේ පැමිණීම විශ්වාස කරන අතර, එදිනට උත්සව පවත්වන ලද්දේ තම අස්වැන්න හා සතුන් ආරක්ෂා කර ගැනීම සඳහාය. පරිසරයේ පවත්නා කුණාටු, ලෙඩ රෝග සහ කෘමීන්ගෙන් ආරක්ෂා වීම සඳහා එදිනට වයින් පානය කරන්නේ නීරෝගී බව ලබා ගැනීම සඳහාය.

බැටලු පැටවකු බැද කෑම ගන්නා අතර කාන්තාවන් වැඩබිම්වලට යෑම එදිනට නොකරන්නේ කුණාටුවලින් ආරක්ෂා වීම පිණිසය. එසේම මැයි දිනය දා උදේ පාන්දර වැටෙන පිනිවලින් මුහුණු දොවා ගැනීම වාසනාව ගෙන දෙන්නක් ලෙස සැලකීම තවත් සමාචාර ක්‍රමයකි. එසේම මැයි දිනය දා දේශගුණික තත්ත්වය නිතරම ඉතා හොඳ බවට විශ්වාසයක් ඇති නිසා එදිනට උත්සව පැවැත්වීමට යොදා ගෙන ඇත.



## අන්තර්ජාතික කම්කරු දිනය

ස්වීඩනයේ ජනතාව මැයි දිනය අන්තර්ජාතික කම්කරු දිනය ලෙස සමරන අතර කැනඩාව ද කොලොම්බියාවේ කොටසක් වශයෙන් ඊට එක් වේ. බ්‍රිතාන්‍යය තවමත් එයාකාරයම අනුගමනය කරන තත්ත්වයක් ඇති බව කියැවේ.

අමෙරිකා එක්සත් ජනපදය මුල් කාලයේ මැයි දින උත්සව පැරණි එංගලන්තයේ පැවැති ක්‍රම අනුව සිදු වූ අතර 1886දී සිදු වූ haymarket massacare ඛේදවාචකය මෑතකාලීන ප්‍රධාන සිදුවීමක් වූ අතර, 1917 රුසියාවේ කම්කරු විප්ලවය අමෙරිකාවේ මැයි දිනය සැමරීමට හේතු විය. පසුකාලීනව සමාජවාදයත් කොමියුනිස්ට්වාදයත් අතර පැවැති මතභේදවලදී ඇතැමුන් සිරගතවීමත් සමඟ 1929 දී සිදු වූ ස්ටොක්මාකට් සිදුවීම නිසා අමෙරිකාව රුසියාවෙන් ගත් අත්දැකීම වූයේ රුසියාව ඉතා වේගයෙන් කාර්මීකරණයට ලක් වන ආකාරයයි. එය ආදර්ශයට ගත් අමෙරිකානුවෝ සමාජවාදී ගමනකට අවතීර්ණ වීමත් සමඟ මැයි දිනය රුසියාවට සමපාත ආකාරයකට පැවැත්වීමට පටන් ගත්හ.

එහෙත් දෙවන ලෝක යුද්ධයෙන් පසුව ඇති වූ සීතල යුද්ධය නිසා අමෙරිකාවේ මැයි දිනය ජාතිකවාදී මුහුණුවරකට පත් විය. නමුත් මුල්කාලීන අමෙරිකාවේ මැයි දිනයේදී දේව සංකල්පය දැක ගත හැකි වූ අතර, පසුව ඊට කම්කරු දිනය ද එක් විය. 2012 දී එතෙක් පැවැති විවිධ ප්‍රාන්තවල විවිධත්වය එකක් බවට එනම් වත්මන් තත්ත්වයට පත් විය.

හවායි දූපතේ ද සාම්ප්‍රදායිකව පැවැති මැයි දිනය Lei day ලෙස නම් කළ අතර, 1927 දී නිල වශයෙන් පැවැත්වීමට යෝජනා කර ඇත්තේ කලාකරුවකු හා කවියකු විසින් බව කියැවේ. ඕස්ට්‍රේලියාවේ මැයි දිනය මුල් කාලවලදී පවත්වා ඇත්තේ මැයි මස පළමුවන සඳුදා දිනයේදී වූ අතර පසුව එය මැයි 1 වනදාට යෙදිණි.

## දේව සංකල්පයක්

සෑම යුරෝපීය රටකම පැවත ඇත්තේ මැයි දිනය දේව සංකල්පයක් ලෙස හා වසන්ත සමය සැමරීමක් වශයෙනි. නිල වශයෙන් දැනට වාර්තා වන අන්දමට රටවල් 80ක් පමණ මැයි දිනය කම්කරු දිනය ලෙස පවත්වන්නේ මුල්කාලවලදී පවත්වාගෙන ආ දේව ඇදහිලි හා වසන්ත උත්සවවලට සමපාතවය. එසේම නොනිල වශයෙන් මැයි දිනය සමරන රටවල් ද ඇති බව වාර්තා වේ. ඒවා කෙමෙන් වෙනස් වෙමින් දිනය පසුව එක් අරමුණකට පැමිණ ඇත්තේ විශේෂයෙන් 1886දී චිකාගෝ නගරයේ හේමාර්කට් සිදුවීමත් සමඟය.

එම සිදුවීමට විශේෂ වශයෙන් හේතුවක් වූයේ රුසියානු විප්ලවයේ හඬ වන අතර, එය පිළිගැනීමකට ලක්ව ඇත්තේ සමාජවාදය හා කොමියුනිස්ට්වාදය යන දෘෂ්ටිවාදවල පලයක් වශයෙනි. කෙසේ නමුත් විවිධ රටවල මැයි දින උත්සව වෙනත් අරමුණු මත පවත්වා ඇති අතර, අවසානයේ ලෝක නැතහොත් අන්තර්ජාතික කම්කරු දිනය ලෙස ව්‍යාප්ත වී ඇත. වර්තමාන ලෝකයේ ඇති වී ඇති අවාසනාවන්ත තත්ත්වයත් සමඟ මැයි දිනය දුක්ඛර තත්ත්වයකට ගෙන ඒමට කොවිඩ් වසංගතයට හැකි වී ඇත. මෙවර ලෝකය මැයි දිනය සමරනු ඇත්තේ පෙර ලෙස නීරෝගී බව සඳහා දේව ඇදහිල්ලක් ලෙස වනු ඇත. මෙය තවත් මැයි දිනයක සන්ධිස්ථානයක් වීමට බොහෝ දුරට හේතු වන ආකාරය අපට දැක ගත හැක්කේ මෙවර ලෝකයේ රටවල් එය සමරනු ලබන ආකාරය අනුවය.





ලුණු දියරින් උගුර සෝදන අමෙරිකානු හට පිරිසක්

# එදා ස්පාඤ්ඤ උණ මෙදා කොරෝනා

කොවිඩ් 19 වසංගතයට බෙහෙවින්ම සමාන රෝග ලක්ෂණ පෙන්වන වසංගත රෝගයක් සියවසකට ඉහතදී ද ලොව පුරා පැතිර ගියේය. වයිරසයක් යනු කුමක් දැයි මේ කාලයේදී හඳුනාගෙන නොතිබුණි. ඉන්ෆ්ලුවැන්සා රෝගයේ ලක්ෂණ පෙන්වන මෙම වසංගත රෝගයට අදින් සියවසකට පෙර ජීවත් වූ ජනතාව ද මුහුණ දුන්නේ අප මෙදා කොරෝනාවෙදි අනුගමනය කරන සෞඛ්‍ය පුරුදුම අනුගමනය කරමිනි.

ස්පාඤ්ඤ උණ වශයෙන් සිංහලට පරිවර්තනය වන එම රෝගී තත්ත්වය ලොව පුරා ප්‍රචලිත වූයේ ස්පැනිෂ් ෆ්ලූ (Spanish Flu) නමිනි. ස්පාඤ්ඤ උණ රෝගය කොරෝනාවට බෙහෙවින්ම සමාන රෝග ලක්ෂණ පෙන් වූ අතර, පැතිරයෑමේ ස්වභාවය ද සමාන ස්වරූපයක් ගත්තේය.

නිශ්චිත වෛද්‍ය ප්‍රතිකාර ක්‍රමයක් රෝගය සඳහා සොයා නොගැනුණු අතර 1918 – 1921 අතර කාලයේදී මිලියන 500කට ආසන්න ජනතාව රෝගයට ගොදුරු වූ බවත් මිලියන 20ත් 50ත් අතර සංඛ්‍යාවක් රෝගයෙන් මියගිය බවත් විශ්වාස කෙරේ.

## පළමුවන රැල්ල

රෝගය පළමු වරට වාර්තාවීමේදී හෙවත් පළමු රැල්ලේදී බොහෝදෙනා සීඝ්‍රයෙන් පැතිරි ගිය තද උණ සෙම්ප්‍රතිශ්‍යා හා කැස්ස තත්ත්වයකට ගොදුරු වූහ. කිහිපදෙනෙක් පමණක් රෝග තත්ත්ව උත්සන්න වී මිය ගියහ. පළමු රැල්ලේදි කිසිවකු මේ රෝගය එතරම් බරපතළ ලෙස නොතැකූ අතර මිය ගිය අයගේ මරණවලට හේතුව සෙම නරක් වී ඇති වූ නිව්මෝනියා තත්ත්වයක් ලෙස පිළිගැනිණි.

ස්පාඤ්ඤ උණට ගොදුරු වූ මුල්ම රෝගියා ලෙස වාර්තා වන්නේ අමෙරිකාවේ කන්සාස් ප්‍රාන්තයේ හමුදා කඳවුරක සේවය කළ ඇල්බට් ගිමෙල් නමැති කෝකියෙකි. ඔහු රෝහල්ගත කිරීමත් සමගම 54000ක හට බණ්ඩයක් සිටි කඳවුරේ මාසයක් තුළදී 1100ක් සමාන රෝග ලක්ෂණ පෙන්වන්නට පටන්ගත්හ. සෙම්ප්‍රතිශ්‍යා උණ උත්සන්නවීමෙන් කඳවුරේ සෙබළු 38ක් මිය ගියහ.

පළමු ලෝක යුද සමයේදී යුරෝපයේ ඇරැඹුණු ස්පාඤ්ඤ උණ රෝගය ලොව පුරා පැතිරුණේ අමෙරිකානු හා තවත් රටවල සොල්දාදුවන්ගේ සංචරණ හේතුවෙන් බව පිළිගැනේ.

1918 අප්‍රේල් හා මැයි මාස වෙද්දී එංගලන්තය, ප්‍රංශය, ස්පාඤ්ඤය හා ඉතාලියේ ලැව්ගිනි සේ රෝගයේ පළමු රැල්ල පැතිරී තිබුණි. ප්‍රංශ හමුදාවේ 3/4, බ්‍රිතාන්‍යය හමුදාවේ 1/2ක්, රෝගයට ගොදුරු වූහ. ෆැරන්හයිඩ් අංශක 104 දක්වා ඉහළ යන උණ, හොටු හා කැස්ස තත්ත්වය දින තුනක් පැවැති අතර, රෝගීහු මෙම පළමු රැල්ලේදි සාමාන්‍යය උණ මෙන් සුවපත් වූහ. මිය ගියේ ඉතා සුළු පිරිසකි.

මේ කාලයේදී මුළු යුරෝපයම පාහේ පළමු ලෝක යුද්ධයේ හවුල්කාරයන්ව සිටි අතර, පුවත්පත්වලට ද වාරණ පැනවී තිබුණි. හමුදාවේ චිත්ත ධෛර්යය පිරිහෙන මෙන්ම යුද්ධයට බාධක විය හැකි හා යුද විරෝධී පුවත් පළ කිරීම පුවත්පත්වලට තහනම් විය. පුවත්පත් වාරණය ඉතා තදින් ක්‍රියාත්මක විය. හමුදා සෙබළුන් අතර වසංගත උණක් පැතිරී යන බව යුද්ධයට සම්බන්ධ කිසිම රටක පුවත්පත්වල මේ නිසා පළ නොවීය. කෙසේ නමුත් පළමු ලෝක යුද්ධයට සක්‍රීයව සම්බන්ධ නොවූ ස්පාඤ්ඤයේ කිසිම පුවත්පත් වාරණයක් මේ අනුව ක්‍රියාත්මක නොවූ අතර, එරට පුවත්පත් හිතේ හැටියට නිදහසේ මේ අමුතු උණ රෝගයට ගැන වාර්තා කළේය.යුදකාමීහු රෝගයට ස්පාඤ්ඤ උණ යන නම පටබැන්දහ. රෝගය ස්පාඤ්ඤ උණ ලෙස ප්‍රචලිත විය.

1918 ගිම්හානය උදා වෙද්දී ඇරැඹී ලැව් ගිනි සේ පැතිර ගිය ස්පාඤ්ඤ උණ රෝගීන් පිළිබඳ වසන්තය ඇරැඹීමත් සමඟ (මාර්තු - අප්‍රේල් මාසවල) වාර්තා වීම පහත වැටුණේය. ලැබුණේ සුළු විරාම කාලයකි.

## දෙවන රැල්ල

ශීත ඍතුව වෙද්දී උණ මාරයා යළි කුපිතව පැමිණියේය. ඉතාම හොඳ නිරෝගී සම්පන්න පුද්ගලයකු පවා රෝග ලක්ෂණ පෙන්වා පැය 24ක් තුළ මරා දැමීමට තරම් මෙවර උණ මාරයා බිහිසුණු විය. ස්පාඤ්ඤ උණ මාරයා යළි ආක්‍රමණශීලීව පැතිර ගියේය.



මහමඟ විෂබීජ නාශක ඉසින පුද්ගලයෙක්



මුඛාවරණ පැලඳ ගත් යුවළක්



මුඛාවරණ පැලඳගෙන වැඩ කරන යුවතියක්

බ්‍රිතාන්‍යයේ ප්ලයිමවුත් වරායේ සිට සොල්දාදුවන් රැගත් නැව් යුද්ධයට සම්බන්ධ වීමට පිටත් වූහ. ප්‍රංශයේ බ්‍රෙස්ට් , අමෙරිකාවේ බොස්ටන් නුවර අමෙරිකාවේ ෆීටවුන් ආදි ප්‍රදේශවල රෝගය තදින්ම පැතිරෙන්නට පටන් ගත්තේය. ස්පාඤ්ඤ උණේ දෙවැනි රැල්ල ලෙස මේ තත්ත්වය හැඳින්වුණි. පළමු රැල්ලේදී කුඩා ළමයින් හා වයෝවෘද්ධ පුද්ගලයන් මිය ගිය අතර, දෙවන රැල්ලේදී නිරෝගී ශක්තිමත් (25-55) යොවුන් හා ගැටවර වියේ පසුවූවෝ ද ලක්ෂ ගණනින් ලොව පුරා මිය ගියහ.

නිරෝධායන හා හුදකලා කිරීම් සිදු නොකිරීම රෝගය පැතිරීමට හේතුවන බව වෛද්‍යවරු දැක්වූහ. එහෙත් එසේ සිදු කිරීම යුද්ධයට බාධාවක් ලෙස පිළිගැනුණු අතර, හුදකලා කිරීම් සිදු කිරීමට බලධාරීහු පසු බෑහ. මහා බ්‍රිතාන්‍යයේ ඉහළම පරිපාලන නිලයක් දැරූ ආතර් නිවුස් හොම් (Arthur Newsholme) දැඩි හුදකලා කිරීම හෙවත් ලොක්ඩවුන් අනුගමනය කළ යුතු බව එකහෙළාම පිළිගත් අතර, එහෙත් යුද්ධයට හානිදායක විය හැකි දේ කිරීමට ඔහු පසුබෑවේය. අමෙරිකාවේ හෙදියන්ගේ හිඟයක් ඇති විය. බොහෝ හෙද හෙදියන් හමුදා කඳවුරුවල සේවයට අනුයුක්ත කෙරුණි. මේ අතර,



කපුරු මාල පැලඳගත් ළමයි





බ්‍රිතාන්‍ය නිළියන්ට සලාක ක්‍රමයට දොඩම් බෙදා දුන් අවස්ථාවක්.

අමෙරිකා - අප්‍රිකා සම්භවයක් ඇති පුද්ගලයන් හෙද සේවයට පුහුණු කිරීමට ගෙනා යෝජනාවට අමෙරිකා රතු කුරුස සංවිධානය පිටුපෑහ.

වෛද්‍යවරු අසරණ වූහ. රෝගයට පිළිසරණක් හෝ ප්‍රතිකර්මයක් නොවුණි. මිනිස්සු බොහෝ විකල්ප ක්‍රම සෙවූහ. නාස් හා මුඛාවරණ පැලඳීම බෙහෙවින්ම ප්‍රචලිත වී තිබුණි. සියලු දෙනාම පාහේ මුඛ හා නාස් ආවරණ භාවිතා කළහ. සමහර මවුපියෝ රෝගයෙන් බේරීමට සිතා සිය දරුවන්ගේ ගෙලේ කපුරු මාල පැලඳවූහ. දොඩම් වැනි පලතුරු භාවිතයට අනුබල ලැබුණි. ලුණු දියරෙන් උගුර සේදීම ප්‍රචලිත විය. සමහරු විෂබීජ නාශක ගුණය ඇති බව සිතිය හැකි විවිධ දියර ජාති සාදා මහමඟ ඉස්සහ. සමහර රටවල් එම රෝගය බෝවීම වැළැක්වීමට ජනතාව අතර සලාක ක්‍රමයට දොඩම් බෙදා හැරියේය. තැපෑලේ වැඩ නැවැතුණි. පාසල් වැසුණි. කඩසාප්පු වැසුණි. ප්‍රසිද්ධ ස්ථානවල කෙළ ගැසීම් තහනම් විය. අත්‍යාවශ්‍ය සේවකයන් සේවයට කැඳවුණු අතර, බොහෝදෙනා නිවෙස්වලටම වී සිටියහ

රෝගීන් ඇසුරින් ඈත් වීම හෙවත් හුදකලා වීම හා පරිස්සම හැර වෙනත් ක්‍රමයක් රෝගයෙන් බේරීමට එදාත් නොතිබුණු අතර, මිනිස්සු ඖෂධ පසු පස හඹා නොයමින් රෝගයෙන් බේරීමට පරිස්සම් වූහ.

ස්පාඤ්ඤ උණේ දෙවැනි රැල්ල බිහිසුණු වීමට හේතුව ලෙස සැලකුණේ දෙවැනි රැල්ල ශීත සමයේදී හට ගැනීමයි. මිනිස්සු වැඩිපුර සිටියේ නිවෙස් තුළය. මේ කාලයට යුරෝපයේ නිවෙස්වල දොර ජනේල වසා තැබෙන අතර, හිරු එළිය හා වාතාශ්‍රය ලැබුණේ අඩුවෙනි. බොහෝදෙනා රෝගයට ගොදුරු වූයේත් රෝගය පැතිර ගියේත් මේ නිසා බව සැලැකේ. පළමු රැල්ල බිහිසුණු නොවූයේ ගිම්හානය නිසා ලැබුණු හොඳ වාතාශ්‍රය හා හිරු එළිය නිසා බවත් සිතති. ඉලෙක්ට්‍රෝනික මයික්‍රොස්කෝපය සොයාගෙන නොතිබුණු 1918දී වෛරස ගැන කිසිවකු දැන සිටියේ නැත. මියගිය අයගේ දේහයන් කපා බලද්දී පෙණහලු අක්මා හා වකුගඩුවල ඉදිමුම් වෛද්‍යවරු නිරීක්ෂණය කළහ. වෛද්‍යවරු සිතුවේ නිව්මෝනියා කාරක බැක්ටීරියාවක අමුතු හැසිරීමක් බවය.අමෙරිකාව හා යුරෝපයේ රටවල් රෝගය පිළිබඳ පර්යේෂණ සඳහා අති විශාල වශයෙන් මුදල් යෙදවූහ. ස්පාඤ්ඤ උණේ දෙවැනි රැල්ලේදි අමෙරිකාවේ ෆිලඩෙල්ෆියාවේ 1918 නොවැම්බරයේ පැවැති රැලියකට එක්වූ මහ පිරිසක් රෝගයට ගොදුරු වීම ඛේදනීයම අවස්ථාවක් ලෙස ඉතිහාසගත වී ඇත. මේ සිද්ධියේදී සමහර දරුවන්ට මවුපිය දෙදෙනාම අහිමි විය.

1918 දෙසැම්බරය අවසන් වන විට මාරාන්තික දෙවන රැල්ල ක්‍රමයෙන් නිමා විය.

## තුන්වන රැල්ල

වසරක්ම ගෙවී ගියේය. 1919 ජනවාරිය උදා විය. ඕස්ට්‍රේලියාවේදී තුන්වැනි රැල්ල ඇරැඹුණේය. දෙවැනි රැල්ල මෙන්ම වේගයෙන් තුන්වන රැල්ල පැතිර ගියේය. පළමු ලෝක යුද්ධය අවසන් කිරීමේ සාම සම්මුතියට අස්සන් තැබීමට ප්‍රංශයේ පැරිස් නුවරට පැමිණි අමෙරිකානු ජනාධිපති වුඩ්රෝ විල්සන් ද තදින්ම ස්පාඤ්ඤ උණට ගොදුරු විය. අමෙරිකා රජය සිද්ධිය සැඟවූයේය. පසුව ජනාධිපතිවරයා සුවය ලැබීය. දෙවන රැල්ලේදී මෙන්ම විශාල පිරිසක් තුන්වන රැල්ලේදී ද මිය ගියේය.

## හතරවන රැල්ල

ස්පාඤ්ඤ උණේ හතරවන රැල්ල වාර්තා වූයේ 1920 වසන්තයේදීය. එනම් මාර්තු මාසය වෙද්දීය. එහිදී රෝගයට ගොදුරු වූවෝ පළමු රැල්ලේදී මෙන් සාමාන්‍ය උණ හෙම්බිරිස්සා තත්ත්වයට ගොදුරුව සුවය ලැබූහ. කිහිපදෙනෙක් පමණක් මියගියහ. හතරවන රැල්ල බෙහෙවින්ම පළමු රැල්ල මෙන් විය. හතරවන රැල්ල එතරම් මාරක නොවී ක්‍රමයෙන් පහවිය. හතරවන රැල්ලේදි මිනිස්සු රෝගයට ඔරොත්තු දීමට ස්වභාවිකවම කායිකව ශක්තිමත් වී සිටි බවත් සෞඛ්‍ය පුරුදු තදින්ම අනුගමනය කළ බවත් මේ නිසා ස්පාඤ්ඤ උණ මාරයා පැරදවීමට හැකි වූ බවත් විශ්වාස කෙරේ.

රෝගය පිළිබඳ පුවත්පත්වල වාර්තවීම් ද නැවැතුණි. රෝගය පිළිබඳ මතකය හා කතාබහ නැවැතුණි.

ස්පාඤ්ඤ උණ පිළිබඳ සාමාන්‍ය මහජනතාව අතර යළි සීඝ්‍ර කතාබහ ඇරැඹෙන්නේ චීනයේ අරැඹුණු බව සැලකෙන කොවිඩ් -19 වසංගතයත් සමගය. ස්පාඤ්ඤ උණ සෑදූ විෂ බීජය කුමක්ද ඊට අවසානයේ සිදු වූයේ කුමක් දැයි කිසිවෙක් අදත් නොදනිති. සමහර විට එම විෂ බීජය බෙලහීනව තවමත් ලොව සැරිසරනවා වෙන්නට බැරි ද නැත. කිසියම් සතුරු පාර්ශවයක් විසින් මේ විෂබීජය සිය සතුරු කඳවුරු වෙත මුදාහරින්නට ඇති බවට සැකයක් ඇතැම් ඉතිහාසඥයන් අතර අදටත් පවතී. රෝගය අරැඹුණේ අමෙරිකාවේ ද යුරෝපයේ ද කියා තවමත් නිශ්චිතව නොදනී.

**සමන්මලී ජයතුංග**





## දැන ගත යුතු ලුණු

මෙරට සමාජයේ අටුවන් බැසගත් මිථ්‍යා මතිමතාන්තර කප්පරකි. එහෙත්, එය එසේ බව තවමත් අපේ හුඟදෙනෙක් නොදනිති. මුළුතැන්ගෙයි අස්සකට මුල්ලකට වන්නට තබා තිබෙන ලුණු පොල්කට්ටටත් එය එසේමය.

'ලුණුයි බතුයි කාලා හරි ජීවත් වෙන්න එපැයි' 'ගේ හරියේ ලුණු කැටයක්වත් නැහැ...' මේ, ගැමි ගෙදරින් සේම සිදාදියෙන් ද නිතර අසන්නට ලැබෙන්නකි.

ඒ කෙසේ වෙතත් ඒ තරම් හරි හරියට ලුණු රස බැලුව හොත් කාට කාටත් සිදු වන්නේ ඉක්මනින්ම මළගම් යෑමටය. එය එතරම්ම භයානක වන වග මේ වන විට පර්යේෂණාත්මකව තහවුරු කොට තිබේ.

ඇත්තෙන්ම, බෝ නොවන රෝග නිසා මෙරට වැඩිම මරණ ගණනක් වාර්තා වන වග අමුතුවෙන් සඳහන් කළ යුතු නැත. හෘදයාබාධ, ආඝාතය, අංශභාග රෝගය පමණක් සලකා බැලුව ද එහි විපාක සුළු පටු නොවේ.

අකාලයේ ඒවාට ගොදුරු වී මිය යන වැඩිහිටියන්ගේ හව්හරණ අහිමි වීමෙන් මිලින වන මල් කැකුළු වැනි දරු පැටවු ගණන ඉතා විශාලය. මේ වන විට හෙළිදරව් කොටගෙන තිබෙන අන්දමට මෙරටින් හඳුනාගැනීමට ලැබෙන මාරාන්තික හෘදයාබාධ හතරකින් එකක් වැනි ඉහළ ප්‍රමාණයකට ප්‍රධානම හේතුව අධික ලුණු පරිභෝජනයයි.

එපමණක් නොවේ අංශභාගය වැනි අභාග්‍ය සම්පන්න ඉරණමක් නිරෝගී මිනිසකුට කෙටි කලකදී උරුම කරවන්නට ලුණුවලට පුළුවන. ලෝක සෞඛ්‍ය සංවිධානයේ උපදෙස්වලට අනුව එක් මිනිසකු දිනකට ලුණු ග්‍රෑම් 5කට වඩා භාවිත නොකළ යුතුය. ඒ ඊට වඩා ලුණු පරිභෝජනය දරුණු රෝගාබාධ ඇති කරන්නක් විය හැකි බැවිනි. එහෙත්, මෙරට ඇත්තන්ගේ 'ලුණු කෑම' ඒ අනුමත ප්‍රමාණය මෙන් දෙගුණයකටත් වඩා වැඩි වග පර්යේෂණාත්මකව හෙළිදරව් වී තිබෙන්නකි.

මෙරට පැරැන්නන් බතට ලුණු එක් කිරීම නොතරම්,එසේත් නැතිනම් නොකළ යුත්තක් වශයෙන් සැලකූහ. එහෙත් අද වන විට බොහෝදෙනකුට එය අමතක වී ඇති සැටියකි. ඒ, අද සමාජයේ හුඟදෙනෙක් බත් මුට්ටියට ලුණු දැමීම පුරුද්දක් කරගෙන සිටින බැවිනි.

ලාභ රසකාරකයක් වන ලුණු නිසා නූතන මිනිසා අත්කරගන්නා අවාසි සහ අභාග්‍ය ද රැසකි. අඩු ලුණු සහිතව, නො එසේ නම් නියමිත ලුණු රසැතිව ආහාරවල රසය විඳ ගැනීමේ වරම මේ නිසා මිනිසාට අහිමි වේ. ලුණු රසින් මිනිස් දිවේ රස අංකුර අක්‍රිය වීම ඊට හේතුවකි. එය එසේ වූ විට නැවත යථා තත්ත්වයට පත් කර ගැනීම ලෙහෙසි පහසු නැත. කුඩා කල සිටම ලුණු අඩුවෙන් භාවිතයට දරුවන් හුරු කිරීමට මවුපියන් වග බලා ගතයුතු වන්නේ එහෙයිනි.

එම්.එස්.ජී.(MSG) ආහාරයට එක්කර නොගත යුතු බව දැන් දැන් අපේ සමාජයේ හුඟ දෙනෙක් දැනුම්වත්ය. ඒ අනුව බොහෝ ජනප්‍රිය වෙළෙඳ නාම යටතේ වෙළෙඳපොළට පැමිණෙන සකස් කළ ආහාර බොහොමයකම ඒවා අඩංගු නොවන වග ඒවායේ අසුරණවල සටහන් කර තිබෙනු දක්නට පුළුවන.

එහෙත් විද්‍යාත්මකව සොයා බැලීමේදී එම්.එස්.ජී බහුල බව කියැවෙන සුප් කැටවලත් ලුණුවලත් මහා වෙනසක් නැති වග හෙළි කර ගෙන තිබේ. ඒ ඒවායේ ද හරි හරියට සෝඩියම් අණු අන්තර්ගත හෙයිනි.

සැබැවින්ම, අපේ සිරුරට අවශ්‍ය කරන සෝඩියම් ප්‍රමාණය නොඅඩුව එළවළු, පලතුරු, මස්, මාළු ආදියෙන් ලැබේ. එය එසේ තිබියදී දවස පුරා ප්‍රධාන හා අතුරු ආහාර වේල් සමග අප අමතර වශයෙන් ලුණු බහුලව යෙදූ ආහාර පාන ගැනීමෙන් කර ගන්නේ බරපතළ හානියකි.

මේ වග දියුණු රටවල් හොඳින්ම පසක් කරගෙන සිටී. ඒ ඒ රට වැසියන් ලුණු අඩුවෙන් යෙදූ සකස් කළ ආහාර පාන වලට වැඩි කැමැත්තක් දක්වති.

ඒ කෙසේ වුවත් දිගු කලක් තිස්සේ මුළුතැන්ගෙයිහිදී ගොජ ගොජ හඬ නංවමින් ව්‍යංජනයට මෙන්ම බතටත් ලුණු වක්කරන පුරුද්ද එක්වරම අත්හැරීම හුඟදෙනකුට අපහසු කරුණක් විය හැකිය. එබැවින් ක්‍රමානුකූලව ඊට හුරුවීම අවශ්‍ය වේ. කරවල වැනි ලුණු නොඅඩුව අන්තර්ගත ආහාරවලටත් ලුණු දැමීම අපේ හුඟ දෙනකුගේ පුරුද්දකි. එතැනින් ලුණු අඩු කිරීමේ කාර්යය ඇරඹිය හැකිය. ඒ ඒවා හොඳින් උණු වතුරෙන් සෝදා පිරිසුදු කොට කුරුඳු වැනි දේශීය කුළුබඩු හරි හරියට කෑමට එක් කර ගැනීමෙනි. ලුණු රසින් යටපත් වූ අපේ රස නහරවලට නැවත පණ දී ආහාරයේ සැබෑ රසය අපට විඳගත හැක්කේත් එහි සැබෑ පෝෂණ ගුණය නොඅඩුව විඳිමින් නිරෝගිමත් ජීවිතයක් අපට ගත කළ හැකි වන්නේත් එවිටය.

**නුවන් මහේෂ් ජයවික්‍රම**

# ජනාධිපති මාධ්‍ය ප්‍රකාශක කිංස්ලි රත්නායක

**මහින්ද අලුත්ගෙදර**

ප්‍රවීණ මාධ්‍යවේදී කිංස්ලි රත්නායක මහතා ජනාධිපති මාධ්‍ය ප්‍රකාශකවරයා වශයෙන් පත් කර තිබේ.

සිරස රූපවාහිනියේ නාලිකා ප්‍රධානි ලෙස කලක් කටයුතු කළ කිංස්ලි රත්නායක මහතා ඊයේ (29) ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා අතින් එම ධුරයට අදාළ පත්වීම් ලිපිය ගෙන තිබේ.

පෞද්ගලික ගුවන් විදුලියක් ලෙස සිරස එෆ්. එම්. ආයතනය ආරම්භයේ සිටම නිවේදකයකු හා වැඩසටහන් නිෂ්පාදකයකු වශයෙන් කටයුතු කළ කිංස්ලි රත්නායක මහතා නිර්මාණශීලි හැකියාවන් තුළින් නව ගුවන් විදුලි අත්දැකීම් රැසක් ශ්‍රාවකයන්ට දීමෙන් රසික ආකර්ෂණය දිනා ගැනීමට සමත් විය. කිංස්ලි රත්නායක මහතා කොළඹ ආනන්ද විද්‍යාලයේ දීප්තිමත් ආදි සිසුවෙකි.

# මඟීන් වැඩියෙන් ගෙන යන බස්වලට නීති දැඩි කරයි

**අසේල කුරුළුවංශ**

කොවිඩ් අවදානම පිළිබඳ රජය දල්වා තිබෙන රතු එළිය නිම වන තුරු ආසන ප්‍රමාණය ඉක්මවා මඟීන් ගෙන යන බස් රථ සම්බන්ධයෙන් දැඩි නීති ක්‍රියාත්මක කර දඩ මුදල් අය කිරීමට රථවාහන පොලිසියට බලයදී තිබෙන බව ප්‍රවාහන රාජ්‍ය ඇමැති දිලුම් අමුණුගම මහතා පවසයි.

බස් ගාස්තු ඉහළ දැමීමක් කිරීමට ආණ්ඩුව අවසර දුන්නේ ආසන ගණනට පමණක් මඟීන් රැගෙන යැමේදී බස් හිමියන් ලබන පාඩුව අවම කර ගැනීමට බවත් සෞඛ්‍ය නිර්දේශ නොතකා බස් රථවල මඟීන් ගෙන යැමෙන් රජය අපේක්ෂා කළ අරමුණු බිඳ වැටෙන බවත් ඒ මහතා කීය.

මේ ව්‍යසනකාරි අවස්ථාවේ බස් රථ රියැදුරන්ට මෙන්ම කොන්දොස්තරවරුන්ටද අදාළ සීමාවලට යටත්ව මඟීන් ගෙන යැමේ වගකීමක් මෙන්ම යුතුකමක් තිබෙන බවත් එය මඟී ජනතාවටද අදාළ බවත් හෙතෙම අවධාරණය කළේය.

# AC කාමරවල වයිරසය පැතිරීම වේගවත්

**සන්ධ්‍යා කරුණාරත්න**

වායුසමීකරණය කළ ස්ථානයන්හි කොවිඩ් - 19 වයිරසය ශීඝ්‍රයෙන් ව්‍යාප්ත වන බව වසංගත රෝග විද්‍යා අංශයේ ප්‍රධානි විශේෂඥ වෛද්‍ය සුදත් සමරවීර මහතා පැවසුවේය.

පුද්ගලයන් කිහිපදෙනකු ගැවසෙන ස්ථානයන්හි දොර ජනෙල් විවෘත කර හොඳින් වාතාශ්‍රය ලැබෙන ලෙස පසුබිම සකස් කළ යුතු බවද ඒ මහතා කියා සිටියේය. පුද්ගලයන් දෙදෙනකු හෝ ඊට වඩා වැඩි දෙනකු කතාබහ කරන විට අනිවාර්යයෙන්ම නිසි ලෙස මුව ආවරණය පැළඳීම කළ යුතු බවත් දැනට පවතින වයිරසය ව්‍යාප්ත වීමේ වේගය වැඩි නිසා වයිරසයෙන් ආරක්ෂා වීමට ජනතාව වග බලා ගත යුතු බවත් ඔහු ප්‍රකාශ කළේය. ජනතාවගේ හැසිරීම මත වයිරසය තව දුරටත් ව්‍යාප්ත වන්නේද නොවන්නේ ද යන්න තීරණය වන බවත් වයිරසයෙන් ආරක්ෂා වීම සඳහා ස්වයං පාලනයක් පවත්වා ගත යුතු බවත් හෙතෙම පැවසීය.

# ගැබිනි මව්වරුන් අවදානම් කාණ්ඩයට

**සන්ධ්‍යා කරුණාරත්න**

මේ වන විට රට පුරා පැතිරෙමින් තිබෙන කොවිඩ් - 19 වයිරසයට ගොදුරු විය හැකි අවදානම් කණ්ඩායමක් ලෙස ගැබිනි මව්වරුන් හඳුනා ගෙන ඇති බව ප්‍රසව හා නාරිවේද විශේෂඥ වෛද්‍යවරුන්ගේ විද්‍යායතනයේ විශේෂඥ වෛද්‍ය ප්‍රදීප් ද සිල්වා මහතා පැවසුවේය. වයිරසයට වැළඳුණු ගැබිනි මවුවරුන් තිදෙනකු දැඩි සත්කාර ඒකකවල මේ වන විට ප්‍රතිකාර ලබමින් සිටින බවත් නැගෙනහිර කොළඹ ශික්ෂණ රෝහලේ දැඩි සත්කාර ඒකකයේ ප්‍රතිකාර ලබන ගැබිනි මව අසාධ්‍ය තත්ත්වයෙන් පසු වන බවත් ඒ මහතා ප්‍රකාශ කළේය. ගැබිනි මව්වරුන් මේ වයිරසයට ගොදුරු වුව හොත් ඔවුන් රැක බලා ගැනීමේ ගැටලුවක් ඇති විය හැකි බවද ඒ මහතා කීය.

# ගාල්ල - කළුතර ආසාදිතයන්ටත් එංගලන්ත ප්‍රභේදය වැළඳිලා

## ආචාර්ය චන්දිම ජීවන්දර

**සන්ධ්‍යා කරුණාරත්න**

කොවිඩ් - 19 වයිරසය ආසාදිත ගාල්ල සහ කළුතර ප්‍රදේශවලින් ගත් ජෛව සාම්පලවල පවතිනුයේ එංගලන්ත ප්‍රභේදය බවට මූලික පරීක්ෂණවලින් හෙළි වී ඇතැයි ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ අසාත්මිකතා, ප්‍රතිශක්ති විද්‍යා හා සෛල ජෛව විද්‍යා ආයතනයේ අධ්‍යක්ෂ ආචාර්ය චන්දිම ජීවන්දර මහතා 'දිනමිණ'ට ඊයේ (29) පැවසුවේය.

ඉදිරි සතිය තුළදී එය නිශ්චිතවම තහවුරු කළ හැකි බවද ඒ මහතා ප්‍රකාශ කළේය. එංගලන්තයේ පැතිර යන B117 කොවිඩ් ප්‍රභේදය මේ වන විට රට පුරා ව්‍යාප්ත වෙමින් පවතින අතර, මේ වයිරසය සාමාන්‍ය වයිරසයට වඩා සියයට 50ක වේගයකින් පැතිරීම සිදු වේ. සැම දිස්ත්‍රික්කයකින්ම ගත් කොවිඩ් ආසාදිතයන්ගේ ජෛව සාම්පල පරීක්ෂා කිරීමට වැඩපිළිවෙළක් සකස් කර ඇති බවත් සෞඛ්‍ය අමාත්‍යාංශය මාර්ගයෙන් මේ ජෛව සාම්පල් තම රසායනාගාරය වෙත ලැබෙන බවත් ඒ මහතා කියා සිටියේය.

# ආගමික ස්ථානවල එක්රැස් වීම් තහනම්

**භක්ති ධර්මප්‍රිය මෙන්ඩිස්**

දිනපතා වාර්තා වන කොවිඩ් ආසාදිතයන් සංඛ්‍යාව ඉහළ යෑමත් සමග නැවත දැනුම් දෙන තුරු සියලු ආගමික ස්ථානවල සාමූහික ක්‍රියාකාරකම් හෝ රැස්වීම් පැවැත්විය නොහැකි බව සෞඛ්‍ය අමාත්‍යාංශය ප්‍රකාශ කරයි. නිවේදනයක් නිකුත් කරමින් එම අමාත්‍යාංශය සඳහන් කළේ ඕනෑම අවස්ථාවක එම පරිශ්‍රයක් තුළ සිටිය හැකි උපරිම බැතිමතුන් ගණන 25ක් ලෙස සීමා විය යුතු බවයි.

01 වැනි පිටුවෙන්...

## එජාප මැයි සැමරුම...

රටේ පවතින කොරෝනා වසංගතය තත්ත්වය හමුවේ රැස් කිරීමට අවසර ඇත්තේ 100ක් පමණක් බැවින් මේ තීරණයට එළැඹි බව පක්ෂයේ මහ ලේකම් පාලිත රංගේ බණ්ඩාර මහතා දිනමිණට පැවසීය.පක්ෂ ක්‍රියාකාරීන් සමග කරන සාකච්ඡා සූම් හෝ වෙනත් සමාජ මාධ්‍ය ක්‍රමවේදයකට පවත් වන ලෙසත් නිරෝධායන නීතිවලට පිටින් කිසිදු පක්ෂ ක්‍රියාකාරකමක් නොකරන ලෙසත් පක්ෂ නායක රනිල් වික්‍රමසිංහ මහතා උපදෙස් දී තිබේ.

# දිස්ත්‍රික්ක 9ක වසම් රැසක් හුදෙකලා කරයි

**භක්ති ධර්මප්‍රිය මෙන්ඩිස් සහ නුවන් කොඩිකාර**

කොවිඩ් -19 වයිරස ව්‍යාප්තිය හේතුවෙන් මේ වන විට දිස්ත්‍රික්ක 9කට අයත් ග්‍රාම නිලධාරි කොට්ඨාස රැසක් හුදෙකලා කර ඇති බව කොවිඩ් -19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථානයේ ප්‍රධානි, යුද හමුදාපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා මහතා පැවසීය.

මොනරාගල දිස්ත්‍රික්කයේ වැල්ලවාය පොලිස් බල ප්‍රදේශය, වැල්ලවාය නගර බල ප්‍රදේශයේ ග්‍රාම නිලධාරි කොට්ඨාසය, වෙහෙරයාය ග්‍රාම නිලධාරි කොට්ඨාසය, කොට්ටම්ගම්බොක්ක ග්‍රාම නිලධාරි කොට්ඨාසය, බුත්තල පොලිස් බල ප්‍රදේශයේ රහතන්ගම ග්‍රාම නිලධාරි කොට්ඨාසය, අම්පාර දිස්ත්‍රික්කයේ උහන පොලිස් බල ප්‍රදේශයේ, කුමාරිගම ග්‍රාම නිලධාරි කොට්ඨාසය, මාතලේ දිස්ත්‍රික්කයේ නාඋල පොලිස් බල ප්‍රදේශයේ, අලුගොල්ල ග්‍රාම නිලධාරි කොට්ඨාසය, උකුවෙල පොලිස් බල ප්‍රදේශයේ, පල්ලෙකුඹුර ග්‍රාම නිලධාරි කොට්ඨාසය, ගාල්ල දිස්ත්‍රික්කයේ රත්ගම පොලිස් බල ප්‍රදේශයේ, ඉඹුලගොඩ ග්‍රාම නිලධාරි කොට්ඨාසය, කටුදම්පේ ග්‍රාම නිලධාරි කොට්ඨාසය හුදෙකලා කර තිබේ.

පොළොන්නරුව දිස්ත්‍රික්කයේ හිඟුරක්ගොඩ පොලිස් බල ප්‍රදේශයේ, සිරිකෙත ග්‍රාම නිලධාරි කොට්ඨාසය, ගම්පහ දිස්ත්‍රික්කයේ - කොටදෙනියාව පොලිස් වසමේ, පොල්හේන ග්‍රාම නිලධාරි කොට්ඨාසය, හීරළුගෙදර ග්‍රාම නිලධාරි කොට්ඨාසය, කළුඅග්ගල ග්‍රාම නිලධාරි කොට්ඨාසය, මිනුවන්ගොඩ පොලිස් වසමේ, අස්වැන්නවත්ත නැගෙනහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසය, කළුතර දිස්ත්‍රික්කයේ මීගහතැන්න පොලිස් වසමේ, මිරිස්වත්ත ග්‍රාම නිලධාරි කොට්ඨාසය, පැලවත්ත උතුර ග්‍රාම නිලධාරි කොට්ඨාසය, පැලවත්ත නැගෙනහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසය, කළුතර දකුණ පොලිස් බල ප්‍රදේශයේ, අධිකාරිගොඩ ග්‍රාම නිලධාරි කොට්ඨාසය, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ත්‍රිකුණාමලය පොලිස් වසමේ, පුම්පුහාර් ග්‍රාම නිලධාරි කොට්ඨාසය, කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුඹුක්ගැටේ පොලිස් වසමේ, නිරාවිය ග්‍රාම නිලධාරි කොට්ඨාසය (441), තිත්තවැල්ගම කුඹුක්ගැටේ ග්‍රාම නිලධාරි කොට්ඨාසය, කුලියාපිටිය පොලිස් වසම, වැල්ලව පොලිස් වසමේ, නිකදලුපොත ග්‍රාම නිලධාරි කොට්ඨාසය (1185), දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානය, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ උප්පුවේලි පොලිස් බල ප්‍රදේශය, සුමේදගම්පුර ග්‍රාම නිලධාරි වසම, ත්‍රිකුණාමලය පොලිස් බල ප්‍රදේශය, මුදෝව් ග්‍රාම නිලධාරි වසම, කෝවිලඩි ග්‍රාම නිලධාරී වසම, ලින්ගානගර් ග්‍රාම නිලධාරී වසම, චයිනා බේ පොලිස් බල ප්‍රදේශය, කවට්ටිකුඩා ග්‍රාම නිලධාරි වසම, චයිනා බේ ග්‍රාම නිලධාරි වසම් මෙලෙස හුදෙකලා කර ඇති බව හමුදාපතිවරයා කියා සිටියේය.

01 වැනි පිටුවෙන්...

## තෙවැනි බැඳුම්කර වෙන්දේසිය ...

අමල් රණරාජා, නාමල් බළල්ලේ සහ ආදිත්‍ය පටබැඳිගේ යන මහත්වරුන්ගෙන් සමන්විත කොළඹ ත්‍රිපුද්ගල මහාධිකරණ විනිසුරු මඬුල්ල මේ අවසරය දුන්නේය.

දැනට රටින් පලා ගොස් සිටින විත්තිකරුවන් ගෙන්වා ගැනීමට රාජ්‍ය තාන්ත්‍රික සාකච්ඡා පැවැත්වෙන බවත්, විත්තිකරුවන් නොමැතිව නඩුව විභාග කිරීමට නියම කරන ලෙසත් නීතිපතිවරයා වෙනුවෙන් දැක්වූ කරුණු සැලකිල්ලට ගැනීමෙන් අනතුරුව මේ නියෝගය නිකුත් කළේය.

2016 වසරේ මාර්තු මස 31වැනි දා කළ මහ බැංකු බැඳුම්කර තෙවැනි වෙන්දේසියට එරෙහිව මේ නඩුව පවරා ඇත.

පැමිණිල්ල වෙනුවෙන් පෙනී සිටි ජ්‍යෙෂ්ඨ රජයේ නීතිඥ ලක්මිණි ගිරිහාගම මෙණෙවිය අධිකරණය හමුවේ ඉල්ලීමක් කරමින් මේ නඩුවේ තුන්වැනි විත්තිකරු වශයෙන් නම් කර සිටින අර්ජුන් මහේන්ද්‍රන් සහ නව වැනි විත්තිකරු වශයෙන් නම් කර සිටින අජහාන් ගාර්දිය පුංචිහේවා යන අය මේ වන විට අධිකරණය මග හැර විදේශගතව සිටින හෙයින් අපරාධ නඩු විධාන සංග්‍රහයේ 458 වැනි වගන්තිය යටතේ ඔවුන් නොමැතිව නඩු විභාගය පවත්වාගෙන යෑම සඳහා වන ඉල්ලීමට අදාළව සාක්ෂි මෙහෙය වීමට අවසර දෙන්නැයි ඉල්ලා සිටියාය.

රජයේ ජ්‍යෙෂ්ඨ නීතිඥවරියගේ සාක්ෂි මෙහෙයවීම මත ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ පාලකවරයා වෙනුවෙන් පෙනී සිටි බලයලත් නිලධාරි කැලුම් ප්‍රියන්ත මහතා අධිකරණය හමුවේ කරුණු දැක්වීය.

මේ නඩුවේ තුන්වැනි විත්තිකරු වශයෙන් නම් කරනු ලැබ සිටින හිටපු මහ බැංකු අධිපති අර්ජුන් මහේන්ද්‍රන් මහතා 2017 වසරේ ඔක්තෝබර් මස 13 වැනිදා අවසන් වශයෙන් ශ්‍රී ලංකාවෙන් පිටවී ගොස් තිබෙන බව හෙතෙම සාක්ෂි දෙමින් සඳහන් කළේය

සිංගප්පූරු ගුවන් සේවයට අයත් SQ 469 දරන ගුවන් යානයෙන් කටුනායක අන්තර්ජාතික ගුවන් තොටුපොළේ සිට සිංගප්පූරුව බලා පිටත්ව ගොස් තිබෙන අතර, ඉන් පසුව ඔහු මේ දක්වා ශ්‍රී ලංකාවට පැමිණ නැති බවද පැවසීය.නඩුවේ නව වැනි විත්තිකරු වශයෙන් නම් කරනු ලැබ සිටින අජහාන් ගාර්දිය පුංචිහේවා නමැත්තා බ්‍රිතාන්‍ය ගුවන් ගමන් බලපත්‍රයකින් 2018 වසරේ ජූනි මස 23 වැනිදා බණ්ඩාරනායක ගුවන් තොටුපොළේ සිට මැලේසියාව දක්වා පිටත්ව ගොස් තිබෙන බවට ආගමන විගමන දෙපාර්තමේන්තු වාර්තාවල සඳහන්ව ඇති බවද පැවසීය.

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පොලිස් සැරයන් ප්‍රියන්ත නානායක්කාර මහතා අධිකරණය හමුවේ කරුණු දක්වමින් කියා සිටියේ මේ නඩුවේ විත්තිකරුවකු වන හිටපු මහ බැංකු අධිපති අර්ජුන් මහේන්ද්‍රන් නමැත්තාට සිතාසි දීම සඳහා කොළඹ -3, මල් පාරේ පිහිටි ඔහුගේ නිවෙසට ගියද ඔහු එම නිවෙසේ නොමැති බවය.

එම නිවෙසේ සිටි නටාෂා කාංචනා අංජලී මහේන්ද්‍රන් නමැත්තිය ප්‍රකාශයක් කරමින් අර්ජුන් මහේන්ද්‍රන් තම පියා බවත් ඔහු මේ වන විට සිංගප්පූරුවේ වාසය කරන බවට ප්‍රකාශ කළ බවත් පැවසීය.

මේ හේතුවෙන් විත්තිකාර අර්ජුන් මහේන්ද්‍රන්ට අදාළ සිතාසිය භාර දීමට නොහැකි වූ බවද සඳහන් කළේය.

එමෙන්ම නඩුවේ නව වැනි විත්තිකරු වශයෙන් නම් කර සිටින අජහාන් ගාර්දිය පුංචිහේවා නමැත්තාට අදාළ සිතාසිය භාර දීම සඳහා ඔහු පදිංචිව සිටි කොළඹ, නිදහස් මාවතේ පිහිටි නිවෙසට ගිය බව පැවසූ සාක්ෂිකරු එම නිවෙසේ ඔහු නොසිටි අතර ඔහුගේ මව වන අනෝමා පුංචිහේවා නමැත්තිය එහි සිටි බවත් කිවේය. තම පුත්‍රයා මේ වන විට මැලේසියාවේ පදිංචිව සිටින බවද. මව සඳහන් කර ඇත.

මේ සාක්ෂිකරුවන් ඉදිරිපත් කළ කරුණු සලකා බැලූ ත්‍රිපුද්ගල මහාධිකරණ විනිසුරු මඬුල්ල අර්ජුන් මහේන්ද්‍රන් සහ අජාහාන් ගාර්දිය පුංචිහේවා යන විත්තිකරුවන් දෙදෙනා අධිකරණය මග හැර විදේශගතව සිටින බවට කරුණු තහවුරු වී ඇති බැවින් එම විත්තිකරුවන් දෙදෙනා නොමැතිව නඩු විභාගය පවත්වා ගෙන යෑමට පැමිණිල්ලට අවසර දුන්නේය.

විදේශගත ගාර්දි පුංචිහේවා විත්තිකරු වෙනුවෙන් තමන්ට පෙනී සිටීමට අවසර දෙන ලෙස නීතිඥ මහේෂ් සේනාරත්න මහතා එහිදී ඉල්ලා සිටියේය.

අපරාධ නඩු විධාන සංග්‍රහයේ 456 වැනි වගන්තිය යටතේ එවැනි පෙනී සිටීමක් කිරීමට නීතිඥවරයාට හැකියාවක් නොමැති බව මෙහිදී රජයේ ජ්‍යෙෂ්ඨ නීතිඥ ලක්මිණි ගිරිහාගම මෙණෙවිය විරෝධතාවක් මතු කළාය.

ඒ අනුව විත්තිකාර අජහාන් ගාර්දිය පුංචිහේවා වෙනුවෙන් නීතිඥවරයකු පෙනී සිටීමට අවසර දෙන්නේ ද? නැද්ද? යන නියෝගය ලබන මැයි මස 19 වැනිදා ප්‍රකාශයට පත් කරන බවද ත්‍රිපුද්ගල විනිසුරු මඬුල්ල නියෝග කළේය.

## තැබූ පියවර ...

රසායනික පොහොර භාවිතයෙන් ඉවත් වූ කිසිදු රටක් ලෝකයේ නොමැති වීම අරමුණට ළඟා වීමට බාධාවක් නොවන බව පෙන්වා දෙන ඒ මහතා කථා කර කර නොසිට ගොවියා දැනුම්වත් කර වගා බිමට බැස නීරෝගී පරපුරක් බිහි කිරීමට එක් වන්නැයි සියලු දෙනාගෙන් ඉල්ලීමක් කරයි. රසායනික පොහොර, කෘමිනාශක හා වල් නාශක භාවිතය හා ආනයනය තහනම් කිරීම පිළිබඳ දැනුම්වත් කිරීම සඳහා ඊයේ (29) පෙරවරුවේ ජනාධිපති කාර්යාලයේදී පැවති සාකච්ඡාවේදී ජනාධිපතිවරයා මේ බව සඳහන් කළේය. "නිරෝගිමත් සහ ඵලදායි පුරවැසියකු බිහි කිරීමට රජය විසින් වස විසෙන් තොර ආහාර වේලක් සඳහා ජනතාවට ඇති අයිතිය සහතික කළ යුතු වන අතර, ඉදිරි දශකය තුළ ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තය සඳහා මුළුමනින්ම කාබනික පොහොර යොදා ගැනීමට එම නිෂ්පාදන වේගවත් කළ යුතුය" යන්න 'සෞභාග්‍යයේ දැක්ම' ප්‍රතිපත්ති ප්‍රකාශයේ පොරොන්දුව විය. එය යථාර්ථයක් බවට පත් කිරීමේ අඩිතාලම දමමින් දේශගුණික විපර්යාසයන්ට තිරසර විසඳුම් සහිත හරිත සමාජ - ආර්ථික රටාවක් අරමුණු කර ගනිමින් විසි වැදැරුම් අමාත්‍ය මණ්ඩල සංදේශය පසුගියදා කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කළ අතර, ශ්‍රී ලංකාව රාසයනික පොහොර ආනයනය සඳහා 2019 දී ඩොලර් මිලියන 221ක් වැය කළේය. තෙල් මිල වැඩි වීම සමඟ එම වියදම ඩොලර් මිලියන 300 – 400 අතර ප්‍රමාණයකින් ඉහළ යනු ඇති අතර, රසායනික පොහොර, වල් නාශක සහ පලිබෝධ නාශක සඳහා අති විශාල වියදමක් කළද කෘෂිකාර්මික නිෂ්පාදනයෙහි ගුණාත්මක වර්ධනයක් සිදුව නැතැයි ජනාධිපතිවරයා පෙන්වා දෙයි.

පස නිසරු වී අස්වැන්න අඩුවීමත්, ජෛව විවිධත්වය විනාශ වීමත් දක්නට තිබෙන අතර, රසායනික පොහොර සහ කෘමිනාශක භාවිතය ගංගා, ඇළ දොළ ජලය දූෂණය කරන අතර ගුණාත්මක පානීය ජල සම්පාදනයට ප්‍රබල අභියෝගයක් වී ඇත. වකුගඩු, පිළිකා ඇතුළු බෝ නොවන රෝග රැසකට රජය විසින් දරන වියදම වාර්ෂිකව ඉහළ යමින් පවතී. ග්‍රාමීය ජනතාවගේ ජීවනෝපාය මාර්ග අහිමි වීම, සෞඛ්‍ය තත්ත්වය දුර්වල වීම සහ ජනතාවගේ ඵලදායිතාව අඩු වීම රට මුහුණ දෙන අභියෝගයක් බවට පත් වී ඇත.

වැඩසටහන ආරම්භයේදී ගැටලු ඇති විය හැකි අතර, එහෙත් තිරසර හරිත සමාජ ආර්ථික රටාවක් ගොඩනැඟීම පමා කළ යුතු නැත. මතු වන ගැටලුවලට නිවැරදි විසඳුම් හඳුනා ගත යුතුය. රසායනික පොහොර භාවිතය අත්හැරීමෙන් නිෂ්පාදනය අඩු වනු ඇතැයි ගොවීන් කල්පනා කිරීමට පිළිවන. එසේ වන්නේ නම් රසායනික පොහොර සහනාධාරයට වාර්ෂිකව වැය කෙරෙන රුපියල් බිලියන 50ක මුදලින් අඩු වන ආදායම ගෙවන බවට ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා සහතික වෙයි. විධිමත් පුහුණුවක්, නිසි අධ්‍යයනයක් සහිත පිරිසක් වැඩසටහන ක්‍රියාවට නැංවීමට අවශ්‍ය වන අතර රට සහ පරිසරය පිළිබඳ හැඟීම ඒ හා සමානය. වැඩසටහනට අකැමැත්තක් දක්වන හෝ වෙනස්ව හිතන පිරිසට ආරම්භයේදීම ඉවත් වීමට බාධාවක් නැති බවද ජනාධිපතිවරයා සඳහන් කළේය. අභියෝගය ජය ගැනීමට තමා පෞද්ගලිකව ගොවි ජනතාව අතරට පැමිණීමට සූදානම් යැයිද හෙතෙම පැවසීය.

දිස්ත්‍රික් මට්ටමින් කාබනික පොහොර නිෂ්පාදන දිරි ගැන්වීමට අවශ්‍ය සියලු පහසුකම් නිෂ්පාදකයන්ට සැපයීමට රජය සෘජුව මැදිහත් වන බවද ජනාධිපතිවරයා සඳහන් කළේය. කෘෂි ක්ෂේත්‍රයේ නිරත බොහෝ පිරිසකට සංවේදී විෂයයක් බැවින් විරෝධතා පැමිණිය හැකිය. ආගමික නායකයන්, ගොවි සංවිධාන, වෘත්තිකයන්, පර්යේෂකයන්, රාජ්‍ය නිලධාරීන්, මාධ්‍ය සහාය සහ සියලු පාර්ශ්ව එක්වීමෙන් අරමුණට පහසුවෙන් ළඟා විය හැකි බව මේ අවස්ථාවට එක් වූ දරිද්‍රතාව තුරන් කිරීම සහ ආර්ථික පුනර්ජීවනය පිළිබඳ ජනාධිපති කාර්යසාධක බළකායේ ප්‍රධානි බැසිල් රාජපක්ෂ මහතා සඳහන් කළේය. ගොවියාට පහසු වන ආකාරයෙන් කාබනික පොහොර වෙළෙඳපොළ සුලබ කිරීමේ අවශ්‍යතාව ද බැසිල් රාජපක්ෂ මහතා පෙන්වා දුන්නේය.

## ආබාධිත - මියගිය ...

මේ යටතේ එම රණවිරුවන්ගේ පවුල්වල සාමාජිකයන්ට මහගු සේවාවක් සැලසිය හැකි බවද ආරක්ෂක ලේකම්වරයා පෙන්වා දුන්නේය.

ආරක්ෂක අමාත්‍යාංශයේ ඊයේ (29) උදෑසන පැවති ප්‍රවෘත්ති සාකච්ඡාවට සහභාගි වෙමින් අදහස් දැක්වූ ජෙනරාල් කමල් ගුණරත්න මහතා එහිදී මෙසේද කීවේය.

ආබාධිත රණවිරුවන් මෙන්ම ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් මේ සම්බන්ධව දිගින් දිගටම ඉල්ලීම් කළා. ඔවුන්ට මේ අවස්ථාව දීමට අපට හැකිවීම ලොකු සතුටක්. වයස අවු. 55 සම්පූර්ණවීමට පෙර හිමිගන්වනු ලබන දීමනාවන් රණවිරුවා හට වයස අවුරුදු 55 සම්පූර්ණ වූ පසුවද අඩුවීමකින් තොරව යැපෙන්නන්ගේ ජීවිතාන්තය දක්වාම නොවෙනස්ව හිමිගැන්වීමට ජනාධිපතිවරයාගේ උපදෙස් හා මගපෙන්වීම යටතේ ධනාත්මකව සලකා බැලීම සඳහා නිර්දේශයන් මේ වන විටත් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර තිබෙනවා.

මේ සම්බන්ධව ආරක්ෂක කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් ශ්‍රී ජයවර්ධනපුර පාර්ලිමේන්තු සංකීර්ණයේදී ඉකුත් 28 වැනිදා රැස්වූ අතර, එහිදී ආබාධිත සහ මිය ගිය රණවිරු පවුල්වලට ගෙවන වැටුප් සහ දීමනා පිළිබඳ විශේෂයෙන් සාකච්ඡා කළා. ආබාධිත රණවිරුවන්ට දිවි ඇති තෙක් ගෙවනු ලබන වැටුප් සහ දීමනා ඔවුන් මිය ගිය පසු ඔවුන්ගෙන් යැපෙන්නන්ටත් දිවි ඇති තෙක් ගෙවීම පිණිස අනුමැතිය ගැනීමට සකස් කළ කැබිනට් පත්‍රිකාව මේ වන විටත් ඇමැති මණ්ඩලයට යොමු කර ඇති බව එහිදී ජනාධිපතිවරයා විසින් පවසා සිටියා.

ඒ අනුව මිය ගිය රණවිරුවන්ගෙන් යැපෙන්නන්ටත් එකී වැටුප් සහ දීමනා ජීවිතාන්තය දක්වා ගැනීමටද මින් අවස්ථාව සැලසේ. තවද රණවිරු පවුල්වල ඉල්ලීම ඉටු කරන බව සඳහන් කළ එතුමා ඒ සඳහා උද්ඝෝෂණ කිරීමේ අවශ්‍යතාවක් නැති බවත්, උද්ඝෝෂණ පිටුපස ඇත්තේ වෙනත් අරමුණක් බවත් වැඩි දුරටත් පෙන්වා දෙන ලදි.

සටනේදී මිය ගිය සහ ආබාධිත වූ ත්‍රිවිධ හමුදා, පොලිස් සහ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ රණවිරුවන් සහ ඔවුන්ගේ යැපෙන්නන්ගේ සුභ සාධනය සඳහා ඉහළම ප්‍රමුඛතාවක් දෙමින් ජනාධිපතිවරයා ඇතුළු ආරක්ෂක ලේකම් සහ ත්‍රිවිධ හමුදාපතිවරු කටයුතු කරනු ලැබේ. තවද 2021 අප්‍රේල් මස 7වැනිදා ආරක්ෂක අමාත්‍යාංශයේ මහජන දිනයේදී එම රණවිරු බිරියන් හමු වී සාකච්ඡා කරනු ලැබිණි..

## අඩු ආදායම්ලාභීන්ට ගෙයක්...

මේ ඉදි කෙරෙන මහල් නිවාස සංකීර්ණය මහල් 15කින් යුක්තයි. එහි නව නිවෙස් 700 කින් සමන්විත වන අතර, ඒ සඳහා නාගරික සංවර්ධන අධිකාරිය සතු අක්කර 2ක ප්‍රමාණයක ඉඩමක් යොදා ගැනේ.

ඉදි කෙරෙන මේ නව නිවෙස් වතු පවුල් 700ක් සඳහා නොමිලේ දෙයි. එක් නිවෙසක් වර්ග අඩි 500කින් යුක්තයි. භූමියේ වටිනාකම හැර එක් නිවෙසක් ඉදි කිරීම සඳහා රුපියල් මිලියන 5.6ක් රජය වැය කර තිබේ. ඉදි කෙරෙන සැම නිවෙසක්ම විසිත්ත කාමරයකින්, නිදන කාමර 2කින්, මුළුතැන්ගෙයකින්, නාන කාමරයකින් සහ සඳළු තලයකින් සමන්විතයි. මහල් 15ක නිවාස සංකීර්ණයේ නිවැසියන් සඳහා විදුලි සෝපාන පහසුකම්ද සපයා තිබේ. තවද වාහන නැවැත්වීමේ පහසුකම් ඇතුළු තවත් පහසුකම් රැසක් මේ නිවාස ව්‍යාපෘතියට එක්කොට ඇති බව නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ ලේකම් සිරිනිමල් පෙරේරා මහතා ප්‍රකාශ කරයි.

නිවැසියන්ගේ එදිනෙදා අත්‍යවශ්‍ය පාරිභෝගික ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා එක් මහලකට එක් වෙළෙඳසලක් බැගින් මහල් 15ට වෙළෙඳ සල් 15ක් ඉදි කිරීමටද නියමිතය.

Design and construction of housing unit යන ව්‍යාපෘති නාමය යටතේ ඉදි කෙරෙන මේ නිවාස සංකීර්ණයේ කොන්ත්‍රාත්කරුවන් ලෙස තුඩාවේ සහෝදරයෝ පෞද්ගලික සමාගම ක්‍රියා කරයි. මේ නිවාස සංකීර්ණය ඉදි කිරීමට රුපියල් බිලියන 4ක මුදලක් වැය වෙතැයි ඇස්තමේන්තුගත කර ඇත.

Asian and infrastructure investment bank (AIIB) මෙහි මූල්‍ය ප්‍රතිපාදන සපයන අතර, නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය හා නාගරික සංවර්ධන, වෙරළ සංරක්ෂණ, අපද්‍රව්‍ය බැහැරලීම් හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය මේ ව්‍යාපෘතිය දියත් කරයි.

නිවාස 5,000ක් ඉදි කිරීමේ 'සෞභාග්‍යයේ දැක්ම' ප්‍රතිපත්ති ප්‍රකාශය යටතේ ඉදි කෙරෙන මේ නිවාස 700ත් සමගම නිවාස 4,024ක් ඉදිකිරීමේ කටයුතු ආරම්භ කර තිබේ.

ඒ යටතේ මේ වන විට ඇපල්වත්තේ නිවාස 700ක්, කොළඹගේ මාවතේ නිවාස 624ක්, ස්ටේඩියම්ගම නිවාස 1,000ක්, ඔබේසේකරපුර නිවාස 300ක්, ෆර්ගියුසන් පාර නිවාස 750ක් සහ තොටළඟ නිවාස 700ක් සඳහා රජය මේ වන විට රුපියල් බිලියන 18ක් වැය කර තිබේ. මේ අනුව අඩු ආදායම්ලාභීන් සඳහා ක්‍රියාත්මක කරන නිවාස ව්‍යාපෘති 9න් මේ වන විට නිවාස ව්‍යාපෘති 6ක වැඩ කටයුතු රජයේ මෙහෙයවීමෙන් නිම වෙමින් පවතී.

# එන ඡන්දයෙදිත් උතුරේ මහ ඇමැති අපේක්ෂකයා මමයි

## මාවෙයි සේනාධිරාජා

**උතුරු පළාත් විශේෂ රසුල දිල්හාර ගමගේ**

මීළඟ පළාත් සභා මැතිවරණයේදී උතුරේ මහ ඇමැති ධුර අපේක්ෂකයා තමා මිස වෙනත් අයකු නොවන බව දෙමළ ජාතික සන්ධානයේ මාවෙයි සේනාධිරාජා හිටපු මන්ත්‍රීවරයා ඊයේ (29)දා පැවසීය.

යාපනයේ මාටින් පාරේ පිහිටි ඉලංකෙයි තමිල් අරුසු කච්චි පක්ෂ කාර්යාලයේ පැවති මාධ්‍ය හමුවකදී ඔහු මේ බව කියා සිටියේය.

"උතුරේ මහ ඇමැති ධුරයට එක් එක් අය පත් කරවන්න බොහෝ දෙනකුට වුවමනාවක් තියනවා. මේ වුවමනාව තියෙන්නේ කොළඹ ඉදලා යාපනයට ඇවිත් මෙහෙ දේශපාලනය කරන පිරිසකට මිසක් උතුරේම ජීවත් වෙන අයට නම් නෙමෙයි.විග්නේශ්වරන් මන්ත්‍රීවරයා මේ දවස්වල වේලන් සාමිවරයා මේ තනතුරට සුදුසුයි කියලා ඔහුව තෝරගෙන වෙනම ගමනක් යනවා. වේලන් සාමිවරයත් ඒකට කැමැත්ත පළ කරලා තියනවා. නමුත් උතුරේ මහ ඇමැති ධුරයට පත් වෙන්න ඕනේ සිල් රකින කෙනෙක් නෙමෙයි. ඒකට හේතුව ඉතා බරපතළ තීන්දු තීරණ ගන්න සිද්ධ වෙනවා.

පාරවල්වල ලඟින්න උද්ඝෝෂණ කරන්න පොලිස් අත්අඩංගුවේ ඉන්න මේ හැම දේකටම මුහුණ දෙන්න පුළුවන් කෙනෙක් වෙන්න ඕනේ. ඒත් ඒක එයාලගේ කැමැත්ත නේ.දෙමළ ජාතික සන්ධානය දැනටමත් තීරණය කරලා තියෙන්නේ මාව ඉදිරි පළාත් සභා මැතිවරණයේදී මහ ඇමැති අපේක්ෂකය කරන්නයි.මේක මට පසු ගිය වතාවෙයි පක්ෂයෙන් ලැබුණේ. ඒත් විග්නේශ්වරන් මන්ත්‍රීවරයාට මහ ඇමැති වෙන්න අවස්ථාවක් දෙන්නයි මම නිහඬ වුණේ. අවසානයෙදි වෙච්ච දෙයක් නෑ.

උතුරේ ඉපදුණු උතුරේ ජනතාවත් එක්ක එදා ඉදලා දේශපාලනය කළ මට උතුරේ ජනතාවගෙන් විශාල සහයෝගයක් තිබෙනවා. ඒක නිසා ඒ අවස්ථාව මම මඟ හරින්නේ නෑ,

# මනිලාල් 6 වැනිදා කෝප් කමිටුව හමුවට කැඳවයි

**ස්වර්ණා විජේකෝන්**

රුපියල් හය කෝටියකට අධික මුදලක් වංචා කර ඇතැයි කියන සිද්ධියක් සම්බන්ධයෙන් විමර්ශනය කිරීම සඳහා ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනයේ හිටපු සභාපති මනිලාල් ප්‍රනාන්දු මහතා පොදු ව්‍යාපාර පිළිබඳ පාර්ලිමේන්තු කාරක සභාව හමුවට (කෝප්) ලබන හය වැනිදා කැඳවා ඇත.

ඉතාලි පාපන්දු ක්‍රීඩකයන්ගේ සංගමය පරිත්‍යාග කළ රුපියල් ලක්ෂ 60ක මුදලක් හිටපු සභාපතිවරයා සිය පෞද්ගලික ගිණුමකට බැර කර ගෙන ඇති බවටත් පරිත්‍යාග ලෙස ලැබුණු තවත් රුපියල් පන් කෝටියකට වැඩි මුදලක් අවභාවිත කර ඇති බවටත් විගණන වාර්තා මගින් තොරතුරු හෙළි වී ඇත.

ඒ අනුව අදාළ දූෂණ හා වංචා සම්බන්ධයෙන් මනිලාල් ප්‍රනාන්දු මහතාගෙන් දීර්ඝ වශයෙන් කරුණු විමසීම සඳහා පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව හෙවත් කෝප් කමිටුව වෙත කැඳවා තිබේ.

එමෙන්ම ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනයේ වර්තමාන ප්‍රධානින්ද පොදු ව්‍යාපාර පිළිබඳ පාර්ලිමේන්තු කාරක සභාවට ලබන හයවැනිදා කැඳවීමට නියමිත වේ.

# ශානිගේ ඇප පෙත්සම මැයි 13 දා විභාගයට

**නෙල්කා මැදගෙදර**

හිටපු නියෝජ්‍ය පොලිස්පති වාස් ගුණවර්ධන මහතා ඇතුළු විත්තිකරුවන්ට එරෙහි නඩුවකට අදාළව බොරු සාක්ෂි සෑදූ බවට සැක පිට අත්අඩංගුවට ගෙන රක්ෂිත බන්ධනාගාරගත කර සිටින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ හිටපු අධ්‍යක්ෂ ශානි අබේසේකර මහතා ඇප මත මුදා හරින ලෙස ඉල්ලා ගොනු කර ඇති ප්‍රතිශෝධන පෙත්සම ලබන මැයි මස 13 වැනිදා විභාගයට ගැනීමට අභියාචනාධිකරණය ඊයේ (29) තීරණය කළේය.

එසේම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ හිටපු උප පොලිස් පරීක්ෂක සුගත් මෙන්ඩිස් මහතා ගොනු කළ ප්‍රතිශෝධන පෙත්සමද එදින සලකා බැලීමට නියම විය.

පෙත්සම් සම්බන්ධ විරෝධතා මැයි මස 4වැනිදා හෝ ඊට පෙර ගොනු කරන ලෙස නියම කෙරිණ. එම ප්‍රතිශෝධන පෙත්සම් කැඳවූ අවස්ථාවේදී නිශ්ශංක බන්දුල කරුණාරත්න සහ ආර්. ගුරුසින්හ යන අභියාචනාධිකරණ විනිසුරු මඬුල්ල විසින් මේ නියෝගයන් කරන ලදි.

පෙත්සම් කැඳවූ අවස්ථාවේදී ශානි අබේසේකර මහතා වෙනුවෙන් පෙනී සිටි නීතිඥ විරාන් කොරයා මහතා සඳහන් කළේ මේ වන විට සිය සේවා දායකයා දිගින් දිගටම බන්ධනාගාරගත කර සිටින බවය. රෝගාබාධ කිහිපයකින්ම පෙළෙන ඔහුගේ සෞඛ්‍ය තත්ත්වය අයහපත් බවද නීතිඥවරයා සඳහන් කළේය.

සෞඛ්‍ය හේතු මත ශානි අබේසේකර මහතාගේ ජීවිතය තර්ජනයකට ලක්ව ඇති බවද ඒ මහතා කීය.

එබැවින් තව දුරටත් කල් දැමීමකින් තොරව පෙත්සම විභාගයට ගන්නා ලෙස ඔහු අධිකරණයෙන් ඉල්ලා සිටියේය.

ඒ අනුව පෙත්සම් ලබන මැයි මස 13 වැනිදා කැඳවීමට නියම කෙරිණ.

හිටපු නියෝජ්‍ය පොලිස්පති වාස් ගුණවර්ධන මහතා ඇතුළු විත්තිකරුවන් පිරිසකට එරෙහිව ගොනු කර තිබූ නඩුවකට අදාළව අසත්‍ය සාක්ෂි නිර්මාණය කළේ යැයි කියන සිද්ධියක් සම්බන්ධයෙන් සැකපිට ශානි අබේසේකර සහ සුගත් මෙන්ඩිස් යන මහත්වරුන් අත්අඩංගුවට ගැනීමෙන් පසු ගම්පහ මහේස්ත්‍රාත් අධිකරණය මඟින් රක්ෂිත බන්ධනාගාරගත කර තිබිණි.

තමන්ව ඇප මත මුදා හරින මෙන් ඉල්ලා එම සැකකරුවන් විසින් ගම්පහ මහාධිකරණය වෙත ප්‍රතිශෝධන පෙත්සමක් ඉදිරිපත් කර තිබිණි.

# බැංකුවල වැඩ අද වරුවයි

අද (30) දිනය සඳහා දින අර්ධයක විශේෂ බැංකු නිවාඩුවක් ලැබෙන බව ශ්‍රී ලංකා මහ බැංකුව ප්‍රකාශයට පත් කර තිබේ. ලෝක කම්කරු දිනය යෙදෙන මැයි 1 දින, සෙනසුරාදා දිනයකට යෙදීම හේතුවෙන් අද දිනයේදී සියලු බැංකු සඳහා එම දින අඩක විශේෂ නිවාඩුව නම් කර ඇත.

# මරණ දැන්වීම්

**කුසුම් කාන්ති අක්මීමන මහත්මිය** - (විවාහයට පෙර ද සිල්වා) - නැසීගිය මංගලසේන ද සිල්වා මහතාගේ සහ ලීලා චන්ද්‍රා ජයසිංහ මහත්මියගේ දියණිය වූද, නැසීගිය අතුල අක්මීමන මහතාගේ භාර්යාව වූද, අවිශ්කා අක්මීමන (ගුවන් හමුදාව) ගේ මෑණියන් වූද, චන්ද්‍රා කීගල් සෝමරත්න, සුනිල් සේනාරත්න, ලක්ෂ්මි, ගවේෂ්, අශාන් (කැලිෆෝනියාව ඇමරිකාව) අශෝකා, ගාමිණී, විජිත, ශ්‍රියානි, උපාලි, චන්ද්‍රිකා යන අයගේ සොහොයුරිය වූද, කුසුම් කාන්ති අක්මීමන මහත්මිය අභාවප්‍රාප්ත වූවාය. අවමංගල කටයුතු ජයරත්න මල්ශාලාව කනත්ත සුසාන භූමිය, බොරැල්ලහිදී **2021/04/30 වන දින සවස 5.00 ට සිදු කෙරේ.** 032277

# කොවිඩ් අභියෝග හමුවේ පවා 2020 දී රුපියල් කෝටි 1,500ක බදු ගෙවීමට පෙර ලාභයක් වාර්තා කිරීමට අපට හැකි වුණා

## ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ සභාපතිනි කේෂලා ජයවර්ධන

**ජයසිරි මුණසිංහ**

කොවිඩ්-19 වසංගතය හමුවේ පවා පසුගිය වසරේ දී තම බැංකුව රුපියල් බිලියන 15ක බදු ගෙවීමට පෙර ලාභයක් වාර්තා කොට ඇතැයි ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ සභාපතිනි කේෂලා ජයවර්ධන මහත්මිය ප්‍රකාශ කළාය.

මීට වසර හතළිස් නවයකට ප්‍රථම ඇරඹි ජාතික ඉතිරි කිරීමේ බැංකුව මෙසා විශාල බදු පෙර ලාභයක් වාර්තා කළේ ඉකුත් වසරේදී බව අවධාරණය කළ සභාපතිනිය බදු ගෙවීමෙන් පසු එහි ලාභය රුපියල් බිලියන 10.5ක් වූ බව ද සඳහන් කළාය.

2019 පැවැති ජනාධිපතිවරණය ජය ගත් රටට දායාද වූ ශ්‍රේෂ්ඨ නායක ගෝඨාභය රාජපක්ෂ මහතාගේ සෞභාග්‍යයේ දැක්ම සර්වප්‍රකාරයෙන්ම සාර්ථක කර ගැනීමට මහත් පිටුබලයක් සැපයීම බැංකුවේ අරමුණ බව කී සභාපතිනිය ජනාධිපතිවරයා දුන් මඟ පෙන්වීම සහ උපදෙස් අනුව යමින් තම බැංකුව මේ වන විට සාර්ථක ගනුදෙනුකාර සේවාවක් පවත්වාගෙන යමින් රටේ පොදු ජනතාවගේ සමාජ සත්කාරක සේවාවලටද එක්වෙමින් ප්‍රශංසනීය සේවාවක් ඉටු කරමින් සිටින බවද සභාපතිනිය සිහිපත් කළාය.

කොළඹ, කොල්ලුපිටිය පිහිටි ජාතික ඉතිරි කිරීමේ බැංකු මූලස්ථානයේ ඊයේ (29) දහවල් පැවැති විශේෂ හමුවකට එක්වෙමින් සභාපතිනිය මේ බව කීවාය.

වසර 2019 ට සාපේක්ෂව 2020 දී ඉහළ මූල්‍ය ප්‍රගතියක් අත්කරගත් බැංකුව ලාභාංශ වශයෙන් රුපියල් බිලියන 1 ½ ක මුදලක් මහා භාණ්ඩාගාරයට ලබාදීමට පියවර ගත් බව ද සභාපතිනිය සඳහන් කළාය. මෙහිදී විශේෂයෙන් කොවිඩ් තත්ත්වය හමුවේ පවා වඩාත් මහජන මිත්‍රශීලී කාර්යක්ෂම බැංකු සේවාවක් පවත්වා ගැනීමට බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය, ඉහළ කළමනාකාරිත්වය සහ සමස්ත සේවක පිරිස සිදු කළා වූ මෙහෙවර ද සභාපතිනිය මෙහිදී අගය කළාය.

ඉතිරි කිරීමේ පුරුද්ද ජාතියට හුරු කළ බැංකුවක් ලෙස කටයුතු කරන තම බැංකුවට වසර 2020 දී රුපියල් බිලියන 64 ක මුදලක් තැන්පතු ලෙස ඉතුරු කරගැනීමට හැකි වූ බව ද කේෂලා ජයවර්ධන මහත්මිය පැවසුවාය. තැන්පතු ප්‍රතිශතය 22% දක්වා ඉහළ නංවා ගැනීමට ද හැකියාව ලැබී ඇත. මෙහිදී බැංකුවේ මිලියන 20ක් තරම් වන ගනුදෙනුකරුවන්ගේ දායකත්වය තමා බෙහෙවින් අගය කරන බව ද සභාපතිනිය කීවාය.



ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ සභාපතිනි කේෂලා ජයවර්ධන මහත්මිය

කොවිඩ්-19 ගෝලීය වසංගත තත්ත්වය හමුවේ ව්‍යාපාර, කර්මාන්ත, සේවා ඇතුළු සෑම අංශයකම සිදු වූ බිඳවැටීම් සමනය කර ගනිමින් ඉදිරියට යෑමට ජනාධිපතිවරයාගේ උපදෙස් මත රජය ක්‍රියාත්මක කළ මූල්‍ය සහන සියල්ල ගනුදෙනුකරුවන්ට ලබාදීමට ජාතික ඉතිරි කිරීමේ බැංකුව කටයුතු කර ඇත. ඒ අනුව ජාතික ණය තොරතුරු කාර්යාංශයේ නම සඳහන් වුවද ඒ පිළිබඳව දැඩි සොයා බැලීමකින් තොරව දිරිමත් ව්‍යවසායකයන්ට අලුතින් ණය ලබාදීමට බැංකුව පියවර ගත් බව කී සභාපතිනිය එහි ප්‍රතිඵලයක් ලෙස විශාල ව්‍යවසායක ප්‍රජාවක් බැංකුවේ සේවාවන් ලබාගත් බව සිහිපත් කළාය. ජනාධිපතිවරයාගේ මඟපෙන්වීම මත 09% ත් 04% ත් අතර අඩු පොළී අනුපාත යටතේ ව්‍යාපාරික ණය ලබාගැනීමට හැකිවීම නිසා ගනුදෙනුකරුවෝ බොහෝ පිරිසක් බැංකුවෙන් ප්‍රතිලාභ හිමිකරගත් බව ද ඇය කීවාය.

බැංකුවේ මූල්‍ය සහ බැංකු සේවාවන්ට අමතරව සමාජ සත්කාරක සේවා පැවැත්වීමේ අරමුණින් වන වගාව ඉහළ නැංවීමට රුක් රෝපණ වැඩසටහන්වලට දායකවීම, එළවළු සහ පලතුරු පැළ නොමිලේ ලබා දෙමින් ග්‍රාමීය ජනතාවගේ එදිනෙදා ආහාර සඳහා අස්වැන්න ලබාගැනීමට ඉඩකඩ සලසා දීම, දිළිඳු පවුල් සඳහා විදුලි බලය ලබාගැනීමට උදව් කිරීම, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියාමනය කරනු ලබන ක්ෂුද්‍ර මූල්‍ය ආයතන සඳහා ණය තොග ලබාදීම සිදු කළ බව ද සභාපතිනිය කීවාය.

ඊට අමතරව තම බැංකුව අනුබද්ධිත ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුව හරහා කුරහන්, තල,බඩඉරිඟු, ඉස්සන්,රූපලාවණ්‍ය, පෙරපාසල් සහ ආර්ථිකයේ දියුණුවට දායක වන තෝරාගත් අංශ රාශියකට සහ එහි යෙදෙන්නන්ට මූල්‍යාධාර ලබාදීමට පසුගිය වසරේදී සිදු කළ බව සභාපතිනිය පෙන්වා දුන්නාය.

# වාහන ගෙන්වීම නතර කිරීමෙන් ලක්ෂ හතරක පමණ පිරිසක් ආදායම් මාර්ග අහිමිව අසරණ වෙලා

## මෝටර් රථ ආනයනකරුවන්ගේ සංගමයේ ලේකම්

**ශිරාන් රණසිංහ**

කොරෝනා වයිරසය පැතිරයෑමත් සමඟ ඉකුත් වසරේ මාර්තු සිට වාහන ආනයනය නතර කිරීම නිසා පාවිච්චි කළ වාහනවල මිල ගණන් සියයට තිහක් - හතළිහත් අතර ප්‍රමාණයකින් ඉහළ ගොස් ඇතැයි මෝටර් රථ ආනයනකරුවන්ගේ සංගමයේ ලේකම් ප්‍රසාද් කුලතුංග මහතා දිනමිණට පැවසීය.

2020 වසරේ මාර්තු මස සිට කොරෝනා වයිරසය මෙරට පැතිරයාමෙන් පසුව මෝටර් රථ ආනයනය තාවකාලිකව නතර කර දැමීමට රජය තීරණය කළේය.

සාමාන්‍යයෙන් මෝටර් රථ හැටදහසක් පමණ වසරකට මෙරටට ආනයනය කරන අතර ඉකුත් මාස දහතුනක කාලයේ මෝටර් රථ ගෙන්වීම සම්පූර්ණයෙන්ම නතර වී ඇතැයි ද කුලතුංග මහතා කීය.

මේ වයිරස කාලසීමාවේදී රුපියල අවප්‍රමාණය වීම නතර කර දැමීම සඳහා යැයි කියමින් මෝටර් රථ ආනයනය නතර කළත් ඉකුත් මාර්තු මස රුපියල් 180ට පමණ තිබූ ඩොලරයේ අගය මේ වන විට රුපියල් 200 ඉක්මවා ගොස් ඇතැයි ද ඒ මහතා කීය.

මෝටර් රථ ආනයනය නතර කිරීම නිසා ඉන් යැපුණු ලක්ෂ හතරක පමණ පිරිසක් ආදායම් අහිමිව අසරණව සිටින බවද හෙතෙම සඳහන් කළේය. කෙසේ වෙතත් පාවිච්චි කළ පැරණි වාහන මිල අසාධාරණ ලෙස ඉහළ යෑම සැලකිල්ලට ගෙන රජයට වැඩි බදු ආදායමක් ලැබෙන පරිදි රටට අවශ්‍ය වාහන යම් ප්‍රමාණයක් ගෙන්වීමට ඉඩ දෙන ලෙස වාහන ආනයනකරුවන්ගේ සංගමය ඉල්ලා සිටී.

# තෙල් සංස්ථා සේවක ණය සකසුරුවම් සමිතිය විශ්‍රාමිකයන්ට පාරිතෝෂික මුදල් ගෙවීම මාස දෙකකින් ප්‍රමාද කරලා

## විශ්‍රාමිකයෝ පාලනාධිකාරියට පැමිණිලි කරති

**ශිරාන් රණසිංහ**

විශ්‍රාම යන ලංකා ඛනිජ තෙල් සංස්ථා සේවකයන් වෙනුවෙන් ක්‍රියාත්මක සකසුරුවම් සමිතිය මගින් විශ්‍රාමිකයන්ට දිය යුතු පාරිතෝෂික මුදල් ගෙවීම් මාස දෙකක් තිස්සේ පමා කර ඇතැයි විශ්‍රාමික සේවකයන් පාලනාධිකාරියට පැමිණිලි කර ඇත.

මේ තෙල් සංස්ථා සේවක සකසුරුවම් සමිතිය සතුව රුපියල් කෝටි දෙසිය පනහක පමණ ස්ථාවර තැන්පත් මුදලක් රාජ්‍ය බැංකු දෙකක තැන්පත් කර ඇතැයි ද ඔවුහු පවසති. නමුත් ඉකුත් වසරේ සිටම විශ්‍රාම ගිය සේවකයන් දෙසිය දෙනකුට පමණ අදාළ පාරිතෝෂික මුදල් ගෙවීම පැහැර හැර ඇත.

සේවකයකුගේ මාසික වැටුපෙන් සියයට 1.5ක මුදලක්ද, ආයතනයෙන් සියයට 1.5ක මුදලක් ලෙස මේ අරමුදලට මුදල් අය කර ගනී.

2020 වසරේ විශ්‍රාම ගිය සේවකයන්ට ලබන මැයි මස මුල් සති දෙක තුළ ඔවුනට හිමි මුදල් ලබාදීමට නියමිත යැයි මේ සම්බන්ධයෙන් දිනමිණ කළ විමසීමේදී ලංකා ඛනිජ තෙල් සංස්ථා ණය සකසුරුවම් සමිතියේ ලේකම් ලයනල් ගුණසේකර මහතා කීය.

# චීන-ශ්‍රී ලංකා ද්විපාර්ශ්වික සබඳතා තවදුරටත් ප්‍රවර්ධනය කිරීමට බලාපොරොත්තු වෙනවා

## චීන ආරක්ෂක ඇමැති ජෙනරල් වෙයි ෆෙන්ග්හි කියයි



**රක්ෂණ ශ්‍රියන්ත**

චීනය සහ ශ්‍රී ලංකාව අතර සහයෝගීතාව ඉහළ නැංවීම සහ ද්විපාර්ශ්වික සබඳතා තවදුරටත් ප්‍රවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකාව සමඟ එක්ව කටයුතු කිරීමට බලාපොරොත්තු වන බව චීන රාජ්‍ය මන්ත්‍රී සහ ආරක්ෂක අමාත්‍ය ජෙනරල් වෙයි ෆෙන්ග්හි මහතා පවසයි.

චීන රාජ්‍ය මන්ත්‍රී සහ ආරක්ෂක ඇමැති ජෙනරල් වෙයි ෆෙන්ග්හි මහතාගේ නිල ශ්‍රී ලංකා සංචාරයට සමගාමීව ශ්‍රී ලංකාව සහ මහජන චීන සමූහාණ්ඩුව අතර ද්විපාර්ශ්වික සාකච්ඡාවක් පෙරේදා (28) කොළඹ ෂැන්ග්‍රිලා හෝටලයේදී පැවැත්විණි. එහිදී ඒ මහතා මේ බව ප්‍රකාශ කළේය.

එහිදී ආරක්ෂක ලේකම් ජෙනරල් කමල් ගුණරත්නගේ මහතාගේ ප්‍රධානත්වයෙන් යුත් ශ්‍රී ලංකා නියෝජිත පිරිස ජෙනරල් ෆෙන්ග්හි මහතාගේ ප්‍රධානත්වයෙන් යුත් චීන නියෝජිත පිරිස සමඟ සාකච්ඡාවක නිරත වූහ.

කොළඹ චීන තානාපති ක්වි ෂෙන්හොන්ග් මහතා සහ ශ්‍රී ලංකාවේ විදේශ අමාත්‍යාංශ ලේකම් අද්මිරාල් මහාචාර්ය ජයනාත් කොළඹගේ මහතා සහ ත්‍රිවිධ හමුදාපතිවරු ද අදාළ පාර්ශ්ව නියෝජනය කරමින් මේ අවස්ථාවට සහභාගි වූහ.

දීර්ඝ කාලයක් තිස්සේ දෙරට අතර පැවති ද්විපාර්ශ්වික සබඳතා පිළිබඳ සිහිපත් කරමින් ජෙනරල් ගුණරත්න මහතා කියා සිටියේ බුද්ධාගම, වෙළෙඳාම, යටිතල පහසුකම් සංවර්ධනය සහ ගෝලීය සම්බන්ධතාව ඇතුළු විවිධ ක්ෂේත්‍ර රැසක් ඔස්සේ චීනය ශ්‍රී ලංකාවේ සගයකු වූ බවයි.

එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේදී ශ්‍රී ලංකාවට එරෙහිව මෑතකදී සභාගත කළ යෝජනාවේදී චීන රජය විසින් ශ්‍රී ලංකාවට දුන් සහයෝගය පිළිබඳව ආරක්ෂක ලේකම් මෙහිදී අගය කළේය.

දෙරට අතර සහයෝගීතාව ඉහළ නැංවීම සහ ද්විපාර්ශ්වික සබඳතා තවදුරටත් ප්‍රවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකාව සමඟ එක්ව කටයුතු කිරීමට බලාපොරොත්තු වන බව ජෙනරල් ෆෙන්ග්හි පැවසීය.

ආරක්ෂක ලේකම් සහ ශ්‍රී ලංකා රේගු අධ්‍යක්ෂ ජෙනරාල් හා චීන ජාතික ආරක්ෂක විශ්ව විද්‍යාලයේ ආදි ශිෂ්‍ය සංගමයේ ශ්‍රී ලංකාවේ සභාපති මෙන්ම ආරම්භක සාමාජික මේජර් ජෙනරල් (විශ්‍රාමික) විජිත රවිප්‍රියගේ මහතාගේ ආරාධනයෙන් ජෙනරල් ෆෙන්ග්හි මහතා ශ්‍රී ලංකාවේ චීන ජාතික ආරක්ෂක විශ්වවිද්‍යාලයේ ආදි ශිෂ්‍ය සංගමයේ නිල වෙබ් අඩවිය ක්‍රියාත්මක කළේය.

ඉහළ පෙළේ චීන ආරක්ෂක නියෝජිතයන්ගේ මේ නිල සංචාරයේදී දෙරට අතර හමුදාමය සහයෝගිතා පිළිවෙත (Military Assistance Protocol) නිල වශයෙන් අත්සන් කිරීමද සිදු විය.

ශ්‍රී ලංකා ආරක්ෂක ලේකම්, ත්‍රිවිධ හමුදාපතිවරු සහ චීන නියෝජිත ප්‍රධානී ජෙනරල් ෆෙන්ග්හි අතර සංකේතාත්මකව සමරු තිළිණ හුවමාරු කර ගැනීමද මෙහිදී සිදුවිය.

මහජන චීන සමූහාණ්ඩු ඒකාබද්ධ මාණ්ඩලික දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය ප්‍රධානී ලුතිනන් ජෙනරල් ෂාවෝ යුවාන්මින්ග්, මධ්‍යම හමුදා කොමිෂන් සභාවේ ජාත්‍යන්තර හමුදා සහයෝගීතාව පිළිබඳ අධ්‍යක්ෂ ජෙනරාල් මේජර් ජෙනරල් සී ගුඕවෙයි, මධ්‍යම හමුදා කොමිෂන් සභා ප්‍රධාන කාර්යාලයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජෙනරාල් මේජර් ජෙනරල් ෂෙන් ෆැන්ග්වු, මහජන චීන සමූහාණ්ඩු දකුණු විධානයේ සහකාර මාණ්ඩලික ප්‍රධානී මේජර් ජෙනරල් හූ සියන්ජුන් සහ චීන තානාපති කාර්යාලයේ ආරක්ෂක උපදේශක ජ්‍යෙෂ්ඨ කර්නල් වැන් ඩොන්ග් මේ අවස්ථාවට සහභාගි වූහ.

# සාගර සම්පත් ආරක්ෂා කර ගැනීමට දැනට තිබෙන නීතිරීති යාවත්කාලීන කළ යුතුයි

## රාජ්‍ය ඇමැති, ආචාර්ය නාලක ගොඩහේවා

**චන්දිමා කරුණාරත්න**

සාගර සම්පත් ආරක්ෂා කර ගැනීමට පවතින නීතිරීති යාවත්කාලීන කළ යුතු බව නාගරික සංවර්ධන, වෙරළ සංරක්ෂණ, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය ඇමැති ආචාර්ය නාලක ගොඩහේවා මහතා පැවසීය.



ජනතාව දැනුවත්ව හෝ නොදැනුවත්ව පරිසරයට වන හානිය අනාගත පරපුර වෙනුවෙන් වළකාලිය යුතු බව ද ඇමැතිවරයා මෙහි දී පෙන්වා දුන්නේය. නාලක ගොඩහේවා මහතා මේ අදහස් පළ කළේ සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයේ පැවැති හයවන 'ජාතික සමුද්‍ර පරිසර විද්වත් සමුළුව 2020/2021' වැඩසටහනට සහභාගි වෙමිනි.

එහිදී අදහස් දැක්වූ ඇමැතිවරයා මෙසේද කීය. සාගරය අයිති මහජනතාවට. ඒ නිසා මේ සාගර සම්පත් රැක ගැනීම සමස්ත ජනතාවගේම වගකීමක්. අද අපේ රටේ පමණක් නොවෙයි මුළු ලෝකය පුරාම මේ සාගර සම්පත් අවදානමට ලක් වෙලා තිබෙන්නේ මිනිසාගේ ක්‍රියා නිසාමයි. ඒ ගැන අවධානයෙන් නොසිටීම නිසා සගරය දූෂණයට, අගතියට, විනාශයට පත් වෙලා අනාගත පරම්පරාවට මේවා නැතිවීමේ තර්ජනයක් ඇති වී තිබෙනවා. අපේ රටට සාගරය ඉතාමත් වැදගත්. අපට අයිති මුහුදු කලාපය ලංකාවේ භූමිය වගේ අට ගුණයක්. ලංකාවේ භූමියෙන් අපි අපේ රටේ වර්තමාන පරම්පරාව වගේම අනාගත පරම්පරාව වෙනුවෙන් ප්‍රයෝජන ගන්න කොට සාගරය ගැනත් අපි ඒ විදිහටම බැලිය යුතුයි. සාගරය අපි ප්‍රයෝජන ගන්නකොට අපට අනාගත පරම්පරාව අමතක කරන්න බැහැ. මොකද මේක අයිති සමස්ත මානව ප්‍රජාවටම. අතීතයේ, වර්තමානයේ වගේම අනාගතයේ මානව ප්‍රජාවට මේ සියලු සම්පත් අයිතියි. ඒ නිසා තමයි මේ සාගර සම්පත් ආරක්ෂණයට විශාල අවධානයක් යොමු කර, විශේෂයෙන්ම ඒ සඳහා වෙනම ආයතනයක්, වෙනම නීති පද්ධතියක් සකස් කර තිබෙන්නේ.

කෙසේ වෙතත් මේ සම්පත් ආරක්ෂා කර ගැනීමට මේ රටේ සිටින සියලුම පුරවැසියන්ට අපි ආරාධනා කරනවා. අද අපේ වෙරළ තීරය ප්ලාස්ටික් අපද්‍රව්‍යවලින් පිරිලා. අපේ වෙරළ තීරයට එන මේ ප්ලාස්ටික් අපද්‍රව්‍ය වෙරළ තීරයට එන්නේ කොහෙන්ද? මේවා මේ වෙරළට එන මිනිසුන් දාන අපද්‍රව්‍ය නොවෙයි. ඔවුනුත් දානවා. නමුත් බහුතරයක් වන 70%කට වඩා එන්නේ රට ඇතුළේ ගංගා ඇළ දොළ මගින් ගලාගෙන එන කුණු කසළ, ප්ලාස්ටික් අපද්‍රව්‍ය මගින්. එය වළක්වා ගන්න නම් අපි වෙරළ සුද්ධ පවිත්‍ර කිරීම විතරක් මදි. ගංගා ඇළ දොළට මේ අපවිත්‍ර ද්‍රව්‍ය මුදා හරින ජනතාව දැනුම්වත් කළ යුතුයි.

අමාත්‍යාංශ ලේකම් සිරිනිමල් පෙරේරා, මොරටුව විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය අජිත් ද අල්විස්, සමුද්‍ර පරිසර අධිකාරියේ සභාපති නීතිඥ දර්ශනී ලහඳපුර, සාමාන්‍යාධිකාරී ආචාර්ය පී.බී.ටී. ප්‍රදීප් කුමාර මහත්ම මහත්මීන් ඇතුළු ක්ෂේත්‍රයේ විද්වත්හු පිරිසක් මේ අවස්ථාවට සහභාගි වූහ.

## දියවන්නා ඔයේ ජල දූෂණය ගැන සොයන්න කාර්යසාධක බළකායක්:

# වාහන ගෙන්වීමේදී විදුලි බලයෙන් ක්‍රියාත්මක කරන වාහන ආනයනයට ප්‍රමුඛත්වයක්

## පරිසර ඇමැති කියයි

පරිසරය හා කෘෂිකර්මය නගා සිටුවීම පිළිබඳව ජනාධිපතිවරයා ඉදිරිපත් කළ යෝජනා මේ රටේ හැරවුම් ලක්ෂ්‍යයක් වනු ඇති බව පරිසර ඇමැති මහින්ද අමරවීර මහතා පැවසීය.

ජනාධිපතිවරයා විසින් පසුගිය අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කළ "දේශගුණික විපර්යාසයන්ට තිරසර විසඳුම් සහිත හරිත සමාජ- ආර්ථික රටාවක් කරා" යනුවෙන් හඳුන්වන ලද අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව මගින් මේ රටේ පරිසරය හා කෘෂිකර්මයට අදාළ ක්ෂේත්‍ර රැසක් පිළිබඳ අවධානය යොමු කර ඇති වත් මෙහි ඇති යෝජනා 20න් 13ක්ම පරිසරයට අදාළ බවත් ඇමැතිවරයා සඳහන් කළේය. එබැවින් ජනාධිපතිතුමා විසින් යෝජනා කළ සියලු කරුණු ක්‍රියාත්මක කිරීමට පරිසර අමාත්‍යවරයා වශයෙන් කටයුතු කරන බව ප්‍රකාශ කරන්නේයැයි පරිසර ඇමැති මහින්ද අමරවීර මහතා අවධාරණය කළේය.

ඇමැතිවරයා මේ බව ප්‍රකාශ කළේ ඊයේ (29) පරිසර අමාත්‍යාංශයේදී පැවැති මාධ්‍ය හමුවකදීය.

මෙහිදී වැඩිදුරටත් ඇමැති මහින්ද අමරවීර මහතා මෙසේද කීය.

ජනාධිපතිවරයා ඇමැති මණ්ඩල රැස්වීම ආරම්භ කරමින් කියා සිටියේ "මේ රටේ ජනතාව මම ජනාධිපතිවරයා ලෙස පත් කර ගැනීමේ දී මගෙන් ඉල්ලා සිටියේ මේ රටේ පරිසරය සුරක්ෂිත කිරීමට පියවර ගන්නා ලෙසයි. ඒ සඳහා මට වගකීමක් තිබෙනවා. මම මේ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවේ සඳහන් යෝජනා ඉදිරිපත් කරන්නේ ඒ නිසා " කියලයි ජනාධිපති ප්‍රකාශ කළේ.

මේ යෝජනා ඉදිරි කාලයේ ක්‍රියාත්මක කිරීමට පියවර ගැනීම ඉතාමත් වැදගත්. ඒ නිසා මේ යෝජනාවලිය අපේ රටේ හැරවුම් ලක්ෂ්‍යයක් වනු ඇති බව ද ඇමැතිවරයා ප්‍රකාශ කළේය.

විශේෂයෙන් කාබනික ගොවිතැන ප්‍රවර්ධනය සඳහා ජනාධිපතිතුමා විශේෂ අවධානයක් යොමු කර තිබෙනවා. අපේ රටේ දැනට රසායනික පොහොර හා කෘමිනාශක භාවිතය නිසා සිදුව තිබෙන විශාල හානිය අවම කර ගැනීමට පියවර ගැනීම ඉතාමත් වැදගත්. මම කෘෂිකර්ම අමාත්‍යවරයා වශයෙන් සිටියදී මගේ කුඹුර පළමු කාබනික ගොවිතැන ලෙස වගා කර රටට අවශ්‍ය ආදර්ශය ලබා දුන්නා. රසායනික පොහොර යොදනවාට වඩා ලබා ගත හැකි විශාල අස්වැන්නක් මට ලබා ගැනීමටත් හැකි වුණා.

එමෙන්ම මෙරටට වාහන ආනයනය කිරීමේ දී මින්පසු විදුලි බලයෙන් ක්‍රියා කරන වාහන ආනයනයට ප්‍රමුඛත්වය ලබාදීමට ජනාධිපතිතුමා යෝජනා කර තිබෙනවා. ඒ අනුව යමින් මම මේ වනවිටත් අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් අමාත්‍ය මණ්ඩල ලේකම් කාර්යාලයට යොමු කර තිබෙනවා. ලබන සතියේ අමාත්‍ය මණ්ඩල සාකච්ඡාවේ දී එම පත්‍රිකාව සාකච්ඡා කෙරේවි. ඒ අනුව ඉදිරියේ දී රජය විසින් වාහන ආනයනය කිරීමේ දී විදුලිබලයෙන් ක්‍රියාත්මක වන වාහන ආනයනය සඳහා ප්‍රමුඛත්වය ලබා දෙන ලෙස මම මේ ඇමැති මණ්ඩල පත්‍රිකාවෙන් යෝජනා කර තිබෙනවා.

මේ වනවිට දියවන්නා ඔයේ ජල දූෂණය සම්බන්ධව කාර්යසාධක බළකායක් පත් කිරීමට පරිසර අමාත්‍යාංශය තීරණය කර තිබෙනවා. මේ කාර්යසාධක බළකායේ සභාපති ධුරයට අමාත්‍යාංශයේ ලේකම් විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ මහතා පත් කරනවා.

ඒ වගේම එහි සෙසු සාමාජිකයන් වශයෙන් විශ්ව විද්‍යාල ආචාර්යවරුන් වන මහාචාර්ය එම් පද්මලාල් මහතා- ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, මහාචාර්ය චන්ද්‍රිකා නානායක්කාර මිය- කොළඹ විශ්ව විද්‍යාලය, මහාචාර්ය රංජන යූ. කේ. පියදාස මහතා - කොළඹ විශ්වවිද්‍යාලය, මහාචාර්ය ජගත් මනතුංග මහතා- මොරටුව විශ්වවිද්‍යාලය, මංජු ගුණවර්ධන මහතා- ජ්‍යෙෂ්ඨ විද්‍යාඥ - නැනෝ තාක්ෂණික ආයතනය පත් කරනවා යැයි ද ඇමැතිවරයා සඳහන් කළේය.

මේ කාර්යසාධක බළකාය විසින් නැවත මෙවැනි තත්ත්වයක් ඇති නොවන පරිදි ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගනු ඇතැයි ද ඇමැතිවරයා කීය.





# චීන ආරක්ෂක ඇමැතිගේ

## දෙදින ශ්‍රී ලංකා නිල සංචාරයේ විශේෂ අවස්ථා...

දෙදින නිල සංචාරයක් සඳහා දිවයිනට පැමිණි චීන රාජ්‍ය මන්ත්‍රී හා ආරක්ෂක ඇමැති ජෙනරාල් වෙයි ෆෙන්ග්හි මහතා ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ, අගමැති මහින්ද රාජපක්ෂ මහත්වරුන් හමු වී සාකච්ඡා පැවැත්වූ අතර, එම සංචාරයේ විශේෂ අවස්ථා කීපයක් කැමරාවට හසු වූ අයුරුයි මේ.

ඇමැති චමල් රාජපක්ෂ ශ්‍රී ලංකාවේ චීන තානාපති ෂී සෙන්හොන් (Qi Zhenhong), චීන මහජන හමුදාවේ ඒකාබද්ධ මාණ්ඩලික දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය ප්‍රධානී හා අන්තර්ජාතික කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ ජෙනරාල් ලුතිනන් ජෙනරාල් ෂාඕ යැන්ග්මින් (Lt. Gen. Shao Yuanming), මේජර් ජෙනරාල් සි ග්වීඕවෙයි (Ci Guowei) සහ ජනාධිපති ලේකම් පී.බී. ජයසුන්දර විදේශ ලේකම් අද්මිරාල් (විශ්‍රාමික) මහාචාර්ය ජයනාත් කොළඹගේ යන මහත්වරු මේ අවස්ථාවට එක්ව සිටියහ.

ඡායාරූප - ජනාධිපති මාධ්‍ය අංශය සහ දුෂ්මන්ත මායාදුන්න









# කොවිඩ් අවදානමට මුහුණ දීමට ගම්පහ-වැරැල්ලවත්තට කොවිඩ් ප්‍රතිකාර මධ්‍යස්ථානයක්

## ඇඳන් 2,000කින් යුක්තයි - කටුනායක සහ මීරිගම වසාදැමූ කම්හල් දෙකකුත්

**මහින්ද අලුත්ගෙදර**

කොවිඩ් අවදානමට මුහුණදීමට ඇඳන් 2000කින් සමන්විත කොවිඩ් ප්‍රතිකාර මධ්‍යස්ථානයක් ගම්පහ, වැරැල්ලවත්ත ප්‍රදේශයේ ස්ථාපිත කිරීමට රජය තීරණය කරයි.

දැනට වසා දමා ඇති ඇඟලුම් කර්මාන්තශාලාවක් මේ සඳහා ලබා ගැනීමට අපේක්ෂිත අතර ඊට අමතරව කටුනායක සහ මීරිගම ප්‍රදේශවල වසාදමා ඇති කර්මාන්තශාලා 02ක ගොඩනැඟිලි ද ප්‍රතිකාර මධ්‍යස්ථානවලට ලබාගැනීමට තීරණය කර තිබේ.

සංචාරක ඇමැති ප්‍රසන්න රණතුංග මහතාගේ ප්‍රධානත්වයෙන් ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කොරෝනා තත්ත්වය පාලනය කිරීම සඳහා ගතයුතු ඉදිරි ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට පැවති රැස්වීමක දී මේ තීරණයට එළඹ ඇත.

පෙරේදා දිනයේ පමණක් ගම්පහ දිස්ත්‍රික්කයෙන් කොරෝනා රෝගීන් 234ක් හඳුනාගෙන ඇතැයි මෙහි දී අනාවරණය වූ අතර මේ වනවිට ගම්පහ දිස්ත්‍රික්කයෙන් මෙතෙක් හඳුනාගෙන ඇති කොරෝනා රෝගීන් සංඛ්‍යාව 20,029කි. එය මෙරට සමස්ත කොවිඩ් ආසාදිත සංඛ්‍යාවෙන් පහෙන් එකක් බව ගම්පහ ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා සඳහන් කළේය.

ඔහු පෙන්වා දුන්නේ ගම්පහ දිස්ත්‍රික්කයේ ජනගහනයෙන් 248,387 දෙනෙකු කොවිඩ් එන්නත ලබාගෙන ඇති අතර ඉදිරි දින කීපයේ දිස්ත්‍රික්කයේ සෞඛ්‍ය සේවකයන්ට එම එන්නත දෙවන මාත්‍රාව ලබාදෙන බවයි. වර්ධනය වෙමින් පවතින කොවිඩ් තත්ත්වයට මුහුණ දීම සඳහා ප්‍රතිකාර මධ්‍යස්ථාන කීපයක් දිස්ත්‍රික්කයේ පිහිටුවීමේ අවශ්‍යතාව පෙන්වා දුන් ගම්පහ දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා වැරැල්ලවත්ත, මීරිගම හා කටුනායක වසා දමා ඇති කර්මාන්තශාලා තුනක් මේ සඳහා හඳුනාගෙන ඇතැයි ද කීය. ඒ සඳහා මැදිහත්ව එම කර්මාන්තශාලා තාවකාලික කොවිඩ් ප්‍රතිකාර මධ්‍යස්ථාන ලෙස ලබාදීමට කටයුතු කරන ලෙස ද ඔහු ඇමැති ප්‍රසන්න රණතුංග මහතාගෙන් ඉල්ලා සිටියේය.



වහා ක්‍රියාත්මක වූ ඇමැති ප්‍රසන්න රණතුංග මහතා ඒ මොහොතේම දුරකථනය ඔස්සේ ආයෝජන මණ්ඩල ප්‍රධානීන් සමඟ සාකච්ඡා කොට අදාළ කර්මාන්තශාලා කොවිඩ් ප්‍රතිකාර මධ්‍යස්ථාන ලෙස ලබාදීමට අවශ්‍ය පියවර ගත්තේය. යෝජිත වැරැල්ලවත්ත කොවිඩ් ප්‍රතිකාර මධ්‍යස්ථානය ස්ථාපනය කිරීම සඳහා නාවික හමුදාව දැනටමත් සිය සහාය පළකර ඇතැයි ද මෙහි දී අනාවරණය විය.

පවතින අවදානම් සහගත තත්ත්වයට මුහුණ දීම සඳහා ගම්පහ දිස්ත්‍රික්කයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලවලට අවශ්‍ය පහසුකම් සම්බන්ධයෙන් ද මෙහි දී දීර්ඝ ලෙස සාකච්ඡා කෙරිණි. ප්‍රවාහන පහසුකම් සහ අවශ්‍ය තරම් මානව සම්පත් නොමැතිවීම පිළිබඳව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් මෙහි දී කරුණු ඉදිරිපත් කළ අතර ඇමැතිවරයා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලවලට අවශ්‍ය ප්‍රවාහන පහසුකම් ලබාදෙන්නැයි දිස්ත්‍රික්කයේ පළාත් පාලන ප්‍රධානීන්ට උපදෙස් දුන්නේය.

මේ වනවිට පත්වීම් ලබා පුහුණුව ලබන උපාධිධාරීන් එම කාර්යාලවලට අනුයුක්ත කරන්නැයි ඇමැතිවරයා දිස්ත්‍රික් ලේකම්වරයාට කීය. ඒ අනුව අවශ්‍ය පරිදි එම අනුයුක්ත කිරීම් සිදුකිරීමට ද මෙහි දී තීරණය කෙරිණි.

රාජ්‍ය ඇමැතිනී සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ, ගම්පහ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපති සහන් ප්‍රදීප්, ගම්පහ දිස්ත්‍රික් ලේකම් සුනිල් ජයලත් මහත්ම මහත්මීන් ඇතුළු පිරිසක් මේ අවස්ථාවට එක්ව සිටියහ.

# ඉන්දියාවේ වසංගත තත්ත්වය ගැන ජනපති ගෝඨාභය මෝදිට සොව පළ කරයි



මහින්ද අලුත්ගෙදර

ඉන්දියාව මුහුණ දී සිටින කොවිඩ් 19 වසංගත තත්ත්වය සම්බන්ධයෙන් ඉන්දීය අගමැති නරේන්ද්‍ර මෝදි මහතා වෙත ලිපියක් යොමු කරමින් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා සිය දැඩි සංවේගය පළ කරයි. ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා පෙරේදා (28) අගමැති නරේන්ද්‍ර මෝදි මහතා වෙත ලිපියක් යොමු කරමින් ඉන්දියාව මුහුණ දී සිටින කොවිඩ් වසංගත තත්ත්වය සම්බන්ධයෙන් දැඩි සංවේගය පළ කළ බව ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලය පවසයි.

අතීතයේ සිටම මෙවන් වසංගත තත්ත්වයන් ජය ගැනීමට ගන්නා ලද මනුෂ්‍යත්වයේ සාමූහික ප්‍රයත්නයන් සාර්ථක වී ඇති බව සිහිපත් කරන ගෝඨාභය රාජපක්ෂ මහතා මනා කැපවීමක් සහිත විද්වතුන් සහ වෘත්තීයවේදීන්ගේ සහයෝගයෙන් අගමැති නරේන්ද්‍ර මෝදි මහතාගේ නායකත්වය යටතේ ඉන්දියාව මේ අර්බුදයට සාර්ථකව මුහුණ දෙනු ඇතැයි විශ්වාසය පළ කරයි.

ශ්‍රී ලංකාවේ මහා සංඝරත්නය ඉන්දීය ජනතාව වෙනුවෙන් රතන සූත්‍රය දේශනා කිරීමට සූදානම් වන බවද ජනාධිපතිවරයා සිය ලිපිය මඟින් ඉන්දීය අගමැතිවරයාට දන්වා තිබෙන අතර, ජනාධිපතිවරයාගේ මහා සංඝරත්නයේ කාරුණිකභාවය තුළින් පිළිබිඹු වන්නේ ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර සියවස් ගණනාවක් පුරා පවතින සමීප සබඳතාවේ ගැඹුර සහ ශක්තිමත්භාවය බවද එම මහ කොමසාරිස් කාර්යාලය සඳහන් කරයි.

කොවිඩ් 19 වසංගත තත්ත්වය විසින් මතු කර ඇති අභියෝගාත්මක කාලයේදී ශ්‍රී ලංකාව ඉන්දියාව සමඟ සිටීම ඉන්දීය නායකත්වය සහ ජනතාව ඉතා අගය කොට සලකන අතර, මූලික සැලැස්මට පෙර ශ්‍රී ලංකාවේ එන්නත්කරණ වැඩසටහන ආරම්භ කිරීමට ශ්‍රී ලංකා රජයට අවස්ථාව උදා කරමින් ඉන්දියාව විසින් පරිත්‍යාග කරන ලද ඉන්දියාවේ නිෂ්පාදිත කොවිඩ්-19 මර්දන එන්නත් මාත්‍රා 500,000 සම්බන්ධයෙන් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා ශ්‍රී ලංකා ජනතාව වෙනුවෙන් ඉන්දියාවට හෘදයංගම කෘතවේදීත්වය පළ කර තිබේ.

ඉන්දියාව සහ ශ්‍රී ලංකාව කොවිඩ් 19 වසංගතය විසින් මතු කර ඇති දැවැන්ත අභියෝගයන්ට මුහුණ දීමේදී එකිනෙකාට සහයෝගය දක්වා තිබෙන අතර, මේ සම්බන්ධයෙන් දෙරට අතර සහයෝගීතාව සමීප සහ මිත්‍රශීලී ද්විපාර්ශ්වික බැඳීම් සනිටුහන් කරන බවද එය දෙරට ජනතාවගේ සුබ සිද්ධිය සහ ඔවුන් අතර සහෝදර සහ ශිෂ්ටාචාරමය බැඳීම් වර්ධනය කිරීමට තව දුරටත් ඉවහල් වන බවද ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලය පෙන්වා දෙයි.

# ටෝකියෝ ඔලිම්පික් යන මැටිල්ඩාට ඇමැති නාමල් සුබ පතයි

බුද්ධි කරුණාරත්න



ශ්‍රී ලංකාවෙන් ප්‍රථම වතාවට අශ්වාරෝහණ ක්‍රීඩා ඉසව්ව සඳහා 2020 ටෝකියෝ ඔලිම්පික් තරගය නියෝජනය කිරීමට සුදුසුකම් ලබා ඇති මැටිල්ඩා කාල්සන්ට ක්‍රීඩා ඇමැති නාමල් රාජපක්ෂ මහතා සුබ පතා තිබේ. 1984 දී ශ්‍රී ලංකාවේ උපත ලද දැන් 35 හැවිරිදි වියේ පසුවන මැටිල්ඩා කුඩා කාලයේදී ස්වීඩන් ජාතික කැපකරු මව්පියන් සෙවණේ හැදී වැඩී ඇති අතර, අශ්වයන් ධාවනයට සමත්කම් දක්වන්නීය. 2018දී මව්රටට පැමිණි ඇය රටේ ජනයාගේ ආගන්තුක සත්කාර ගැන පැහැදී ශ්‍රී ලංකා ධජය යටතේ අශ්වාරෝහණ ඉසව්වෙන් ඔලිම්පික් දක්වා තරග කිරීමේ අදිටනින් මෙරට ක්‍රීඩා ක්ෂේත්‍රයට එක් වූවාය.

# නිරෝධායන රීති කැඩූ අයෙක් රිමාන්ඩ්

සිරන්ජනි කුමාරි

නිරෝධායන නීති උල්ලංඝනය කරමින් මුඛ ආවරණයක් නොමැතිව රාජගිරිය ප්‍රදේශයේ සිට කුරුඳුවත්ත ප්‍රදේශයට මහාමාර්ගයේ ගමන් කළ පුද්ගලයකු මැයි 3 වැනි දින දක්වා රක්ෂිත බන්ධනාගාර ගත කිරීමට කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් බුද්ධික සී. රාගල මහතා ඊයේ (29) නියෝග කෙළේය.

රාජගිරිය ප්‍රදේශයේ පදිංචි කේ. කේ. පෙරේරා යන සැකකරු මෙලෙස රක්ෂිත බන්ධනාගාර ගත කළ මහේස්ත්‍රාත්වරයා සැකකරුගේ මානසික වෛද්‍ය වාර්තා ද කැඳවීමට නියෝග කැර සිටියේය.

මුඛ ආවරණය නොමැතිව කුරුඳුවත්ත ප්‍රදේශය වෙත පැමිණි බව කියන සිද්ධිය සම්බන්ධයෙන් කුරුඳුවත්ත පොලිසිය සැකකරු අත්අඩංගුවට ගෙන නිරෝධායන නීති උල්ලංඝනය කරමින් මුඛ ආවරනයක් නොමැතිව රාජගිරිය ප්‍රදේශයේ සිට කුරුඳුවත්ත ගමන් කළ බවට චෝදනා කරමින් සැකකරු අධි කරණයට ඉදිරිපත් කැර තිබිණි.

# කොවිඩ් වැලඳුණු රෝගීන්ට ප්‍රතිකාර කරන්න වෙන් කළ ඇඳන් 3197ක් තවමත් හිස්ව තිබෙනවා

## නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් වෛද්‍ය එස්.එම්. ආනල්ඩ්

සන්ධ්‍යා කරුණාරත්න

කොවිඩ් - 19 වයිරසය වැලඳුණු රෝගීන්ට ප්‍රතිකාර ලබාදීම සඳහා වෙන් කර ඇති ඇඳන් 12,789 න් 3197 ක් මේ වන විට හිස්ව තිබෙන බව සෞඛ්‍ය අමාත්‍යාංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (වෛද්‍ය සේවා 2) වෛද්‍ය එස්.එම්. ආනල්ඩ් මහතා පැවසුවේය.

කොවිඩ් ප්‍රතිකාර ඒකක 82 ක් මේ වන විට ක්‍රියාත්මක අතර දැනට වාර්තා වන රෝගීන්ගේ සංඛ්‍යාව අනුව රෝග සත්කාර අංශයේ ගැටලුවක් මතුව නොමැති බව ද ඒ මහතා ප්‍රකාශ කෙළේය. සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යාංශයේ පැවැති මාධ්‍ය හමුවට සහභාගි වෙමින් ඒ මහතා මේ බව පැවසුවේය.

කොවිඩ් රෝගීන්ට අවශ්‍ය ඇඳන්, දැඩි සත්කාර ඒකක ඇඳන්, ඔක්සිජන් යනාදිය ප්‍රමාණවත් පරිදි පවතින්නේ යැයි ද හෙතෙම පැවසීය.

මේ වන විට වාර්තා වන රෝගීන්ගේ සංඛ්‍යාව ඉක්මවා ඉදිරියේදී වාර්තා වුවහොත් ප්‍රතිකාර ඒකක ඇඳන් ධාරිතාව පිළිබඳ ගැටලුවක් මතු විය හැකි බවත් ඒ තත්ත්වය දක්වා නොයාමට මහජනතාව වග බලා ගත යුතු බවත් ඔහු කීය.

අසල්වැසි ඉන්දියාවේ කොවිඩ් සම්බන්ධයෙන් ඉතා බරපතල තත්ත්වයක් වාර්තා වන්නේ යැයි ද, ඒ තත්ත්වය දක්වා නොයෑමට ආරක්ෂාකාරීව ජීවන කටයුතු සිදු කිරීම අප සියලු දෙනාගේම වගකීමක් යැයි ද ඒ මහතා ප්‍රකාශ කෙළේය.

කොවිඩ් රෝගීන්ගේ වාර්තා වීම ඉහළ ගියත් මේ දක්වා සංචරණ සීමාවන් පැනවීම සිදු නොකළේ ජනතාවගේ ආර්ථික තත්ත්වය කඩා නොවැටෙන ලෙස පවත්වා ගැනීම සඳහා බවත් නමුත් කොවිඩ් මර්දන සෞඛ්‍ය මාර්ගෝපදේශ නොපිළිපදිමින් ජනතාව කටයුතු කරන්නේ නම් සංචරණ සීමාවන් රට තුළ නැවත වතාවක් දැමීමට සිදු වන බවත් ඔහු කීය.

# නගරාන්තර හා දුර ගමන් දුම්රිය ගමන්වාර හෙට සිට අඩු වෙයි

අනුර ප්‍රේමලාල් හා භක්ති මෙන්ඩිස්

කොවිඩ් 19 වසංගතය නිසා නගරාන්තර හා දුර ගමන් දුම්රිය ගමන්වාර ප්‍රමාණය හෙට (1) සිට අඩු කිරීමට කටයුතු කරන බව දුම්රිය දෙපාර්තමේන්තුව නිවේදනය කැර සිටියි.

මේ සම්බන්ධයෙන් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (ගමනාගමන) ඒ.ඩී.ජී. සෙනෙවිරත්න මහතා කියා සිටියේ, 1001 දරණ කොටුව - බදුල්ල, 1009,1010 කොටුව-කන්කසන්තුරය-කොටුව, 4003 කොටුව - කන්කසන්තුරය, 4021/4022 කොටුව -කන්කසන්තුරය - කොටුව, 6075 කොටුව -පොළොන්නරුව, 4017 කොටුව කන්කසන්තුරය, 8054 කොටුව-බෙලිඅත්ත, 1002 බදුල්ල- කොටුව,1015 කොටුව-බදුල්ල,6076 පොළොන්නරුව-කොටුව,4018 කන්කසන්තුරය - කොටුව,8055 බෙලිඅත්ත- කොටුව,1016 බදුල්ල -කොටුව,පෙරවරු 8.30 සිට කොළඹ කොටුව සිට බදුල්ල දක්වා ධාවනය වන අංක 1015 දරණ සීඝ්‍රගාමී දුම්රිය ලබන මස 8 හා 14 යන දිනයන්හී සහ බදුල්ල සිට කොළඹ කොටුව දක්වා ධාවනය වන අංක1016 දුම්රිය 9 හා 15 යන දිනයන්හීදි ධාවනය වේ.

අංක1001/1002 දුම්රියන් සඳහා ප්‍රවේශ පත් වෙන්කරගත් මගීන් සඳහා අංක 1005 හා 1006 දුම්රියන්හී ගමන් පහසුකම් සලසා හැකියි. ඒ සඳහා කොළඹ කොටුව සිට බදුල්ල බලා ධාවනය වන අංක1005 දුම්රිය 01,02,08,13,14 හා 15 යන දිනයන්හී පෙරවරු 6.30ට ගමන් ආරම්භ කෙරෙන බව මෙයින් ජනතාවට දැනුම් දෙමු.

# බදියුදීන්ලා නිදහස් කරන්නැයි ඉල්ලා සමගි ජන බලවේගයෙන් අද විරෝධතාවක්

මැදකොළඹ සමූහ

යහපාලන ආණ්ඩුවේ හිටපු ඇමැතිවරයකු ලෙස කටයුතු කළ රිෂාද් බදියුදීන් මහතා සහ ඔහුගේ සොහොයුරු රියාජ් බදියුදීන් නිදහස් කරන්නැයි ඉල්ලා සමගි ජනබලවේගයේ කොළඹ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී මුජිබර් රහුමාන් මහතාගේ ප්‍රධානත්වයෙන් අද (30) පස්වරු 2.00ට කොළඹ 07, ඇස්වාට්ටුවේ දවටගහ මුස්ලිම් පල්ලිය අසලදී නිහඬ විරෝධතාවක් පැවැත්වේ.

මෙම අවස්ථාවට සමගි ජන බලවේගයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හා හිටපු පළාත් සභා මන්ත්‍රීවරුන් ඇතුළු කොළඹ මහ නගර සභාවේ නාගරික මන්ත්‍රීවරුන් පිරිසක් සහභාගී වීමට නියමිතය.

# ප්‍රථම තිරසර අපද්‍රව්‍ය කළමනාකරණ ගිවිසුමට අත්සන් තැබේ

චන්දිමා කරුණාරත්න



ජාතියේ පුරෝගාමී අපද්‍රව්‍ය කළමනාකරණ විසඳුම් දෙන සියම් සිටි සිමෙන්ති (ලංකා) පුද්. සමාගමට අනුබද්ධිත ආයතනයක් වන Insee Ecocycle Lanka (Private) Limited, රට පුරා ඇති විශ්ලේෂණ විද්‍යාගාර මගින් එකතු වන අපද්‍රව්‍ය සිමෙන්ති පෝරණුවේ සම සැකසුම් භාවිතයෙන් බැහැර කරමින් පාරිසරික බලපෑම අවම කිරීමට ප්‍රථම තිරසාර අපද්‍රව්‍ය කළමනාකරණ ගිවිසුම සඳහා මධ්‍යම පරිසර අධිකාරිය (CEA) සමඟ අත්සන් තැබීය.

මෙම ගිවිසුමට මධ්‍යම පරිසර අධිකාරියේ සභාපති සිරිපාල අමරසිංහ සහ සියම් සිටි සිමෙන්ති (ලංකා) සභාපති නන්දන ඒකනායක යන මහත්වරුන් අත්සන් තැබිණි.

එම අවස්ථාව සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් හේමන්ත ජයසිංහ, Insee Ecocycle Lanka (Private) Limited හි අධ්‍යක්ෂ සංජීව චූලකුමාර යන මහත්වරුන් ඇතුළු තවත් නිලධාරීන් රැසක් සහභාගී වූහ.

එහිදී අදහස් දක්වමින් සියම් සිටි සිමෙන්ති (ලංකා) සභාපති නන්දන ඒකනායක මහතා පැවසුවේ "Insee Ecocycle ආයතනය සිමෙන්ති පෝරණුවල සම සැකසුම් ක්‍රියාවලියට අමතරව අපද්‍රව්‍ය කළමනාකරණ විසඳුම්, සම්පත් ප්‍රතිසාධනය, විශ්ලේෂණ රසායනාගාර විසඳුම්, රසායනික අපද්‍රව්‍ය ඇතුළු අනෙකුත් පාරිසරික විසඳුම් ලබාදීම සඳහා විවිධාංගීකරණය කර ඇති බවයි. තවද අපද්‍රව්‍ය කළමනාකරණය, කාර්මික පිරිසිදු කිරීම, අපද්‍රව්‍ය විදුලි හා ඉලෙක්ට්‍රොනික උපකරණ කළමනාකරණය, වැනි කාරණා සම්බන්ධයෙන් කාලෝචිත අවශ්‍යතාවයකට සරිලන පාරිසරික චක්‍රයේ තවත් සන්ධිස්ථානීය ව්‍යාපෘතියක් වන බවත් මධ්‍යම පාරිසර අධිකාරියේ සහයෝගයෙන් මෙම විසඳුම දියත් කිරීමට ලැබීම ගැන ආඩම්බර වන බවයි."

මෙහිදී අදහස් දැක්වූ මධ්‍යම පරිසර අධිකාරියේ සභාපති සිරිපාල අමරසිංහ මහතා. "රසායනාගාරයෙන් අවසානයේදී අපද්‍රව්‍ය ඉවත් කළ විට, එය අත්පත් කරගත් හෝ උත්පාදනය කළ පුද්ගලයින්ට අමතරව, අවසානයේදී සමස්තයක් වශයෙන් එය බලපානු ලබන්නේ සමාජයටයි. මධ්‍යම පරිසර අධිකාරිය වශයෙන් අපට පොදු ක්ෂේත්‍රයේදී අපද්‍රව්‍යවල විභව හා අහිතකර බලපෑම අවම කිරීම අපගේ යුතුකමක්. අපගේ විද්‍යාගාරවල අපද්‍රව්‍ය කළමනාකරණයේ දූරදර්ශී හා තිරසාර භාවිතයන් සහතික කිරීම සඳහා තමයි අපි Insee Ecocycle සමඟ වැදගත් ගිවිසුමක් අත්සන් කළේ'.

මධ්‍යම පරිසර අධිකාරියේ, ප්‍රධාන කාර්යාලයේ රසායනාගාරයේදී සිදු කරනු ලබන අපද්‍රව්‍ය කළමනාකරණ විසඳුම දිවයින පුරා පිහිටි ඔවුන්ගේ කලාපීය විද්‍යාගාර නවයට ද ව්‍යාප්ත කෙරේ. මධ්‍යම පරිසර අධිකාරියේ විද්‍යාගාර හැරුණු විට, ජාතික මට්ටමින් අපද්‍රව්‍ය කළමනාකරණය සහ බැහැර කිරීමේ අවශ්‍යතා සඳහා Insee Ecocycle කැපවී සිටින අතර විශ්වවිද්‍යාල, රාජ්‍ය ආයතන සහ පෞද්ගලික සමාගම් ඇතුළු දිවයින පුරා ඇති සියලුම විශ්ලේෂණ විද්‍යාගාරවල මෙම විසඳුම් නැවත සකස් කර ආදේශ කිරීම අරමුණු කර ගෙන ඇත.

# ඉඩම්-මූල්‍ය-ශ්‍රමික-ආයතන ගැටලු විසඳන්න විශේෂ සමථ මණ්ඩල පිහිටුවීමට කැබිනට් අනුමැතිය

ඉඩම් ආරවුල්, මූල්‍ය ආරවුල්, විදේශ ගත ශ්‍රමිකයන්ගේ පවුල්වල හා පළාත් පාලන ආයතනවලට පවතින ගැටලු විසඳීම සඳහා විශේෂ සමථ මණ්ඩල පිහිටුවීමට අධිකරණ ඇමැති ඉදිරිපත් කළ කැබිනට් පත්‍රිකාවට ඇමැති මණ්ඩල අනුමැතිය ලැබී තිබේ.

සමථ මණ්ඩල ක්‍රියාවලිය තවදුරටත් ශක්තිමත් කර එම ක්‍රියාවලියට ප්‍රතිසංස්කරණ හඳුන්වාදීම යටතේ දැනට ක්‍රියාත්මක වන සුළු ආරවුල් විසඳීමේ සමථ මණ්ඩලවලට අමතරව ඉඩම් ආරවුල් විසඳීමේ විශේෂ සමථ මණ්ඩලයන්, මූල්‍ය ආරවුල් විසඳීමේ විශේෂ සමථ මණ්ඩලයන්, විදේශ ගත ශ්‍රමිකයන්ගේ පවුල්වල ගැටලු සඳහා හඳුනාගත් ප්‍රදේශවල සමථ මණ්ඩලයන් හා පළාත් පාලන ආයතනවලට පවතින ගැටලු විසඳීමට විශේෂ සමථ මණ්ඩලයන් පිහිටුවීම සඳහා අධිකරණ ඇමැති ජනාධිපති නීතීඥ අලි සබ්රි මහතා ඇමැති මණ්ඩලය වෙත ඉදිරිපත් කළ කැබිනට් පත්‍රි කාවට අනුමැතිය හිමිව තිබේ.

මේ තුළින් මහේස්ත්‍රාත් අධිකරණවලට එන නඩු සංඛ්‍යාව අවම කිරීමටත් නීතිමය ගාස්තුවලින් තොරව කඩිනමින් සුළු ආරවුල් සමථයකට පත් කිරීමටත් අපේක්ෂා කරනු ලබන අතර එකී ඉලක්කයන් සපුරා ගැනීමේදී සමථ මණ්ඩල මසකට වෙතාවක් රැස්වීමට නියමිතයි.

අගතියට පත් පාර්ශ්වයන්ට සිය දුක් ගැනවිලි අඩු වියදමකින් කඩිනම් ලෙස සහ මිත්‍රශීලී වටපිටාවක් තුළ දී සමථ මණ්ඩල හරහා විසඳා ගැනීමට මෙම විශේෂ සමථ මණ්ඩල පිහිටුවීමෙන් හැකියාව තිබේ.

සෞභාගයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශය යටතේ අධිකරණ අමාත්‍යාංශය වෙත පැවරී ඇති කාර්යයන් අතර සමථකරණය සඳහා සුවිශේෂී ප්‍රමුඛතාවක් ලබා දී ඇති අතර ඒ යටතේ සමථකරණ ක්‍රියාවලිය සඳහා ද සුවිශේෂී ප්‍රතිසංස්කරණ හඳුන්වා දීමට අධිකරණ ඇමැතිවරයාගේ උපදෙස් පරිදි අමාත්‍යාංශය කටයුතු යොදා ඇත.

# කොවිඩ් ප්‍රතිකාර රෝහල්වලට ඔක්සිජන් ජම්බෝ සිලින්ඩර් හිඟයක් නැතිව සැපයීමට තීරණයක්

සන්ධ්‍යා කරුණාරත්න

නව කොවිඩ් වයිරසය වැලඳීම නිසා රෝහල්ගත වන රෝගීන්ට අවශ්‍ය ඔක්සිජන් සැපයීම සඳහා කොවිඩ් ප්‍රතිකාර රෝහල්වලට ඔක්සිජන් ජම්බෝ සිලින්ඩර් හිඟයකින් තොරව සැපයීමට ප්‍රාථමික සෞඛ්‍ය සේවා, වසංගත රෝග හා කොවිඩ් රෝග පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය තීරණය කරයි.

රෝගීන්ට අවශ්‍ය ඔක්සිජන් ප්‍රමාණය හිඟයකින් තොරව සැපයීම මෙම තීරණයේ අරමුණ බව ප්‍රාථමික සෞඛ්‍ය සේවා, වසංගත රෝග හා කොවිඩ් රෝග පාලන කටයුතු රාජ්‍ය ඇමැතිනී විශේෂඥ වෛද්‍ය සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය පැවසුවාය.

නව කොවිඩ් වයිරසය හේතුවෙන් රෝහල්ගත වන රෝගීන්ට ඔක්සිජන් අවශ්‍යතාව ක්‍රම ක්‍රමයෙන් ඉහළ යෑමත් සමඟ ඒ සඳහා අවශ්‍ය ඔක්සිජන් සංචිතය පවත්වා ගැනීම සඳහා කටයුතු කිරීමත්, අදාළ සැපයුම් ආයතන සමඟ සාකච්ඡා කර හදිසි අවශ්‍යතාවකදී ලබා ගත හැකි ඔක්සිජන් ප්‍රමාණයන් පිළිබඳ තක්සේරුවක් කිරීමටත් ඇමැතිවරිය පියවර ගෙන තිබේ.

අසාධ්‍ය නොවන නමුත් විශේෂ අවධානයක් යොමු කළ යුතු රෝගීන් සඳහා High Dependency Unit (HDUs) ස්ථාපිත කිරීමටත්, එම ඒකක සඳහා High Flow Machines සවි කිරීමටත් ඇමැතිවරිය තීරණය කැර තිබේ.

ගම්පහ දිස්ත්‍රික්කයේ පී.සී.ආර්. පරීක්ෂණ සිදු කිරීම ඉහළ නැංවීම සඳහා වතුපිටිවල රෝහලට නව පී.සී.ආර්. යන්ත්‍රයක් සැපයීමට අවධානය යොමු කැර ඇත.

අලුත් අවුරුදු කාලය තුළ කොවිඩ් - 19 වැළඳෙන රෝගීන්ගේ වැඩිවීමක් දිනෙන් දින වාර්තා වීමත් සමඟ වයිරසයේ නව ප්‍රභේදය වන B117 වයිරස් කාණ්ඩය රට තුළ ශීඝ්‍රයෙන් පැතිර යන බවට හඳුනා ගැනීමෙන් පසුව ඉදිරියේදී ඇති විය හැකි තත්ත්වයන්ට මුහුණ දීම සඳහා අවශ්‍ය කරන පූර්ව සැලසුමක් සකස් කිරීම කෙරෙහි අවධානය යොමු කරමින් ඇමැතිවරිය මෙම පියවරයන් ගෙන තිබේ

# වැටුප් ඉල්ලා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ නොසන්සුන්තාවක්

ශිරාන් රණසිංහ

රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ සේවකයන්ට මේ මස වැටුප ගෙවන ලෙස ඉල්ලමින් එහි සේවකයන් දහසකට ආසන්න පිරිසක් කොළඹ පිහිටි ප්‍රධාන කාර්යාලයේ සභාපතිවරයාගේ නිල කාමරය අසලට රැස් වී ඊයේ (29) කළ උද්ඝෝෂණයක් නිසා එහි දැඩි නොසන්සුන්තාවක් හටගැනිණි.

දහවල් කෑම පැයේදී මෙම කලබලකාරී තත්ත්වය ඇති වූ පසු රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ සභාපති රත්නසිරි කළුපහන මහතා දුන් පොරොන්දුවකින් පසුව පිරිස විසිර ගොස් ඇත.

රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ සභාපති රත්නසිරි කළුපහන මහතාගෙන් මේ ඇති වූ තත්ත්වය පිළිබඳ 'දිනමිණ' කළ විමසීමේදී ඒ මහතා කියා සිටියේ එක්සත් ජාතික පක්ෂයට හා ජනතා විමුක්ති පෙරමුණට සම්බන්ධ වෘත්තීය සමිති සාමාජිකයන් එක් වී දේශපාලන අරමුණින් වැටුප් ඉල්ලමින් මෙලෙස ක්‍රියා කළ බවයි.

රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ සේවකයින් 2465 දෙනකු සේවය කරන අතර ප්‍රාදේශීය වැඩබිම්වල සේවකයන්ට ඊයේ (29) වන විටත් වැටුප් ගෙවා දමා තිබූ බවයි.

සෑම මසකම 25 වැනි දා වැටුප් ගෙවන මුත් ඇතැම් ව්‍යාපෘතිවලින් අය විය යුතුව තිබූ මුදල් ප්‍රමාණයක් ප්‍රමාද වීම නිසා දිනක් දෙකක් වැටුප් ගෙවීම ප්‍රමාද වූ බවද සභාපතිවරයා කීය. කෙසේ වෙතත් සංස්ථාවේ සියලු සේවකයන්ට ඊයේ (29) සවස් වන විට වැටුප් දීමට කටයුතු යොදා තිබූ බව ද ඒ මහතා කීය.

මෙම ආයතනයේ වැටුප් සඳහා මසකට රුපියල් ලක්ෂ 1600ක මුදලක් අවශ්‍යය. රාජ්‍ය ඉංජිනේරු සංස්ථා සභාපති කාමර අඩස්සියට ගත් බවට පැතිර ගිය කතාවේ සත්‍යයක් නොමැති බවද ඒ මහතා කීය.

# හෙරොයින් සැකකරුවෙක් අත්අඩංගුවට

රක්ෂණ ශ්‍රියන්ත

හෙරොයින් ග්‍රෑම් 10 මිලි ග්‍රෑම් 700ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවකු බොරැල්ල පොලිස් වසමේ මැනින් ටවුන් ප්‍රදේශයේදී පෙරේදා (28) කොළඹ දකුණ කොට්ඨාස අපරාධ විමර්ශන අංශයේ නිලධාරීන් පිරිසක් සිදු කළ වැටලීමකදී අත්අඩංගුවට ගෙන තිබේ.

අත්අඩංගුවට ගත් සැකකරු වැඩිදුර විමර්ශන කටයුතු සඳහා බොරැල්ල පොලිස් ස්ථානය වෙත භාරදීමට කටයුතු කර තිබේ.

අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 27ක් වූ බොරැල්ල මැනිංටවුන් ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.

සැකකරු ඊයේ (29) මාලිගාකන්ද මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට නියමිතව තිබුණි.

බොරැල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරයි.

# ප්‍රේමදාස කල්ලිය පාස්කු ප්‍රහාරයේ විමර්ශන අඩපණ කරන්න අඩම සැලසුම් සකස් කරනවා

## මහාමාර්ග ඇමැති ජොන්ස්ටන් ප්‍රනාන්දු

**ක්‍රිසන්ති විතාරණ**

පාස්කු ප්‍රහාරයේ වින්දිතයන්ට යුක්තිය ඉටු කරනවා වෙනුවට ප්‍රේමදාස කල්ලිය පාස්කු ප්‍රහාරයේ විමර්ශන කටයුතු අඩපණ කිරීමට අඩම සැලසුම් සකස් කරන බව මහාමාර්ග ඇමැති ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා පැවසීය.

ඇමැති ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා මේ අදහස් පළ කළේ ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ සුරතින් ලබන මස කහතුඩුව ප්‍රදේශයේදී ඉදිකිරීම් ආරම්භ කිරීමට යෝජිත රුවන්පුර අධිවේගී මාර්ගයේ පළමු අදියර සඳහා මුල්ගල තබන ස්ථානයේ පසුගිය දා (28) ස්ථානීය පරීක්ෂාවක් සිදු කිරීමෙන් අනතුරුවය. එහිදී මාධ්‍ය වෙත වැඩිදුරටත් අදහස් දැක්වූ ඇමැතිවරයා මෙසේද පැවසීය.

පාස්කු ප්‍රහාරය සංවිධානාත්මක මිනී මැරුමක් මෙන්ම ත්‍රස්තවාදී ප්‍රහාරයක්. එම ඝාතන සැලැස්මට සෘජුව හෝ වක්‍රව සම්බන්ධ වූ සියලු දෙනාට තරාතිරම නොබලා දඬුවම් ලබා දෙනවා.

එදා 2002 වසරේ යුද හමුදා බුද්ධි අංශය රහසිගතව අතුරුගිරිය මිලේනියම් සිටි නිවාස සංකීර්ණය තුළ පවත්වා ගෙන ගිය දිග දුර විහිදුම් බලකා කඳවුර වටලා එහි තිබූ අවි ආයුධ සහ බුද්ධි අංශ සාමාජිකයන් අත්අඩංගුවට ගනිමින් රාජ්‍ය ආරක්ෂාව අනතුරේ හෙළ රට අරාජික කළා. මෙය එදා ආණ්ඩු පක්ෂය ලෙස කටයුතු කළ එක්සත් ජාතික පක්ෂයේ නායකයන්ගේ අනුදැනුම මත වූ සිදු සිදුවීමක් බව හැමෝම දන්නා කරුණක්. රටේ බුද්ධි අංශය සහ එහි සාමාජිකයන්ගේ තොරතුරු හෙළිවීම නිසා කර්නල් මුතාලිෆ්, කපිතාන් නිලාම් වැනි විශිෂ්ට නිලධාරීන්ව එදා එල්ටීටීඊ ත්‍රස්තයන් විසින් මහ මග ඝාතනය කළා.

2002 වසරේ එජාප ආණ්ඩුවේ සිටි ප්‍රබලයන් වර්තමානයේ දී විපක්ෂය නියෝජනය කරනවා. දැන් ඔවුන් උත්සාහ කරන්නේ එදා ඔවුන් විසින් සිදු කළ දෙය අද රට තුළ සිදු කිරීමටයි. එනම් පාස්කු ප්‍රහාරය පිළිබඳ කතෝලික ජනතාව අතර වැරදි මත පතුරවමින් විමර්ශන කටයුතු අඩාළ කිරීමටත් අපක්ෂපාතීව විමර්ශන කරන නිලධාරීන්ව ඉවත් කිරීමටත් ප්‍රේමදාස කල්ලියේ පාර්ලිමේන්තු කණ්ඩායම උත්සාහයක නිරත වෙනවා.



රිෂාඩ් බදියුදීන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා නියෝජනය කරන්නේ සමගි ජනබලවේගයයි. අද රිෂාඩ් වෙනුවෙන් පෙනී සිටින මුජිබර් රහුමාන්, රාවුෆ් හකීම්, අබ්දුල් හලීම් යන අයත් සමගි ජනබලවේගයේ මන්ත්‍රීවරුන්. මුස්ලිම් පල්ලිවල කඩු තිබිල අහුවෙද්දි හලීම් මන්ත්‍රීවරයා කිව්වේ කඩු ගෙනාවේ තණකොළ කපන්න කියලයි. දැන් අපිට මේකෙන් පෙනෙන්නේ අත්අඩංගුවේ සිටින සැකකරුවන් වෙනුවෙන් පෙනී සිටින්නෙත් ඒවාට අනුබල දුන්න අය කියලයි.

ආණ්ඩුවේ කිසිදු අතපෙවීමකින් තොරව ස්වාධීනව සිදු කරන මෙම විමර්ශන නිසා ප්‍රේමදාස කල්ලියේ දැවැන්තයන් බියට පත් වෙලා. ඒ නිසයි ඔවුන් අද පාස්කු ප්‍රහාරයේ විමර්ශන කටයුතු අඩාල කිරීමේ කූඨ සැලැස්මක නියැලමින් සිටින්නේ. කතෝලික ඇමැතිවරයකු වශයෙන් මම ඉතා වගකීමෙන් කියනවා පාස්කු ප්‍රහාරයට සෘජුව හෝ වක්‍රව සම්බන්ධ සියලු දෙනාට තරාතිරම නොබලා දඬුවම් ලබා දීමෙන් කාදිනල් හිමිපාණන් ඇතුළු සමස්ත කතෝලික ප්‍රජාවට සාධාරණයක් ඉෂ්ට කරනවා කියලා.

මෙම අවස්ථාවට මහාමාර්ග අමාත්‍යාංශයේ ලේකම් ආර්.ඩබ්ලිව්.ආර්.පේමසිරි මහතා, රුවන්පුර අධිවේගී මාර්ගයේ අධ්‍යක්ෂිකා එච්.ජී.එන්. ප්‍රේමකාන්ති මහත්මිය ඇතුළු පිරිසක් සහභාගි වූහ.

# සුමන්තිරන් මන්ත්‍රීවරයා දේශපාලනයෙන් ලබා ගත් දේ විශාලයි

## හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී ඊස්වරනාදන් සරවනබවන්

**උතුරු පළාත් විශේෂ**

දෙමළ ජාතික සන්ධානය භේද බින්න කොට දේශපාලන පක්ෂවලට නැති බලයක් පෙන්වීමට කටයුතු කරන සුමන්තිරන් මන්ත්‍රීවරයා පක්ෂයෙන් ඉවත් කිරීමට නායකත්වය තීරණය කළ යුතු බව දෙමළ ජාතික සන්ධානයේ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී ඊස්වරනාදන් සරවනබවන් මහතා පසුගිය දා (28) පැවසීය.



යාපනයේ සිට දෙමළ මාධ්‍යයට අදහස් දක්වමින් ඒ මහතා මේ බව පැවසීය.

තවදුරටත් ඒ මහතා මෙසේද පැවසීය.

සුමන්තිරන් මන්ත්‍රීවරයා පටලවන නූල් සූත්තරවලට සම්පන්ධන් මන්ත්‍රීවරයා හැම දාම පැටලෙනවා. මේ නිසා දෙමළ ජාතික සන්ධානයට බොහෝ දේ අහිමි වී තිබෙනවා.

සුමන්තිරන් මන්ත්‍රීවරයා කොළඹ සිට යාපනයට පැමිණ දේශපාලනයේ නිරත වන්නේ ඔහුගේ පෞද්ගලික වාසි මත මිසක් ජනතාවට සේවය කිරීමට නොවෙයි.ඔහු පසුගිය කාලයේ ආණ්ඩු දෙකටම හොරෙන් සහයෝගය දිලා විවිධ දේ ලබා ගත්තා.ඔහුගේ දේශපාලන ජීවිතය තුළ ඔහු ජනතාවට ලබා දී ඇති දේට වඩා ඔහු ලබා ගෙන ඇති දේ විශාලයි.

දෙමළ ජාතික සන්ධානයේ හිටපු විශාල පිරිසක් පක්ෂය හැර දමා ගියේ සුමන්තිරන් මන්ත්‍රීවරයා නායකයාට ගතු කේලම් කීම නිසායි.ශිවාජිලිංගම්, ශ්‍රී කාන්තා, විග්නේස්වරන්, සුරේෂ් ප්‍රේමචන්ද්‍රන් වගේ අය පක්ෂයෙන් ඉවත් වුණේ මොහුගේ ක්‍රියා කලාපය නිසායි.

දෙමළ ජාතික සන්ධානයට කැප වීමෙන් කටයුතු කොට ඝාතනයට ලක් වූ නඩරාජා රවිරාජ්ගේ බිරිය ශෂිකලා රවිරාජ් මහත්මිය පසුගිය මහ මැතිවරණයේදී ප්‍රතිඵල අනුව ගොඩාක් ඉදිරියෙන් හිටියා. නමුත් විශාල ආරක්ෂක නිලධාරීන් පිරිසක් එක්ක ඇවිත් රවිරාජ්ගේ බිරියව බය කරලා අවසානයේ දී ඔහු ජය ගත්තා. මම මන්ත්‍රීවරයකු වශයෙන් කාලයක්ම පවත්වාගෙන ගිය දේශපාලන ජීවිතය විනාශ කළේත් සුමන්තිරන් මන්ත්‍රීවරයා බව කිවයුතුයි.

මේ නිසා ඔහුව පක්ෂයෙන් ඉවත් කරලා පක්ෂය බේරා ගන්න කියලා මම දෙමළ ජාතික සන්ධානයේ නායකයාගෙන් ඉල්ලා සිටිනවා.

### ජවිපෙ ජනතාවට නිතර බොරු කීමෙන්

# මන්ත්‍රී ධුර ගණනත් අඩු වෙමින් යනවා

## සීමාසහිත ස්වයංරැකියා නියුක්තිකයන්ගේ සම්මේලනයේ සභාපති

**අනුර ප්‍රේමලාල්**

දේශපාලන පළි ගැනීම් කොමිසමෙන් මාව නිදහස් කළා කියා ජනතා විමුක්ති පෙරමුණේ නායකයන් පැවැසීම අසත්‍යක් බවත් මාව නිදහස් කළේ අධිකරණය බව සීමාසහිත ස්වයංරැකියා නියුක්තිකයන්ගේ සම්මේලනයේ සභාපති කොළඹ නාගරික මන්ත්‍රී මහින්ද කහඳගමගේ මහතා පැවසිය.

ඒ මහතා මේ බව සඳහන් කෙළේ ඇන්.ඇම්.පෙරේරා අනුස්මරණ මධ්‍යස්ථානයට ස්වයංරැකියා නියුක්තිකයන්ගේ සම්මේලනය කැඳවා තිබූ මාධ්‍ය හමුවකට එක්වෙමිනි. එහිදි වැඩිදුරටත් අදහස් දැක්වූ සභාපතිවරයා මෙසේද පැවසීය.

පාර්ලිමේන්තු වරප්‍රසාදවලට මුවා වෙලා දේශාපලන පළි ගැනීම් කොමිසන් සභා වාර්තාව පිළිබඳ පසුගිය දිනවල පැවැති විවාදයේදී ජවිපෙ නායක අනුර කුමාර දිසානයක මහතා හා ජවිපෙ ප්‍රචාරක ලේකම් විජිත හේරත් මහතා මාධ්‍ය හමුවක් පවත්වා මා පිළිබඳ සිදු කළ ප්‍රකාශය තරයේ ප්‍රතික්ෂේප කරනවා. 2019 දෙසැම්බර් 20 වැනි දා මාව ගුරු අධිකරණය තමයි නිදහස් කළේ. මේවන විට ඇමැති වාසුදේව නානයක්කාර මහතා මඟින් අනුර කුමාර දිසානායක මහතාගෙන් මේ පිළිබඳ ප්‍රශ්නයක් ඇසීමට අපි කටයුතු යොදා තිබෙනවා. එමෙන්ම ජවිපෙ නායකයාටත් ලිපියක් මඟින් මේ ගැන දැනුම් දුන්නා. ඒ අය පාර්ලිමේන්තු වරප්‍රසාදවලට මුවාවෙලා මෙවැනි අසත්‍ය ප්‍රකාශ කළාම අපිට සිදුවන හානියට කොහොම ද සාධාරණයක් ඉටුවෙන්නේ. මම දේශපාලන පළිගැනීම් කොමිසමට ගියේ මට සි වු හානියට සාධාරණයක් ඉල්ලලයි.

මෙවැනි අසත්‍ය ප්‍රචාරයන් ජනතා විමුක්ති පෙරමුණ සිදු කළ නිසා තමයි ඒ අයගේ පාර්ලිමේන්තු මන්ත්‍රීධුර ගණන තුනට බැහැලා තිබෙන්නේ.

ස්වයංරැකියා නියුක්තිකයන්ගේ සම්මේලනයේ ගම්පහ දිස්ත්‍රික්ක සංවිධායක සංජීව ධම්මක හා කොළඹ දිස්ත්‍රික්ක සංවිධායක ධම්මික පීරිස් යන මහත්වරු ද මෙහිදි අදහස් දැක්වූහ.

# කොරෝනා තුන්වැනි රැල්ල වළක්වා ගන්න ආණ්ඩුව නිසි ක්‍රියා මාර්ග ගත්තේ නැහැ

## එජාප සභාපති කියයි

**ශිරෝමි අබයසිංහ**

සිංහල හින්දු අලුත් අවුරුදු සමයේ කොරෝනා වයිරසය ව්‍යාප්ත වීම වළක්වා ගැනීමට ආණ්ඩුව නිසි ක්‍රියාමාර්ග නොගත් නිසා මේ වනවිට කොරෝනා තුන්වැනි රැල්ල රට පුරා පැතිරී ජනතාව දැඩි පීඩාවන්ට පත්ව සිටින බව එක්සත් ජාතික පක්ෂයේ සභාපති හිටපු ඇමැති වජිර අබේවර්ධන මහතා ප්‍රකාශ කෙළේය.

වජිර අබේවර්ධන මහතා මෙම අදහස් පළ කෙළේ පසුගිය 25 වැනි දා, ගාල්ල රත්ගම ආසනයේ එජාප ක්‍රියාකාරීන් පිරිසක් සංවිධානය කළ අවුරුදු උත්සවයේ තරඟ ජයග්‍රාහක ජයග්‍රාහිකාවන් සඳහා ත්‍යාග ප්‍රධානය කිරීමේ අවස්ථාවට එක්වෙමිණි.

සෞඛ්‍ය පිළිවෙත්වලට අනුගත වෙමින් හික්කඩුව සෑම් හෝටලයේ පැවැති මෙම උත්සවය සංවිධානය කර තිබුණේ රත්ගම එජාප ප්‍රාදේශීය සභා මන්ත්‍රීධූර අපේක්ෂක ලෙස තරඟ කළ අජිත් මංගල, රත්ගම කොට්ඨාශ නියෝජිත එස්.ආර්. නානායක්කාර යන මහත්වරු ප්‍රමුඛ රත්ගම එජාප ක්‍රියාකාරීන් පිරිසක් විසිනි.

පැරණි ගීත හා බයිලා ගායනයට මුල් තැන දෙමින් මියුරු සංගීත නාද මධ්‍යයේ පැවැති මෙම උත්සවයේ තෑගි ප්‍රධානය කිරීමෙන් අනතුරුව තවදුරටත් අදහස් දැක්වූ වජිර අබේවර්ධන මහතා මෙසේද පැවසීය.

පසුගිය කාලයේ එක් කොරෝනා රෝගියෙක් හමුවූ විට රට වසා දැමූ ආණ්ඩුව රෝගීන් දහස් ගණනක් හමුවන විට රට වසා නොදැමූවේ මන්දැයි ප්‍රශ්න කළ යුතුයි. මේ අනුව පැහැදිලි වන්නේ ආණ්ඩුව ක්‍රියාත්මක කර ඇති මුල් පියවර හෝ එහෙමත් නැතිනම් දෙවැනි පියවර වැරදි සහගත බවයි.

පසුගිය කාලයේ කොරෝනා වැළඳුණු එක් රෝගියෙක් හෝ කිහිපදෙනෙක් හමුවූවිට රට වසා තැබුවා. නමුත් දහස් ගණනක් රෝගීන් හමුවන විට එවැනි ක්‍රියාමාර්ගයක් අනුගමනය කළේ නැහැ. මේ සම්බන්ධව ගැටලු ගණනාවක් මතුව තිබෙනවා. මෙමඟින් පැහැදිලි වන්නේ ආණ්ඩුව ගත් මුල් පියවර වැරදියි, එසේත් නැතිනම් දෙවැනි පියවර වැරදි බවයි.

සිංහල හින්දු අලුත් අවුරුදු සමයේදී කොරෝනා පැතිරීමට ඉඩ හැර බලා සිටියා. මේ ගැන ආණ්ඩුවට නිසි කළමණාකාරීත්වයක් තිබුණේ නැහැ. මේ නිසා අද වනවිට රට පුරා කොරෝනා තුන්වැනි රැල්ල ව්‍යාප්ත වී ජනතාව දැඩි පීඩාවන්ට මුහුණ පා සිටිනවා.

මේ ප්‍රදේශවල බොහෝ දෙනෙක් සංචාරක ව්‍යාපරය ආශ්‍රිතව ආදායම් මාර්ග සකසාගෙන තිබුණා. නමුත් මේ වනවිට සංචාරක ව්‍යාපාරය මුළුමනින්ම කඩාවැටී තිබෙනවා. හෝටල් විවෘතව පැවතුනත් සංචාරකන් පැමිණෙන්නේ නැහැ. මේ තත්ත්වය නිසා විශාල පිරිසක් අද තම අදායම් මාර්ග අහිමිව අන්ත අසරණ තත්ත්වයට පත්ව සිටිනවා.

රටේ සංචාරක ව්‍යාපාරය කඩාවැටීමත් සමඟ ඒ ආශ්‍රිතව විවිධ රැකියා හා වෙනත් කටයුතු කරගෙන ජීවත් වූ ලක්ෂ 20 කගේ පමණ රැකියා ආදායම් මාර්ග මුළුමනින්ම කඩාවැටී තිබෙනවා. මේ අය තම දරු පවුල් ජීවත් කරවීමට නොහැකිව දැඩි අසරණ තත්ත්වයට පත්ව තිබෙනවා. ආණ්ඩුවක යුතුකම හා වගකීම වන්නේ මේ ජනතාවට උදව් උපකාර කිරීමයි. නමුත් එවැන්නක් මේ ආණ්ඩුවෙන් සිදුවන්නේ නැති බව කිව යුතුයි.





# ‘ශ්‍රී ලංකා ග්‍රේට්ස් ලෙවන්ස්’ හා ‘ටීම් ශ්‍රී ලංකා’ තරගයෙන් ලැබෙන රු. කෝටි 2ක ආදායම කොරෝනා එන්නත් මිල දී ගැනීමේ අරමුදලට



## කණ්ඩායම් දෙකේ නායකත්වය සනත්ට හා දසුන්ට

**ප්‍රින්ස් ගුණසේකර**

ශ්‍රී ලංකා ජාතික කණ්ඩායමේ හිටපු ක්‍රීඩකයන්ගෙන් සමන්විත කණ්ඩායම හා ශ්‍රී ලංකා ක්‍රිකට් පුහුණු සංචිතවල සිටින ක්‍රීඩකයන්ගෙන් සැදුම්ලත් කණ්ඩායම අතර, ලබන 4 වැනිදා පල්ලේකැලේ අන්තර්ජාතික ක්‍රීඩාංගණයේ විදුලි ආලෝක ධාරා මැද පැවැත්වෙන විස්සයි20 තරගයේ සම්පූර්ණ ආදායම කොරෝනා එන්නත් මිලදී ගැනීමේ අරමුදලට පිරිනමන ලෙස ක්‍රීඩා හා තරුණ කටයුතු ඇමැති නාමල් රාජපක්ෂ මහතා ශ්‍රී ලංකා ක්‍රිකට් වෙත දැනුම් දෙයි. ක්‍රීඩා අමාත්‍යාංශ එළිමහන් පරිශ්‍රයේ ඊයේ පැවැති මාධ්‍ය හමුවකදී ඇමැතිවරයා පැවසුවේ නරඹන්නන් නැතිව පැවැත්වෙන මේ තරගය ලොව පුරා විකාශනය කිරීමට සෝනි රූපවාහිනී විකාශන ආයතනය මිලදී ගෙන ඇති බවත් තවත් අනුග්‍රාහක ආයතන කිහිපයකින් ද ලැබෙන සියලු මුදල් කොරෝනා එන්නත් මිළදී ගැනීමේ අරමුදලට බැර කරන බවත් ය.

මේ තරගයෙන් දළ වශයෙන් අමෙරිකානු ඩොලර් ලක්ෂයක (රුපියල් කෝටි 2ක් පමණ) මුදලක් කොරෝනා එන්නත් මිලදී ගැනීමේ අරමුදලට දිය හැකි වනු ඇතැයි ක්‍රිකට් කළමනාකරණ කමිටු සභාපති මහාචාර්ය අර්ජුන ද සිල්වා මහතා අප කළ විමසීමකදී පැවසීය. රූපවාහිනී විකාශන සමාගමෙන් හා අනෙකුත් අනුග්‍රාහකයන්ගෙන් රුපියල් කෝටි 2ක පමණ මුදලක් ලැබෙනු ඇතැයි සිල්වා මහතා තහවුරු කළේය.

ශ්‍රී ලංකා ජාතික කණ්ඩායමේ හිටපු ක්‍රීඩකයන්ගෙන් සමන්විත කණ්ඩායම සනත් ජයසූරියගේ නායකත්වයෙන් පිටියට පිවිසෙන අතර එය ‘ශ්‍රී ලංකා ග්‍රේට්ස් ලෙවන්ස්’ ලෙස නම් කොට තිබේ. දසුන් ශානකගේ නායකත්වයෙන් ශ්‍රී ලංකා ක්‍රිකට් පුහුණු සංචිතවල සිටින ක්‍රීඩකයන්ගෙන් සැදුම්ලත් කණ්ඩායම ‘ටීම් ශ්‍රී ලංකා’ ලෙස නම් කර ඇත.

ශ්‍රී ලංකා ජාතික කණ්ඩායමේ හිටපු ක්‍රීඩකයන්ගෙන් සමන්විත ‘ශ්‍රී ලංකා ග්‍රේට්ස් ලෙවන්ස්’ කණ්ඩායමට අරවින්ද ද සිල්වා බොහෝ දුරට ක්‍රීඩා කරනු ඇතැයි සඳහන් වේ. නුවන් කුලසේකර, සමන් ජයන්ත, තිලාන් තුෂාර, ධම්මික ප්‍රසාද්, උපුල් තරංග, අජන්ත මෙන්ඩිස්, මලින්ත වර්ණපුර, උපුල් චන්දන, ඉන්දික ද සේරම්, චාමර සිල්වා හා චාමර කපුගෙදර එක් වෙති.

ශ්‍රී ලංකා ක්‍රිකට් පුහුණු සංචිතවල සිටින ක්‍රීඩකයන්ගෙන් සැදුම්ලත් ‘ටීම් ශ්‍රී ලංකා’ කණ්ඩායමට භානුක රාජපක්ෂ, අවිශ්ක ප්‍රනාන්දු, කුසල් ජනිත් පෙරේරා, තිසර පෙරේරා, ඉසුරු උදාන, සදීර සමරවික්‍රම, ෂිරාන් ප්‍රනාන්දු, විජේකාන්ත් වියස්කාන්ත්, ධනංජය ලක්ෂාන්, මහේෂ් තික්ෂණ, මොහොමඩ් ෂිරාස්, අශේන් බණ්ඩාර හා රමේෂ් මෙන්ඩිස් ක්‍රීඩා කරති.

මේ තරගය ඉන්දියාවේ සංචාරය කළ ශ්‍රී ලංකා ලෙජන්ඩ්ස් හා ජාතික පිලේ ක්‍රීඩකයන් කිහිප දෙනකු සහභාගි වන තරගයක් ලෙස පැවැත්විය යුතු බවට කලින් මත පළ වුවද පසුව එය ශ්‍රී ලංකා පිලේ සම්බන්ධයකින් තොරව පැවැත්විය යුතු බවට මත පළ විය. මේ තරගයට ටී.එම්. ඩිල්ෂාන් සහභාගි නොවනු ඇති බවත් එයට හේතුව ඔහු ඉන්දියාවේ පැවැති තරගාවලියෙන් අනතුරුව ශ්‍රී ලංකාවේදී හා දැනට පදිංචි ඔස්ට්‍රේලියාවේ දින 14 බැගින් නිරෝධායනය වීම බවත් ක්‍රිකට් කළමනාකරණ කමිටු සභාපතිවරයා පැවසීය.

ශ්‍රී ලංකා ජාතික කණ්ඩායමේ හිටපු ක්‍රීඩකයන්ගෙන් සමන්විත ‘ශ්‍රී ලංකා ග්‍රේට්ස් ලෙවන්ස්’ කණ්ඩායම මේ දිනවල කොළඹ එස්එස්සී පිටියේ පුහුණුවීම් සිදු කරන අතර, එම පුහුණුවීම් හිටපු ටෙස්ට් නායකයකු වන හෂාන් තිලකරත්න යටතේ සිදු කෙරේ.



# පාසල් වසා දමා ඇති සමයේ දරුවන් ව්‍යායාම්වල යොදවන්න

## වැඩසටහන් හදන්න රූපවාහිනී ආයතනවලට ඇමැතිගෙන් ආරාධනා

**ප්‍රින්ස් ගුණසේකර**

රට තුළ කොරෝනා වයිරස ව්‍යාප්තිය හේතුවෙන් පාසල් වසා දමා ‘ඔන්ලයින්’ ක්‍රමයට අධ්‍යාපනය ලබන දරුවන් දවසේ පැයක් තුළ ව්‍යායාම්වල යොදවන ලෙසත් ඒ සඳහා වැඩ සටහන් සම්පාදනය කිරීමට රූපවාහිනී ආයතන පියවර ගැනීම වැදගත් බවත් ක්‍රීඩා ඇමැති නාමල් රාජපක්ෂ මහතා පවසයි. ශ්‍රී ලංකාව දකුණු ආසියාවේ ක්‍රියාශීලීම රට බවට පත් කිරීමේ වැඩ පිළිවෙළ සාර්ථක කර ගැනීමට නම් සියලු පුරවැසියන් ව්‍යායැම්වලට හුරු වීම වැදගත් බව ඒ මහතා සඳහන් කර සිටී.

ක්‍රීඩා ඇමැතිවරයා මේ බව පැවසුවේ ක්‍රීඩා අමාත්‍යාංශ එළිමහන් පරිශ්‍රයේදී ඊයේ පැවැති මාධ්‍ය හමුවකදීය.

“කොරෝනා වසංගතය හේතුවෙන් නැවැත පාසල් වසා දමා තිබෙනවා. ඇතැම් ග්‍රාම නිලධාරී වසම් හුදෙකලා කිරීමට සිදු වීමෙන් ජනතාව නිවෙස්වල කොටු වී සිටිනවා. ක්‍රීඩා අමාත්‍යාංශය විදිහට අපේ උත්සාහය ජව සම්පන්න සමාජයක් නිර්මාණය කිරීමට. ඒ වගේම ක්‍රියාශීලී රටක් හදන්න. අපේ ඉලක්කය දකුණු ආසියාවේ ක්‍රියාශීලීම රට බවට අපේ රට පත් කරන්න. ඒ අරමුණ කරා යද්දී බෝ නොවන රෝගවලින් වැළකී සිටීමට හැකියි. ඒ වගේම විනයානුකූල සමාජයක් ගොඩනගා ගැනීමට මේ තුළින් හැකියාව ලැබෙනවා” ඇමැතිවරයා පැවසීය.

මේ හේතුවෙන් උදෑසන හෝ සවස් කාලයේ දරුවන්ගේ ව්‍යයැම් සඳහා අවශ්‍ය වැඩසටහන් කිහිපයක් මාධ්‍ය ආයතන සකස් කරන්නේ නම් එය විශාල මෙහෙවරක් වනු ඇතැයි ඇමැතිවරයා විශ්වාසය පළ කළේය. දැනට ජාතික සංචිතවල සිටින ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ දායකත්වය ඇතිව අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරවන සමාජ මාධ්‍ය ඔස්සේ උදෑසන දරුවන්ගේ ව්‍යයැම් සඳහා අවශ්‍ය වැඩසටහන් කිහිපයක් ප්‍රචාරය කිරීමට කටයුතු යොදා ඇතැයිද ක්‍රීඩා ඇමැතිවරයා සඳහන් කළේය.

“මාධ්‍ය ආයතනවලටත් මා ආරාධනා කරනවා දරුවන්ට නිවෙසේ සිට ව්‍යායැම්වල යෙදිය හැකි වැඩ සටහන් සම්පාදනය කොට ඒ සඳහා දායකත්වය දෙන ලෙස. මවුපියන්ගෙන් ඉල්ලා සිටින්නේ ‘ඔන්ලයින්’ ක්‍රමයට දරුවා අධ්‍යාපනය හදාරමින් සිටිද්දී උදෑසන හෝ සවස පැයක කාලයක් දරුවා වයායැම් සඳහා යොමු කරන ලෙසයි” නාමල් රාජපක්ෂ මහතා සඳහන් කළේය.

# ශ්‍රී ලංකා පිලෙන් දස වසරකට පසු පළමු කඩුල්ලට ද්විත්ව ශතක සබඳතාවක්

## දිමුත් 118: තිරිමාන්න නොදැවී 131යි



වසර 10කට පසු පළමු කඩුල්ලට ද්විත්ව ශතකය සබඳතාවක් එක්කරමින් නායක දිමුත් කරුණාරත්න සහ ළහිරු තිරිමාන්න ගොඩනැගූ විශිෂ්ට සබඳතාව හේතුවෙන් ඊයේ පල්ලේකැලේ ක්‍රීඩාංගණයේදී සංචාරක බංග්ලාදේශ කණ්ඩායමට එරෙහිව ආරම්භ වූ දෙවැනි ටෙස්ට් තරගයේ පළමු දිනය නිමා වන විට ශ්‍රී ලංකා පිල පළමු ඉනිම සඳහා කඩුල්ලක් දැවී ලකුණු 291ක් රැස් කර ගෙන සිටියේය.

ක්‍රීඩාව නතර කරන විට ළහිරු තිරිමාන්න ලකුණු 131ක් සහ ඕෂධ ප්‍රනාන්දු ලකුණු 40ක් රැස් කරමින් නොදැවී කඩුල්ලේ රැඳී සිටියහ. දෙදෙනා අතර, දෙවැනි කඩුල්ලට ගොඩනැගී තිබු නොබිඳුණු සබඳතාව ලකුණු 82කි.

පන්දු 253කට මුහුණ දුන් තිරිමාන්න හතරේ පහර 14ක් එල්ල කර තිබූ අතර, හතරේ පහර 4ක් සමගින් ඕෂධ පන්දු 98කට මුහුණ දී තිබිණි.

තිරිමාන්න ඊයේ රැස් කළේ තෙවැනි ටෙස්ට් ශතකයයි. කාසියේ වාසිය දිනාගත් ශ්‍රී ලංකා පිල වෙනුවෙන් ඉනිම ඇරඹූ නායක දිමුත් කරුණාරත්න සහ ළහිරු තිරිමාන්න පළමු කඩුල්ලට ලකුණු 209ක සබඳතාවක් ගොඩනැගීමට සමත් වූහ.

තරගයේ දිවා විවේකය වන විට ලකුණු 66ක් (ඕවර 27) පමණක් රැස් කළ මේ පිතිකරුවන් දෙදෙනා අනතුරුව සවස තේ පානය වන තෙක් යැවූ ඕවර 31 තුළින් ලකුණු 122ක් රැස් කිරීමට සමත් වූහ. තේ පානයෙන් පසුව යැවූ 6 වැනි ඕවරයේ පළමු පන්දුවෙන් කරුණාරත්න දැවී ගියේ ෂොරිෆුල් ඉස්ලාම්ට මංගල ටෙස්ට් කඩුල්ල අත් කර දෙමිනි. පන්දු 190කට මුහුණ දුන් ඔහු හතරේ පහර 15ක් සමගින් ලකුණු 118ක් රැස් කළේ 12 වැනි ටෙස්ට් ශතකය ලෙසිනි.

දිමුත් ඊයේ ලකුණු 8ක් රැස් කිරීමත් සමග ටෙස්ට් ලකුණු 5000 සීමාවට පිවිසි අතර, මේ සීමාවට පිවිසි 10 වැනි ශ්‍රී ලාංකික පිතිකරු ඔහුය.

මේ දෙදෙනා පළමු කඩුල්ලට එක් කළ ලකුණු 209 ශ්‍රී ලංකා ක්‍රිකට් ඉතිහාසයට එක් වූයේ වසර 10කට පසු පළමු කඩුල්ලට ගොඩනැගූ ද්විත්ව ශතක සබඳතාව ලෙසිනි. ශ්‍රී ලංකාව වෙනුවෙන් අවසන් වරට පළමු කඩුල්ලට ද්විත්ව ශතක සබඳතාවක් ගොඩනගා තිබුණේ 2011 වසරේදීය. ඒ තිලකරත්න ඩිල්ෂාන් සහ තරංග පරණවිතාන ලෝඩ්ස් ක්‍රීඩාංගණයේදී එංගලන්තයට එරෙහිව එක් කළ ලකුණු 207යි.

**ශ්‍රී ලංකා පළමු ඉනිම**

| | |
|---|---|
| ඩී. කරුණාරත්න ඇ.දාස් ප.ෂොරිෆුල් | 118 |
| එල්. තිරිමාන්න නොදැවී | 131 |
| ඕ. ප්‍රනාන්දු නොදැවී | 40 |
| අතිරේක | 2 |
| **එකතුව කඩුල්ලක් දැවී (ඕවර 90)** | 291 |

**කඩුලු බිඳ වැටීම:** 1-209

**පන්දු යැවීම:** ජායිද් 16-3-47-0, අහමඩ් 17-3-69-0, හසන් 22-4-67-0, ෂොරිෆුල් 16-3-52-1, තයිජුල් 19-2-56-0.

එමෙන්ම පළමු කඩුල්ල වෙනුවෙන් ශ්‍රී ලංකාව වෙනුවෙන් වාර්තා වූ තෙවැනි හොඳම සබඳතාව ලෙස ද මෙය වාර්තා පොතට එක් විය. සනත් ජයසූරිය සහ මාවන් අතපත්තු 2000 වසරේ පාකිස්තානයට එරෙහිව රැස් කල ලකුණු 335 පළමු කඩුල්ලේ ඉහළම සබඳතාව ලෙස වාර්තා වන අතර, ඔවුන් දෙදෙනාම එක්ව 2004 වසරේ සිම්බාබ්වේ පිලට එරෙහිව ගොඩනැගූ ලකුණු 281 දෙවැනි ඉහළම සබඳතාවයි.

මේ තරගයේදී ශ්‍රී ලංකාව වෙනුවෙන් 22 හැවිරිදි ප්‍රවීන් ජයවික්‍රම ටෙස්ට් වරම් දිනාගත් අතර, බංග්ලාදේශය වෙනුවෙන් ෂොරිෆුල් ඉස්ලාම් ද ටෙස්ට් වරම් දිනා ගත්තේය. ප්‍රවීන් ශ්‍රී ලංකාව වෙනුවෙන් ටෙස්ට් වරම් ලැබූ 156 වැනි ක්‍රීඩකයායි.

ශ්‍රී ලංකා පිල වෙනස්කම් දෙකක් සිදු කරමින් ප්‍රවීන් සමග රමේෂ් මෙන්ඩිස් කණ්ඩායමට කැඳවා තිබුණේ ආබාධයකට ලක් වූ ළහිරු කුමාර සහ වනිඳු හසරංග වෙනුවටය.

*අද තරගයේ දෙවැනි දිනයයි.*

# දේශීය තරග පාවා දීමේ සිද්ධියක් ගැන ශ්‍රී ලංකා ක්‍රිකට් කළමනාකරුවකුගෙන් අයිසීසී දූෂණ මර්දන නිලධාරීහු ප්‍රශ්න කරති

**ප්‍රින්ස් ගුණසේකර**

ශ්‍රී ලංකා ක්‍රිකට් දේශීය තරගාවලි සංවිධාන අංශයේ නියෝජ්‍ය කළමනාකාරවරයකු අන්තර්ජාතික ක්‍රිකට් කවුන්සිලයේ දූෂණ මර්දන අංශයේ නිලධාරීන් භාරයට ගෙන ප්‍රශ්න කරයි. ඔහුගේ ජංගම දුරකතනය ද අයිසීසී දූෂණ මර්දන අංශයේ නිලධාරීන් බාරයට ගෙන එහි දත්ත විශ්ලේෂණයට ඉදිරියේදී කටයුතු සිදු වේ.

මෙරට පැවැති තරගාවලියකදී සිදු වූයේ යැයි කියන තරග පාවාදීමේ සිද්ධියක් ඔස්සේ අයිසීසී දූෂණ මර්දන අංශයේ නිලධාරීන් පරීක්ෂණ පවත්වන අතර, කොළඹ ප්‍රධාන හෝටලයකදී අදාළ නිලධාරියාගෙන් ප්‍රශ්න කර ඇත. මෙලෙස ප්රශ්න කළ නිලධාරියාට මීට පෙර ද මෙවැනි චෝදනා එල්ල වී තිබූ අතර, එම කිසිදු චෝදනාවකට අයිසීසිය වැරදිකරුවකු බවට පත් කොට නොතිබිණි. මේ ආකාරයෙන් ප්‍රශ්න කිරීමට ලක් වීම ශ්‍රී ලංකා ක්‍රිකට් ප්‍රතිරූපයට හානි කර බවත් මේ සම්බන්ධයෙන් අභ්‍යන්තර විනය පරීක්ෂණයක් පවත්වන බව ශ්‍රී ලංකා ක්‍රිකට් පරිපාලන කමිටු සභාපති මහාචාර්ය අර්ජුන ද සිල්වා මහතා ‘දිනමිණ’ට පැවසීය.

“මේ පුද්ගලයා ස්ථිර සේවකයෙක්. ඔහු සම්බන්ධ අයිසීසිය වෙනම පරීක්ෂණයක් සිදු කොට අවශ්‍ය පියවර ගනියි. ඒ මොනවා වුණත් ආයතන මට්ටමින් පරීක්ෂණයක් කර අවශ්‍ය උපරිම ක්‍රියා මාර්ග ගන්නවා” මහාචාර්යවරයා පැවසීය.

ශ්‍රී ලංකා හිටපු වේග පන්දු යවන ක්‍රිකට් ක්‍රීඩක නුවන් සොයිසාට ක්‍රිකට් සම්බන්ධ සියලු ක්‍රියා සම්බන්ධයෙන් වසර 06 ක තහනමක් අන්තර්ජාතික ක්‍රිකට් කවුන්සිලය විසින් පෙරේදා පැන වීය. අන්තර්ජාතික ක්‍රිකට් කවුන්සිලයේ දූෂණ විරෝධී නීති සංග්‍රහය උල්ලංඝනය කිරීමේ චෝදනාවට ඔහු වරදකරුවකු වීම හේතුවෙන් මේ තහනම ඔහුට පනවා ඇත.

## පල්ලේකැලේ තණතීරුවට දඬුවම් ලකුණක්

ශ්‍රී ලංකාව සහ බංග්ලාදේශය අතර පළමු ටෙස්ට් තරගය පැවැති මහනුවර පල්ලේකැලේ ක්‍රීඩාංගණයේ තණතීරුව නියමිත ප්‍රමිතියට නොතිබූ බව පවසන ජගත් ක්‍රිකට් කවුන්සිලය මේ හේතුවෙන් එම ක්‍රීඩාංගණයට එරෙහිව දඬුවම් ලකුණක් (demerit point) පැනවීමට ද කටයුතු කර තිබේ.

එම තරගයේ තරග තීරකවරයා ලෙස කටයුතු කළ රංජන් මඩුගල්ල මහතා විසින් මේ බව තීරණය කර ඇති අතර, ඔහු සඳහන් කර ඇත්තේ දින පහක් තුළ තණතීරුවේ ස්වාභාවය වෙනස් වී නැති බවත් එම තරගයේදී පිතිකරණය සහ පන්දු යැවීම අතර සමබරතාවේ වෙනසක් සිදු නොවූ බවත්ය. මේ තරගයේදී එක් කඩුල්ලක් සඳහා ලකුණු සාමාන්‍ය 75.82ක් ලෙස සටහන් වූ බවත්, එය ඉතා ඉහළ මට්ටමක් බැවින්, අයිසීසීයේ මාර්ගෝපදේශයන්ට අනුකූලව මේ තණතීරුව සාමාන්‍ය තත්ත්වයට වඩා අඩු අගයක් ගන්නා බවට නියම කරන බවත්ය. මේ ක්‍රීඩාංගණයට හිමි වූ දඬුවම් ලකුණ වසර 5ක කාලයක් වලංගු වන අතර, එම ප්‍රමාණය 5 හෝ ඊට වඩා වැඩි වන විට අදාළ ක්‍රීඩාංගණයේ ජගත් තරග සංවිධාන කිරීම ජගත් ක්‍රිකට් කවුන්සිලය විසින් මාස 12කට අත්හිටුවීමට කටයුතු කරනු ලැබේ.



රුතුරාජ් ගයික්වාඩ්

## චෙන්නායි උඩ එයි

**අයිපීඑල් ක්‍රිකට් තරගාවලියේ ප්‍රසාද ලකුණු සටහනේ පෙරමුණ ගැනීමට මහේන්ද්‍ර සිං දෝනිගේ නායකත්වයෙන් යුත් චෙන්නායි සුපර් කිංග්ස් පිල සමත් වෙයි.**

**තරගාවලියේ 23 වැනි තරගයෙන් සන්රයිසස් හයිද්‍රාබාද් පිලට එරෙහිව කඩුලු 7ක් ජයක් සමගින් චෙන්නායි පිල (10) පෙරමුණට පිවිසියේය. චෙන්නායි පිල තරග 6කදී හිමිකරගත් 5 වැනි ජය මෙය වන අතර, හයිද්‍රාබාද් පිල ලැබූ 5 වැනි පරාජය ද මෙයයි. දිල්ලිහිදී පැවැති තරගයේ පළමුව පන්දුවට පහර දුන් හයිද්‍රාබාද් පිල ලකුණු 171ක් රැස් කළ අතර, චෙන්නායි පිල එම ඉලක්කය පසු කළේ එම ඉලක්කය හඹා ගිය චෙන්නායි පිල පන්දු 9ක් ඉතිරිව තිබියදී ජය හිමි කර ගත්තේ කඩුලු 3ක් පමණක් අහිමි කර ගනිමිනි.**

# රග්බි ආයතනය ප්‍රජා සේවයට අත තබයි

**ෆවුස් මොහොමඩ්**

කොරෝනා වසංගතයේ ව්‍යාප්තිය හේතුවෙන් දුෂ්කරතාවට මුහුණ පා සිටින මෙරට ජනතාව වෙනුවෙන් ආසියානු පැසිෆික් ආපදා කළමනාකරණ සංවිධානය හා එක්ව ආපදා අවදානම පිළිබඳ ජනතාව දැනුවත් කිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට ශ්‍රී ලංකා රග්බි ආයතනය සැලසුම් කර තිබේ. එය මෙරට ක්‍රීඩා සංගමයක් විසින් මෙහෙවනු ලබන පළමු ප්‍රජා සංවර්ධනය වැඩසටහන ලෙස ඉතිහාසයට එක් වනු ඇත.



රග්බි සභාපති රිස්ලි ඉල්යාස්

ජපාන රාජ්‍ය නොවන සංවිධානයක් වන ආසියානු පැසිෆික් ආපදා කළමනාකරණ සංවිධානයේ මෙරට අධ්‍යක්ෂ ෆිර්සාන් හෂීම් මහතා මේ සඳහා දායකත්වය දීමට ඉදිරිපත් වූ බව ශ්‍රී ලංකා රග්බි ආයතනයේ සභාපති රිස්ලි ඉල්යාස් මහතා ‘දිනමිණ’ට කීවේය.

රග්බි ක්‍රීඩාව ව්‍යාප්ත වූ මෙරට විවිධ පළාත්වල ක්‍රීඩා ආචාර්යවරුන් සඳහා පැවැත්වීමට නියමිත මේ වැඩසටහනට නාය යෑම් වැනි විවිධ ව්‍යසනවලදී කටයුතු කළ යුතු ආකාරය පිළිබඳ අවබෝධයක් දීම, ආපදාවලදී ආරක්ෂාකාරිව හා සාර්ථකව මුහුණදෙමින් දෛනික ජීවිතය පවත්වාගෙන යෑමේ හැකියාව වර්ධනය කිරීම ඇතුළු කරුණු රැසක් ඇතුළත් ය.

ලෝක රග්බි සම්මේලනය හා ආසියානු රග්බි සංගමය විසින් ඉදිරිපත් කර ඇති Get Into Rugby වැඩසටහනට අනුකූලව ප්‍රථමාධාර වැඩමුළු සහිත මේ වැඩසටහන දින තුනක් පුරා පැවැත්වෙන අතර, අවසානයේ වටිනා සහතික පත්‍රයක් පිරිනමමින් රග්බි ආචාර්යවරුන්ට අතිරේක සුදුසුකමක් දීමට ද නියමිත බව රග්බි සභාපතිවරයා කීවේය.

මීට අමතරව ග්‍රාමීය පළාත්වල රග්බි ක්‍රීඩාවේ නිරතව දරුවන්ගේ ඉංග්‍රීසි භාෂා වර්ධනය කිරීමේ අරමුණින් වයිෆයි අන්තර්ජාලා පහසුකම්, පරිඝනක ලබා දෙමින් ඔවුන්ට නව තාක්ෂණය පිළිබඳ මූලික දැනුම දීමටත් කටයුතු යොදා තිබේ. ඉදිරි මාස 6ක කාලය ඇතුළත උතුරු හා නැගෙනහිර පළාත්වල පාසල් 60ක් ඉලක්ක කරමින් එවැනි වැඩසටහන ක්‍රියාත්මක වන බව ඉල්යාස් මහතා සඳහන් කළේය.

සෑම වැඩසටහනකටම දරුවන් 200ක් ඇතුළත් කර එමගින් රග්බි ක්‍රීඩාවට පාසල් දරුවන් තුන්දහසක් එක් කර ගැනීම රග්බි ආයතනයේ අපේක්ෂාව වී ඇත.

කොරෝනා වසංගතයේ තුන්වැනි රැල්ලේ අවදානම ව්‍යාප්ත වීමට පෙර මෙරට සත් සාමාජික රග්බි තරගාවලියක් පැවැත්වීමට තිබූ අවස්ථාව මග හැරී යෑම කනගාටුදායක කරුණක් බව කී රග්බි සභාපතිවරයා, ක්‍රීඩා හා තරුණ කටයුතු ඇමැති නාමල් රාජපක්ෂ මහතාගේ අතිශය වැදගත් රග්බි සංකල්ප ක්‍රියාත්මක කිරීමේ අරමුණින් රග්බි ආයතනය විසින් කරනු ලැබූ විවිධ උත්සාහයන් ක්‍රීඩා අමාත්‍යාංශයේ ඇතැම් නිලධාරීන්ගේ වගකීම් විරහිත ක්‍රියාකලාපය හේතුවෙන් ව්‍යර්ථ වී ගිය බව කීවේය.

“ක්‍රීඩා අමාත්‍යාංශයේ නිලධාරින් මීට වඩා නම්‍යශීලී විය යුතුව තිබෙනවා. රග්බි ක්‍රීඩාව සිවුවැනි මට්ටමේ අවදානම් සහිත ක්‍රීඩාවක් ලෙස සෞඛ්‍ය නිර්දේශ මත අධ්‍යාපන අමාත්‍යාංශය නම් කරනු ලැබුවත් දැඩි සෞඛ්‍ය නීතිරෙගුලාසි මැද අපට ගුවන් හමුදාව හා එක්ව සත් සාමාජික රග්බි තරගාවලියක් පැවැත්වීමේ හැකියාව තිබුණා. එහෙත් ඒ සඳහා යටිතල පහසුකම් සංවිධාන කිරීමට ගුවන් හමුදාව අසමත් වීමත්, අවසන් මොහොතේ අනුග්‍රාහක සමාගම තරගාවලියෙන් ඉවත්වීමත් ඊට බලපෑවා.” ඔහු පැවසීය.

“ක්‍රීඩා ඇමැතිවරයාට රග්බි ක්‍රීඩාවේ දියුණුව ගැන විශාල දැක්මක් තිබෙනවා. එහෙත් නිලධාරීන්ට එවැනි අවබෝධයක් නෑ. මෙවැනි වසංගත තත්ත්වයකදී ක්‍රීඩාව සහ ක්‍රීඩකයන් වෙනුවෙන් කළ හැකි කාර්යභාරය ගැන ඇමැතිවරයා සමඟ සාකච්ඡා කිරීමට සංගමයක් විදිහට අපි අවස්ථාවක් ඉල්ලා සිටියා. එහෙත් ක්‍රීඩා අමාත්‍යාංශයේ නිලධාරීන් ඒ ඉල්ලීම මගහැරියා.” ඉල්යාස් මහතා කියා සිටියේය.

# අහස්ගව්ව

## වින්දනීය සිනමාවේ වර්තමාන කියවීම



**ඔබගේ රුව මාගේමයි**
**සතුටේ මල් පීදේමයි**
**පෙර මග මුතු පෑදේමයි**
**කිරි පැණි සේ පෑහේමයි**

**ඔබගේ හද මාගේමයි**
**කතරේ මල් පීදේමයි**
**නොවිඳපු සුව සෑදේමයි**
**රන්රස සේ පෑහේමයි**

චිත්‍රපටය - හරිම බඩු තුනක් (1976)

# වසරකට පෙර නික්ම ගිය සරදියෙල්ගේ පුතා

## ඇලෙක්සැන්ඩර් ප්‍රනාන්දු

වර්තමානය වන විට ලාංකේය සිනමාවට ආදේශ කළ යුතු චරිතයන් බොහොමයක්ම තිබේ. සරලව කියන්නේ නම් පෙම්වතාගේ පෙම්වතියගේ සිට වීරයා දක්වා ද දුෂ්ටයා දක්වාත් සියලු චරිතයන් මේ මොහොතේ අප සිනමාවට හිඟ පාඩු චරිතයන්ය. එවන් වූ චරිතයන් මේ මොහොතේ ලාංකේය සිනමා පටයන්හි දක්නට නොලැබෙන්නේ කවර කරුණක් නිසාදැයි විශ්ලේෂණය කිරීම පසෙක තැබීම වටී. මන්ද අතීත සිනමාව තුළ ස්වර්ණමය ලෙසින් තම හැකියාවන් දිගහැරි චරිතයන් පිළිබඳ කතාබහ කිරීම ඊටත් වඩා ඵලදායි වන නිසා ය. නළුවකු, පෙම්වතකු, වීරයකු යැයි කිව හැකි චරිත වර්තමානයේ දී සොයාගත හැකි වන්නේ අතළොස්සකි. නමුත් පසුගිය වසරේ ලාංකේය සිනමාවට පිරිපුන් සිනමාවක් බිහිකරලීම උදෙසා තම දායකත්වය සැපයූ චරිතයක් තම ජීවන රඟමඬලින් බැස ගියේය. ඔහු ඇලෙක්සැන්ඩර් ප්‍රනාන්දුය. එසේත් නැත්නම් හිතමිත්‍රයන් රසිකයන් කවුරුත් හඳුනන ඇලෙක්ස්ය.

ප්‍රේක්ෂකයන්ගේ විසිල් හඬ මැද්දේ දුෂ්ටයන්ට දුවන්නට පහර දුන් වීරයා, ජෝෂප් එම්මානුවෙල් ප්‍රනාන්දු උපන්නේ 1940 අගෝස්තු 25 වනදා කොළඹ කොටහේන කොච්චිකඩේ දීය. බොහෝ දෙනාගේ අදහස වූයේ ඇලෙක්ස් සිටිනා සිනමාපටයක් කම්මැළිකමකින් හුදකලාවකින් තොරව නැරඹිය හැකි බවයි. වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම ඔහු තිරය මත ක්‍රියාශීලී විය. නමුත් මෙවන් චණ්ඩිකම් පෑ වීරයකුට වූයේ තම කුඩා සන්දියේ දී හුදකලාව ජීවිතය ගෙවන්නටය. එයට හේතු වූයේ තමාට වයස අවුරුදු දහය වන විට ඔහුගේ මව මිය යාමයි. මව් සෙනෙහස අහිමි වූ ඔහුට ජීවත්වන්නට සිදු වූයේ තම පියා සමඟය. කුඩා ඇලෙක්ස් මුලින්ම අධ්‍යාපනය ලැබුවේ රවීන්ද්‍ර රන්දෙණිය, විජය කුමාරතුංග පවා අධ්‍යාපනය ලැබූ කොටහේන ශාන්ත බෙනඩික් විද්‍යාලයේ ය. සෙන්ට් ඇන්තනීස් විද්‍යාලයට ඇතුළත් වූයේ ඉන් පසුවයි. සිනමාපට තුළ හොඳ හැටි කරණම් ගැසූ ඔහුට එය ඒ හැටි කජ්ජක් නොවීය. එයට හේතු වූයේ කොළඹ නගර සභාවේ ක්‍රීඩා උපදේශකයකු ලෙස සේවය කිරීමට පෙර ඔහු පාසල් සමයේ සිටම ක්‍රීඩාවට උපන් හපන්කම ඇත්තකු වීමය. එපමණක් නොව ආත්මාරක්ෂක සටන් කලාවන් මෙන්ම සෙසු ක්‍රීඩාවන් අතින් ද ඔහු ඉදිරියෙන්ම සිටින්නට විය. වයස අවුරුදු 15 වන විටම ආම්ස්ට්‍රෝන් රෙස්ලින් ක්‍රීඩා සමාජය හා සම්බන්ධ වන්නට ඔහු කටයුතු කළේය.



පාසලේ දී බොහෝ දෙනෙක්ට ඔහුව හඳුනාගත හැකි වූයේ බොක්සිං ක්‍රීඩාවට මෙන්ම මල්ලවපොර සඳහා ද උපන් හපන්කම් ඇත්තකු ලෙසයි. එමෙන්ම කරාටේ, ජූඩෝ සඳහා පමණක් නොව සෙසු ක්‍රීඩාවන් උදෙසා ද පාපන්දු ක්‍රීඩාව මෙන්ම පිහිනුම් සඳහා ද ඔහු අති දක්ෂයකු විය. ලාංකේය සිනමාව තුළ ඔලිම්පික් ක්‍රීඩා උළෙළට සහභාගි වූ නළුවකු සම්බන්ධ වී සිටියා දැයි කෙනකු ඇසුව හොත් දීමට ඇති මුල්ම පිළිතුර වන්නේ අන් කවරකුවත් නොව ඔහු ඇලෙක්සැන්ඩර් ප්‍රනාන්දු බවය. අධ්‍යාපනය හමාර කිරීමෙන් පසු 1960 දී වරාය අධිකාරිය හා සම්බන්ධ වූ ඔහු 1964 දී ජපානයේ ටෝකියෝහි පැවැති ඔලිම්පික් ක්‍රීඩා උළෙළේ දී ශ්‍රී ලංකාව නියෝජනය කිරීමට සමත් විය. ඉන් පසුව 1966 වර්ෂයේ දී බැංකොක් හි පැවැති නිපොන් ආසියානු ක්‍රීඩා උළෙළට සම්බන්ධ වී එහිදී දක්ෂතාවයන් පෙන්වූයේ ඔහුට වයස අවුරුදු 26දීය. නමුත් ඊට පෙර ඇලෙක්ස්ට වයස අවුරුදු 22 වන විටම ලංකාවේ අපරාජිත මල්ලව පොර ශූරයා ලෙසින් නම් දරා සිටින්නට හැකි විය. වරක් රූපවාහිනී වැඩසටහනකට සම්බන්ධ වූ ඇලෙක්ස් පැවසුවේ විදේශයක දී පැවැති ක්‍රීඩා උළෙළකට ඔහුට යාමට නොහැකි වූයේ රජය මඟින් ඒ සඳහා මුදල් වෙන්කිරීමක් කළ නොහැකි නිසාවෙන් බවයි. වසර කිහිපයක්ම අපරාජිතව මල්ලවපොර ශූරයා ලෙසින් තම දක්ෂතා එළි දක්වා සිටි ඇලෙක්ස්ට කොළඹ නගර සභාවේ ක්‍රීඩා උපදේශක තනතුර ලැබුණේ මේ හැකියාවන්ගෙන් පසුවය.

ක්‍රීඩාවෙන් තම හැකියාවන් මනා ලෙස පෙන්නුම් කළ මෙවන් වූ කලබලකාරී චරිතයකට කලාව කෙසේවත් පිහිටීමේ හැකියාවක් නැතැයි බොහෝ දෙනෙක් කල්පනා කළා වන්නට පිළිවන. නමුත් ජවසම්පන්න ඇලෙක්සැන්ඩර්ගේ සිත පුරාම පැවැතියේ කලාවට ළැදි බවයි. එහි ප්‍රතිඵලයක් ලෙස මුලින්ම ඔහු සම්බන්ධ වූයේ ජුලියස් සීසර් සහ තවත් දෙමළ වේදිකා නාට්‍යයක් වෙනුවෙනි. සිනමාවට එන්නට පාර කැපුණේ මෙතැනිනි. මේ නාට්‍ය බැලීම සඳහා වරක් ලෙනින් මොරායස් පැමිණ සිටි අතර, පසුකාලීනව ඔහු ලෙනින් මොරායස්ගේ අතිජාත මිත්‍රයෙක් වූවා පමණක් නොව ඔවුන් එකම කාමරය බෙදාගත් මිත්‍රයෝ ද වූහ. මේ මිත්‍රත්වය මඟින් ඇලෙක්ස්ට ලැබුණු ත්‍යාගය වූයේ ටී. සෝමසේකරන්ගේ 'වෙනින් ස්වර්ගයක්' චිත්‍රපටය හා සම්බන්ධ වීමේ අවස්ථාව ලැබීමය. නමුත් කනගාටුවට කරුණ වූයේ ඔහු රඟපෑ මුල්ම චිත්‍රපටයේ දර්ශනයක් කවර හෝ හේතුවක් නිසා චිත්‍රපටයෙන් ඉවත් කොට තිබීමයි. එම ජවනිකාව හෙන්රි ජයසේනයන් සමඟ ඇලෙක්ස් මැදි වූ ගැටුමකි. නමුත් පසුකාලීනව මොරායස්ගේ සෑම චිත්‍රපටයකම ඉඩක් තම මිත්‍රයා වෙනුවෙන් වෙන්ව තිබිණි. ඒ තරමට ඔවුන් දෙදෙනාගේ මිත්‍රත්වය බද්ධ වී තිබුණි.



ඇලෙක්සැන්ඩර් ප්‍රනාන්දු සමඟ මාලනී ෆොන්සේකා

**අටවැනි පුදුමය චිත්‍රපටයෙන් ඔහුට හමුවූ සුවිශේෂී චරිතයක් වූයේ සේනාධීර රූපසිංහය. අටවැනි පුදුමය චිත්‍රපටය රූගත කරන සමයේ සේනාධීර රූපසිංහට ඔහු සටන් පුහුණු කළේ උස්වැටකෙයියාවේ මුහුදු වෙරළේදීය. ක්‍රමවත් ලෙස සේනාධීර රූපසිංහට සටන් ශිල්ප ඉගැන්වූ ඇලෙක්සැන්ඩර් පසුකාලීනව පැවසුයේ සේනාධීර රූපසිංහ මියයන තුරුම ඒ හේතුව නිසා තමාව ගෞරවයෙන් සිහිපත් කළ බවයි.**





මුල්ම චිත්‍රපටයෙන් ඔහුගේ දර්ශනය ඉවත් කර තිබූ බැවින් ඩබ්. එම්. එස්. තම්පෝගේ 'රුහුණු කුමාරි' චිත්‍රපටය ඔහුගේ සිනමා ආගමනය ලෙස හැඳින්විය හැක. මේ චිත්‍රපටයට ඇලෙක්ස්ව සම්බන්ධ කර ගත්තේ එවක 'චණ්ඩියා' චිත්‍රපටයෙන් ජනප්‍රියව සිටි රොබින් ප්‍රනාන්දුය. මෙසේ රුහුණු කුමාරියෙන් ගමන් ඇරඹි ඇලෙක්ස්ට ඉන් පසු අටවැනි පුදුමය චිත්‍රපටය හා සම්බන්ධ වීමට හැකි වන අතර එතැන් සිට කොහොමද වැඩේ, භාරලක්ෂය, ශ්‍රී මදාරා, සහයට ඩැනී, සිංගප්පූර් චාලි, හිතක පිපුණු මල්, අපි කවදත් ශූරයෝ, සූරයන්ගෙත් සූරයා, යකඩයා, හතර දෙනාම සූරයෝ, අභිරහස, මිරිඟුව, සූරයා සූරයාමයි, ඔහොම හොඳද, ආදරේ හිතනවා දැක්කම, පසමිතුරු, සරදියෙල්ගේ පුතා වැනි චිත්‍රපට සමඟින් චිත්‍රපට 150කට වඩා ඔහුට රඟපෑමේ අවස්ථාව ලැබුණි. අටවැනි පුදුමය චිත්‍රපටයෙන් ඔහුට හමුවූ සුවිශේෂී චරිතයක් වූයේ සේනාධීර රූපසිංහය. අටවැනි පුදුමය චිත්‍රපටය රූගත කරන සමයේ සේනාධීර රූපසිංහට ඔහු සටන් පුහුණු කළේ උස්වැටකෙයියාවේ මුහුදු වෙරළදීය. ක්‍රමවත් ලෙස සේනාධීර රූපසිංහට සටන් ශිල්ප ඉගැන්වූ ඇලෙක්සැන්ඩර් පසුකාලීනව පැවසුයේ සේනාධීර රූපසිංහ මියයන තුරුම ඒ හේතුව නිසා තමාව ගෞරවයෙන් සිහිපත් කළ බවයි.

එපමණක් නොවේ ඔහු රෝයි ද සිල්වා, සනත් ගුණතිලක, ගාමිණී ෆොන්සේකා යන චරිතය උදෙසා ද සටන් පුහුණු කිරීමේ කටයුත්තේ නියැළි සිටියෙකි. සූරයන්ගෙත් සූරයා චිත්‍රපටය වෙනුවෙන් ගාමිණී ෆොන්සේකාට සටන් පුහුණු කළ නිසා ගාමිණී කොතෙක් ඇලෙක්ස් සම්බන්ධයෙන් පැහැදුනා දැයි කිව හොත් තාත්වික සටන් කිරීමට ගාමිණී තුළ තිබූ ආශාව නිසා මිරිඟුව චිත්‍රපටයේ රූ ගතකරන සමයේ ගාමිණී ෆොන්සේකාගේ පහරකෑමට ලක්ව දින තුනක් ඇලෙක්ස් කට ඇර ගැනීමටවත් නොහැකිව සිටියේය. මෙම සිදුවීම නිසා ගාමිණී ෆොන්සේකා නිතර නිතර ඇලෙක්ස් ගැන සොයා බැලූ අතර, ඔහු රඟපෑ චිත්‍රපට බොහොමයකට ඇලෙක්ස්ව සම්බන්ධ කර ගැනීමටත් කටයුතු කළේය.

ඇලෙක්සැන්ඩර් ප්‍රනාන්දු ප්‍රධාන නළුවන් සමඟ සහය චරිත මවමින් සිටිය ද ඔහුගේ සිනමා ගමනේ වැදගත්ම සංධිස්ථානය ලෙසින් චිත්‍රපට විචාරකයන් මෙන්ම ඔහු ද හඳුන්වා දී ඇත්තේ තමාට 'ශ්‍රී මදාරා' චිත්‍රපටයේ ප්‍රධාන චරිතයට සම්බන්ධ වීමට ලැබීම බවයි. මේ අවස්ථාව ඔහුට ලබා දුන්නේ සතිස්චන්ද්‍ර එදිරිසිංහයන්ය. මීට පෙර ඔහු සතිස්චන්ද්‍ර එදිරිසිංහ මහතාගේ 'මාතර ආච්චි' චිත්‍රපටයේ සටන් අධ්‍යක්ෂ ලෙස කටයුතු කර තිබිණි. එමෙන්ම 'සරදියෙල්ගේ පුතා' චිත්‍රපටයෙහි රඟපෑම වෙනුවෙන් ද ඔහුට මහත් ජනප්‍රියත්වයක් ලැබුණු අතර, එහි



බන්දු මුණසිංහ, සේනාධීර රූපසිංහ, ඇලෙක්සැන්ඩර් ප්‍රනාන්දු

ඔහු රඟපෑවේ කලක දී අකාලයේ මියගිය ආනන්ද ජයරත්න සමඟිනි. එහි ප්‍රධාන නිළිය ලෙසින් කටයුතු කළේ මාලනී ෆොන්සේකා. නීල් රූපසිංහ අධ්‍යක්ෂණය කළ සරදියෙල්ගේ පුතා චිත්‍රපටය තිරගත වීම ඇරඹුයේ 1976 සැප්තැම්බර් මස 10 දාය. කෙසේ වෙතත් එහි සිදුවූ විශේෂිතම සිදුවීම වූයේ එම වසරේ ගාමිණී ෆොන්සේකා, තිස්ස විජේසුරේන්ද්‍ර, රවීන්ද්‍ර රන්දෙණිය වැනි ජනප්‍රියත්වයේ සිටි නළුවන් රඟපෑ චිත්‍රපට අභිබවා වැඩිම ආදායම් ලැබූ චිත්‍රපටය වන්නට සරදියෙල්ගේ පුතා සමත් වීමයි.

ඕනෑම තරුවකට බැබළෙන්නට වරම් ලැබෙන්නේ කාලයකි. ඒ නිසාමදෝ කලක් ගත වන විට ඇලෙක්ස්ට ද සිනමාපට ලැබීමේ හිඟයක් පැවතුනි. නමුත් කලාවත් සමඟින්ම සිටි ඔහු තමා කලාව ආරම්භ කළ වේදිකාවටම යළිත් සම්බන්ධවීමට ඉටාගත්තේය. ඒ සමඟම 'සිරිපාල සහ රන්මැණිකා' වේදිකා නාට්‍යය මෙන්ම 'යම ලොව පෙරළිය' වේදිකා නාට්‍යයේත් ප්‍රධාන භූමිකාව ඔහු විසින් හෙබවීය.



මේ අයුරින් එවක සිනමා අඹර දිදුල ගාමිණී ෆොන්සේකා, සේනාධීර රූපසිංහ, ආනන්ද ජයරත්න, ජෝ අබේවික්‍රම, රොබින් ප්‍රනාන්දු, විජය කුමාරතුංග, ටෝනි රණසිංහ, රවීන්ද්‍ර රන්දෙණිය, ඇන්තනි සී. පෙරේරා, බැප්ටිස් ප්‍රනාන්දු වැනි එවක අතිශය ජනප්‍රිය තලයේ සිටි නළුවන් සමඟ එකට මුහු වී තම හැකියාවන් පෙන්නුම් කළ ඇලෙක්ස් මෙරට සිනමාවේ ස්වර්ණමය අවධියේ සිනමාව වෙනුවෙන් මනා ලෙසින් තම දායකත්වය සැපයූවන් අතරින් ඉහළින්ම සිටි චරිතයකි. පෙම්වතාගේ චරිතයත් දුෂ්ටයාගේ චරිතයත් මනා ලෙස නිරූපණය කළ ඇලෙක්ස්ට වැඩි වශයෙන් සම්බන්ධ වන්නට සිදු වූයේ සටන් ජවනිකා සඳහාය. එම නිසා බොහෝ අය ඔහු සටන් නළුවකු යැයි නම් කරන තත්ත්වයටම පත් විණි. කෙසේ වෙතත් ඔහු සම්බන්ධ වූ සිනමාපට සඳහා රසික ප්‍රතිචාර ඉහළින්ම ලැබුණු බව නම් කිව යුතුමය. 1984 දී ජනාධිපති සම්මානයක් ද ජාතික ක්‍රීඩාවට කළ මෙහෙවර වෙනුවෙන් 2009 වසරේ ක්‍රීඩා අමාත්‍යාංශයෙන් ඔහුට ඇගැයීම් සම්මානයක් ද ලැබ තිබිණි. 1978 වසරේ දී අනෝමා ලුම්බිණී සමඟ විවාහ වූ ඇලෙක්සැන්ඩර් ප්‍රනාන්දු මිය යන විට දියණියන් දෙදෙනකුගේ හා එක් පුතකුගේ දයාබර පියෙකි.



**රජිත බස්නායක**

# ජනතා මණ්ඩපය

■ ජනතා මණ්ඩපය, දිනමිණ, ලේක්හවුස්, කොළඹ 10
■ ෆැක්ස් 2429241 ■ ඊ මේල් - janathamadapayaancl@gmail.com

# විස පොහොරෙන් වැඩිවන වකුගඩු උවදුර



ශ්‍රී ලංකාවේ උතුරු මැද පළාතෙන් ආරම්භ වූ වකුගඩු රෝගය අද වන විට වයඹ සහ ඌව පළාත් වලටත්, ක්‍රමයෙන් දකුණු පළාතටත් ව්‍යාප්ත වෙමින් තිබේ. මා ඌව පළාතේ මහියංගන නගරයේ ගිරාදුරුකෝට්ටේ නමැති ප්‍රදේශයේ පදිංචිකරුවෙකි. අප ප්‍රදේශයේ සෑම ගෙදරකම එක් අයකු හෝ වකුගඩු රෝගයට ගොදුරු වී ඇති අතර වාර්ෂිකව සිදුවන මරණ සංඛ්‍යාව ද ඉහළ ගොස් තිබේ.
"මාගේ දෙමාපියන් ද වකුගඩු රෝගීන් ය. දියවැඩියාවට සහ අධිරුධිර පීඩනයට ප්‍රතිකාර කරමින් සිටිය දී වකුගඩු රෝගයට ගොදුරු විය."
දරුවන්ගේ ප්‍රකාශන :-
"සඳරේණු උපමාලිකා වන මාගේ පියා වකුගඩු රෝගයට ගොදුරු වී එක්තැන් වූයේ මා 12 වසර අධ්‍යාපනය ලබමින් සිටියදී ය. ඉන් වසර තුනකට පසු ඔහු රෝගය නිසා මරණයට පත්විය."
"අනුෂිකා මිහිරානි වන මා ජයවර්ධනපුර සරසවියේ පළමු වසර අධ්‍යාපනය ලබමින් සිටින විට මා හට මාගේ පියා ද අහිමි වූයේ වකුගඩු රෝගය නිසාය."
ක්‍රමයෙන් උඩු දුවන වකුගඩු රෝගයට ප්‍රධාන හේතුව වන්නේ, අප ප්‍රදේශයේ ළිංවල සහ නළ ළිං වලින් භාවිතා කරන ජලයේ ඇති රසායනික ද්‍රව්‍යය. අප ප්‍රදේශයේ බොහෝ දෙනාගේ ප්‍රධාන ජීවනෝපාය වන්නේ ගොවිතැනය.
ආචාර්ය ගම්මන්පිල මහතා පවසන ආකාරයට මධ්‍යම කඳුකරයේ කෘෂිකර්මාන්තය සඳහා යොදා ගන්නා රසායනික ද්‍රව්‍ය ජලය සමඟ මුසු වී එම ජලය ඇළ වේලි ඔස්සේ වියළි කලාප වල වැව් දක්වා ගලා ඒමත්, එම ජලය භාවිත කරමින් සිදු කරන වී වගාව නිසා විෂ රසායනික රට පුරා වැසියන්ට ශරීරගත වීම් ද සිදු වී තිබේ.
"වැව් පතුලේ රොන් මඩ මහා පරිමාණයෙන් ඉවත් කළා. ඒවා විවිධ පළාත් වලට ගිහින් දැම්මේ වැව් පතුලේ වැලි ගොඩ දැමීමෙන්. ඒ වැලි ප්‍රදේශ රැසකට ව්‍යාප්ත වුණා. 2013 ලෝක සෞඛ්‍ය සංවිධානය නිකුත් කළ වාර්තාවට අනුව කුඹුරු වලට වඩා රජරට නිවාසවල ගෙමිදුලේ අහිතකර රසායනික වැඩි ප්‍රමාණයක් තිබෙන බව පෙනී ගොස් ඇත. එපමණක් ද නොව රන්දෙනිගල , වික්ටෝරියා වැනි ජලාශ පතුලෙන් ටර්බයින් කරකවා පිටවන ජලය එවනවා, එතකොට ජලාශ පතුල කැලඹී ඉහළට එන්නේ වැඩි රසායනික ප්‍රමාණයක් තැන්පත් වූ ජලයයි. ඒවා ගලාගෙන ගියාම රජරට වැව් පතුල අහිතකර ද්‍රව්‍ය වලින් පිරෙනවා. දිවයිනේ ප්‍රදේශ රැසක වයස් භේදයකින් තොරව වකුගඩු රෝගය වාර්තා වී ඇති බවත් ආචාර්ය ගම්මන්පිල මහතාගේ අදහසයි.
මීට අමතරව දීර්ඝ කාලීනව දියවැඩියාව, අධි රුධිර පීඩනය, පිළිකා, විවිධ චර්ම රෝග යනාදිය සඳහා ප්‍රතිකාර දීර්ඝකාලීනව ගැනීම නිසාද වකුගඩු රෝගයට හේතු වේ. තවද සර්ප දෂ්ඨනයට ගොදුරු වීම නිසා ද වකුගඩුවලට හානි සිදු වේ. ජනතාව සර්ප දෂ්ඨනයට නිසි ප්‍රතිකාර නොකිරීම ද මෙයට හේතු වේ. ශ්‍රී ලංකාවේ වියළි කලාපවල වැඩි වශයෙන් ම වාර්තා වන්නේ තිත් පොළඟා දෂ්ඨ කිරීම සහ කුණ කටුවාගේ දෂ්ඨ කිරීම් බහුලව දක්නට ලැබේ. සර්ප විෂ යනු සංඝටක ගණනාවක් සහිත සංයුක්ත ද්‍රව්‍යකි.
1979 වසරේ සිට ශ්‍රී ලංකාව තුළ ග්ලයිපොසෙට් භාවිතා කරන බව පෙන්වා දෙන පර්යේෂකයින් එය දිස්ත්‍රික්ක කිහිපයක ව්‍යාප්තව පවතින වකුගඩු රෝගයට මූලික හේතුව බවට තර්ක කරති.
" බී බී සී, සිංහල සේවය කළ විමසීමක දී ග්ලයිපොසෙට් පළිබෝධ නාශකය පිළිබඳව වසර කිහිපයක සිට පර්යේෂණ සිදු කරන මහාචාර්ය චන්න ජයසුමන මෙම රෝගය හඳුන්වා දෙනු ලබන්නේ " කෘෂිකාර්මික වකුගඩු රෝගය යන නමිනි.,,
තව ද නූතනයේ අප විසින් භාවිත කරනු ලබන ශරීරයට අහිතකර කෘත්‍රිම ආහාරපාන නිසා ද වකුගඩු වලට හානි සිදු වේ. පර්යේෂකයන් පවසන්නේ වකුගඩු රෝගයට ප්‍රධාන හේතුව වන්නේ වියළි කලාපවල ජලයේ පවතින රසායනික ද්‍රව්‍ය බවය.
එනිසා රජය විසින් බොහෝ ක්‍රියාමාර්ග ගෙන තිබේ. නමුත් එම ක්‍රියාමාර්ග සීමිත වීම ප්‍රධාන ගැටලුවකි. අප ප්‍රදේශයේ තෙල්දෙණියාය, බෙලගන්වැව, හෙබරව,උල්හිටිය යන ගම් පහකටම ඇත්තේ, බ/උල්හිටිය මහා විද්‍යාලය ඉදිරිපිට ඉදි කර ඇති වතුර පිරිසිදු කිරීමේ ජල ෆිල්ටරය පමණකි.
මාගේ යෝජනාව වන්නේ සෑම ගමකටම එක් ජල ෆිල්ටරයක් බැගින් නාවික හමුදාව මූලික කරගෙන ඉදි කළ හැකි නම් මේ රෝගය යම්තාක් දුරට පාලනය කළ හැකි බවයි.
ගිරාදුරුකෝට්ටේ දිසා රෝහල යනු වකුගඩු රෝගීන්ට මහත් සේවාවක් ඉටු කළ රෝහලකි. ගිරාදුරුකෝට්ටේ වකුගඩු රෝග ප්‍රතිකාර මධ්‍යස්ථානයේ ලිශාන්ත ගුණරත්න මහතා ඇතුළු කාර්යය මණ්ඩලය විසින් සායන, වකුගඩු රෝගීන්ට ප්‍රතිකාර, දැනුවත් කිරීමේ වැඩසටහන්, වාර්ෂික වකුගඩු රෝග පරීක්ෂණ සායන පැවැත් විය. එම නිසා රෝගීන් හඳුනාගෙන ප්‍රතිකාර කිරීම්, නිවෙස්වල ළිං ජලය මාසිකව පරීක්ෂා කිරීම් ආදී සෞඛ්‍ය සේවා රාශියක් සිදුකොට තිබේ. නමුත් වෛද්‍ය ලිශාන්ත ගුණරත්න මහතාගේ ස්ථාන මාරුවීමත් සමඟ මෙකී වැඩපිළිවෙළ ක්‍රමයෙන් අඩාළ වී තිබේ. තව ද වකුගඩු රෝගය පිළිබඳව ජනතාව දැනුවත් කිරීමට රජය ගෙන ඇති ක්‍රියා මාර්ග යාවත්කාලීන වීමක් වන බවක් පෙනෙන්නට නොමැත. කෘෂි රසායනික ද්‍රව්‍ය භාවිතය සීමා කිරීම සහ ඒ වෙනුවට කාබනික පොහොර භාවිතය වැඩි කිරීමත්, වකුගඩු රෝගය පිළිබඳව ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමත්, රෝග ලක්ෂණ මොනවාද යන්නත් ඊට නිසි ප්‍රතිකාර කවරක්ද යන්නත් පෙන්වා දීම වැනි වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතුය.
එසේම රජය විසින් රුපියල් 3000ක මුදලක් වකුගඩු රෝගයට ගොදුරු වූ පවුල් වලට දුන්න ද එය ප්‍රමාණවත් නොමැත. එම දීමනාව රුපියල් 5000ක් දක්වා වැඩි කිරීම සාධාරණ බව හැඟේ. උල්හිටිය ප්‍රදේශයේ වයස අවුරුදු 21-40 අතරත්, බෙලගන්වැව ප්‍රදේශයේ 21-40ත් අතර හොබරියාව ප්‍රදේශයේ 60 ට වැඩි සහ ගිරාදුරුකෝට්ට සහ මිල්ලත්තාව ප්‍රදේශ වල 21-40 අතර වයස් වල රෝගීන් බොහෝමයක් වාර්තා වී තිබේ. අප ප්‍රදේශයේ ගොවිතැන් කටයුතු සඳහා වැඩි වශයෙන් පුරුෂයන් යොමු වීම නිසා 73%ටම වකුගඩු රෝගය වැලඳී තිබේ. මේ රෝගයට රජයේ අවධානය යොමු නොවුණ හොත් අනාගතයේ බිලිඳා ද වකුගඩු රෝගයට ගොදුරු වනු නොඅනුමානය.

**ඒ.එන්.විනෝද්‍යා කල්පනි**
නැගෙනහිර විශ්වවිද්‍යාලය
ත්‍රිකුණාමල මණ්ඩපය

# මතට තිත තබමු



වත්මන් ශ්‍රී ලංකාව මුහුණ පා ඇති ප්‍රබල අභියෝගයක් හා සමාජ ව්‍යසනයක් ලෙස පුද්ගලයා මත්ද්‍රව්‍ය භාවිතයට හුරු වීම හා ඒ තුළින් සමාජ හා සෞඛ්‍ය ගැටලු ඇති වීම පෙන්වා දිය හැකිය. මේ අභියෝගය ජය
ගැනීම සඳහා ශ්‍රී ලංකා පොලිසිය, පොලිස් මත්ද්‍රව්‍ය නාශක අංශය, සුරාබදු දෙපාර්තමේන්තුව , බන්ධනාගාරය, ශ්‍රී ලංකා රේගුව , වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව , ත්‍රිවිධ හමුදාව වැනි නීතිය ක්‍රියාත්මක කරන ආයතන ක්‍රියාත්මක වේ . අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය, මත්ද්‍රව්‍ය නීති ක්‍රියාත්මක කිරීමේ කමිටුව මගින් නීති රීති සම්බන්ධීකරණ කටයුතු කරන අතර නව නීති සැකසීම, ප්‍රතිපත්ති සැලසුම් කිරීම ආදිය සිදු කරයි. ඒ හා සමගාමීව නීතිය බලාත්මක කිරීම, නිවාරක අධ්‍යාපනය හා ජනතාව දැනුවත් කිරීම, ප්‍රතිකාර පුනරුත්ථාපනය හා පසු රැකවරණය මෙන් ම මත් ද්‍රව්‍ය දුර්භාවිතාව පිළිබඳ පර්යේෂණ හා විශ්ලේෂණය කරමින් කටයුතු කරන ආකාරයක් දැකගත හැකිය.එමෙන්ම ජාතයන්තර හා කලාපීය සහයෝගීතාවය සඳහා කටයුතු දියත් කිරීම මණ්ඩලයේ ප්‍රබල කාර්ය භාර්යයකි.
මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූවන් පුනරුත්ථාපනය ඔස්සේ යහපත් පුරවැසියන් ලෙස සමාජගත කිරීමට උර දෙමින් මත්ද්‍රව්‍ය විරෝධී ව්‍යාපාරයක් ශ්‍රී ලංකාවේ සක්‍රියව පවත්වා ගැනීමට අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය ගන්නා උත්සාහය සාධනීය ය. ඉහත වැඩසටහන් සියල්ල යතාර්ථවත් වීමට සහ ශක්තිමත් කරවීමට අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය දක්වන දායකත්ව, නායකත්ව්‍ය සහ මඟපෙන්වීම ඉහළින්ම දායකත්වය ලැබීම මෙරට මත් උවදුර මුලිනුපුටා දැමීමට ගන්නා විශිෂ්ට ක්‍රියා මාර්ගයක් ලෙස පෙන්වා දිය හැකිය. පුද්ගලයන් මත් ද්‍රව්‍ය වලට යොමු වීම ඔවුනට පමණක් නොව ගෝලීය ගැටලුවක් බවට පත් වී ඇත. ශ්‍රී ලංකාවේ තත්ත්වය සැලකිල්ලට ගැනීමේ දක්නට ලැබෙන්නේ ද මෙවැනිම අහිතකර ප්‍රතිඵල රාශියකි.
2019 වර්ෂයේ අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩයේ මත් ද්‍රව්‍ය දුර්භාවිත අත්පොතට අනුව 2018 වර්ෂයේ දී මත් ද්‍රව්‍ය සන්තකයේ තබා ගැනීම, වෙළෙඳාම සහ ප්‍රවාහනය ආදී වැරදි සඳහා පුද්ගලයින් 98,752ක් අත්අඩංගුවට යගන ඇත. එය 2017 වර්ෂය හා සසඳන විට 22% ක වැඩි වීමකි. මෙයින් හෙරොයින් වැරැදි සදහා 42%ක්, ගංජා ආශ්‍රිත වැරැදි සඳහා 55% ක් අයත් ය. මින් බහුතරයක් එනම් 61% ක් බස්නාහිර පළාතෙන් වාර්තා වී ඇත. වයඹ පළාත තුළත් 10% ක් හා මධ්‍යම පළාත තුළින් 8%ක් වාර්තා වී ඇත. 2018 වසර තුළ හෙරොයින් වැරැදි සම්බන්ධයෙන් පුද්ගලයින් 40,998ක්, ගංජා සම්බන්ධයෙන් පුද්ගලයින් 54686ක් අත්අඩංගුවට පත්ව ඇත. ශ්‍රී ලංකාවේ වයස 15-64 අතර ජනගහනයයන් පුද්ගලයින් ලක්ෂයකට 485 දෙනකු අත්අඩංගුවට පත්ව ඇති බව ඉහත සංඛ්‍යා ලේඛන වලින් පැහැදිළි වේ. ඉහත කරුණු අනුව පැහැදිලි වන්නේ මත් ද්‍රව්‍ය භාවිතය මත් පැන් හා දුම් පානය කිරීමෙන් ඇති විය හැකි හානිකර අනිටු ඵල විපාක පිළිබඳ තොරතුරු සමාජය තුළ ප්‍රකට කිරීමේ දැඩි අවශ්‍යතාවක් පවතින බවයි .
මේ කරුණු සැලකිල්ලට ගනිමින් මීට පිළියම් යෙදීමට එක්සත් ජාතීන්යේ සංවිධානය ඒ සඳහා විශේෂ අවධානයක් යොමු කර ඇත. . මෙහිදී මූලික පියවරක් ලෙස මත්පැන් හා දුම් පානය කිරීමෙන් ඇතිවිය හැකි හානිකර ප්‍රතිඵල විපාකයන් පිළිබඳ සමාජය තුළ ප්‍රකට කිරීම වැදගත් ය . එමෙන්ම තරුණ ප්‍රජාව මෙම උවදුරෙන් මුදව ගැනීමට එහි අවදානම් සහගත බව පිලිබඳව පුද්ගලයින් දැනුවත් භාවයක් ලබාදීම කාලීන අවශ්‍යතාවකි.
ඊට පිළියම් සෙවීම ඉක්මනින් සිදු විය යුතු බව ලෝකය වටහා ගන්නේ 20 වන සියවසේ දීය. ඒ වර්ෂ 1909 දී චීනයේ ෂැංහයි නුවර පැවති මත්ද්‍රව්‍ය පිළිබඳ ප්‍රථම ජගත් සමුළුව විසින් මත් ද්‍රව්‍ය දුර්භාවිතය ආරම්භයේදීම මත්ද්‍රව්‍ය ගෝලීය ගැටලුවක් බව හඳුනාගැනීමත් සමග ය.මෙම කරුණු සැලකිල්ලට ගනිමින් වර්ෂ 1987 දෙසැම්බර් මස හත්වන දින එක්සත් ජාතීන්යේ මහා මණ්ඩලයට ඉදිරිපත් කරන යෝජනාවක් මගින් මත්ද්‍රව්‍ය දුර්භාවිතය සහ නීති විරෝධී ප්‍රවාහනයට එරෙහිව ජාත්‍යන්තර දිනය ලෙස සෑම වර්ෂයකම ජූනි 26 වන දින නම් කිරීමට මහා මණ්ඩලය තීරණය කළේය.

**ප්‍රනීශා මදුශනි නිලන්දූව**
නැගෙනහිර විශ්වවිද්‍යාලය,

# සේවයට අගැයුමක් දෙන්න

ධාර්මිකව ධනය උපයා ගැනීමට යම් කර්මාන්තයක නිරතවීම බුදු දහම තුළ පවා ඇගයීමට ලක්වේ. මෙලොව උපත ලබන සෑම මනුස්සයෙකුගේම එකම පැතුම උපන් රටට වැඩදායී පුද්ගලයෙකු වීමය. රැකියා වියුක්තිය ලොව සෑම රටක්ම මුහුණ දෙන ප්‍රබලම අර්බුදයකි. නොවිසඳෙන මෙම අර්බුදය හමුවේ සෑම රටක්ම අසරණ වෙයි. අප දියුණු යැයි හැඳිනගත් අමෙරිකා එක්සත් ජනපදය පවා වසරකට රැකියා දහස් ගණනක් කප්පාදු කරයි. ලෝකයේ කුමන රටකට වුවද පොදු වූ කරුණක් ලෙස රැකියා වියුක්තියට විසඳුම් සෙවීමට හැම රටක්ම දැන් දැන් උනන්දු වී තිබේ.
වර්තමාන රජය ද මේ සඳහා යම් වැඩපිළිවෙළක් සකස් කරගෙන තිබේ. ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා බලයට ඒමට පෙරම රටට වූ පොරොන්දුවක් වන්නේ රැකියා ලක්ෂයක පුහුණු ශ්‍රම බළකායක් ගොඩනඟන බවය.
දැන් එම කටයුත්ත ආරම්භ කර තිබේ. දැන් යාන්ත්‍රණය ක්‍රියාත්මක කළ යුතුය. එහෙත් මෙහි දකින අඩුපාඩු රාශියක් අපට පැහැදිලිවම පෙනෙයි. ඒ පිළිබඳව කතා කිරීමට පෙර මෙම පුහුණු බළකායට අලුතින් එක්වන අයට කිවයුතු පණිවුඩයක් ද තිබේ. එනම් ඔබ රාජ්‍ය සේවයේ කුමන තරාතිරමක තනතුරකට පත්වුවද අප්‍රමාණ කැපකිරීම් කිරීමට සිදුවන බවය.
දැන් ගැටලුව විග්‍රහ කරමු. බහුකාර්ය සේවකයන් ස්ථානගත කිරීමේදී සියලු විද්‍යාත්මක ක්‍රමවේදයක් උපයෝගී කරගෙන නොමැති බවට අපට පැහැදිලිව පෙනෙයි. බඳවා ගැනීමේ අරුතම උල්ලංඝනය වී ඇති බවක් පෙනෙයි. බඳවා ගන්නේ බහුකාර්ය සඳහාය. එහෙත් රැකියාව ලැබෙන්නේ ආරක්ෂක නිලධාරියෙකු ලෙසය. ඔහු හෝ ඇය රැකියාවට බැඳුණු දින සිටම අයිස් ජොබ් එකක් අතට ලැබී තිබේ. දැන් තිබෙන්නේ කාලය කෙසේ හෝ කා දැමීම පමණි. තමාට පවා ඔරොත්තු නොදෙන ගරු ගාම්භීර රැකියාවක් හිස මත තබා තිබේ. එසේ නම් අප බලාපොරොත්තු වූ ශ්‍රම බළකාය මේ නම් රටේ හෙට දවසේ බදු ගෙවන ජනතාවට දෙවියන්ගේම පිහිට තමාය. මන්ද මොවුන් සියලුදෙනාට පඩි ගෙවිය යුතු නිසාය.

**චන්දන ලියනආරච්චි**
දෙහිඅත්තකණ්ඩිය

# දුර බස්වලට වැලිගම ඉඩ නැද්ද?



වැලිගම ප්‍රධාන බස් නැවතුම්පොළ දැනට වසර 12කට පමණ පෙර රුපියල් ලක්ෂ තිස්පහක වියදමින් සාදා නිමකර ඇත. මේ නිසා පොදු ජනතාවට ඇතිවූ සෙත ඉමහත්ය.
කොළඹ - මාතර ප්‍රධාන බස් මාර්ගයේ පිහිටි වැලිගම බස් නැවතුම්පොළ පසුකර මාතර, දික්වැල්ල, තංගල්ල, ඇඹිලිපිටිය, හම්බන්තොට, කතරගම, බදුල්ල, අම්පාර, මඩකළපුව, නුවරඑළිය සහ දෙහිඅත්තකණ්ඩිය දක්වා යන බස් රථ ධාවනය වේ.
දිනපතා මාතරට සහ දුර ගමන් යෑම සඳහා වැලිගම බස් නැවතුමට පැමිණෙන ජනතාව දසදහස් ගණනකි. එහෙත් වැලිගම බස් රථ නැවතුම්පොළේ එම මගීන්ගේ පහසුව සඳහා ස්ථානයක් වෙන්කර නොමැතිවීම නිසා මාතරට හා දුර ගමන් යන මගීන්ට සිටීමට සිදු වී ඇත්තේ වැලිගම විවිධ සේවා සමුපකාර සමිති කාර්යාලය ඉදිරිපිට මහ මාර්ගය අසල සිට බස් රථවලට ගොඩවීමටය.
මෙම තත්ත්වය නිසා මගීන්ට අව්වෙන් සහ වැස්සෙන් සිදුවන පීඩාව ඉමහත්ය. ස්ථිර බස් නැවතුම්පොළක් තිබියදී වසර 12කට වැඩි කාලයක සිට පවතින මෙම අඩුපාඩුව පිළිබඳව මේ දක්වා කිසිදු වගකිවයුතු බලධාරියකුගේ අවධානයට යොමු වී නොමැත. එමනිසා දැන්වත් වගකිවයුතු බලධාරීන්ගේ අවධානය යොමු වී නොපමාව වැලිගම බස් රථ නැවතුම්පොළෙහි ඉඩක් වෙන්කර දිය යුතු බව සඳහන් කරමි.

**වසන්ත ද සිල්වා**
වැලිගම

# ඉදිකිරීම් වැඩ හෙමින්

බේරුවල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කොට්ඨාසයේ ඉදිවෙන දෙවැනි සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය වූ (MOH) පයාගල (පිණිදියමුල්ලේ) විහාරකන්දේ මේ වන විට වසර ගාණක් තිස්සේ ඉබි ගමනින් සිදු කරනු ලබයි.
කොන්ත්‍රාත් ආයතනය මන්දගාමීව ඉදිකිරීම් සිදු කිරීම නිසා පයාගල (MOH) සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය හරහා තම සෞඛ්‍ය සේවාවන් ලබාගැනීමට සිටි ජනතාව කබලෙන් ළිපට වැටී ඇත. ඉදිකිරීම අධික ලෙස ප්‍රමාද පයාගල, පිණිදියමුල්ල නව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය සම්බන්ධයෙන් වහාම සොයා බලා ජනතා අයිතියට පැවරීමට වත්මන් රජයේ සෞඛ්‍ය අමාත්‍යවරියගේ සහ කළුතර සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයාගේ සහ දේශපාලන අධිකාරියේ කඩිනම් මැදිහත්වීම අපේක්ෂා කෙරේ.

**බෙන් කලපුගේ**
බේරුවල

# එළකිරිවලට තැනක් දෙන්න

වත්මන් රජයේ සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුව 2025 වර්ෂය වන විට ශ්‍රී ලංකාව කිරිවලින් ස්වයංපෝෂිත කිරීමට සැලසුම් සකස් කර ඇත.
මෙම වැඩපිළිවෙළට අනුව කෘෂිකර්ම සංවර්ධන අමාත්‍යාංශය යටතේ කිරි නිෂ්පාදන කටයුතු සඳහා රාජ්‍ය ඇමැතිවරයකු පත්කර ඇත. දේශීය කිරි නිෂ්පාදනය කිරීම සඳහා සමුපකාර කිරි සම්පත් පිහිටුවීම හා කිරි ජනතාව අතර බෙදාහැරීම සංවිධානය කිරීමට සමුපකාර අලෙවි කටයුතු හා පාරිභෝගික කටයුතු පිළිබඳ රාජ්‍ය අමාත්‍යාංශයට බලය පවරා ඇත.
කෘෂිකර්ම සංවර්ධන හා කිරි නිෂ්පාදන රාජ්‍ය ඇමැති ඩී. බී. හේරත් මතාගේ මෙහෙයවීම යටතේ දිවයිනේ සෑම දිස්ත්‍රික්කයකම ක්‍රියාත්මක පශු වෛද්‍ය කාර්යාලය හරා තෘණ වගා කිරීම, ගොවීන් පුහුණු කිරීම, උසස් වර්ගයේ කිරි එළදෙනුන් හා වැස්සි පැටවුන් සපයාදීම යන සංවර්ධන යෝජනා ක්‍රියාත්මක කර ඇත.



ආර්ථික පුනර්ජීවනය හා දරිද්‍රතාවය තුරන් කිරීමේ ජනාධිපති කාර්ය සාධක බළකාය විසින් ගොවිපළක ගවයින් 1000, 15000කින් සමන්විත නවීන තාක්ෂණයෙන් යුත් මහා පරිමාණ කිරි ගොවිපළවල් 10 - 15ක් පමණ සංඛ්‍යාවක් පිහිටුවීමට දැනටමත් පියවර ගෙන ඇත. මෙම ගොවිපළවලට අවශ්‍ය කිරි එළදෙනුන් නවසීලන්තය, ඕස්ට්‍රේලියාව, පකිස්තානය හා ඉන්දියාව යන රටවලින් ආනයනය කිරීමට ආයෝජකයින්ට රජය මගින් අවසර ලබා දී ඇත.
ආනයනය කරන ලද කිරි එළදෙනකුගෙන් දිනකට කිරි ලීටර් 25 - 30 අතර ප්‍රමාණයක් දොවා ගැනීමට හැකිවන පරිදි ගොවිපළවල් සංවර්ධනය කිරීමට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සැලසුම් හා උපදෙස් ලබා දී තිබේ. ගොවිපළවලට අවශ්‍ය රජයේ ඉඩම් ලබාදීමට ආයෝජන මණ්ඩලය පියවර ගෙන ඇති අතර, ගව ආහාර සඳහා අක්කර සිය ගණනක බඩඉරිඟු වගා කිරීමට සැලසුම් කර ඇත. වියළි කලාපයේ හඳුනාගෙන ඇති ඉඩම් මේ සඳහා වෙන්කර ඇති අතර, ආයෝජකයින්ට මෙම ඉඩම් ලබාදීම සිදු කරනු ලැබේ. මෙම වැඩපිළිවෙළත් සමඟම නිෂ්පාදනය කිරීමට බලාපොරොත්තු වන කිරි ප්‍රමාණය රජයට සම්බන්ධ 'මිල්කෝ' කිරි සමාගමට ලබාදීමටත් අතිරික්ත කිරි ප්‍රමාණය 'කිරි අවශ්‍ය' නිෂ්පාදකයින්ට සැපයීමට සැලසුම් කර ඇත.
'සෞභාග්‍යයේ දැක්ම' ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුව සමුපකාර සේවා අලෙවි සංවර්ධන පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය ඇමැති ලසන්ත අලගියවන්න මැතිතුමා විසින් සමුපකාර ව්‍යාපාරය ශක්තිමත් කිරීමට පියවර ගෙන ඇත.
රටේ ජනතාවට නිහඬ සේවයක් ඉටුකරන සමුපකාර ව්‍යාපාරයට නව පණක් ලබා දී පාරිභෝගික ආරක්ෂණ හා ශක්තිමත් සමුකාර ව්‍යාපාරයක් ඇති කිරීමේ අරමුණ ඇතිව දේශීය ගොවි නිෂ්පාදන, සුළු අපනයන බෝග වගාවන් හා දේශීය නිෂ්පාදන ව්‍යවසාය ශක්තිමත් කිරීමේ නිෂ්පාදන සමුපකාර ජාලයක් ඇති කිරීමේ කාර්යය සඳහා 'සේවා ලබාගැනීමට' හැකිවන පරිදි ව්‍යාපාර විශේෂඥයින්ගේ ස්වේච්ඡා උපදේශනාත්මක සේවයක් ලසන්ත අලගියවන්න රාජ්‍ය ඇමැතිතුමා විසින් සමුපකාර ව්‍යාපාරයට හඳුන්වා දී ඇත. දිවයින පුරා කිරි නිෂ්පාදන කටයුතුවල යෙදී සිටින ලක්ෂයකට වැඩි ගම්බද කිරි ගොවීන් දැනුවත් කර කිරි නිෂ්පාදන සමුපකාර සමිති පිහිටුවීමට සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව හා පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව කටයුතු කරමින් සිටී.
දිවයින පුරා දැනට සාර්ථකව ක්‍රියාත්මක කිරි ගොවීන්ගේ සමුපකාර සමිති ප්‍රථමයෙන් ශක්තිමත් කිරීමට ව්‍යාපාර විශේෂඥයින්ගේ සේවය මේ දිනවල ක්‍රියාත්මක කර ඇත.
දේශීය කිරි අවශ්‍යතාවය ලීටර් මිලියන 1250කි. එයින් 60% ක් කිරිපිටි වශයෙන් ද පිටරටවලින් ආනයනය කරනු ලබන අතර, 40% ක ප්‍රමාණයක් රට තුළින් එකතු කර ගනු ලැබේ. දේශීය සම්පත් උපයෝගී කරගෙන දේශීය අවශ්‍යතාවය සියයට 100%කින් සංවර්ධනය කර ගැනීමේ රජයේ ඉලක්කයට අනුව දිවයින පුරා සමුපකාර ප්‍රාථමික කිරි සමිති බිහි කිරීම මගින් දේශීය කිරි කර්මාන්තයට හොඳ කලක් උදාවනු නියතය.

**කේ. වි. සී. ධර්මවර්ධන**
ශ්‍රී ලංකා කිරි නිපදවන්නන්ගේ
සමුපකාර සමිති සංවර්ධන උපදේශක

# සමෘද්ධිලාභීන් පොත පතට හුරු කරමු

කියවීම තුළින් රටට යහපත් හොඳ පුරවැසියෙකු බිහිකිරීම හරහා විනාශකාරී ක්‍රියාවන් බොහෝදුරට අවම කර ගැනීමට අවස්ථාව උදාවන අතර, මෙම තත්ත්වය සක්‍රියව ක්‍රියාත්මක කිරීමට අප සැවොම දායක විය යුතුව ඇති කාලය එළඹ ඇත.
දිවයින පුරා ඇති පළාත් පාලන ආයතන මඟින් ප්‍රධාන නගරවල පුස්තකාල පවත්වාගෙන යනු ලබන අතර, එයට පරිබාහිරව එකී බලප්‍රදේශයේ ගම්වල ද ශාඛා පුස්තකාල ක්‍රියාත්මකව තිබේ. මෙමගින් පුස්තකාලය පරිහරණය කරන මහජනතාවට වන සේවය අති විශාලය.
මෙම ක්‍රියාවලිය තවදුරටත් සක්‍රීයව ක්‍රියාත්මක වීමට නිවෙස්වල කුඩා ගෘහස්ථ පුස්තකාල ඇතිකිරීම ඉතා වටිනා මිනුම් ඒකකයක් වනු ඇත. සමහර නිවෙස්වල දැනට ද ගෘහස්ථ පුස්තකාල පවත්වාගෙන යනු ලබයි. ඕනෑම නිවසක විවිධ මාදිලියේ එක් එක් විෂය ක්ෂේත්‍රයට අදාළ වන්නා වූ වැදගත් පොත්පත්, සඟරා යනාදිය තිබිය හැකි අතර, ඒවා ක්‍රමවත් ගොනුවීමක් නොමැතිවීම නිසාම අපිළිවෙළට ඒවා තිබෙන බැවින්, බොහෝ නිවෙස්වල මෙම පොතපත පරිහරණයක් ද සිදු නොවේ. එසේ වීම නිසාම අලුතින් පොත් එකතුවට පොත් මිලදී ගෙන හෝ තබාගැනීමට තම හිතට එන එම අදහස පහළ වන්නේ ද අවම වශයෙනි.
ගෘහස්ථ පුස්තකාල ඇති කිරීමේ ව්‍යාපෘතියේදී විශේෂයෙන් අඩු ආදායම්ලාභී පවුල්වලට පහසුකම් ලබාදීමේ වැඩපිළිවෙළක් දියත් කිරීම ඉතා වැදගත්ය. මේ හෙයින් මෙම ගෘහස්ථ පුස්තකාල ආරම්භ කිරීමේ වැඩපිළිවෙළ ආරම්භ කිරීමට පළමුවෙන්ම අඩු ආදායම්ලාභී සමෘද්ධි ආධාර ලබන පවුල් සඳහා එකී පහසුකම් ලබාදීමේ වැඩපිළිවෙළක් සකස් කළ යුතුව ඇත. සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවට අදාළ බලප්‍රදේශයේ මහ නගර සභා, ප්‍රාදේශීය සභාවට හා වෙනත් ප්‍රජා සංවිධානවලට මේ සඳහා මූල්‍ය දායකත්වය ලබා දෙමින් ආරම්භයේදී සමෘද්ධිලාභී පවුල් සඳහා නිවසකට එක් කුඩා පොත් රාක්කය බැගින් ලබාදීමේ සත්ක්‍රියාවට දායක විය හැකිය. දැනට ලෝකයේ සමහර රටවල වීදි පුස්තකාල පවා ක්‍රියාත්මක වන මෙවන් අවධියක එය දික්විජය කොට නිවෙස් සඳහා ද ගෘහස්ථ පුස්තකාල ඇති කිරීම ඒ තරම් අපහසු නොවේ.
පළමුව අඩු ආදායම්ලාභී සමෘද්ධි පවුල්වල අයට මෙම ගෘහස්ථ පුස්තකාල ඇති කිරීම සඳහා කුඩා පොත් රාක්කයක් බැගින් ලබාදීම සඳහා කටයුතු කිරීමට අදාළ බලධාරීන් දායකත්වය ලබාදීම ඉතා වැදගත් කොට සලකමි. මෙමඟින් දුවා දරුවන්ගේ මෙන්ම වැඩිහිටියන්ගේ අනාගත දිවිය සාර්ථක වන අතර, කියවීමෙන් ලබන පන්නරය තුළින් මුද්‍රිත මාධ්‍යයට ලිපි සැපයීමෙන් දැනුම වර්ධනය කරගැනීමට රුචිකත්වය ඇති කර ගැනීමට අවස්ථාව උදාවන අතර, අනාගත දිවිය සාර්ථක වනු ඇත.
මෙම කරුණ සම්බන්ධයෙන් අතිගරු ජනාධිපතිතුමාගේ, ගරු අග්‍රාමාත්‍යතුමන්ගේ සහ ගරු සමෘද්ධි කටයුතු පිළිබඳ රාජ්‍ය ඇමැතිතුමන්ගේ අවධානය ද යොමු වේවා.

**එම්. ඒ. ජයවීර**
අම්බලන්ගොඩ

සීගිරිය විශේෂ

# දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානය වහලා: එළවළු විකිණීම මහපාරේ





දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානය 29 දින විවෘත කරන බවට පසුගිය දා සිදු කළ ප්‍රකාශයත් සමඟ 29 උදෑසන ගොවීන් විශාල වශයෙන් දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානයට එළවළු රැගෙන විත් තිබිණි.

එහෙත් ආර්ථික මධ්‍යස්ථානය වසා දැමීම නිසාවෙන් සහ ප්‍රධාන මාර්ගයේ යුද හමුදාව පොලීසිය යොදවා එළවළු ගොවීන් එම ස්ථානවලින් ඉවත් කිරීම හේතුවෙන් ගොවීන්ට සිදුව ඇත්තේ විවිධ ස්ථානවලට ගොස් හොර රහසේ තම අස්වනු විකුණා ගැනීමට බව ගොවීහු කියති.

දඹුල්ල ,ගලේවෙල ප්‍රධාන මාර්ගයේ මෙන්ම දඹුල්ල-මාතලේ ප්‍රධාන මාර්ගයේත් කණ්ඩලම ඇරැවුල ග්‍රාමීය ප්‍රදේශවල ඉතා සූක්ෂම ලෙස කැළෑවල් ඇතුළත එළවළු වෙළෙඳාම සිදුකරමින් යන අයුරු 29 උදෑසන දැක ගැනීමට හැකි විය.

දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානයට එළවළු රැගෙන ආ ගොවීන් කියා සිටියේ තම නිෂ්පාදන වගා බිමේ විනාශ වීමට ඉඩ නොදී රටේ ජනතාවට ආහාර සඳහා අරගෙන ආව ද යුද හමුදාව සහ පොලීසිය යොදවා ඒවා නගරයේ අලෙවි කිරීමට ඉඩ ලබා නොදෙන බවය.

දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානයේ අතරමැදි වෙළෙන්දන් රැසක් මේ වනවිට විවිධ ස්ථානවල තාවකාලිකව ගොවීන්ගේ එළවළු පිට පළාත්වල ව්‍යාපාරිකයන්ට අලෙවි කිරීමේ මැදිහත්කරුවන් ලෙස පෙනී සිටිමින් ඔවුන් කොමිස් මුදල් මත ගොවීන්ගේ එළවළු එම පිරිස් වෙත අලෙවි කිරීම් සිදුව වන බව ගොවීහු කියති .

ගොවීන් වැඩිදුරටත් කියා සිටින්නේ විශාල මිල ගණන් යටතේ අලෙවි වූ තම අස්වැන්න ඉතා අඩු මිල ගණන් යටතේ ලබාගෙන අලෙවි කිරීම් සිදු කරන බවය.

දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානයේ කොවිඩ් වයිරසය ශරීරගත වූ පුද්ගලයන් රැසක් සිටින බව ප්‍රකාශ කරමින් එම පිරිස ආර්ථික මධ්‍යස්ථානයේ ඇතුළෙන් පිටත් කර යවා ආර්ථික මධ්‍යස්ථානයේ ගොඩනැගිලි ටික පමණක් හුදෙකලා කිරීම් තුළින් සිදුව ඇත්තේ එහි රැඳී සිටි කොවිඩ් ආසාදනය වූ පිරිස් දඹුල්ල සහ අවට සෑම තැනම ඇවිද යමින් වෙළෙඳාම් කටයුතුවල නිරත වන බව ව්‍යාපාරිකයෝ මෙන්ම ගොවීහු ද මෙහිදී පෙන්වා දුන්හ .

මේ පිළිබඳව දඹුල්ල ආර්ථික මධ්‍යස්ථාන වෙළෙඳ සංගමයේ සභාපති යු . බී. ඒකනායක මහතාගෙන් විමසීමේදී කියා සිටියේ ආර්ථික මධ්‍යස්ථානයේ සේවකයන් මේ වන විට සියයට අනුවකට වඩා පීසීආර් පරීක්ෂණ සිදු කොට හමාර බවය.

ආර්ථික මධ්‍යස්ථානය විවෘත කිරීමේ ක්‍රමවේදයක් තවමත් දැනුම් දී නැති බවද මේ හේතුව නිසා අසරණ ගොවීන් විශාල වශයෙන් වෙනත් පුද්ගලයන්ගේ ජාවාරම් කරුවකරුවන්ගේ ග්‍රහණයට නතු වී තිබෙන බවද පෙන්වාදුන්නේය.

ඇඹිලිපිටිය සංචාරක ඩබ්ලිව්. විදානපතිරණ

### සබරගමුව සුරාබදු ඉතිහාසයේ

## විශාලම ඇල්ලීම සහ දඩය ඇඹිලිපිටියෙන්

ඇඹිලිපිටිය කඩදාසි කම්හලට ආසන්න හිගුර ප්‍රදේශයේ ස්ථානයක මහා පරිමාණයෙන් හොර රහසේ කසිප්පු පෙරූ පුද්ගලයෙකු ඉකුත් දින සුරාබදු නිලධාරීන් විසින් කසිප්පු බෝතල් 704 ක්, ගෝඩා බෝතල් 493 ක් සහ පෙරීමේ උපකරණ විශාල තොගයක් සමග ග්‍රහණයට ගෙන එදිනම ඇඹිලිපිටිය අතිරේක මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් පසු රක්ෂිත බන්ධනාගාර ගත කර දින 07කට පසුව නැවතත් එම අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් පසු ඔහු වරද පිළිගැනීම නිසා රු. 175,000 ක දඩ නියම විය. ඔහු එදින රු. 10,000 ගෙවූ අතර ඉතිරි රු.165,000 මුදල ලබන මස 5 දින ගෙවීමට පොරොන්දු වීම නිසා ඒ සඳහා රු. 100,000 බැගින් වූ ශරීර ඇප දෙකක් ඔහු පදිංචි ප්‍රදේශයෙන් එක් අයකු සහ තවත් එක් ඇපයක් තැබීමට ද අධිකරණය නියෝග කරන ලදි.

සබරගමුව සුරාබදු ඉතිහාසයේ මෙතෙක් සිදුකළ විශාලතම හොර සුරා ග්‍රහණය සහ දඩ මුදල ද මෙය බවත්, ඉහත දඩය නියම වූ පුද්ගලයා මස්කෙළිය ප්‍රදේශයේ පදිංචි පදිංචිකරුවකු බවත්, සුරාබදු නිලධාරියෙක් ප්‍රකාශ කළේය.

සබරගමුව සුරාබදු සහකාර කොමසාරිස් ශ්‍යාමන් රත්නායක මහතාට ලැබුණ තොරතුරු මත ඔහුගේ ද උපදෙස් හා සහභාගීත්වයෙන් රත්නපුර සුරාබදු අධිකාරී පද්ම කුමාර, ඇඹිලිපිටිය සුරාබදු ස්ථානාධිපති ආර්.ඒ. සරත්චන්ද්‍ර , රත්නපුර සුරාබදු ස්ථානාධිපති සුනිල් පෙරේරා , ඇඹිලිපිටිය සුරාබදු පරීක්ෂක ප්‍රසාද් මංජුල මහත්වරු ඇතුළු නිලධාරීන් ඉහත වැටලීම සිදු කර ඇත.

කොටදෙණියාව සමූහ එම් පී කුමාර

# අධිබල යතුරුපැදි 2ක් අත්අඩංගුවට



පල්ලෙවෙල ප්‍රදේශයේ නිවෙසක සඟවා තිබූ අධිබල ධාරිතාවකින්යුතු රුපියල් ලක්ෂ 90ක් පමණ වටිනා යතුරු පැදි දෙකක් ගම්පහ දිස්ත්‍රික් අපරාධ විමර්ශන කොට්ඨාසය විසින් අත්අඩංගුවට ගෙන ඊයේ 28 පස්වරුවේ පල්ලෙවෙල පොලිසියට භාර දෙනු ලැබීය. මෙසේ පොලිස් භාරයට ගෙන ඇත්තේ එන්ජින් ධාරිතාව ඝන සෙන්ටිමීටර් දහසක් වන ඉතාලියේ හා ජර්මනියේ නිෂ්පාදිත යතුරුපැදි දෙකකි.

මෙම යතුරුපැදි කුමන ආකාරයෙන් මෙරටට ගෙන ආවා ද කුමක් සඳහා භාවිතා කළාද එමෙන්ම යතුරු පැදි ආනයනයේදී තීරුබදු ගෙවා ඇත්දැයි හෙළිකර ගැනීමට පරීක්ෂණ පැවැත්වේ . මෙම යතුරු පැදි ධාවන තරග සඳහා භාවිතා කිරීමට ගෙන එන ලද ඒවා බව යතුරු පැදි වල අයිතිකරු ප්‍රකාශ කර ඇතැයි පොලීසිය සඳහන් කරයි . ඉදිරි විමර්ශන වලදී හෙළි වන තොරතුරු මත අධිකරණ ක්‍රියාමාර්ග ගන්නා බව පොලිසිය සඳහන් කරයි

ගම්පහ කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී කේ. කේ. ඉන්දික ද සිල්වා මහතාගේ මෙහෙයවීම යටතේ දිස්ත්‍රික් අපරාධ විමර්ශන කොට්ඨාසයේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක සුමිත් ගුණවර්ධන පොලිස් සැරයන්වරුන් වන 13092අංජන, 2926පුෂ්පානන්ද,60900ප්‍රදීප්,1867 හෙට්ටිගේ සහ පොලිස් කොස්තාපල් 81544 වීරතුංග යන නිලධාරීහු මෙම වැටලීමට එක්ව සිටියහ

ගලෙන්බිඳුණුවැව සමූහ ජයන්ත වාසුලසේන

# යූරියා පොහොර ලබාගන්න දිගු පෝලිම්

ඉදිරියේදී යූරියා පොහොර හිඟයක් ඇතිවේයැයි යන බියෙන් හුරුළුවැව ව්‍යාපාරයේ ගොවීන් ඉකුත් 28 වැනි දිනයේදී ගලෙන්බිඳුණුවැව නගරයේ වෙළෙඳසැල් ඉදිරිපිට යූරියා පොහොර ලබාගැනීමේ අරමුණ ඇතිව දිගු පෝලිම් ගැසී සිටින අයුරු දකින්නට ලැබුණු බව ගලෙන්බිඳුණුවැව ප්‍රදේශවාසීහු පවසති . මේ දිනවලදී හුරුළුවැව ව්‍යාපාරය පුරා ඉදිරියේදී යූරියා පොහොර හිඟයක් ඇතිවන බවට ඇතැම් පුද්ගලයන් විසින් ගෙනයන කටකතා හේතුවෙන් මෙසේ ගොවීන් විශාල වශයෙන් යූරියා පොහොර එක්රැස්කර තබාගැනීමට පෙලඹීම මෙම දිගු පෝලිම්වලට හේතුවී ඇතිබවද ගලෙන්බිඳුණුවැව ප්‍රදේශවාසිහු පවසති. රජය මඟින් ඉදිරියේදී රසායනික පොහොර භාවිතයෙන් ඉවත්කර ඒ වෙනුවට කාබනික පොහොර භාවිතාකර වගාවන් සිදුකිරීමට ගොවීන් නැඹුරුකරන බව පැවසීම නිසා එය වැරදිලෙස වටහාගත් ගොවීන් මෙසේ විශාල වශයෙන් පොහොර එක්රැස්කර තබාගැනීමට පෙළඹී ඇතිබවද කෘෂිකර්ම නිලධාරීහු පවසති.

දිනමිණ දසත දස අත ම එක තැන



රාහුල් සමන්ත හෙට්ටිආරච්චි - අම්බලන්තොට සමූහ

# හම්බන්තොට කොරෝනා ප්‍රතිකාර මධ්‍යස්ථානයට රෝගීන් ඇතුළත් කිරීම සීමා කෙරේ

හම්බන්තොට කොරෝනා ප්‍රතිකාර මධ්‍යස්ථානයේ සේවය සඳහා ප්‍රමාණවත් වෛද්‍ය වරුන් ඇතුළු කාර්යමණ්ඩලය නොමැති වීම නිසා මේ වනවිට රෝහලට කොරෝනා රෝගීන් ඇතුළත් කිරීම සීමා කර තිබේ.

හම්බන්තොට පැරණි රෝහලේ ස්ථාපිත කර තිබෙන කොරෝනා රෝගී ප්‍රතිකාර ඒකකයේ අප්‍රේල් 28 වැනිදා වනවිට රෝගීන් 229ක් ප්‍රතිකාර ලබන අතර එම රෝගීන් සියලු දෙනාහටම ප්‍රතිකාර කිරීමට යොදවා ඇත්තේ වෛද්‍ය වරුන් හතර දෙනකු බවත් තවත් රෝගීන් ඇතුළත් කරගැනීමෙන් ඔවුන්හට ප්‍රතිකාර කිරීමට එම වෛද්‍ය වරුන් ගණන ප්‍රමාණවත් නොමැති බවයි රෝහල් බලධාරියකු කියා සිටියේ.

කෙසේ නමුත් තවත් රෝගීන් 100 දෙනෙකුට පමණ අවශ්‍ය ඇඳන් රෝහලේ තිබෙන බවද හෙතෙම කියා සිටියේය.

මාතලේ දිස්ත්‍රික් සමූහ

# සෞඛ්‍ය අංශ ලබාදුන් උපදෙස් පිළිනොපැදීම නිසා දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානය වසා දැම්මා

## කොවිඩ් කමිටු සම්බන්ධීකාරක මේජර් ජෙනරාල් නිශාන්ත මානගේ

මාතලේ දිස්ත්‍රික් කොවිඩ් කමිටුවේ සෞඛ්‍ය අංශ විසින් ලබාදුන් උපදෙස් නොතකා හරිමින් එම උපදෙස් සමච්චලයට ලක් කරමින් පී.සී.ආර්.පරීක්ෂණ සිදුකිරීම දඹුල්ල විශේෂිත ආර්ථික මධ්‍යස්ථානයේ පිරිස් විසින් මගහැරීමට කටයුතු කිරීම නිසා නැවත දැනුම් දෙනතුරු මෙම ආර්ථික මධ්‍යස්ථානය වසා දැමීමට සිදුවූ බව මාතලේ දිස්ත්‍රික් කොවිඩ් කමිටු සම්බන්ධීකාරක මේජර් ජෙනරාල් නිශාන්ත මානගේ මහතා පැවසිය.

මේජර් ජෙනරාල්වරයා මෙසේ පැවසුවේ දඹුල්ලේ දැනට පැනනැඟී ඇති සුවිශේෂි තත්ත්වය සැලකිල්ලට ගනිමින් දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී පසුගිය අඟහරුවාදා ( 27) පැවති මාතලේ දිස්ත්‍රික් කොවිඩ් මර්ධන කමිටු රැස්වීමට සහභාගිවෙමිනි.

මෙහිදී ඒ මහතා වැඩිදුරටත් මෙසේද සඳහන් කළේය.

දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානයේ කොවිඩ් වයිරසය ආසාදිතයන් හතළිස්අටදෙනකු (48) වාර්තාවීමත් සමගම එහි ව්‍යාප්තිය පාලනය කිරීම සඳහා මාතලේ දිස්ත්‍රික් කොවිඩ් මර්ධන කමිටුවේ තීරණයක් අනුව දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානයේ සියලුම ව්‍යාපාරිකයන්,සේවකයන් මෙන්ම කම්කරුවන්ගේද පි.සි.ආර්.පරීක්ෂණ සිදුකර නිරෝගී පුද්ගලයන් සමග ආර්ථික මධ්‍යස්ථානය දැනට වසාදමා ඇති දින තුනෙන් පසුව යළි විවෘත කිරීමට හැකි බව සෞඛ්‍ය අංශ විසින් දඹුල්ල ආර්ථික මධ්‍යස්ථාන වෙළෙඳ සංගමයට හා ආර්ථික මධ්‍යස්ථාන කළමනාකරණ භාරයට උපදෙස් ලබාදුන්නා.

නමුත් එම උපදෙස් නොතකා හරිමින් එකී උපදෙස් සමච්චලයට ලක් කරමින් ඔවුන් කටයුතු කර තිබෙනවා. සෑම ව්‍යාපාරික පරිශ්‍රයකම සේවයේ නිරත පිරිස් පී.සී.ආර් පරීක්ෂණ සඳහා යොමු කිරීමට ව්‍යාපාරිකයන්ට මෙසේ උපදෙස් ලබාදුන්නත් ඒ ගැන නොතකා ඇතැම් ව්‍යාපාරිකයන් තමන් වෙනුවට මෙම කමිටු රැස්වීමට එවා තිබුනේ කම්කරුවන්.

එපමණක් නොව දින තුනක් මෙම මධ්‍යස්ථානය වසාදමා එම ස්ථානයන්හි සේවය කරනු ලබන පුද්ගලයින් පී.සී. ආර් පරීක්ෂණ සඳහා යොමුකරන ලෙස ව්‍යාපාරිකයන්ගෙන් ඉල්ලා සිටි නමුත් මෙම පරීක්ෂණය සඳහා යොමුවුණේ ඉතා සුළු පිරිසක්.

මෙම මධ්‍යස්ථානයේ කම්කරුවන් දහසකට වඩා සේවය කරනවා.මොවුන් මෙසේ මෙම පරීක්ෂණ මගහැරීම මෙම රෝග ව්‍යාප්තියට හේතුවක් වෙනවා.එම නිසා කොවිඩ් රෝගය පැතිරයෑම වැළැක්වීම සඳහා මෙම ආර්ථික මධ්‍යස්ථානය තවදුරටත් හුදකලා කිරීමට කොවිඩ් මර්ධන කමිටුව තීරණය කළා.

දමන සමූහ කේ.ඒ.මෛත්‍රීපාල

# ඔක්සිජන් නිෂ්පාදනාගාරය නිරීක්ෂණය කරයි



අම්පාර දිස්ත්‍රික්කය පුරා පැතිර යන කොවිඩ් 19 තත්ත්වයට මුහුණ දීමට ඉදිරියේදී ඔක්සිජන් ලබා දීම අවශ්‍ය වුවහොත් ඒ සඳහා පෙර සූදානමක් තිබිය යුතු බැවින් දිගාමඩුල්ල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී වෛද්‍ය තිලක් රාජපක්ෂ මහතා අම්පාර දිස්ත්‍රික්කයේ මහඔය රෝහලේ පිහිටි ඔක්සිජන් නිෂ්පාදනාගාරය නිරීක්ෂණය සඳහා එහි ගියේය. එහිදී ඉදිරියේදී වඩාත් කාර්යක්ෂමව මෙම නිෂ්පාදනාගාරය ක්‍රියාත්මක කිරීමටනම් දැනට තිබෙන යම් යම් අඩුපාඩු ඉතා ඉක්මනින් නැවත සකස් කිරීමට ඒ සඳහා අවශ්‍ය කඩිනම් විසඳුම් ලබා ගැනීම සඳහා අදාළ අංශ දැනුවත් කිරීමට වෛද්‍ය තිලක් රාජපක්ෂ මහතා පියවර ගත්තේය. එසේම දැනට මෙහි දිනකට සෑම පැය 4කට වරක්ම විශාල ප්‍රමාණයේ ඔක්සිජන් ටැංකි 8ක් පිරවීම් කළහැකි අතර ඒ අනුව දිනකට විශාල ප්‍රමාණයේ ටැංකි 48ක් පිරවීම කළ හැක. මෙහි දැනට හදිසි ප්‍රතිකාර ඒකක හා ශල්‍යාගාර සඳහා අවශ්‍ය ඔක්සිජන් ටැංකි පිරවීමේ නොහැකියාවක් පවතින අතර එයද මෙහි ආරම්භ කිරීමට අවශ්‍ය කටයුතු දින කීපයක් ඇතුළත සකස් කිරීමට අදාළ අංශ දැනුවත් කළ බවද වෛද්‍ය තිලක් රාජපක්ෂ මහතා පැවසීය.

ඩී.එස් ගුණතිලක -ඌව වෙල්ලස්ස විශේෂ

# වන අලියකු පහරදීමෙන් වගුරුවෙල ගොවියෙක් මරුට

ගෝනගංආර වගුරුවෙල පන්සල පාරේ පිහිටි වගාබිමක් ආරක්ෂාව සඳහා යමින් සිටි ගොවියකු අලියකු පහරදීමෙන් ජීවිතක්ෂයට පත්වී ඇතැයි ගෝනගංආර පොලීසිය පවසයි.

මෙලෙස ජීවිතක්ෂයට පත්ව ඇත්තේ බුත්තල වගුරුවෙල පන්සල පහර පදිංචි ඩබ්ලිව්. පී ප්‍රේමදාස (57) නැමති තිදරු පියෙකි.

හෙතෙම නිවසේ සිට හේනට යමින් සිටියදී වන අලියකු පහරදීමෙන් බුත්තල ප්‍රාදේශීය රෝහලට ඇතුළත් කොට වැඩිදුර ප්‍රතිකාර සඳහා මොනරාගල රෝහලට මාරුකිරීමෙන් අනතුරුව (29) අලුයම මියගොස් ඇත.

ගෝනගංආර පොලිස් ස්ථානාධිපති ඒ.එල්.ඩී සතිෂ් කුමාර මහතා පරීක්ෂණ පවත්වයි.

කේ.ඒ.මෛත්‍රීපාල - දමන සමූහ

# ඔක්සිජන් නිපදවන යන්ත්‍රයක් හඳුන්වා දෙයි



බදුල්ලේ ඉංජිනේරුවන් හා රජයේ වෛද්‍ය නිලධාරින්ගේ සංගමයේ වෛද්‍යවරුන් විසින් රෝගීන්ට වාට්ටුව තුළම ඉතාම අඩු මිලට ඔක්සිජන් නිපදවා ලබා දිය හැකි යන්ත්‍රයක් රෝහල වෙත හඳුන්වාදීම සිදු කෙරිණි. මේ මඟින් ඔක්සිජන් අධික මිලට දියර ලෙස නිපදවා ටැංකි මඟින් රැගෙනවිත් ලබා දීම වෙනුවට වාට්ටුව තුළම ඔක්සිජන් නිපදවාගත හැක.

ඌරුබොක්ක විශේෂ - ඒ.පී.දයාචන්ද්‍ර

# පස්ගොඩ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි වරයාට පහරදීමට තැත් කළැයි සැකකරු අත්අඩංගුවට

පස්ගොඩ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි වරයාට පහරදීමට උත්සාහ කිරීම සහ එම පහරදීම වැළැක්වීමට මැදිහත් වූ පුද්ගලයකුට පහරදුන් පුද්ගලයකු රොටුඹ පොලීසිය විසින් පෙරේදා (28) දින දහවල් අත්අඩංගුවට ගෙන ඇත.

මෙසේ අත්අඩංගුවට ගෙන ඇත්තේ පස්ගොඩ,පහළවත්ත පදිංචි 35 හැවිරිදි පුද්ගලයකු බවට පොලීසිය පැවැසීය.පස්ගොඩ සෞඛ්‍ය මධස්ථානයේ මාසිකව පැවැත්වෙන ළමා හා මාතෘ සායනය පෙරේදා (28) දින පැවැති අතර එම සායනයට තම දරුවාට එන්නත් කර ගැනීම සඳහා පැමිණි මවකගේ ස්වාමි පුරුෂයකු තම භාර්යාව නිවෙසට යෑම ප්‍රමාද වීම නිසා සායනය පැවැති ස්ථානට පැමිණ භාර්යාවට පරුෂ වචනයෙන් බැන පහරදීමට උත්සාහ කර ඇති අතර එම ස්ථානයේ සායනය පැවැත්වූ ඌරුබොක්ක හීගොඩ ප්‍රාදේශීය රෝහලට අනුයුක්තව ඇති පස්ගොඩ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි වෛද්‍ය එම්.කේ.බන්දුතිලක් (54) මහතාටද පරුෂ වචනයෙන් බැන පහර දීමට උත්සාහ කර ඇති අතර එම පහරදීම වැළැක්වීමට සිය භාර්යාව සමඟ පැමිණ සිටී ස්වාමි පුරුෂයකු මැදිහත්වී ඇති අතර ඒ අවස්ථාවේ ඔහුට පහරදී ඇත.මෙසේ පහරකෑමට ලක්ව ඇත්තේ පස්ගොඩ පොතුහැල්ගොඩ ප්‍රදේශයේ පදිංචි ඉලන්දාරිගේ චාමර (32) යන අයයි.සිද්ධිය වන අවස්ථාවේ පස්ගොඩ සෞඛ්‍ය මධස්ථානය තුළ පවුල් සෞඛ්‍ය නිලධාරිණියන්,පස්ගොඩ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයේ සේවකයන්,ත්‍රිපෝෂ ලබා ගැනීමට සහ දරුවාට එන්නත් කර ගැනීම සඳහා පැමිණි මව්වරුන් සහ පියවරුන්ද ඇතුළු පිරිසක් සිට ඇත.

පහරදීමට සම්බන්ධ පුද්ගලයා පොලීසිය විසින් අත්අඩංගුවට ගෙන ඇති අතර එහිදී ඔහු අධික ලෙස මත්පැන් පානය කර සිට ඇත.

එස්. ජී. උබේපාල - කැබිතිගොල්ලෑව සමූහ

# රසායනික පොහොර නැතිව ඕනෑම භෝගයක් වගා කළ හැකියි

## ග්‍රාමීය සමාජ සංවර්ධන ආයතනයේ විධායක අධ්‍යක්ෂ



ලංකාවේ වකුගඩු රෝගීන් සහ පිළිකා රෝගීන් දිනෙන් දින වැඩි වෙමින් පවතින බවත් ජලය සමඟ පරිසරය සම්පූර්ණයෙන්ම අපවිත්‍ර වන මේ රසායනික පොහොර නැතිව රට තුළ ඕනෑම භෝගයක් වගා කළ හැකි බවත් රසායනික කෘමිනාශක වර්ග සහ රසායනික පොහොර රටට ගෙන්වීම නතර කිරීමට ජනාධිපතිවරයා ගත් තීරණය අගය කළ යුතු ක්‍රියාවක් බවත් ග්‍රාමීය සමාජ සංවර්ධන ආයතනයේ විධායක අධ්‍යක්ෂ නිමල් පද්මසිරි මහතා කියා සිටියේය.

කාබනික පොහොර සහ කෘමිනාශක රටට ගෙන්වීමේදී ඇති වන බලපෑම් සහ වාසි පිළිබඳව අදහස් පැහැදිලි කරමින් පසුගියදා (22) පදවිය සුදර්ශනගම ගම්මානයේදී විධායක අධ්‍යක්ෂවරයා එසේ පැවැසීය.

වැඩිදුරටත් අදහස් දැක්වූ ග්‍රාමීය සමාජ සංවර්ධන ආයතනයේ විධායක අධ්‍යක්ෂ නිමල් පද්මසිරි මහතා මෙසේ ද පවසා සිටියේය.

"ලංකාවේ වකුගඩු රෝගය සහ පිළිකා රෝග එන්න එන්නම වැඩි වෙමින් පවතිනවා. ජලය සමඟ පරිසරය සම්පූර්ණයෙන්ම අපවිත්‍ර වන මේ රසායනික පොහොර නැතිව අප රට තුළ ඕනෑම භෝගයක් වගා කළ හැකියි. අප එය පදවිය සුදර්ශනගමින් රටටම ඔප්පු කර පෙන්වා දී තිබෙනවා. කාබනික පොහොර හදන්න අපේ රටේ ඕනෑතරම් සම්පත් තිබෙනවා. අමු ගොම, පිදුරු, ගිනිසීරියා කොළ ඒ වාගේම අප මුළුතැන්ගෙවල්වලින් ඉවත් කරන කුණු රොඩු අපට ප්‍රයෝජනයට ගන්න පුළුවන්. මෙච්චර සම්පත් තිබිලත් අපේ රටේ ඒ සම්පත් නිසි ප්‍රයෝජනයක් ගන්නේ නැති වීම ලොකුම අඩුවක්."

ඩබ්. ක්‍රිස්පිල් බෙනඩික් ප්‍රනාන්දු - පුත්තලම සමූහ

## කොවිඩ් පිළිබඳ දැනුම්වත් කිරීමක්

සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කිරීම පිළිබඳව ජනතාව දැනුම්වත් කිරීමේ වැඩසටහනක් පසුගියදා (27) හලාවත නගරයේදී පැවැත්විණි. හලාවත පොලිස් අධිකාරි ලලිත් රෝහණ ගමගේ මහතාගේ මෙහෙයවීම යටතේ හලාවත පොලිසියේ නිලධාරීන් එම දැනුම්වත් කිරීම් සිදු කළ අයුරුයි මේ.



කිරිඳිවැල සමූහ

## කිරිඳිවැල හදිසි මෙහෙයුමකින් 26ක් අත්අඩංගුවට

බස්නාහිර පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහතාගේ උපදෙස් මත කිරිඳිවැල පොලිස් වසමේ සිදු කළ විශේෂ සෝදිසි මෙහෙයුමකදී වරෙන්තුකරුවන් 16ක්, ගංජා ළඟ තබාගත් 8ක් සහ හෙරොයින් ළඟ තබාගත් දෙදෙනෙක් අත්අඩංගුවට ගැනීමට පසුගියදා කිරිඳිවැල පොලිසියේ නිලධාරීන් සමත් වී තිබේ. මෙලෙස අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට නියමිතව තිබිණි. එසේම දහවල් කාලයේදී පොල් කඩමින් රාත්‍රී කාලයේදී සූක්ෂ්මව ගෙවල් කොල්ලකෑ දෙදෙනකු ද අත්අඩංගුවට ගෙන ඇති අතර සැකකරුවන් සොරකම් කරන ලද නිවෙස්වල භාණ්ඩ විකුණා මුදල් ලබාගෙන තිබේ.

බස්නාහිර පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහතාගේ නියෝගය මත බස්නාහිර උතුර භාර නියෝජ්‍ය පොලිස්පති දමයන්ත විජය ශ්‍රී, ගම්පහ කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි ඉන්දික ද සිල්වා, සහකාර පොලිස් අධිකාරි iii චින්තක පීරිස් යන මහත්වරුන්ගේ මෙහෙයවීමෙන් කිරිඳිවැල පොලිසියේ ස්ථානාධිපති ප්‍ර.පො.ප. නිරංජන් මිලන් ද සිල්වා, අපරාධ අංශයේ ස්ථානාධිපති පො.ප. දේශාන්ත පෙරේරා, දූෂණ මර්දන අංශයේ ස්ථානාධිපති පො.ප. පරාක්‍රම, පො.සැ. වරුන් වන (55562) වසන්ත නවරත්න, (31028) රත්නායක, පො.කො. (83397) ගයාන් යන නිලධාරීහු විශේෂ මෙහෙයුමට එක් වූහ.

ගයාන් සංජය

## අත්තනගලු ඔයේ ජයටම කසිප්පු පෙරලා



ගම්පහ මාකවිට කළුවල්ගොඩ ප්‍රදේශයේ අත්තනගලු ඔය ආශ්‍රිතව සූක්ෂ්මව කරගෙන ගිය හොර මත්පැන් නිෂ්පාදනාගාරයක් වැටලීමට ගම්පහ පොලිසියේ දූෂණ මර්දන අංශය පසුගියදා සමත් වී තිබේ. මේ වැටලීම ගම්පහ කොට්ඨාස බුද්ධි අංශයෙන් ලද තොරතුරකට අනුව ගම්පහ පොලිසියේ දූෂණ මර්දන අංශයේ ස්ථානාධිපති බිනුර රණසිංහ මහතා ඇතුළු නිලධාරීන් විසින් සිදු කර ඇත.

මේ වැටලීමේදී බැරල් 15ක තිබී ගෝඩා මිලිලීටර 2,700,000ක් සහ මත්පැන් පෙරීමට භාවිත කළ උපකරණ ද අත්අඩංගුවට ගෙන තිබේ.

බස්නාහිර පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහතාගේ නියෝගය මත බස්නාහිර උතුර භාර නියෝජ්‍ය පොලිස්පති දමයන්ත විජය ශ්‍රී, ගම්පහ කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි ඉන්දික ද සිල්වා, සහකාර පොලිස් අධිකාරි i තුසිත කුමාර යන මහත්වරුන්ගේ උපදෙස් මත ගම්පහ මූලස්ථාන පොලිස් පරීක්ෂක ප්‍ර.පො.ප. සමන් ජයසිංහ, දූෂණ මර්දන අංශයේ ස්ථානාධිපති උ.පො.ප. බිනුර රණසිංහ, උ.පො.ප. හේරත්, පොලිස් කොස්තාපල්වරුන් වන (87450) බණ්ඩාර, (71035) කරුණාරත්න, (92559) මුණසිංහ යන නිලධාරීහු වැටලීමට එක් වූහ.

දිනමිණ
දිසත
දස අත ම එක තැන

ප්‍රසාද් පූර්ණමාල් - පුත්තලම දිසා සමූහ

# වයඹ බටහිර වෙරළ තීරයේ මුහුදු ජලය පාරට



අසාමාන්‍ය ලෙස මුහුදු රළ ගොඩබිම දෙසට පැමිණීම හේතුවෙන් වයඹ බටහිර වෙරළ තීරයේ මුතුපන්තිය, තොඩුවාව යන ගම්මානවලට ගැටලු මතුව තිබේ. ඉකුත්දා (27) පස්වරුවේ මේ තත්ත්වය ඇතිවී ඇති අතර ඒ අනුව මාස දෙකක කාලයක් තුළ අවස්ථා තුනකදී මේ ගම්මානවලට මුහුදු ජලය පැමිණ තිබේ. මේ තත්ත්වය හේතුවෙන් මුතුපන්තිය ගම්මානයේ නිවාස කිහිපයක් මුහුදු ජලයෙන් යටවී ඇත. මීට අමතරව මාර්ගයට ද හානිවී තිබේ.

මේ පිළිබඳව කළ විමසීමේදී මුතුපන්තිය ධීවර සමිතියේ ලේකම් මර්වින් ප්‍රනාන්දු මහතා කියා සිටියේ මුහුද ගොඩ ගැලීම හේතුවෙන් නිවාසවල ජීවත් වීමට පවා නොහැකි තත්ත්වයක් උදා වී ඇති බවයි. මේ අතර තොඩුවාව ප්‍රදේශයේ මුහුද රළු වීම හේතුවෙන් ද නිවාස කීපයක් මුහුදට සේදී යෑමේ අවදානමක් මතුව තිබේ. මේ පිළිබඳව කළ විමසීමකදී ජාතික ධීවර සහයෝගීතාවයේ පුත්තලම දිස්ත්‍රික් සම්බන්ධීකාරක ලොයෙල් පිරිස් මහතා කියා සිටියේ පසුගියදා (27) පෙරවරුවේ සිටම මුහුද රළු ස්වභාවයක් ගෙන ඇති බවයි. මේ තත්ත්වය මාස දෙකකට ආසන්න කාලයක සිට පවතින අතර මීට හේතු සොයා වහා පිළියම් යෙදිය යුතු බවද පැවසීය. රජය මේ වන විට තොඩුවාව වෙරළ තීරයට ගල් වැටි දැමීම සිදු කරයි.

බී. ටී. තඹවිට - මතුගම

## මතුගම විශේෂ මෙහෙයුමකින් ජාවාරමුන් 9ක් කොටු

ඉත්තපාන පොලිසිය එකම දිනක සිදු කළ විශේෂ මෙහෙයුමකින් හෙරොයින් මිලිග්‍රෑම් 60ක්, කසිප්පු බෝතල් 25ක්, වල්ලාපට්ටා කිලෝ 05ක්, බීමත් රියැදුරන් 02ක් සමඟ සැකකරුවන් 09ක් අත්අඩංගුවට ගෙන ඇත. පොලිස්පතිවරයාගේ නියෝග මත ඉත්තපාන පොලිස් ස්ථානාධිපති පොලිස් පරීක්ෂක සුරේෂ් තරංග මාවතගේ මහතාගේ මෙහෙය වීමෙන් සිදු කළ විශේෂ මෙහෙයුමකදී මේ අත්අඩංගුවට ගැනීම සිදු කර ඇත. ඉත්තපාන පොලිස් වසමේ සඳපහනවත්ත ප්‍රදේශයෙන් හෙරොයින් මිලිග්‍රෑම් 60ක් සමඟ සැකකරුවන් 04 දෙනෙක් ද මිරිස්වත්ත වතුයායෙන් කසිප්පු බෝතල් 25ක් සමඟ එක සැකකරුවකුද කරපාගල ප්‍රදේශයෙන් වල්ලාපට්ටා කිලෝ 05ක් සමඟ සැකකරුවන් දෙදෙනකුද බීමත්ව රිය පැදවූ දෙදෙනකුද මේ මෙහෙයුම අතරතුරදී අත්අඩංගුවට ගැනීමට හැකි වී ඇත. අත්අඩංගුවට ගත් සැකකරුවන් අධිකරණයට ඉදිරිපත් කිරීමට නියමිත අතර ඉත්තපාන පොලිසියේ ස්ථානාධිපති පොලිස් පරීක්ෂක සුරේෂ් තරංග මාවතගේ, රථ වාහන අංශයේ ස්ථානාධිපති පොලිස් සැරයන් (44914) රසාංග, පොලිස් සැරයන් (624) සම්පත්, පොලිස් කොස්තාපල් (88148) අජිත්, (97647) කන්දෙපොළ යන නිලධාරීහු මෙහෙයුමට එක් වූහ.

තමරසිරි විජේසේකර - දෙයියන්දර සමූහ සහ ටී.කේ. මහින්ද - වැලිගම සමූහ

## චාලිමවුන්ට් වත්ත කර්මාන්ත පුරය බලන්න කථානායක යයි



වැලිගම චාලිමවුන්ට් වත්ත කර්මාන්ත පුරය ආරම්භ කිරීමට අවශ්‍ය යෝජිත භූමිය පිළිබඳ සොයා බැලීමේ නිරීක්ෂණ චාරිකාවක් කථානායක මහින්ද යාපා අබේවර්ධන මහතාගේ ප්‍රධානත්වයෙන් පසුගියදා (27) සිදු කෙරිණි.

අමාත්‍ය ඩී. වී. චානක, මාතර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී නිපුණ රණවක යන මහත්වරු ඇතුළු රාජ්‍ය නිලධාරීහු පිරිසක්ද එක්ව සිටියහ.

ඒ. පී. දයාචන්ද්‍ර - ඌරුබොක්ක විශේෂ

## වලස්මුල්ල ප්‍රධාන මාර්ගයේ අලි නාවන වළක්

ඌරුබොක්ක හුලංකන්ද හරහා වලස්මුල්ල ප්‍රධාන මාර්ගයේ හීගොඩ අඹගහහේන ප්‍රදේශයේ මාර්ගයේ ඇති මඩ වළක් හේතුවෙන් මාර්ගය භාවිත කරන රථ වාහන රියැදුරන් දැඩි අපහසුතාවකට පත් වන බවට ප්‍රදේශවාසීහු පවසති.

සුළු වැසි තත්ත්වයකදී පවා අඩි 5 - 6ක් උසට මේ ස්ථානයේ ජලය රැඳෙන අතර එය දින තුනහතරක් යන තෙක් ජලය පිරී පවතින බවට ඔවුහු පෙන්වා දෙති.

මේ හේතුවෙන් රථ වාහන රියැදුරෝ දැඩි අපහසුතාවකට පත්ව ඇති අතරම යතුරුපැදිකරුවන් දිනපතාම මේ ස්ථානයේ වැටී තුවාල ලබා තිබේ. අධික වැසි ඇති වූ අවස්ථාවලදී මේ මඩ වළ හේතුවෙන් පයින්වත් යෑමට නොහැකි තත්ත්වයට පත්වන



අතරම එම අවස්ථාවලදී කෙටි දුරක් යෑමට වුවත් මඟීන්ට සිදු වනුයේ බස් රථයක් පැමිණෙන තෙක් රැඳී සිට මඩ වළ තිබෙන ස්ථානයෙන් බස් රථයෙන් එගොඩ වීමටයි.

මේ ගැටලුව දැනට වසර ගණනාවක සිටම තිබෙන අතර අවස්ථා ගණනාවකදීම මාධ්‍ය මඟින් පෙන්වා දුන්නත් කිසිම බලධාරියෙක් මඩ වළ වසා දැමීමට කටයුතු කර නැත.

පරාක්‍රම ගුණසේකර - සූරියවැව සමූහ

## දුම්කොළ සහ මද්‍යසාර පාලනයට හම්බන්තොට ප්‍රා. සභාවෙන් යෝජනාවක්

මහජනතාවගේ යහපැවැත්ම, ආර්ථිකය සහ සමාජයීය දියුණුව අරමුණු කර ගනිමින් දුම්කොළ සහ මද්‍යසාර පාලනය තවදුරටත් ශක්තිමත් කිරීමට යෝජිත සංශෝධන ගෙන ඒමටත් තනි සිගරට් අලෙවිය තහනම් කිරීමටත් අවශ්‍ය නීති සම්මත කර ක්‍රියාත්මක කරන ලෙස රජයෙන් ඉල්ලා සිටීමේ යෝජනාවක් හම්බන්තොට ප්‍රාදේශීය සභාව මඟින් රජයට ඉදිරිපත් කර තිබේ.

ඉකුත්දා පැවති හම්බන්තොට ප්‍රාදේශීය සභාවේ මාසික මහ සභා රැස්වීමේදී යෝජනාව ඉදිරිපත් කළ සභාපති ගාමිණි සමරගුණරත්න මහතා මෙසේ පැවසීය.

"මද්‍යසාර, දුම්කොළ සහ අනිකුත් මත්ද්‍රව්‍ය භාවිතය වැඩි වීමෙන් රටේ සම්පත් විනාශ වෙමින් රටේ සංවර්ධනයට මරු පහරක් එල්ල වී තිබෙනවා. අපේ බාල පරපුර දුම්වැටිවලට සහ මද්‍යසාරවලට ඇබ්බැහි කිරීමේ කූට උපක්‍රම ක්‍රියාත්මක කෙරෙනවා. මිනිසුන්ගේ යහපැවැත්ම, ආර්ථිකය සහ සමාජයීය දියුණුව අරමුණු කර ගනිමින් දුම්කොළ සහ මද්‍යසාර පාලනය තවදුරටත් ශක්තිමත් කළ යුතුයි."

ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්. ඒ. නිහාල් ශාන්ත මහතා (එ.ජා.ප.) එම යෝජනාව ස්ථිර කරමින් එම යෝජනාව ඉදිරිපත් කළ සභාපතිවරයාට ස්තුතිය ද පළ කර සිටියේය.

රූපිකා කේ. බණ්ඩාර - කුරුවිට සමූහ

## කහවත්ත මූලික රෝහලට පස්මහල් ගොඩනැඟිල්ලක්

සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුව රත්නපුර, කහවත්ත මූලික රෝහලට රුපියල් ලක්ෂ 1,950ක වියදමින් ඇඳන් දෙසියපනහකින් සමන්විත පස්මහල් වාට්ටු සංකීර්ණ ගොඩනැඟිල්ලක් සඳහා ඉකුත්දා (24) මුල්ගල් තබන ලදි. රත්නපුර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ප්‍රේමලාල් ජයසේකර මහතාගේ ඉල්ලීමක් මත පළාත් ආණ්ඩුකාර ටිකිරි කොබ්බෑකඩුව මහතාගේ ආශීර්වාදයෙන් සෞඛ්‍ය ඇමැතිනි පවිත්‍රා වන්නිආරච්චි මහත්මියගේ මැදිහත්වීමෙන් මේ වාට්ටු සංකීර්ණය ඉදිකරනු ලබයි.

මේ අවස්ථාවට කහවත්ත ප්‍රාදේශීය සභාවේ සභාපති කේ. ජිනදාස මහතා ඇතුළු මන්ත්‍රීවරු, සබරගමු පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෛද්‍ය කපිල කන්නන්ගර මහතා, කහවත්ත ප්‍රාදේශීය ලේකම් ගයානි කරුණාරත්න මහත්මිය, කහවත්ත මූලික රෝහලේ අධ්‍යක්ෂවරයා ඇතුළු පිරිස සහභාගි වී සිටියහ.

වජිර පූජිත ගුණවර්ධන - තෙලිජ්ජවිල සමූහ

## දකුණේ ව්‍යවසායකයන්ට බැංකු ණය දීමේ සාකච්ඡාවක්

කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් සඳහා ආසියානු සංවර්ධන බැංකු ණය යෝජනා ක්‍රමය යටතේ මාතර, ගාල්ල දිස්ත්‍රික් දෙකේ කුඩා තේ වතු හිමියන්ට බැංකු ණය දීමේ ප්‍රගති සමාලෝචනය කිරීමේ සාකච්ඡාවක් පසුගියදා ගාල්ල මහමෝදර "සනෝරා" උත්සව ශාලාවේදී දැඩි සෞඛ්‍ය රීතිවලට අනුකූලව සිදු කරන ලදි. මේ අවස්ථාවට වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ අතිරේක ලේකම් තරංගනී වික්‍රමසිංහ, සහකාර අධ්‍යක්ෂ ප්‍රභාත් ජයරත්න, කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ සභාපති මහින්ද විදානපතිරණ, සාමාන්‍යාධිකාරි ධම්මික මහීපාල, කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ මාතර, ගාල්ල ප්‍රදේශීය කළමනාකරු ඊ. ආර්. එස්. ගුණවර්ධන, සාලිය නාරංගස්පිටිය, සහකාර ප්‍රාදේශීය කළමනාකරුවන් වන උදුල දසන්ත, තාරක අමරරුවන්, මොහොට්ටි යන මහත්ම මහත්මීහු රජයේ සහ පෞද්ගලික අංශයේ වාණිජ බැංකුවල නියෝජිත මහත්වරුන් සහ කුඩා තේ වතු සමිති නියෝජිත මහත්වරු සහ කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ මාතර, ගාල්ල සියලුම තේ පරීක්ෂක මහත්ම මහත්මීහු එම සාකච්ඡාවට එක් වී සිටියහ.

අම්බලන්ගොඩ සමූහ - ආර්. ඥාණදාස

# සභාවේ මන්ත්‍රීවරුන් කියන කිසිම දෙයක් ඇතැම් නිලධාරීන් ගණන් ගන්නේ නෑ

## - උප සභාපති කමල් වැල්ලගේ (ශ්‍රීලපොපෙ)

**අම්බලන්ගොඩ නගර සභාව**

අම්බලන්ගොඩ නගරය පුරා මාර්ග අයිනේ විශාල ප්‍රමාණයේ දැන්වීම් පුවරු දකින්න තිබෙනවා. මේ නිසා මරණ දැන්වීමක්වත් අලවන්න තැනක් නැහැ. මේ අනවසර විශාල ප්‍රමාණයේ දැන්වීම් පුවරු නිසා පදිකයන්ටත් පාර මැදින් තමයි ගමන් කරන්න වෙලා තියෙන්නෙ. මේ විශාල ප්‍රමාණයේ දැන්වීම් සතියක් ඇතුළත ඉවත් කර ගන්න කියල මේව සවි කරන අයට දැනුම් දෙන්න. එහෙම නැති වුණොත් ඒ දැන්වීම් පුවරු නගර සභාව මගින් ඉවත් කිරීමට පියවර ගත යුතු යැයි අම්බලන්ගොඩ නගර සභාවේ මාසික රැස්වීමේදී නගර සභා මන්ත්‍රී සරත් ශ්‍රී ලාල් මහතා (ශ්‍රීලපොපෙ) පැවසුවේය.

මාසික සභා රැස්වීම නගර සභාපති නීතිඥ අරුණ ප්‍රදීප් මහතාගේ (ශ්‍රීලපොපෙ) ප්‍රධානත්වයෙන් නගර සභා රැස්වීම් ශාලාවේදී පැවැත්විණි.

**නීතිඥ ලක්ෂ්මී හේමන්තා මහත්මිය (ශ්‍රීලපොපෙ)** - නගරයේ අතුරු මාර්ගවල පවා මෙවැනි දැන්වීම් දකින්න ලැබෙනවා. පක්ෂ පාට නොබලා මේ සියලුම දැන්වීම් ඉවත් කළ යුතුයැයි කියා මමත් කියා සිටිනවා.

**එස්.එම්. සරත් චන්ද්‍ර මහතා (ජවිපෙ)** - නගරයේ සෑම වෙළෙඳසලක් ඉදිරිපිට දැන්වීම් පුවරු ප්‍රදර්ශනයට තබා තිබෙනවා. මේ නිසා පදිකයන්ටත් අනවශ්‍ය කරදර හිරිහැරවලට මුහුණ පාන්න සිදුවී තිබෙනවා.

**සභාපති අරුණ ප්‍රදීප් මහතා (ශ්‍රීලපොපෙ)** - නගරයේ ප්‍රදර්ශනය කර තිබෙන අනවසර දැන්වීම් සියල්ල ඉවත් කරන් ආදායම් නිලධාරීන්ට බලය පවරනවා.

**උප සභාපති කමල් වැල්ලගේ මහතා (ශ්‍රීලපොපෙ)** - නගර සභාවට වැඩිම ආදායමක් ලැබෙන්නෙ වෙළෙඳ දැන්වීම්වලින්. එහෙත් අනවසර වෙළෙඳ දැන්වීම් නගරය පුරා දකින්න තියෙනවා. මේ දැන්වීම් ඉවත් කරන්න නගර සභා නිලධාරීන් පියවර ගෙන නැති බවයි පෙනෙන්න තියෙන්නේ. සභාව මොන පැත්තට යනවද කියල අපිට තේරෙන්නෙ නෑ. මන්ත්‍රීවරයකු කියන කිසිම දෙයක් ඇතැම් නිලධාරීන් ගණන් ගන්නේ නෑ. මේ වගේ දේවල් සිදු වෙන්න ඉඩ තියන්න එපා.

**විපක්ෂ නායක ජේ.ඩබ්ලිව්. ජයන්ත මහතා (එජාප)** - නගරය පුරාම දැන්වීම් හා බැනර් දකින්න තිබෙනවා. මේ සඳහා නගර සභාවට මුදල් ගෙවා නැති බැනර් හා දැන්වීම් පුවරු ඉවත් කිරීමට පියවර ගත යුතුයි. මේවා නගරයේ අලංකාරයට ලොකු බාධාවක්. මේවා ඉවත් කරන්න නගර සභා නිලධාරීන්ට බලය පවරනවා නම් හොඳයි.

**සභාපති** - ඕකන්ද පුස්තකාලය සඳහා පොත් රාක්ක කීපයක් ඉල්ලා තිබෙනවා. මේ සඳහා සභාවේ අනුමැතිය ලබා දෙනවාද?

**ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය (එජාප)** - ඕකන්ද පුස්තකාලයේ සාමාජිකයන් 181 දෙනෙක් සිටිනවා. ඒ පුස්තකායේ සාමාජිකයන් රාක්ක කීපයක් ඉල්ලා තිබෙනව. මේව ලබා දීම ගැන මම විරුද්ධ නැහැ. ඒත් නගර සභාවට එරෙහිව අධිකරණය ඉදිරියේ නඩුවක් තිබෙන බැවින් මේ යෝජනාවට මම විරුද්ධ වෙනවා. නඩුවෙන් පසු මේ ගැන බලමු.

**ධම්මික කොඩිකාර මහතා (ශ්‍රීලපොපෙ)** - මගේ මුදලින් මුදල් කැට හැට හතක් පුස්තකාලයට අරගෙන දෙන්නම්.

**සභාපති** - පොත් රාක්ක හදන්න එතරම් ලොකු මුදලක් වැය වෙන්නේ නැහැ. මාමණ්ඩිට පින් සිදු වෙන්න ඒ සඳහා උදව් කරන්න.

**එස්.එම්. සරත් චන්ද්‍ර මහතා (ජවිපෙ)** - පොත්පත් කියවන්න පොළඹවන එක හොඳයි. බඩ පිරෙන්න ආහාර අරගෙන කයට වස්ත්‍රයක් ඇඳගෙන තමයි පොත් කියවන්න ඕන. රටේ තියෙන්නෙ පසුගාමී තත්ත්වයක්. ඒවා වහන්නද මේ වගේ යෝජනා ඉදිරිපත් කරන්නේ.

**රාහුල ලලිත වික්‍රම මහතා (ශ්‍රීලනිප)** - සභාපතිතුමා සභාව මෙහෙයවන ආකාරය පිළිබඳ අපට ප්‍රශ්නයක් තිබෙනවා. මේ සභාවේ වාර්ෂික අය වැය මේ වන විටත් සභා සම්මත වී නැහැ.

**අතුල ප්‍රියන්ත මහතා (එජාප)** - සභාවේදී අපහාසාත්මක අන්දමින් කථා කරන්න එපා කියල මම සභාපතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. නගර සභාවට විරුද්ධව මහාධිකරණයේ නඩුවක් තිබේද්දී නගර සභාවේ මුදල් වැය කරන්න එපා. ඒක වැරදියි. තුන්වේල කන්න විදියක් නැතිව මිනිස්සු දුක් විඳිනවා.

**ඩී. ධර්මදාස මහතා (ශ්‍රීලපොපෙ)** - රටේ ප්‍රශ්න තිබුනට හැම දෙයක්ම නතර කරන්න බැහැ. අම්බලන්ගොඩ මිනිස්සු අද කන්නෙ බොන්නෙ නැද්ද.

**එස්.එම්.සරත් චන්ද්‍ර මහතා (ජවිපෙ)** - නගරය පුරා තිබෙන අනවසර දැන්වීම් ඉවත් කිරීමට නගර සභාවේ නිලධාරීන්ට බලය පැවරුවත් එවැනි අවස්ථාවලදී ඒ අයට ගැටලුවලට මුහුණ දෙන්න සිදු වෙනවා. එනිසා ඒ මහත්වරුන්ට එවැනි අවස්ථාවලදී පොලීසියේ ආරක්ෂාව ලබා දීමට පියවර ගන්න.

**සරත් ශ්‍රී ලාල් මහතා (ශ්‍රීලපොපෙ)** - ,නගර සභාවට විරුද්ධව සභාවේ මන්ත්‍රීවරු පිරිසක් අධිකරණයට පැමිණිල්ලක් ඉදිරිපත් කොට තිබෙනවා. එසේ තිබියදී එම නඩුවේ විත්තිකාරියක වන සභාවේ ලේකම් මහත්මිය වෙනුවෙන් නීතිඥ ගාස්තු ගෙවීමට නගර සභාවට පුලුවන්කමක් නැහැ. ඒකට අපි විරුද්ධයි.

**ලක්ෂ්මී හේමන්තා මහත්මිය (ශ්‍රීලපොපෙ)** - නඩු පවරල තියෙන්නෙ ආයතනයට විරුද්ධවයි. සභාවේ ලේකම් මහත්මියට නීතිඥ ගාස්තු ගෙවන්න පුළුවන්. මමත් නීතිඥවරියක් නිසා නීතිය ගැන මම දන්නවා.

**රාහුල ලලිත වික්‍රම මහතා (ශ්‍රීලනිප )** - එයට අපි විරුද්ධ වෙනවා. අපේ විරෝධතාවය අපි ලිඛිතව දැනුම් දෙන්නම්.

**එස්.එම්.සරත් චන්ද්‍ර මහතා (ජ.වි.පෙ.)** සභාවේ ලේකම් මහත්මිය මේ නඩුවේ විත්තිකාරයක්. එසේ තිබියදී ඒ මහත්මියට නගර සභාවෙන් නීතිඥ ගාස්තු ගෙවනවාද සභාවේ විරුද්ධ පක්ෂය විරුද්ධයි.

---

මහානාම විතානගේ - මල්වාන සමූහ

# උගුරුවල් පේරුවෙ තිබෙන උගුරු කොටුවලින් පරිසර හානියක් සිදු වෙනවා

## - ලංකා චන්ද්‍රා වික්‍රමආරච්චි (එජාප)

**මහර ප්‍රාදේශීය සභාව**

ප්‍රාදේශීය සභාව මගින් ක්‍රියාත්මක කර තිබෙන 'නැණ මිණි පලස' ශිෂ්‍යත්ව වැඩ සටහන යටතේ මේ 2021 වසරේ ද මහර අධ්‍යාපන කොට්ඨාසයේ පහ වසර ශිෂ්‍යත්ව විභාගයට පෙනී සිටින සිසු දරු දැරියන් සඳහා අධ්‍යාපනික සම්මන්ත්‍රණ දහයක් නොමිලේ පැවැත්වීමට කටයුතු කර ඇතැයි ද පසුගිය වසරේ කොරෝනා වසංගතය හේතුවෙන් එම සිසු දරු දැරියන්ට එම සම්මන්ත්‍රණ වෙනුවට ලබා දුන් පෙරහුරු ප්‍රශ්න පත්තර කට්ටල ඔවුනට මහත් අත්වැලක් වුණේ යැයි ද මහර ප්‍රාදේශීය සභාවේ සභාපතිනි සුදීමා චාන්දනී මහත්මිය (ශ්‍රීලපොපෙ) පැවැසූවාය.

සභාපතිනිය එසේ පැවැසූවේ මහර ප්‍රාදේශීය සභාවේ රැස්වීම් ශාලාවේ පැවති මාසික රැස්වීමේ මුලසුන ගෙන කතා කරමිනි. සභාපතිනිය මෙසේ ද කීවාය.

මෙවර මහර ප්‍රාථමික අංශයේ පාසල් 34 කින් පහ වසර ශිෂ්‍යත්ව විභාගයට සිසු දරු දැරියන් 2200 දෙනකු පෙනී සිටිනවා. ඒ අනුව එක් දින සම්මන්ත්‍රණ දහයක් පැවැත්වීමට සැලැසුම් කර තිබෙනවා. ඒ සඳහා රුපියල් පන් ලක්ෂ හැත්තෑ එක් දහස් දෙසීයක මුදලක් වැය වෙතැයි අපේක්ෂා කරනවා.

**ලංකා චන්ද්‍රා වික්‍රමආරච්චි මහතා (එජාප)** - උගුරුවල් පේරුවෙ තිබෙන උගුරු කොටු වලින් පරිසර හානියක් සිදු වෙනවා. මේ ගැන මා කීප වතාවක්ම කතා කළා. බලන්නට ගියා. එහෙත් කිසිම පියවරක් ගෙන නැහැ.

**සභාපතිනිය** - මෙ සම්බන්ධව නඩු දමන්නට බලය තිබෙන්නේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයටයි. එහෙත් මහජන පීඩාකාරි පනතට අනුව මේවා තහනම් කිරීමට කටයුතු කර තිබෙනවා. දැනටමත් දෙකක් වසා දමා තිබෙනවා. අපි උගුරු කොටු වලට බලපත්‍ර ලබා දී නැහැ.

**කීර්ති විජේසුන්දර මහතා (ශ්‍රීලපොපෙ)** - ප්‍රාදේශීය සභාව මගින් ආයතන වලට හා ජනතාවට ලබා දෙන නියෝග පිළිපදිනවද කියලා නියාමනයක් කරන්න. නැතිනම් සභාව හෑල්ලුවට පත් වෙනවා. මන්ත්‍රීවරුන් අපහසුතාවයට පත් වෙනවා.

**රෝහිණී ලලිතාංගනී මහත්මිය (ශ්‍රීලනිප)** - මහර නුගේගොඩ - නැගෙනහිර පුදේශයේ තිබෙන අත්කම් නිවාස යෝජනා ක්‍රමය තුල පිහිටි පොදු නාන ළිඳ 1972 වසරේ පමණ ඉදි කර තිබෙනවා. එය දැන් ඉවුරු කඩා වැටී අබලන් වෙලා. මෙය අලුත්වැඩියා කර දෙන්න. ඇතැම් පිරිසක් මෙය වසා දමන්නට උත්සාහ කරනවා. මේ ළිඳ වසා දමන්නට එපා.

**උප සභාපති අජන්ත වික්‍රමආරච්චි මහතා (ශ්‍රීලපොපෙ)** - මේ නාන ළිඳ වහලා ප්‍රජා ශාලාවක් ඉදි කරන්නට කියාලා ක්ෂේත්‍ර පරික්ෂණයට ගිය අවස්ථාවේ ගම්මු කීවා. එහි ජලය මදුරුවන් බෝවන තෝතැන්නක් බවට ද පත් වෙලා.

**චාල්ස් වීරසේකර මහතා (එජාප)** - කරගහමුණ , වීරසේකර මාවතේ අතුරු මාර්ගය අබලන් වෙලා. පයින්වත් යන්නට බැහැ. මෙය හදා දෙන්න.

**සිරිනිමල් එදිරිසිංහ මහතා (ශ්‍රීලපොපෙ)** - එඩෙරමුල්ල පුදේශයෙන් කසළ දමන්නට භූමි භාගයක් හමු වුණා. එය කාටවත් හානියක් නොවන ආකාරයට ක්‍රියාත්මක කරන්න.

**රොහාන් රොයිස් මහතා (එජාප)** - එඩෙරමුල්ල හා අවට පුදේශවල වීථි පහන් බොහොමයක්ම අක්‍රියයි. ඒවා අලුත්වැඩියා කරන්න.

---

රවීන්ද්‍ර මැද ගෙදර - අම්පාර සමූහ

# දමන-කෙත්සිරිගම මාර්ගය කාපට් කළත් පාර දෙපස කැලෑ වැවිලා

## - බිබිලේ පියදස්සි හිමි (ශ්‍රීලපොපෙ)

**දමන ප්‍රාදේශීය සභාව**

වසර ගණනාවක් තිස්සේ අබලන්ව තිබු දමන, කෙත්සිරිගම මාර්ගය කාපට් කළා. එහෙත් මේ වන විට පාර දෙපස කැලෑ වැවිලා. පාර දෙපස පේන්නෙ නැති තරමයි. දැනට මරණීය අනතුරු කිහිපයක්ම වුණා. තවත් මරණයක් වෙන්නට පෙර මේ මාර්ගය දෙපස කැලෑව සුද්ධ කරන්න පියවර ගන්න යැයි දමන ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රී බිබිලේ පියදස්සි හිමියෝ (ශ්‍රීලපොපෙ) පැවැසූහ.

උන් වහන්සේ එසේ ප්‍රකාශ කළේ ඉකුත් දා පැවති මාසික සභා රැස්වීමේදීය.

**සභාපති මංගල ගුණවර්ධන මහතා (ශ්‍රීලපොපෙ)**- සභාව සතු කැබ් රථයට හා ජේසීබී යන්ත්‍රයට රියැදුරන් නැහැ. හිටපු දෙන්නා විනය කටයුත්තක් මත ඉවත් කළා. ඒ නිසා තාවකාලික රියැදුරන් දෙදනකු බඳවා ගැනීමට අනුමැතිය දෙන්න.

**ඩී.එම්. ගුණතිලක මහතා (ශ්‍රීලපොපෙ)** - එසේ රියැදුරන් බඳවා ගන්නේ නම් පන්නල් ගම ප්‍රදේශයෙන් සහ පහළලන්ද ප්‍රදේශ යෙන් බඳවා ගන්නා ලෙස ඉල්ලා සිටිනවා.

**සභාපති මංගල ගුණවර්ධන මහතා (ශ්‍රීලපොපෙ)** - එහෙම කරන්න බැහැ. සම්මුඛ පරික්ෂණ තියලා සුදුසුකම් තියෙන අයයි බඳවා ගන්නේ. ගම් මට්ටමින් බඳවා ගන්න බැහැ.

**විපුල රත්නායක මහතා (ශ්‍රීලනිප)** - පල්ලංඔය, පන්නත්ගොඩ පුරාණ රජමහා විහාරස්ථානයේ වැඩ විසූ කඹුරුපිටියේ සුගතවංශ නාහිමි ප්‍රදේශශයට විශාල සේවාවක් කළා. ඒ නිසා දෙමටැල්ල මාර්ගය කඹුරුපිටියේ සුගතවංශ නාහිමි මාවත යනුවෙන් නම් කරන ලෙස ඉල්ලා සිටිනවා.

**කේ.එම්. ආරියරත්න මහතා (ජවිපෙ)** - කාලෝචිත යෝජනාවක්. පහසුකම් නැති යුගයක උන්වහන්සේ පයින් වැඩම කරමින් විශාල සේවාවක් කළා. ඒ නිසා එම නම් කිරීම සුදුසුයි කියා මා ස්ථිර කරනවා.

**මාගරට් වික්‍රමසිංහ මහත්මිය (ශ්‍රීලපොපෙ)** - මගේ කොට්ඨාසයේ නීත්ත ප්‍රදේශයේ පානීය ජල ප්‍රශ්නයක් තිබෙනවා. ඒ ආසන්නයේම මුස්ලිම් ගම්මානයක් තායෙනවා. ඒ ගමටත් මේ ප්‍රශ්නය තියෙනවා. ඒ නිසා ඒ ගම්මාන දෙකකටම වතුර බව්සර් 2ක් යවන්න කියා ඉල්ලා සිටිනවා.

**සභාපති** - මම වතුර දෙන්නම්. හැබැයි මට වතුර ගන්න වෙලා තියෙන්නේ වතුර ටිකවත් නිකං ගන්න පුළුවන් නම් බවුසර් 2ක් දෙන්න පුළුවන්. මට පෞද්ගලිකව සල්ලි දෙන්න බෑ.

**රංජිත බණ්ඩාර මහතා (ශ්‍රීලපොපෙ)** - ඉතා විශාල ප්‍රශ්නයක්ව පැවති ඉතා අබලන් වූ බක්මිටියාව- පන්නල්ගම පාර ජනාධිපති තුමාගේ අවධානයට ලක්වී දැන් වැඩ අරම්භ කර තියෙනවා. ඒ පිළිබඳ ස්තූතිය පළ කරනවා.

**බිබිලේ පියදස්සි හිමි (ශ්‍රීලපොපෙ)** - මට මෙතෙක් සභාවෙන් ලැබුණු දීමනාව දාලා ගෙවල් 64කට සිමෙන්ති අරන් දීලා තියෙනවා. ඒ සමගම ගියවර කඨින පින්කමට එකතු වු මුදල් රු 85.000 ක් හා මගේ සල්ලි යොදවලා රු.164,000 කින් දර්ශනීය බස් හොල්ට් එකක් හැදුවා ඇවිත් බලන්න.

**නදිකා සදරුවන් මහත්මිය (එජාප)** - පරිසර කමිටුවට අපි ඉන්නවා .ඒත් පසුගිය දිනක රුස්වී තිබුණත් අපට දැන්වුයේ නැහැ. ඒ ඇයි කියා දැනගන්න කැමතියි.

**සභාපති** - එය මම දැනගෙන හිටියේ නැහැ ඒ පිළිබඳ සොයා බලන්නම්.

රංජිත බණ්ඩාර මහතා (ශ්‍රීලපොපෙ) අම්බලන්ඔය හංදියේ සිට පන්නල්ගම දක්වා දිවන ප්‍රධාන මාර්ගය හොඳටම අබලන් වෙලා. ඒ පිළිබඳ සියලු දෙනාගේ අවධානය යොමු කරවන්න.

**සභාපති** - පසුගිය වසරේ කොවිඩ් 19 යටතේ වුණත් අපි හැකි පමණින් සංවර්ධන වැඩසටහන් කළා. මේ අවුරුද්දේදිත් මන්ත්‍රීවරුන්ගේ ඉල්ලීම් අනුව සංවර්ධන වැඩ ඉටු කර දෙන්න උත්සාහ ගන්නවා.

---

ආර්. එම්. විජේරත්න - හාලිඇළ සමූහ

# රාජකාරිවලට යන අපේ නිලධාරීන්ට ස්ථිර තැනක් නැතිව අභිගුණ්ඨික තත්ත්වයට පත් වෙලා

## - වයි.එම්. ප්‍රියන්ත විජිත බණ්ඩාර (එජාප)

**සොරණාතොට ප්‍රාදේශීය සභාව**

අප සභා බල ප්‍රදේශයට අයත් කන්දේගෙදර ප්‍රදේශයේ මේ සභාවේ ප්‍රාදේශීය කාර්යාලයක් නොමැතිවීම විශාල අඩුවක්. එයින් ඒ ප්‍රදේශයේ නොයෙකුත් රාජකාරීවලට යන අපේ නිලධාරීන්ට ස්ථිර තැනක් නැතිව තැන් තැන්වල ඉඳගෙන රාජකාරී කරන්න සිදුවෙනවා. ඒ අය නිකම් අභිගුණ්ඨිකයන් තත්ත්වයට පත්වෙනවා. ඒ නිසා මේ වන විට නිසි ප්‍රයෝජනයක් නොගන්නා කන්දේගෙදර දිවා සුරකුම් මධ්‍යස්ථාන ගොඩනැගිල්ලේ ප්‍රාදේශීය කාර්යාලයක් ස්ථාපිත කරන්න පියවර ගන්න.

සොරණාතොට ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.එම්. ප්‍රියන්ත විජිත බණ්ඩාර මහතා (එජාප) එසේ පැවසුවේ එම ප්‍රාදේශීය සභාවේ ඉකුත් මාසික සභා රැස්වීමේදීය. සොරණාතොට ප්‍රාදේශීය සභාවේ සභාපති ඩී.එම්.නදීකා ප්‍රිශාන්ති දිසානායක මහත්මියගේ (එජනිස) ප්‍රධානත්වයෙන් එම සභාවේ සභා රැස්වීම් ශාලාවේදී රැස්වීම පැවැත්විණි.

උප සභාපති ආර්.එම්. සුනිල් දයානන්ද මහතා (එජාප) - අප දිස්ත්‍රික්කයේ වෙනත් ප්‍රාදේශීය සභා සමග බැලුවාම අපේ සභාව පිහිටා තිබෙන්නේ ඉතා සුන්දර පරිසරයක. ඒ වගේම අපේ සභාවට අයත් ඉතා සුන්දර ස්ථාන තිබෙනවා. ඒත් අපි අපේ සම්පත්වලින් ප්‍රයෝජන ගන්නවා අඩුයි. ඒ නිසා අප සභාවේ ඉදිකළ නව බහුකාර්ය ගොඩනැගිල්ලේ සභා රැස්වීම් ශාලාව ස්ථාපිත කර දැනට භාවිතා කරන මේ ගොඩනැගිල්ල සභාවට යම් ආදායමක් ලැබිය හැකි ස්ථානයක් ලෙස යොදාගනිමු.

එම්.ජී. දේවිකා කුමාරි මහත්මිය (එජාප) - උප සභාපතිතුමා කියන්නේ මේ ශාලාව බාහිර කටයුතුවලට කුලියට දිය හැකි බවයි. ඒත් එසේ ලබා දෙනවා නම් ඒ කුමන පදනමින්ද එයට ලබාදෙන පහසුකම් මොනවාද කියා අප පළමුව තීරණයකට එළඹිය යුතුයි. ඒ සම්බන්ධයෙන් සභාවේ මන්ත්‍රීවරුන්ට පැහැදිලි කරන්න.

සභාපති ඩී.එම්. නදීකා ප්‍රිශාන්ති දිසානායක මහත්මිය (එජනිස) - මේ ගොඩනැගිල්ලට අවශ්‍ය පහසුකම් සලසා බාහිර රැස්වීම් උත්සව, ප්‍රිය සම්භාෂණ, නාට්‍ය සංදර්ශන ආදියට කුලී පදනම මත ලබාදිය හැකියි. මුලින් රුපියල් 5000 ක පමණ කුලියකට ලබාදෙමු. ඒ අතර පළාත් පාලන දෙපාර්තමේන්තුවේ උපදෙස් මත විධිමත් වැඩපිළිවෙළක් හදමු. අප කොට්ඨාසය තුළ පොදු අවශ්‍යතා සඳහා එවැනි තැනක් නැති නිසා මෙය ඵලදායිව යොදාගත හැකි බව විශ්වාසයි.

වයි.එම්.ප්‍රියන්ත විජිත බණ්ඩාර මහතා (එජාප) - පසුගිය දිනවල අප සභාව වරිපනම් ගාස්තු සම්බන්ධයෙන් බොහෝ කටයුතු කළා. ඒත් එවන් අවස්ථාවල අප සභා බල ප්‍රදේශයට අයත් කන්දේගෙදර ප්‍රදේශයේ මේ සභාවේ ප්‍රාදේශීය කාර්යාලයක් නොමැතිවීම විශාල අඩුවක්. එයින් ඒ ප්‍රදේශයේ නොයෙකුත් රාජකාරීවලට යන අපේ නිලධාරීන්ට ස්ථිර තැනක් නැතිව තැන් තැන්වල ඉඳගෙන රාජකාරී කරන්න සිදුවෙනවා. ඒ අය නිකම් අභිගුණ්ඨිකයන් තත්ත්වයට පත්වෙනවා. මා කන්දේගෙදර නගරයේ පවත්වාගෙන යන මාගේ පෞද්ගලික කාර්යාලයේ එවන් අවස්ථාවල ඉඩකඩ ලබාදුන්නා. ඒත් එය එ.ජා.ප. දේශපාලන පක්ෂ කාර්යාලයක්. එවන් තැනක සිට රාජ්‍ය නිලධාරීන් රාජකාරී කටයුතු කිරීම සුදුසු නෑ. ඒ නිසා මේ වන විට නිසි ප්‍රයෝජනයක් නොගන්නා කන්දේගෙදර දිවා සුරකුම් මධ්‍යස්ථාන ගොඩනැගිල්ලේ ප්‍රාදේශීය කාර්යාලයක් ස්ථාපිත කරන්න පියවර ගන්න. එය නිලධාරීන්ට පහසුවක් වගේම සභාවට කරන විවිධ ගෙවීම් සිදුකිරීමට ජනතාවටද පහසුවක්. එයින් සභාවේ ආදායමද වැඩිවෙයි.

ආර්.එම්. අනෝමා මල්කාන්ති මහත්මිය (ශ්‍රීලපොපෙ) - අප සභාව ගල්කොටුවේගම ජල ව්‍යාපෘතිය සභාවට පවරාගත්තේ කිසිදු මුදලක් වැයකර නොවේ. ඒ නිසා එහි ජලපාරිභෝගිකයින්ගේ ජල ගාස්තු වැඩි කරනවානම් පළමුව එහි ජලය පිරිසුදු කර විධිමත්ව ලබාදෙන්න. ඉන් පසුව ගාස්තු වැඩි කරන්න. ඒ වගේම පෙර පාසල්වලට සභාවෙන් නොමිලේ ජලය දෙනවා. ඒත් ගල්කොටුවේගම පෙරපාසල තිබෙන්නේ පෞද්ගලික ගොඩනැගිල්ලක. එවිට එම පෙරපාසල සඳහාත් නොමිලේ ජලය දෙනවාද?

සභාපති ඩී.එම්.නදීකා ප්‍රිශාන්ති දිසානායක මහත්මිය (එජනිස) - ඒ සම්බන්ධයෙන් පොදු තීරණයක් ගතයුතුයි. ඒ නිසා ඒ ගැන සාකච්ඡා කර පසුව දැනුම්වත් කරන්නම්.

ආර්.එම්. විජේසිරි බණ්ඩාර මහතා (ශ්‍රීලපොපෙ) - සොරණාතොට වැලිහිඳයාය පයිනස් වගාව ඉවත් කිරීම සම්බන්ධයෙන් මා කීප වරක් සභාවෙන් ඉල්ලීම් කළා. ඒ වගේම අදාළ සියලු අංශ දැනුම්වත් කළා. ඒත් එම වගාව තාම ඉවත් කළේ නෑ. මේ පයිනස් වගාව පරිසරයට මෙන්ම ජල උල්පත්වලටද අහිතකර ලෙස බලපානවා. ඒ සඳහා කඩිනමින් එම වගාව ඉවත් කිරීමට පියවරක් ගන්න. එසේම ගල්කොටුවේගම ජල ප්‍රශ්නය සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාව වගකිව යුතුයි. ඒ සම්බන්ධයෙන්ද නිසි විසඳුමක් ලබාදෙන්න.

චිත්‍රමානෙල් රාජපක්ෂ මහතා (ශ්‍රීලපොපෙ) - පක්ෂ දේශපාලනය තුළ අද විවිධ පක්ෂ- විශේෂයෙන් විපක්ෂයේ දේශපාලන පක්ෂ ජනතා ප්‍රශ්න තම දේශපාලන පොරපිටියක් බවට පත්කරගන්නවා. ජල ගාස්තු සම්බන්ධයෙන්ද වුණේ ඒකයි. ඒත් ජලගාස්තු වැඩිකිරීම සම්බන්ධයෙන් සභාවේ තිබුණේ මධ්‍යස්ථභාවයක්. පානීය ජලය දුන්නට වැඩක් නෑ. පිරිසුදු පානීය ජලයයි දෙන්න ඕනෑ. ඒත් ඒකට පාරේ අරගල කරලා වැඩක් නෑ. පෝස්ටර් කටවුට්වලින් ජයගන්න පුළුවන් නම් මේ රටේ හැමදාමත් දිනන්නේ ජ.වි.පෙ.යි. කපුරුහාමි ළඟ සුවඳ නෑ වගේ ජ.වි.පෙ. ළඟ නැති එකම දේ සමාජවාදයයි.

එම්.ජී.දේවිකා කුමාරි මහත්මිය (එජාප) - අප සභාව විදිහට මීට පෙර ගල්කොටුවේගමදී එම ගැමියන් සමග ජල ප්‍රශ්නය ගැන කතා කළා. එහිදී අප පොරොන්දු වුණා මේ ගැන සාධාරණ පියවරක් ගන්නා බවට. ඒ වගේම සභාවට අයත් ජල ව්‍යාපෘති 15 ක් තිබෙනවා. මේ සියලු ජල ව්‍යාපෘතිවල අඩුපාඩු හැකි ඉක්මණින් සපුරාලීමට සභාව පියවර ගත යුතුයි.

---

ඊ.සී. ප්‍රනාන්දු - මුන්නේශ්වරම සමූහ

# අඩු ආදායම්ලාභීන්ට වැසිකිළි පෝච්චි දෙන විට දේශපාලන භේදය බැලීම වැරදියි

## - නීතීඥ හිලරි ප්‍රසන්න ප්‍රනාන්දු (ශ්‍රීලනිප)

**හලාවත නගර සභාව**

අඩු ආදායම්ලාභි පවුල්වල ආදායම් වැඩි කිරීමට එම පවුල්වල පිරිසක්ට රැකියා දීමට ගත් තීරණය අනුව මේ සභාවටත් තරුණ තරුණියන් 21 දෙනකු එවා තිබෙනවා රැකියා පුහුණුව සඳහා. කියන්න කනගාටුයි ඒ පිරිසට කානු සුද්ධ කරන්න, පාරවල් අතු ගාන්න එක්තරා නිලධාරිනියක් උපදෙස් දිලා. ඇයි ඒ දරුවන්ගේ මානසික තත්ත්වය බිඳ දමන්නේ. වහාම මෙ සම්බන්ධයෙන් පරීක්ෂණයක් කරන ලෙස මා ඉල්ලා සිටිනවායැයි මෙවර හලාවත නගර සභාවේ මාසික රැස්වීමේදී නාගරික මන්ත්‍රී නීතීඥ ඩබ්ලිව්.ඒ. හිලරි ප්‍රසන්න ප්‍රනාන්දු මහතා (ශ්‍රීලනිප) මහතා ඉල්ලා සිටියේය.

සභාපති ඩබ්ලිව්.එම්.ඒ. තුසාන් චතුරංග මහතා (එජාප) මෙදින සභාවට පැමිණ නොසිටි නිසා උප සභාපති නීතීඥ අබ්දුල් වහාබ් සාදිකුල් අමීන් මහතාගේ (ශ්‍රීලනිප) ප්‍රධානත්වයෙන් මෙවර මාසික රැස්වීම පැවැත්විණි.

**නීතිඥ හිලරි ප්‍රසන්න ප්‍රනාන්දු මහතා (ශ්‍රීලනිප)** - පසුගිය සභාවේ දී අඩු ආදායම්ලාභි පවුල් වෙත වැසිකිළි පෝච්චි බෙදා දීම ගැන මා විසින් සඳහන් කළේ වැසිකිළි පෝච්චි දෙන විටත් අපි දේශපාලන භේදය බලමින් කටයුතු කිරීම වැරැදි බවයි. එය වාර්තාවේ සඳහන්වී නෑ. ප්‍රධාන වට රවුමේ පෙරසවි ගල් ඇල්ලීම ගැන දැක්වූ අදහස් ද විකෘතිව සඳහන් කර තියෙනවා.

**තිහිණි තුසිතාංජලි කළුආරච්චි මහත්මිය (ශ්‍රීලපොපෙ)** - කොරයා වත්තේ බොක්කුවක් කැඩිලා දින ගණනාවක් වෙනවා. කිසිදු පියවරක් යොදා නෑ. ගමනාගමන කටයුතු වලදී ජනතාව පීඩනයට පත් වෙලා.

**ලෙස්ලි ප්‍රනාන්දු මහතා ( එජාප)** අඩු ආදායම්ලාභි පවුල්වල තරුණ තරුණියන්ට පත්වීම් ලබා දි ඇත්තේ මේ සභාව නොවෙයි. පිටින් දාලා තියෙන්නේ.

නීතිඥ හිලරි ප්‍රසන්න මහතා (ශ්‍රීලනිප) - සුදුසුකම් අනුව රැකියා පුහුණුවකටයි පැමිණ ඇත්තේ. එහෙම නැතිව සජිත් පත්වීම් දුන්නා වගේ උස් මිටිකම් බලලා දිලා නැහැ.

**ලේකම් කේ.පී. චන්දන කුමාර මහතා** - කිසිවකු කානු සුද්ධ කරන්න හෝ පාරවල් අතුගාන්න දාලා නැහැ. මමයි ඔවුන් පිළිබඳ තීරණ ගන්නේ. වෙන කාටත් එම බලතල දී නෑ.

**එම්. ජුට් සුසන්ත පීරිස් මහතා (ශ්‍රීලනිප)** - එම තරුණ පිරිසේ මානසිකත්වය බිඳ දාන්න කිසිවකු හෝ පියවර ගෙන ඇති බව පෙනෙනවා. ඔවුන්ව අනුයුක්ත කරන්නේ කුමකට ද?

**සමන්ත ප්‍රනාන්දු මහතා ( මහජන සෞඛ්‍ය පරික්ෂක )** - නයිටා එකෙන් මොවුන් ව එවා ඇත්තේ පුහුණුවකටයි. ජූලි 5 දක්වා පමණයි ඔවුන් මෙහි ඉන්නේ.

**චින්තක පීරිස් මහතා (ශ්‍රීලපොපෙ)** - සභාවේ පරිගණක යන්ත්‍ර අලුත්වැඩියා කර ගෙන ඇතත් එම සේවය ලබා ගත් ආයතනයට ගෙවිය යුතු මුදල් මේ දක්වා ගෙවා නැහැ.

**ලේකම් චන්දන කුමාර මහතා** - පමාවක් වී ඇත්තේ බිල්පත් නිසි ලෙස එවා නැති නිසයි.

**කිංස්ලි ආනන්ද වික්‍රමසිංහ මහතා (ජවිපෙ)** - රාජ්‍ය ඇමැති සනත් නිශාන්ත පෙරේරා මහතා පසුගියදා නගර සංවර්ධනය ගැන සාකච්ඡාවක් තියලා. ඒ බව සභාව දැනුම්වත් ද? මට නම් ආරාධනාවක් හෝ ලැබුණේ නැහැ.

**නීතීඥ හිලරි ප්‍රසන්න මහතා (ශ්‍රීලනිප)** - මට නම් ආරාධනාවක් ආවා. නගරය සංවර්ධන සැලැසුම් සකස් කරන විට පාට පක්ෂ භේද බැලිම නොබැලිය යුතුයි. සැලැස්මවල් උඩින් එවිය යුතුත් නැහැ.

**නීතීඥ නිහාල් සුමනධීර මහතා (එජාප)** - මෙතැන ඉන්නේ ජනතා කැමැත්තෙන් ආ අයයි. එසේනම් එයට නොකැඳවීම සුදුසු නෑ.

**එම්.පී.බී. මාජිනි ප්‍රනාන්දු මහත්මිය (එජාප)**- හලාවත පොදු එළවළු වෙළෙඳ පොළට ඇතුළු වන වාහන නිසා පාර්භෝගිකයන් අපහසුතාවට ලක් වෙනවා. මේ පිළිබඳ නිසා අවධානය යොමු කරන්න. අඩු ගණනේ පුවරුවක් හෝ යොදන්න.

**නීතීඥ හිලරි ප්‍රසන්න මහතා (ශ්‍රීලනිප)** - බෝඩ් දාලා පලක් නැහැ. වාහනවලට ඇතුළු විමට නොහැකි ලෙසින් ගැටි යොදන්න.

# මිල ගණන් කැඳවීම

## හලාවත වැවිලි සමාගම

**(පොල්, කිතුල් හා තල් වගා ප්‍රවර්ධනය හා ආශ්‍රිත කාර්මික භාණ්ඩ නිෂ්පාදන හා අපනයන විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශය)**

**හලාවත වැවිලි සමාගම සඳහා ටැබ් පරිගණක හා ලැප්ටොප් පරිගණක මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවීම**

හලාවත වැවිලි සමාගම වෙත, පහත දක්වා ඇති අයිතම දක්වා ඇති ප්‍රමාණයෙන් මිලදී ගැනීමට අවශ්‍ය වී ඇති බැවින් එම අයිතම සඳහා මිල ගණන් කැඳවනු ලැබේ.

| අයිතමය | අවශ්‍ය ප්‍රමාණය |
|---|---|
| 01. ටැබ් පරිගණක | 07 |
| 02. ලැප්ටොප් පරිගණක | 10 |

මිල ගණන් කැඳවීම 2021.05.12 දින පෙ.ව. 11.00 ට අවසන් වන අතර, සවිස්තරාත්මක ලංසු පත්‍රය හා උපදෙස් www.cpl.gov.lk වෙබ් අඩවිය වෙත පිවිසීමෙන් ලබාගත යුතුය. පවතින කෝවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් මෙම උපාංගයේ පවතින කඩිනම් අවශ්‍යතාවය මත තේරී පත්වන සැපයුම්කරු විසින් දින 03 ක් ඇතුළත අදාළ සැපයීම සිදුකළ යුතුය. මිලදී ගැනීම පිළිබඳ අවසන් තීරණය හලාවත වැවිලි සමාගම සතුය.

**සභාපති, ප්‍රසම්පාදන කමිටුව, හලාවත වැවැලි සමාගම, 165, පුත්තලම් පාර, හලාවත.**

**032-5741273**

**2021.04.30**

---

## රාජ්‍ය දැව සංස්ථාව

**පරිසර හා වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශය**

# ප්‍රසම්පාදන දැන්වීම

**ප්‍රසම්පාදන අංක : එස්ටීසී/පීඑස්එම්/2020/ප්‍ර.අ. - 13**

**ක්‍රියෝසෝට් තෙල් ලීටර් 160,000 ක් මිලදී ගැනීම සඳහා ලංසු කැඳවීම**

සභාපති, ප්‍රසම්පාදන කමිටුව, රාජ්‍ය දැව සංස්ථාව, අංක 82, රජමල්වත්ත පාර, බත්තරමුල්ල විසින් ඉහත මිලදී ගැනීම සඳහා සැපයුම්කරුවන්ගෙන්, නිෂ්පාදකයන්ගෙන් සහ ආනයන කරුවන්ගෙන් මුද්‍රා තැබූ මිල ගණන් කැඳවනු ලැබේ.

01. ජාත්‍යන්තර තරගකාරී මිල ක්‍රමය යටතේ මිල ගණන් කැඳවනු ලැබේ.
02. සැපයුම්කරුවන් විසින් ලංසු ලියවිලි කළමනාකාර (මිලදී ගැනීම් හා නාවික) මගින් ඉහත ලිපිනයෙන් මිලදී ගත හැකිය.
03. සැපයුම්කරු අසාදුගත ලේඛනගත නොවී සිටිය යුතුයි.
04. කොන්දේසි හා ලංසු ලියවිලි ඉහත ලිපිනයේ කළමනාකාර (මිලදී ගැනීම් හා නාවික) වෙතින් පරීක්ෂාකර බැලිය හැකි අතර, අංක 011-2866601-04 දුරකථන ඔස්සේ වැඩි විස්තර ලබාගත හැකිය.
05. ඉංග්‍රීසි භාෂාවෙන් සකස්කළ ලංසු පත්‍රිකා අවශ්‍ය සැපයුම්කරුවන්හට කළමනාකාර (මිලදී ගැනීම් හා නාවික) වෙතින් පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා සතියේ වැඩ කරන දිනයන්හිදී ආපසු නොගෙවන ලංසු පත්‍රිකා ගාස්තු රු. 3,500/- ක් ගෙවා 09.06.2021 දින දක්වා ඉහත ලිපිනයෙන් මිලදී ගත හැකිය.
06. ලංසු පත්‍රිකා සභාපති, ප්‍රසම්පාදන කමිටුව, රාජ්‍ය දැව සංස්ථාව, අංක 82, රජමල්වත්ත පාර, බත්තරමුල්ල වෙත 10.06.2021 දින පෙ.ව. 10.30 ට පෙර ලැබිය යුතුය. සැපයුම්කරුවන් හට ලංසු විවෘත කරනු ලබන අවස්ථාවට සහභාගි විය හැකිය.
07. ලංසු පත්‍රිකා ඉදිරිපත් කිරීමේදී, සෑම ලංසුවක් සඳහා 2% ලංසු බැඳුම්කරයක් ලබාදිය යුතු අතර, වලංගු කාලය දින 104 ක් විය යුතුයි.

**සභාපති,**
**රාජ්‍ය දැව සංස්ථාව.**

---

# මහජන බැංකුව

## බේරා නොගත් උකස් භාණ්ඩ වෙන්දේසියේ විකිණීම

මහජන බැංකුවේ පහත සඳහන් ශාඛා සහ ඉතුරුම් හා සේවා මධ්‍යස්ථාන වෙත 2020.02.28 දින දක්වා උකස් කරන ලදුව, ඒ ඒ ශාඛාවන් ඉදිරියෙන් දක්වා ඇති දිනයන්ට බේරා නොගත් රන් භාණ්ඩ මෙම නිවේදනයේ දක්වා ඇති පරිශ්‍රයන්හිදී පෙ.ව. 9.00 සිට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

| ශාඛාවේ / ඉතුරුම් හා සේවා මධ්‍යස්ථානයේනම | පහත දැක්වෙන දිනට බේරා නොගත් භාණ්ඩ | වෙන්දේසි දිනය සහ ස්ථානය |
|---|---|---|
| **පුත්තලම ශාඛාව**<br>ඉතුරුම් හා සේවා මධ්‍යස්ථානය<br>මදුරන්කුලිය | 2021.05.21 | 2021.05.22 සහ 23 පුත්තලම ශාඛා පරිශ්‍රය |
| **කල්පිටිය ශාඛාව**<br>ඉතුරුම් හා සේවා මධ්‍යස්ථානය<br>නොරොච්චෝලේ | | |
| **ආනමඩුව ශාඛාව**<br>ඉතුරුම් හා සේවා මධ්‍යස්ථානය<br>ආඩිගම | | |
| **හලාවත ශාඛාව**<br>ඉතුරුම් හා සේවා මධ්‍යස්ථාන<br>හලාවත ධීවර බැංකුව<br>ආරච්චිකට්ටුව<br>උඩප්පුව | 2021.05.21 | 2021.05.22 සහ 23 හලාවත ශාඛා පරිශ්‍රය |
| **මාදම්පේ ශාඛාව** | | |
| මහවැව ශාඛාව<br>ඉතුරුම් හා සේවා මධ්‍යස්ථානය<br>තොඩුවාව | | |
| **මාරවිල ශාඛාව** | | |
| **වෙන්නප්පුව ශාඛාව**<br>ඉතුරුම් හා සේවා මධ්‍යස්ථාන<br>බෝලවත්ත<br>ලුනුවිල<br>උල්හිටියාව | 2021.05.21 | 2021.05.22 සහ 23 නාත්තණ්ඩිය ශාඛා පරිශ්‍රය |
| **නාත්තන්ඩිය ශාඛාව**<br>ඉතුරුම් හා සේවා මධ්‍යස්ථානය<br>කොට්ටරාමුල්ල<br>වැලිපැන්නගහමුල්ල<br>නාරවිල | | |
| **දන්කොටුව ශාඛාව** | | |

වෙන්දේසියට සහභාගී වන්නන් තම පුද්ගල හැඳුනුම්පත්ද රැගෙන ආ යුතුය. වෙනත් ප්‍රසිද්ධ දැනුම් දීමකින් තොරව මෙම වෙන්දේසි අවලංගු කිරීම, ඒකාබද්ධ කිරීම හෝ කල්දැමීම පිළිබඳ අයිතිය මහජන බැංකුව සතු වේ.

**ප්‍රාදේශීය කළමනාකාරිනී**
**මහජන බැංකුව,**
**ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය (පුත්තලම),**
**අංක 79, මාරවිල පාර, නාත්තණ්ඩිය.**

මහජන බැංකුව PEOPLE'S BANK
www.peoplesbank.lk
AA+ (lka) Fitch Rating, AA- Brand Finance Rating

---

# ප්‍රසම්පාදන දැන්වීම

## ඌව පළාත් සභාව

## පළාත් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව

ඌව පළාත් සභාවේ පළාත් ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් පහත සඳහන් කර්මාන්ත ඉටුකිරීම සඳහා ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) හා අදාළ ක්ෂේත්‍රයේ ලියාපදිංචිය සහිත සුදුසුකම් ලත් කොන්ත්‍රාත්කරුවන් හා ඉදිකිරීම් ආයතන අතුරින් 2021.05.25 දක්වා තරගකාරී ලංසු කැඳවීමේ පදනම මත මුද්‍රා තබන ලද ලංසු භාරගනු ලැබේ.

| අනු අංකය | කොන්ත්‍රාත් අංකය | කර්මාන්තයේ නම | සිවිල් වැඩ වටිනාකම (රු.මි.) (වැට් රහිත) | ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂේත්‍රයේ අවශ්‍ය CIDA ශ්‍රේණිය | ආපසු ගෙවන ලංසු සුරක්ෂණ මුදල (මුදලින් ගෙවන්නේ නම්) (රු.) | ඉදිකිරීම් කාල පරාසය (දින ගණන) | ලංසු ලියවිලි ගාස්තු මුදල (රු.) | ලංසුපත් නිකුත් කරන කාර්යාලය |
|---|---|---|---|---|---|---|---|---|
| 01 | UPBD/EDU/PSDG/ 2021/03/01 | බ/ද්වේ මහා විද්‍යාලයේ 60'X25'දෙමහල් ගොඩනැගිල්ල ඉදිකිරීම | 17.79 | C6 හා C5 | 89,000.00 | 180 | 5,000.00 | පළාත් ගොඩනැගිලි අධ්‍යක්ෂ කාර්යාලය |
| 02 | UPBD/EDU/PSDG/ 2021/03/02 | මො/මදුරුකැටිය කනිෂ්ඨ විද්‍යාලයේ 90'X25' දෙමහල් ගොඩනැගිල්ල ඉදිකිරීම ( 1 අදියර) | 15.54 | C6 හා C5 | 78,000.00 | 180 | 5,000.00 | |
| 03 | UPBD/EDU/PSDG/ 2021/03/03 | බ/වැලිමඩ විජය විද්‍යාලයේ ප්‍රාථමික අංශය සඳහා 110'X25' දෙමහල් ගොඩනැගිල්ල ඉදිකිරීම (1 අදියර) | 14.02 | C6 හා C5 | 70,500.00 | 180 | 5,000.00 | |
| 04 | UPBD/EDU/PSDG/ 2021/03/04 | බ/වැලිමඩ මුස්ලිම් මහා විද්‍යාලයේ ප්‍රාථමික අංශය සඳහා 110'X25' දෙමහල් ගොඩනැගිල්ල ඉදිකිරීම (1 අදියර) | 14.02 | C6 හා C5 | 70,500.00 | 180 | 5,000.00 | |
| 05 | UPBD/EDU/PSDG/ 2021/03/05 | බ/සීවලී මහා විද්‍යාලයේ 70'X25' සිව්මහල් ගොඩනැගිල්ල ඉදිකිරීම (දෙවන අදියර) | 12.41 | C6 හා C5 | 62,500.00 | 180 | 5,000.00 | |
| 06 | UPBD/EDU/PSDG/ 2021/03/06 | බ/පහරගම්මන මුස්ලිම් විද්‍යාලයේ 100'X25' ගොඩනැගිල්ල ඉදිකිරීම(පුස්තකාලය හා විද්‍යාගාරය සහිත) | 11.61 | C6 හා C5 | 60,000.00 | 180 | 5,000.00 | |
| 07 | UPBD/EDU/PSDG/ 2021/03/07 | මො/මුතුකණ්ඩිය 3 පියවර කනිෂ්ඨ විද්‍යාලයේ 90'X25' දෙමහල් ගොඩනැගිල්ල ඉදිකිරීම - අවසන් අදියර | 8.34 | C7 හා C6 | 42,000.00 | 180 | 3,000.00 | ප්‍රාදේශීය ඉංජිනේරු (ගොඩනැගිලි) කාර්යාලය - මොණරාගල |
| 08 | UPBD/H/PSSP/ 2021/03/01 | වෙලන්විට සායන මධස්ථානය ප්‍රතිසංස්කරණය කිරීම (වහලය සහ සිවිලිම) | 2.10 | C8 හා C7 | 10,500.00 | 120 | 3,000.00 | ප්‍රාදේශීය ඉංජිනේරු (ගොඩනැගිලි) කාර්යාලය - බණ්ඩාරවෙල |
| 09 | UPBD/EDU/PSDG/ 2021/03/08 | බ/දඹගොල්ල ශ්‍රී සුමන විද්‍යාලයේ 100'X20' ගොඩනැගිල්ලක් ඉදිකිරීම (අර්ධ ස්ථිර) | 8.00 | C7 හා C6 | 40,000.00 | 180.00 | 3,000.00 | ප්‍රාදේශීය ඉංජිනේරු (ගොඩනැගිලි) කාර්යාලය - බිබිල |
| 10 | UPBD/EDU/PSDG/ 2021/03/09 | බ/ගැමුණුපුර මහා විද්‍යාලයේ 100'X25' පාසල් ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීම | 3.35 | C8 හා C7 | 17,000.00 | 120 | 3,000.00 | |
| 11 | UPBD/EDU/PSDG/ 2021/03/10 | බ/බතලයාය මහා විද්‍යාලයේ 40'X20' ගොඩනැගිල්ල හා ගෘහ විද්‍යා ඒකකය අලුත් වැඩියා කිරීම | 2.66 | C8 හා C7 | 13,500.00 | 120 | 3,000.00 | |
| 12 | UPBD/EDU/PSDG/ 2021/03/11 | මො/හැපොල කනිෂ්ඨ විද්‍යාලයේ 80'X20' ප්‍රධාන ශාලාව අලුත්වැඩියා කිරීම | 2.34 | C8 හා C7 | 12,000.00 | 120 | 3,000.00 | |
| 13 | UPBD/EDU/PSDG/ 2021/03/12 | මො/යකුන්නාව මහා විද්‍යාලයේ 80'X25' ප්‍රාථමික ශාලාව අලුත් වැඩියා කිරීම | 2.07 | C8 හා C7 | 10,500.00 | 120 | 3,000.00 | |

2. ජාතික තරගකාරී ලංසු කැඳවීමේ ක්‍රමය මගින් ලංසු කැඳවනු ලබන අතර, ඇස්තමේන්තු පිරිවැය රුපියල් මිලියන 50 ඉක්ම නොයන කර්මාන්ත වලට අදාළව මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛ අංක 4/2016 (iii) අනුව කොන්ත්‍රාත්කරුවන්ගේ පළාත් ප්‍රමුඛතාවය හා ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියෙහි ලියාපදිංචි ශ්‍රේණියේ ප්‍රමුඛත්වය ලංසු ඇගයීමේදී සැලකිල්ලට ගනු ලැබේ.
3. ඉහත වගුවේ සඳහන් සීඩා ශ්‍රේණිය (CIDA) හා අදාළ ක්ෂේත්‍රයේ ලියාපදිංචිය සහිත අසාධු ලේඛන ගත කිරීම සඳහා නිර්දේශ නොවූ , සාර්ථක හා යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන් ලංසු ප්‍රදනය සඳහා සුදුසුකම් ලබති.
4. ලංසු ඇගයීමේදී මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛ අංක 3/2020 (i) අනුව හා ඊට අදාළව නිකුත්කර ඇති සංශෝධනයන්ට අනුව ඇගයීම් කටයුතු සිදුකරනු ලබන අතර, පහත සඳහන් සුදුසුකම් සලකා බලනු ලැබේ. අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැතිවීම ලංසු ප්‍රතික්ෂේප කිරීමට හේතුවක් වේ.
   - I. පසුගිය වසර පහ තුළ අවම වශයෙන් සිවිල් වැඩ වටිනාකමින් 80%ක වටිනාකමින් යුත් ඊට සමාන එක් කර්මාන්තයක් ඉටුකර ඇති පළපුරුද්ද. (ඉහත වගුවේ අවශ්‍ය සීඩා ශ්‍රේණිය C7 හා C8 ඉල්ලා ඇති කර්මාන්ත සඳහා මෙම කොන්දේසිය අදාළ නොවේ)
   - II. පසුගිය වසර පහ තුළ ඉහත ඉදිකිරීමේ සිවිල් වැඩවල වටිනාකමට සමානව පවත්වාගෙන ගිය සාමාන්‍ය පිරිවැටුම. (ඉහත වගුවේ අවශ්‍ය සීඩා ශ්‍රේණිය C7 හා C8 ඉල්ලා ඇති කර්මාන්ත සඳහා මෙම කොන්දේසිය අදාළ නොවේ)
   - III. මූල්‍යමය හැකියාව.
   - IV. දැනට කර ගෙන යන වැඩවල මූල්‍ය හා භෞතික ප්‍රගතිය
5. ලංසු වටිනාකම රුපියල් මිලියන 05ක් හෝ ඊට වැඩි අගයක් සහිත කර්මාන්ත සඳහා 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් ගිවිසුම් පනත යටතේ ලියාපදිංචි විය යුතු අතර, ලංසු සමග එම ලියාපදිංචි සහතිකය හෝ එය තහවුරු කළ හැකි ලේඛන ඉදිරිපත් කළ යුතුය. එම ලියාපදිංචි සහතිකය හෝ එය තහවුරු කළ හැකි ලේඛන ලංසු සමග ඉදිරිපත් කර නොමැතිවීම ලංසු ප්‍රතික්ෂේප කිරීමට හේතුවක් වේ.
6. මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් හට ඉහත වගුවේ සඳහන් කාර්යාල වෙත ලිඛිත ඉල්ලුම්පතක් ඉදිරිපත් කිරීමෙන් ප්‍රසම්පාදන ආකෘතිපත්වල සම්පූර්ණ ඉංග්‍රීසි භාෂාමය පිටපතක් 2021.05.03 සිට 2021.05.24 දින දක්වා කාර්යාල වේලාවන් තුළදී ඉහත වගුවේ සඳහන් පරිදි ලංසු ලියවිලි ගාස්තුව ගෙවීමෙන් පසු ලබා ගත හැකි අතර, අයකිරීමකින් තොරව පරීක්ෂා කළ හැක.
7. ලංසු සුරක්ෂණය මුදලින් **නොගෙවන්නේ නම්** ලංසු සමග ලංසු බැඳුම්කරයක් අමුණා එවිය යුතුය. ලංසු බැඳුම්කරයක් ඉදිරිපත් කරන්නේ නම්,ලංසු සුරක්ෂණය සඳහා වගුවේ සඳහන් ලංසු සුරක්ෂණ මුදල මෙන් දෙගුණයක් වටිනාකමින් යුත් ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුමත කළ **වාණිජ බැංකුවකින්** ලබාගත් **කොන්දේසි රහිතව** ඉල්ලූවිට ගෙවනු ලබන බැංකු ඇපකරයක් මගින් පමණක් ඉදිරිපත් කළ යුතුය. ලංසු ඇපකරය 2021.09.25 වෙනි දින දක්වා වලංගු විය යුතුය.
8. නිසි පරිදි සම්පූර්ණ කරන ලද ලංසු පිටපත් දෙකකින් යුතුව අදාළ ප්‍රසම්පාදන කමිටුව වෙත 2021.05.25 වන දින පෙ.ව. 10.00 ට පෙර ඉදිරිපත් කළ යුතු අතර, ලංසුපත්වල මුල් පිටපත හා අනු පිටපත යනුවෙන් සඳහන් කර වෙන් වෙන්ව කවර දෙකක බහා එම කවර දෙක එක් ලිපි කවරයක බහා, ඉහළ වම් කෙළවරේ අදාළ කර්මාන්තයේ නම සඳහන් කර මුද්‍රා තබා, සභාපති , ප්‍රසම්පාදන කමිටුව , ඌව පළාත් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව, පිංඅරාව, බදුල්ල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ එම කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම සිදුකළ යුතු අතර, ප්‍රමාද වී ලැබෙන ලංසුපත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
9. අනු පිටපත, මුල් පිටපතේ සෑම පිටුවකම සහතික කරන ලද ඡායාස්ථ පිටපතක් විය යුතුය.
10. අදාළ වැඩි විස්තර, ඌව පළාත් ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට අයත් 055 - 2229629 , බණ්ඩාරවෙල ප්‍රාදේශීය ඉංජිනේරු (ගොඩනැගිලි) කාර්යාලයට අයත් 057-2222025, මොණරාගල ප්‍රාදේශීය ඉංජිනේරු (ගොඩනැගිලි) කාර්යාලයට අයත් 055-2276038, 055-2224753 බිබිල ප්‍රාදේශීය ඉංජිනේරු (ගොඩනැගිලි) කාර්යාලයට අයත් 055-2265317 දුරකථන අංක වලින් ලබා ගත හැක.
11. ලංසු වලංගු කාලය 2021.08.25 වෙනි දින දක්වා විය යුතුය
12. 2021.05.25 දින පෙ.ව. 10.00 ට බදුල්ල, පළාත් ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේදී ලංසු විවෘත කරන අතර, එම අවස්ථාවට ලංසුකරුට හෝ ඔහුගේ නියෝජිතයෙකුට සහභාගි විය හැක.
13. ලංසු කැඳවීම සම්බන්ධ පූර්ව ලංසු රැස්වීමක් (Pre Bid Meeting), 2021.05.17 දින පෙ.ව.10.00 ට බදුල්ල, පිංඅරාව, පළාත් ගොඩනැගිලි අධ්‍යක්ෂ කාර්යාලයේදී පැවැත්වෙන අතර, එහිදී අපේක්ෂිත ලංසුකරුවන්ට ව්‍යාපෘති අවශ්‍යතා සම්බන්ධව පැහැදිලි කිරීම් ඉල්ලා සිටිය හැක. තවද, අවශ්‍ය නම් වැඩ බිම් සංචාරයක්ද පිළියෙල කළ හැක.
14. ලද ලංසු අතරින් යෝග්‍ය ලංසුවක් පිළිගැනීම හෝ සියල්ලම ප්‍රතික්ෂේප කිරීමේ සම්පූර්ණ අයිතිය ප්‍රසම්පාදන මණ්ඩලය සතුවන අතර, ප්‍රසම්පාදන මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ.

**සභාපති - ප්‍රසම්පාදන කමිටුව,**
**පළාත් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව,**
**පිංඅරාව, බදුල්ල.**

**දු.ක / ෆැක්ස් අංකය - 055-2229629,** **ඊ.මේල්-** bdplanningunit@gmail.com
**දිනය: 2021.04.29**

## දවසේ රාහු කාලය

උදේ 10.35 සිට 12.08 දක්වා රාත්‍රී 10.40 සිට 12.08 දක්වා



සුබසෙත ජ්‍යෙෂ්ඨ කර්තෘ ප්‍රවීණ ජ්‍යොතිෂවේදී අජිත් ධර්මසිරි

## දින තත්ත්වය

මේෂ රවි 17 භාග බක් අව ජලවක තිථිය ලත් කිවි දින ඉර උදාව 05.57ට ඉර බැසීම 06.19ට දෙට නැකත දහවල් 12.12' ගෙවී මුල නැකත ලබයි. බක් අව ජලවක තිථිය රාත්‍රී 07.16න් ගෙවේ. අව විසේනිය තිථිය ලබයි. පරිඝ යෝගය උදේ 08.05න් ගෙවී ශිව යෝගය ලබයි. බව කරණය උදේ 08.40 න් ගෙවී බාලවකරණය ලබා එය රාත්‍රී 07.16න් ගෙවී කෞලව කරණය උදා වෙයි.

විෂ කලාව - පෙකණිය / අමෘත කලාව - කන / මරු සිටින දිසාව - ගිනිකොන යෝගිනි - නිරිත / සුබ දිසාව - උතුර

## 2021 අප්‍රේල් 30 සිකුරාදා හෝරාව ලබා ගෙවී යන අයුරු

**උදේ**

05.57 - 06.57 දක්වා - සිකුරු හෝරාව
06.57 - 07.57 දක්වා - බුධ හෝරාව
07.57 - 08.57 දක්වා - සඳු හෝරාව
08.57 - 09.57 දක්වා - සෙනසුරු හෝරාව
09.57 - 10.57 දක්වා - ගුරු හෝරාව
10.57 -11.57 දක්වා - කුජ හෝරාව

**සවස**

11.57 - 12.57 දක්වා - රවි හෝරාව
12.57 - 01.57 දක්වා - සිකුරු හෝරාව
01.57 - 02.57 දක්වා - බුධ හෝරාව
02.57 - 03.57 දක්වා - සඳු හෝරාව
03.57 - 04.57 දක්වා - සෙනසුරු හෝරාව
04.57 - 05.57 දක්වා - ගුරු හෝරාව

**රාත්‍රී**

05.57 - 06.57 දක්වා - කුජ හෝරාව
06.57 - 07.57 දක්වා - රවි හෝරාව
07.57 - 08.57 දක්වා - සිකුරු හෝරාව
08.57 - 09.57 දක්වා - බුධ හෝරාව
09.57 - 10.57 දක්වා - සඳු හෝරාව
10.57 -11.57 දක්වා - සෙනසුරු හෝරාව

**අලුයම**

11.57 - 12.57 දක්වා - ගුරු හෝරාව
12.57 - 01.57 දක්වා - කුජ හෝරාව
01.57 - 02.57 දක්වා - රවි හෝරාව
02.57 - 03.57 දක්වා - සිකුරු හෝරාව
03.57 - 04.57 දක්වා - බුධ හෝරාව
04.57 - 05.57 දක්වා - සඳු හෝරාව

**බබාට නමක්**

මෙදින දහවල් 12.12 දක්වා දෙට නැකත උදාව පවතින අතර එහෙත් උපදින දරුවනට නො,ය,යි,යු අකුරුද ඉන් පසු මුල නැකත උදා වන නිසා එතැන් පටන් උපදින දරුවනට යෙ,යො, බ,බි අකුරුද දිනට අදාළව ච, ජ, ඡ අකුරුද මුල් කොට බබාට නමක් දැමීම සුබයි.






## දවසේ ලග්න පලාපල

### මේෂ ලග්නය - ගෘහ ජීවිතය ඉතා ඵලදායි වේ

මේෂ ලග්නයට අනුව අද ඔබට තම ජීවිත කාලයේ උපරිම සතුටුදායක දිනකි. තම දියුණුවට කටයුතු යෙදේ. රැකියා ව්‍යාපාර සපල වේ. ගෘහ ජීවිතය ඉතා ඵලදායි එකක් වේ. එදිනෙදා කටයුතුවල කාර්ය බහුලතාවක් පෙනේ. තම ආර්ථිකය සුරක්ෂිත කර ගැනීමට උනන්දුවන්න නැත හොත් නැති නාස්තිවීමේ තත්ත්වයක් පෙනෙන්නට තිබේ. තුනටියට අගුණයි. වැටීම් තැළීම් විය හැකියි. හිසේ සෙම තත්ත්වයක් උද්ගත වේ.

### වෘෂභ ලග්නය - රැකියා ස්ථානගත අභිවෘද්ධිය

වෘෂභ ලග්නයට අනුව සිතේ කනස්සල්ල, කාර්යය බහුලතාව හා අධික තරහ කේන්තිය නිසා කටයුතුවල බාධා ඇතිවේ. රැකියා ස්ථානගත අභිවෘද්ධිය මතු කෙරේ. ධන සම්පත් හිමිකම වාහන ඉඩම් නිවාස හිමිකම පෙනෙන්නට තිබේ. විවාහ ස්ථානගත ගැටලු ඇතිවීමට පුළුවන. පිටස්තර අය පවසන දෑ පිළිබඳ දෙවතාවක් සිතන්න. ඒ අය ඔබ නොමග යවනසුලු ප්‍රකාශන කළ හැකිය. මුත්‍ර දෝෂ හටගනී. උපරිම වතුර පානය කරන්න.

### මිථුන ලග්නය - දින චර්යාවේ වෙනසක්

මිථුන ලග්නයට අනුව අද ඔබට පෙර පිං මහිම මතු වේ. ඒ අනුව බොහෝ ලැබීම්වලට හේතු වේ. රැකියාවට අමතරව වෙනත් බාහිර ලැබීම් ඇත. දින චර්යාවේ වෙනසකට අනුව දුර බැහැර රැකියාවකට යාමට සිදු වේ. තම මස්සිනාවරුන් නිසා දවස කාර්යබහුල වන අතර ඒ අය සමග පිටස්තර බලවේගයකට මුහුණ දීමට සිදු වේ. හිසට අපලයි. කලකෝලාහල මතුවන ස්ථානවල ගැවසීම නුවණට හුරු නැත.

### කටක ලග්නය - ආර්ථිකය උසස් වේ

කටක ලග්නයට අනුව අද ඔබට තමන් කරන රැකියාව ආර්ථිකය උසස් මට්ටමට පත් වන ලකුණු පෙනේ. සඳුගේ තත්ත්වය කේතු සමග 05 වැන්නේ දරුවන්ට අපලයි. තම කුස ආශ්‍රිත ස්ථානගතවද උවදුරු පෙනෙයි. තම දේපළක් සම්බන්ධ ගැටලු මතු වේ. නීති ප්‍රශ්න එළඹේ. වියදම අධිකයි. පරිස්සම් වන්න. ආවාට ගියාට තම ජීවිතය ගෙවා දැමීම හොඳයයි නොසිතන්න. මුත්‍ර දෝෂ සහිතයි. ඇඟ නිවෙන ආහාරපාන ගන්න.

### සිංහ ලග්නය - යහපත් විවාහ ලාභ

සිංහ ලග්නයට අනුව අද ඔබගේ කේන්ද්‍රයේ පවතින ප්‍රබල ග්‍රහ යෙදුමකට අනුව රැකියා ආර්ථික යහපත භෞතික සම්පත් ලාභ යහපත් විවාහ ලාභ පෙන්වනු ඇත. කලක් තමා වෙතින් ඈත් වී සිටි අයකු යළි ඇසුරට පත් වේ. එය තම අනාගත දිවි පැවැත්මට සුබවාදි වේ. ලැබීම් උසස් වුවද වියදම උග්‍ර වීමට පුළුවන. දුර බැහැර ගමන්වලින් වැළකී සිටීම යහපත් වෙයි.

### කන්‍යා ලග්නය - ආත්ම අභිමානය ඉහළ නැංවේ

කන්‍යා ලග්නයට අනුව තමා එක්තරා මට්ටමක සංහිඳියාවකට පත්වන දිනකි. ආගමික හෝ වේවා සංස්කෘතිකමය වේවා තමාට ලැබෙන සිතේ සතුට අප්‍රමාණ වේ. තම ආත්ම අභිමානය පිණිස තමා කළ කී දෑ යහපත් පිණිස වෙයි. තමා සමග සතුටු සමාලෝචනයේ යෙදෙමින් සිටි අයකු හදිසියේ ඔබ වෙතින් ඉවත්ව දුරස්ව යෑමට බොහෝ දුරට ඉඩ ඇති නිසා තම මුවින් පිටකරන වචන පිළිබඳව දෙවතාවක් කල්පනා කොට බැලීම යහපත්ය.

### තුලා ලග්නය - දේපළවලට තිබූ ගැටලු සමනය වේ

තුලා ලග්නයට අනුව අද ඔබට තම ව්‍යාපාරික ක්ෂේත්‍රයේ උසස් ඵල හිමිවේ. තම දේපළවලට තිබූ ගැටලු සමනය වේ. ආර්ථික වශයෙන්ද ප්‍රතිලාභ සහිත වේ. පෙර දින කීපයකට එපිට සිට සිතේ පවත්වාගෙන ආ බලාපොරොත්තුවක් සඵල කරවා ගැනීමට හැකිවේ. පාරේ තොටේ ගමන් කිරීමේදී විය හැකි ආපදාවක් නිසා පාඩු විඳීමට සිදු වේ. තුනටිය ආශ්‍රිත ආපදා මතුවිය හැකිය.

### වෘශ්චික ලග්නය - සිතට වද දෙන කාරණා එළඹේ

වෘශ්චික ලග්නයට අනුව අද ඔබට චන්ද්‍රයා - කේතු ලග්න ගතව සිටීම සිතට වදදෙන කරුණු රැසකට හේතු වේ. එහෙත් ලැබීම් අතින් සුබයි. අන් අයගේ බසට කන්නොදී ගන්නා තීන්දු තීරණ නිසා බොහෝ දෙනකුගේ දෝෂ දර්ශනයට ලක්වේ. තමා විසින් ගන්නා තනි තීන්දු නිසා ආපදා වැඩිවේ. සිතේ කනස්සල්ල මතුවේ. ඉවසීමෙන් ඉතා හොඳ මානසිකත්වයෙන් කල් ගෙවීමට උනන්දු වන්න.

### ධනු ලග්නය - සිතට සැහැල්ලුව

ධනු ලග්නයට අනුව අද ඔබට පිටරටක සිහිනය සැබෑ වේ. එහෙත් වියදම අධිකවේ. තම දේපළකට තිබූ නීති ගැටලුවක් ඉවත්ව යෑම සිතට සැහැල්ලුව ගෙනදෙන සුලු එකක් වුවද රැකියා ව්‍යාපාර කටයුතු අධිකවීම, එය කාර්යබහුල වීම නිසා වෙහෙසකර දිනකි. දරුවන්ගේ කටයුතු හා දරුවන්ගේ ජයග්‍රහණ නිසා සිතට මහත් අභිමානයක් දැනෙනු ඇත.

### මකර ලග්නය - ජලය ආශ්‍රිත කටයුතු කෙරෙන් ආපදා

මකර ලග්නයට අනුව අද ඔබට බාධා මැද්දේ වුව ද ජයග්‍රහණ රැසක් හිමි වන දිනකි. ජලය ආශ්‍රිත කටයුතු කෙරෙන් ආපදා පවතී. වැව්, පොකුණු, ගංගා, දියඇලි ආශ්‍රිත කටයුතුවලින් බැහැර වන්න. තමාගේ ළඟ ඥාතියකුගේ කරදරයකදි ඉතා වෙහෙසව කටයුතු කිරීමට සිදු වෙතත් තමා තම ශාරීරික සුවතාව පිළිබඳවද උනන්දුව තබාගත යුතු වේ. නැත හොත් ඒ නිසා පසුතැවීමට හේතු වේ.

### කුම්භ ලග්නය - ජයග්‍රහණ රැසක්

කුම්භ ලග්නයට අනුව අද ඔබට ඉතා සුබයි. ජයග්‍රහණ රැසක් අත්පත් කරගැනීමට සමත් වේ. ඒ අතර සිතට දැඩි සැහැල්ලුවක් දැනෙන දිනකි. සහෝදර සහෝදරියන් පිරිසකගේ ඒකරාශිවීම මත තමාට දිගින් දිගටම පැවති ගැටලුවක් නිරාකරණය කර ගැනීමට හැකිවේ. ඒ සඳහා තම සමීපතමයින්ගේද සහයෝගය නොඅඩුව ලැබේ. යටි බඩ ආශ්‍රිත සැර උෂ්ණතා නිසා පීඩා විඳීමට සිදු වේ.

### මීන ලග්නය - ප්‍රියයන්ගෙන් දුරස් වීමක්

මීන ලග්නයට අනුව අද ඔබට තම ජීවිතයේ පසුතැවීමට හේතු වන කරුණු ගණනාවක් යෙදේ. ප්‍රියයන්ගෙන් වෙන් වීම තම දේපළවලට උවදුරු පැමිණීම හා ආර්ථික පාඩු මූල්‍යමය ගැටලු ලෙසිනි. එහෙත් තම අධිෂ්ඨානය උසස් බවින් පවත්වාගෙන යෑමට ලැබෙන හැකියාව නිසා බාධා මැඩ ඉදිරියට යාමට හැකිවේ. උරහිස ආශ්‍රිත උවදුරු පෙන්වන නිසා සමබර ලෙස බර ඉසිලීම වුවද සුබයි.

## කොළඹ වරාය නගර ආර්ථික කොමිෂන් සභා පනත් කෙටුම්පත පිළිබඳ ප්‍රකාශය

# වරාය නගරයෙහි චීන යටත්විජිතවාදය පිළිබඳ බොරු චෝදනා ආසියා ප්‍රගති සංසදය හෙළා දකී




මුහුද ගොඩ කොට හෙක්ටයාර් 269ක භූමි ප්‍රමාණයක විශේෂ ආර්ථික කලාපයක් පිහිටුවීමේ අපේක්ෂාවෙන් මෑතදී ගැසට් කරන ලද කොළඹ වරාය නගර ආර්ථික කොමිෂන් සභා පනත් කෙටුම්පත ආසියා ප්‍රගති සංසදයේ අවධානයට යොමු වී ඇත. ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන කොමිෂන් සභාවක් මඟින් එය පාලනය වනු ඇති අතර, වරාය නගරය තුළ ව්‍යාපාර කටයුතු කිරීමේ පහසුව වැඩි කිරීම සඳහා තනි කවුළු ආයෝජන පහසුකම් සපයන්නෙකු සේ එය ක්‍රියාත්මක වනු ඇත.

කොළඹ වරාය නගර කොමිෂන් සභා පනත් කෙටුම්පත විවේචනය කිරීමේ මුවාවෙන් විවිධ ප්‍රසිද්ධ පුද්ගලයන් විසින් දරුණු චීන - භීතිකාවක් මතු කරමින් 'චීන යටත් විජිතවාදය' පිළිබඳ කරමින් තිබෙන ප්‍රකාශයන් ආසියා ප්‍රගති සංසදය නිසැකවම හෙළා දකී. එවැනි ප්‍රකාශ කරුණුමය වශයෙන්ම නිවරද්‍ය නොවනවාට අමතරව, ජනතාව නොමග යවන සුලු සහ අපගේ පැරණිතම සහ ස්ථිර මිතුරෙකුට ගැඹුරින් අපහාස කිරීමක් ද වන්නේය. මෙම දේශපාලන ක්‍රියාකාරීන් විසින් ඉදිරිපත් කරන චීන විරෝධී ප්‍රකාශවල කොමිෂන් සභා පනත් කෙටුම්පත ගැසට් කරන්නට පෙර පුවත්පත් මඟින් අනාවරණය කරන ලද ශ්‍රී ලංකාවේ ඇමරිකානු තානාපතිනියගේ ප්‍රකාශ අතර කැපී පෙනෙන සමානකම් ද ආසියා ප්‍රගති සංසදය නිරීක්ෂණය කරයි.

ක්‍රි. ව. 410දී ෆාහියන් භික්ෂුවගේ සංචාරයේ සිට ශ්‍රී ලංකාව චීනය සමඟ සුහද සබඳතා පවත්වාගෙන යයි. 1952 රබර් සහල් ගිවිසුම අපේ රටේ ඉතිහාසයේ වඩාත්ම හිතකර වෙළෙඳ ගිවිසුම විය. එය දක්ෂිණාංශික ශ්‍රී ලංකා රජයක් විසින් අත්සන් කරන ලද්දකි. මහජන චීන සමූහාණ්ඩුව සමඟ දෘෂ්ටිවාදාත්මක වෙනස්කම් පැවතුණ ද අන්‍යෝන්‍ය වශයෙන් වාසිදායක ආර්ථික හේතූන් මත දෙරට සහයෝගයෙන් කටයුතු කළේය. රට තුළත් ඉන් පිටතත් ප්‍රතිගාමී අධිරාජ්‍ය ගැති බලවේගයන්ගේ දැඩි පීඩනය නොතකා, එවකට ශ්‍රී ලංකාවේ ඉදිරිගාමී ප්‍රතිපත්ති සම්පාදකයන් විසින් මහජන චීනය සමඟ හවුල්කාරිත්වයක් ඇති කර ගත්හ. 1957දී මහජන චීනය සමඟ විධිමත් රාජ්‍ය තාන්ත්‍රික සබඳතා ඇති කරගැනීම වාමාංශික ව්‍යාපාරයේ දශක ගණනාවක ක්‍රියාකාරිත්වයේ ප්‍රතිඵලයකි. එතැන් සිට මහජන චීනය කිට්ටු මිතුරෙකු ලෙස කටයුතු කළ අතර යුද්ධය, ස්වාභාවික විපත් සහ අධිරාජ්‍යවාදී සතුරු ක්‍රියාවලදී ශ්‍රී ලංකාවේ ස්වෛරීභාවය සහ භෞමික අඛණ්ඩතාව වෙනුවෙන් නිරන්තරයෙන් පෙනී සිටියේය.

කොළඹ වරාය නගරය සංකල්පය මුලින් ඉදිරිපත් කළේ ශ්‍රී ලංකා ප්‍රතිපත්ති සම්පාදකයන් වන අතර, වරාය නගර කොමිෂන් සභා පනත් කෙටුම්පත ද ශ්‍රී ලංකා ප්‍රතිපත්ති සම්පාදකයන්ගේ නිෂ්පාදනයකි. වරාය නගරය සඳහා ඉඩම් ගොඩ කිරීම ණය බරක් නොවූ අතර, ඒ වෙනුවට ඇමරිකානු ඩොලර් බිලියන 1.4ක ශ්‍රී ලංකා ඉතිහාසයේ විශාලතම සෘජු ආයෝජනයක් සිදු විය. මෙම ඉඩම ශ්‍රී ලංකාවෙන් වෙන් කළ නොහැකි කොටසක් වන අතර, එය නිල වශයෙන් නාගරික සංවර්ධන අධිකාරියට 2019දී පවරා දී ඇත. වරාය නගර පනත් කෙටුම්පතේ සඳහන් වන පරිද්දෙන්, ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදීව තේරී පත් වූ ජනාධිපතිවරයාගේ මධ්‍යගත පාලනය යටතේ මෙම විශේෂ ආර්ථික කලාපය පාලනය වනු ඇති බැවින්, චීනය හෝ කිසිදු විදේශ රටකට ඒ සඳහා මැදිහත් විය නොහැකිය. විශේෂ කලාපයේ ඉඩම් සින්නක්කර පදනම මත විකිණීමට නොහැකි බව ද පනත් කෙටුම්පතේ සඳහන් වේ.

කොළඹ වරාය නගරය, මේ යුගයේ ආර්ථික ගෝලීයකරණයේ හා ඒකාබද්ධ වීමේ සෘජු බලපෑමක් ලෙස ආසියා ප්‍රගති සංසදය පිළිගනී. ශ්‍රී ලංකාව ගැඹුරු ආර්ථික අර්බුදයක සිටින රටකි. සීමිත ස්වාභාවික සම්පත්, ඌන සංවර්ධිත මානව සම්පත්, අඩු මිලදී ගැනීමේ ශක්තිය සහ ඉහළ ජාතික ණය සමඟ අපේ රටට, මෙම ඉදිරියට යමින් පවතින ඓතිහාසික ප්‍රවණතාවයට එරෙහිව කටයුතු කළ නොහැකි අතර, වෙළෙඳපොළ මූලධර්මවලින් 'විසංයෝජනය' ද විය නොහැකිය. ආසියා ප්‍රගති සංසදය සලකන්නේ කොළඹ වරාය නගරය ඉතා අවශ්‍ය විදේශ ආයෝජන ලබා ගැනීමේ අවස්ථාවක් ලෙසයි. එමඟින් ශීඝ්‍රයෙන් අවප්‍රමාණය වන ශ්‍රී ලංකා රුපියල ස්ථාවර කරනු ඇත. සේවා මත පදනම් වූ විශේෂ ආර්ථික කලාපය, තරුණ ශ්‍රී ලාංකික ව්‍යවසායකයන්ට නවෝත්පාදන අවස්ථා උදා කරදීමට සහ බුද්ධි ගලනය අවම කිරීමට හේතු වනු ඇතැයි අපි අපේක්ෂා කරමු. ජාත්‍යන්තර ප්‍රමිතීන් කලාතුරකින් අනුගමනය කරන, වේගයෙන් වර්ධනය වන සේවා අංශයක් ඇති රටක් ලෙස ශ්‍රී ලංකා සේවා අංශය සඳහා වැදගත් මිනුම් සලකුණු මෙම කලාපය විසින් හඳුන්වා දෙනු ඇත. එහි ඇති සේවා ආයතන පාරිභෝගික අභිමතයන් පිළිබඳ විශාල දත්ත ප්‍රමාණයක් සපයනු ඇති අතර, එම දැනුම ශ්‍රී ලාංකික සමාගම් විසින් සපයනු ලබන නිෂ්පාදන හා සේවාවන් නවීකරණය කිරීම සඳහා ඵලදායී ලෙස භාවිතා කළ හැකිය.

ඉහත සඳහන් ප්‍රතිලාභ සැලකිල්ලට ගත් විට චීන විරෝධී වැරදි තොරතුරු, චීනයට සහ එහි ජනතාවට එරෙහිව එක්සත් ජනපදය, ඉන්දියාව ඇතුළු ඔවුන්ගේ සගයින් විසින් දියත් කොට ඇති නව සීතල යුද්ධයට උදව් කිරීමක් හැර අන් කිසිවක් නොවන බව අපි අවධාරණය කරමු. චීනයේ සමාජවාදී වෙළඳපළ ආකෘතිය මඟින් මෙහෙයවනු ලබන, වර්ධනය වන ආසියානු ආර්ථිකය තුළ ශ්‍රී ලංකාව, එහි නියම ස්ථානය ලබා ගැනීම වැළැක්වීම සඳහා එක්සත් ජනපදයේ නායකත්වයෙන් යුත් අධිරාජ්‍යවාදී කඳවුර ගන්නා උත්සාහයක් ලෙස මෙම ප්‍රචාරක ව්‍යාපාරය දැක්විය හැකිය. තවද එවැනි ප්‍රචාර දැනටමත් පවතින වරාය නගරයෙන් ජාතික ආර්ථිකයට අත්විය හැකි ප්‍රයෝජන හා අඩුපාඩු පිළිබඳ තාර්කික ඵලදායී විවාදයන් වළක්වයි. කොළඹ වරාය නගරය යනු ශ්‍රී ලංකා ආර්ථිකය ස්ථාවර කිරීම සඳහා වැදගත් සංවර්ධන මැදිහත්වීමක් බවත් එය තවදුරටත් ඌනපූරණය කිරීම සඳහා ශ්‍රී ලංකා රජයට ඉදිරි පියවර ගත හැකි බවත් ආසියා ප්‍රගති සංසදයේ අදහසයි.

පහත දැක්වෙන්නේ වරාය නගර පනත් කෙටුම්පතේ ඇති දුර්වලතා පිළිබඳව ආසියා ප්‍රගති සංසදය විසින් කරන ලද නිරීක්ෂණ සහ ඒවාට පිළියම් යෙදීමට අවශ්‍ය පියවරයන්ය.

**බෙදාහැරීම්** : ඉඳුරන, නාරත්තල

2021-05-15 — 08:30-17:00

**තොග සහ බෙදාහැරීම්** : ඉන්දික රබර් කර්මාන්ත ශාලාව, තියදුරුපොල රබර් කර්මාන්ත ශාලාව

**බෙදාහැරීම්** : ඒබ්ඩිගල, කිතලන්ගමුව, කෝන්ගොඩ, පලමුරේ

2021-05-17 — 08:00-17:00

**බෙදාහැරීම්** : අල්ගම ඉහලගම, බෝපිටිය, ඉහලවැලිගල්ල, නිවටුව

2021-05-18 — 08:30-17:00

**තොග** : ජේ. ඇන්ඩ්එස්. මෙටල් ක්‍රෂර්

**බෙදාහැරීම්** : අමිතිරිගල, අමිතිරිගල මොබිටෙල්, අමිතිරිගල උතුර, අමිතිරිගල පාසල, උඩකණුගල

### කරවනැල්ල පාරිභෝගික සේවා මධ්‍යස්ථානය

2021-05-10 — 08:00-17:00

**තොග** : කිතුල්ගලතේකම්හල

**බෙදාහැරීම්** : ඉහළවටගල, කිතුල්ගල, කිතුල්ගල පංසල, ගොන්නාන, පරත්තාවල, දූනුකේදෙණිය, බටකිත්ත, මල්වත්තපාර, මල්වත්ත මැද්දෙවත්ත

2021-05-10 — 08:30-17:00

**තොග** : කිතුල්ගලතේකම්හල

**බෙදාහැරීම්** : ඉහළවටගල, කිතුල්ගල, කිතුල්ගල පංසල, ගොන්නාන, පරත්තාවල, දූනුකේදෙණිය, බටකිත්ත, මල්වත්තපාර, මල්වත්ත මැද්දෙවත්ත

2021-05-15 — 08:00-17:00

**තොග** : විනිවෝග් ඇපරල්

**බෙදාහැරීම්** : ගරාගොඩ, මීගස්තැන්න, මීගස්තැන්න 2 ගේට්ටුකඩේ

### කොටියාකුඹුර පාරිභෝගික සේවා මධ්‍යස්ථානය

2021-05-03 — 08:00-17:00

**තොග සහ බෙදාහැරීම්** : අම්පේ ජලපොම්පාගාරය කොටියාකුඹුර

**බෙදාහැරීම්** : මකුරාහංදිය, මල්මඩුව

2021-05-10 — 08:00-17:00

**බෙදාහැරීම්** : දැදිගම, ඉහළගම දැදිගම, මල්මැස්ස

2021-05-21 — 08:00-17:00

**බෙදාහැරීම්** : වරාවලහංදිය, කන්නත්තොට, කන්නත්තොට ඉහළගම, මත්තමගොඩ බෝගලහංදිය, මූදුගමුව

2021-05-24 — 08:00-17:00

**බෙදාහැරීම්** : හරිගල වඳුරාදෙණිය, ඉද්දමල්පාන පන්සල, කිතිගම, කිරිදන ජනපදය, ලාහුපන

2021-05-28 — 08:00-17:00

**බෙදාහැරීම්** : ඊරියගස්මඩ, ලෙනගල, වේරගල

**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සබරගමුව පළාත), ලංකා විදුලිබල මණ්ඩලය, නව නගරය, රත්නපුර.**

*විදුලි බලයෙන් සැපිරිමත් දිවියක්*

**ඔබගේ මාසික විදුලි බිල www.ceb.lk වෙබ් අඩවිය මගින් ගෙවිය හැක**

---

# ප්‍රසම්පාදන දැන්වීමයි

# රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

N-118

රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, ප්‍රසම්පාදන මණ්ඩලයේ, සභාපති විසින් පහත සඳහන් ද්‍රව්‍ය සැපයීම සඳහා විදේශීය නිෂ්පාදකයන් / සැපයුම්කරුවන් හෝ බලයලත් නියෝජිතයින්ගෙන් ලංසු කැඳවනු ලැබේ.

01. CTP Thermal Plate Komori & Chemical
Bid Reference No : SI. 2021/39
Bid Fee : Rs. 2,500.00

| Item No. | Size (mm) | Thickness (mm) | Quantity (Nos.) |
|---|---|---|---|
| 1. CTP Thermal Plate Komori & Chemical | 605X760 | 0.24-0.30 | 2000 |
| 2. Developer (Thermal) : 200 Ltrs. | | | |
| 3. replenisher (Thermal) : 100 Ltrs. | | | |

2021-05-21 දින ප.ව. 2.00 ට ඉහත ලංසුව වසා දමන අතර එම වේලාවටම විවෘත කරනු ලැබේ. ලංසුවලට අදාළ ලිපිලේඛන පහත ලිපිනයේ පිහිටි රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ සැපයීම් අංශයෙන් සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා නිකුත් කරනු ලැබේ. සෑම ලංසුවක් සඳහාම ආපසු නොගෙවන ගාස්තුවක් සමග ලිඛිත අයදුම්පතක් ඉහත සඳහන් ලංසු අවසන් කරන දිනයට පෙර දින ප.ව. 2.00 ට හෝ ඊට පෙර ලැබෙනසේ එවිය යුතුය. වැඩි විස්තර සඳහා සතියේ වැඩ කරන දිනයන්හි පෙ.ව. 9.00 සිට ප.ව. 4.15 දක්වා මගේ කාර්යාලයෙන් ලබාගත හැක.

**ගංගානි ලියනගේ**
**ප්‍රසම්පාදන කමිටු සභාපති**

**රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,**
**අංක 118, ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 8.**

**දුරකථන** : 0112694898
**වෙබ් අඩවිය** : www.documents.gov.lk
www.npa.gov.lk

2021-04-07

---

# බේරා නොගත් උකස් රන් භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

සී.ස. වයඹ සමුපකාර ග්‍රාමීය බැංකු සංගමයේ උකස් නියෝජිතයින් වශයෙන් කටයුතු කරන

**සී/ස. බිංගිරිය වි.සේ.ස. සමිතියේ**

පහත සඳහන් ග්‍රාමීය බැංකු ශාඛා වෙත

**2019-12-31 දින දක්වා උකස් කරන ලද**

එහෙත් මේ දක්වා බේරා නොගත් රන් භාණ්ඩ

**2021-05-15 සහ 16 යන දිනයන්හි පෙ.ව. 9.00 සිට**

බෝවත්ත පිහිටි සමිති ප්‍රධාන කාර්යාලයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

| | | | |
|---|---|---|---|
| 1. | බෝවත්ත | 7. | පඩිවෙල |
| 2. | නාගොල්ලාගොඩ | 8. | බිංගිරිය |
| 3. | වීරපොකුණ | 9. | වැල්ලරාව |
| 4. | තිසෝගම | 10. | මානෙලෙම්බුව |
| 5. | හල්මිල්ලවැව | 11. | තාරණ |
| 6. | හොරගස්අගාර | 12. | කඩිගමුව |

**මෙයට,**
**සාමාන්‍යාධිකාරී.**

**සී/ස. බිංගිරිය වි.සේ.ස. සමිතිය,**
**බෝවත්ත, බිංගිරිය.**
**දුරකථන අංකය : 032-4928856, 032-4928857**

---

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ**

# 7 වන වගන්තිය යටතේ දැන්වීම

මෙහි පහත උපලේඛනයේ විස්තර කරන ඉඩම රජයට ලබාගැනීමට බලාපොරොත්තු වේ. වැඩි විස්තර සඳහා වර්ෂ 2021 ක් වූ මාර්තු මස 26 වැනි දින 2220/77 දරන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ III කොටස බලන්න.

## උපලේඛනය

ප්‍රාදේශීය ලේකම්

| | | |
|---|---|---|
| කොට්ඨාසය | : | අගලවත්ත |
| ගම | : | කැකුළන්දල |
| ඉඩමේ නම | : | පිඹුරවත්ත |
| මූලික සැලැස්ම අංක | : | මූ.පි.ක. 4721 |
| කැබලි අංක | : | 1, 2, 3, 4 |

**ප්‍රාදේශීය ලේකම්**
**අගලවත්ත.**

**අගලවත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දීය.**
**2021.04.30 දින.**

# වමේ ගමනක නිමාව

**1930 දශකයේ මැද හරියේදී මෙරට පළමු වමේ ව්‍යාපාරය ලෙස උපන් ලංකා සමසමාජ පක්ෂය එතැන් සිට දශක තුනකට ආසන්න කාලයක් ඔවුනොවුන්ම ගැටෙමින්, කැඩෙමින්, වෙන්වෙමින් මෙන්ම රණ්ඩු වෙමින් හා යාළුවෙමින් රඟදැක්වූ දේශපාලන සංදර්ශනයේ එක්තරා සන්ධිස්ථානයක් ලෙස 1963 අගෝස්තු 12 වෙනි දින බිහිවූ වාමාංශික එක්සත් පෙරමුණ සැලකිය හැක**

එදා ලංකාවේ දසදෙසින් කොළඹට ඇදී ආ මහජන සයුර අබියස සිට පැරණි වමේ පක්ෂ ලෙස ජන හදවත් තුළ මුල් බැස සිටි ලංකා සමසමාජ පක්ෂය, ලංකාවේ කොමියුනිස්ට් පක්ෂය හා මහජන එක්සත් පෙරමුණ පැරණි වාද - භේද දුරලා එක ධජයක් යටතේ සන්ධානගත වීම වමට වමේ ජය පැතූ ලාංකික හැමට සිය දිවියේ උදා වූ ඓතිහාසික දිනයක්ම විය. එහෙත් එදා ලංකා සමසමාජ පක්ෂයේ, කොමියුනිස්ට් පක්ෂයේ හා මහජන එක්සත් පෙරමුණේ සිමෙන්ති, යකඩ හා කළුගලෙන් නිම වූයේ යැයි උදම් ඇනූ සවිමත් කොන්ක්‍රීට් කුලුන හෙවත් වාමාංශික එක්සත් පෙරමුණ දෙදරා එහි සංඝටක විසිරී යන්නට ද වැඩි කලක් ගත නොවුණි. අවසන් ප්‍රතිඵලය වූයේ ලංකා සමසමාජ පක්ෂය තවදුරටත් ඛණ්ඩනය වී ඉන් පතුරක් ගැලවී ඉවතට යද්දී පක්ෂ නායක ආචාර්ය එන්. එම්. පෙරේරා ඇතුළු සමසමාජ මන්ත්‍රීන් පස්දෙනෙකු ඇමැති පදවි තුනකුත්, උප ඇමැති පදවි දෙකකුත් ලබාගනිමින් 1964 ජුනි 11 වෙනි දින සිරිමා බණ්ඩාරනායක මැතිනියගේ නායකත්වයෙන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂ - ලංකා සමසමාජ පක්ෂ සභාග රජය බිහිවීමයි.

ඒ සභාග රජය ද අකාලයේ පරාජය වී 1965 මාර්තුවේදී පමණ මහ මැතිවරණයක් නියම වූ අතර, එහිදී ලංකා සමසමාජ පක්ෂය හා ලංකාවේ කොමියුනිස්ට් පක්ෂය මහ මැතිවරණය සඳහා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සමඟ නිතරග ගිවිසුමක් යටතේ තරග කළ අතර, පිලිප් ගුණවර්ධන මහතා නායකත්වය දැරූ මහජන එක්සත් පෙරමුණ, දක්ෂිණාංශික පක්ෂය ලෙස සලකන එක්සත් ජාතික පක්ෂයට නැඹුරු වී තරග කරනු දැකගත හැකි විය. මැතිවරණ ප්‍රතිඵලය අනුව ඩඩ්ලි සේනානායක මහතාගේ නායකත්වයෙන් යුත් එක්සත් ජාතික පක්ෂ හවුල් රජයක් බිහි වී මහජන එක්සත් පෙරමුණේ නායක පිලිප් ගුණවර්ධන මහතාට එහි කර්මාන්ත හා ධීවර කැබිනට් අමාත්‍ය ධුරය හිමිවීමයි. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායිකා සිරිමා බණ්ඩාරනායක මැතිනිය විපක්ෂ නායිකාව වූ අතර, ලංකා සමසමාජ පක්ෂය හා කොමියුනිස්ට් පක්ෂය පාර්ලිමේන්තුවේ ආසන පිළිවෙළින් 10 ක් හා 4ක් බැගින් දිනා ගනිමින් විපක්ෂයට එක්විය. මහජන එක්සත් පෙරමුණට දිනාගත හැකි වූ එකම අසුන වූයේ එහි නායක පිලිප් නියෝජනය කළ අවිස්සාවේල්ල අසුනයි. 1965 මැතිවරණ ප්‍රතිඵල අනුව ආණ්ඩුවේ ප්‍රධාන පක්ෂය වූ එක්සත් ජාතික පක්ෂය ආසන 66ක් දිනූ අතර, ප්‍රධාන විපක්ෂය වූ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ආසන 41ක් ජයග්‍රහණය කරන ලදී.

1965 රජය මගින් අරඹන ලද වගා සංග්‍රාමය තරමක සාර්ථක බවක් පෙන්වූ බැව් සැලකෙන නමුත් ජීවන වියදම ඉහළ යාම, විරැකියාව වැඩිවීම හා ප්‍රබල වූ විපක්ෂයේ ක්‍රියාකාරීත්වය රජයට අභියෝගයක් වූ නමුත් එතෙක් ලංකාවේ බිහිවූ සියලු ආණ්ඩු අතරින් සම්පූර්ණ ධුර කාලය හෙවත් අවුරුදු පහක් උපද්‍රවයකින් තොරව ආණ්ඩු කළ හැකි වූ රජය ලෙසට 1965 සිට 1970 දක්වා පැවැති රජය වාර්තාගත විය. ඒ හා සමගම 1964 දී ශ්‍රී ලංකා නිදහස් පක්ෂය හා ලංකා සමසමාජ පක්ෂය අතර ඇති වූ සම්මුතියේ දිගුවක් ලෙස සැලකිය හැකි 'සමගි පෙරමුණ' නමින් වූ නව දේශපාලන සන්ධානය පිහිටුවීම 1968 ජුනි 05 දා සිදු විය. ඒ අනුව ශ්‍රී ලංකා නිදහස් පක්ෂය, ලංකා සමසමාජ පක්ෂය හා ලංකාවේ කොමියුනිස්ට් පක්ෂය යන පක්ෂ තුන පොදු වැඩපිළිවෙළක් මත පදනම්ව පොදු සම්මුතියක් සඳහා අස්සන් තැබූ අතර, එහිදී සිරිමා බණ්ඩාරනායක මැතිනිය ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නියෝජනය කළ අතර, ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා මහතා හා දොස්තර එස්. ඒ. වික්‍රමසිංහ මහතා ලංකා සමසමාජ පක්ෂය හා කොමියුනිස්ට් පක්ෂය වෙනුවෙන් සම්මුතියට අස්සන් තැබීය.

අනතුරුව ලංකාවේ හත්වන පාර්ලිමේන්තු මැතිවරණය 1970 මැයි 27 දින පැවැත්වූ අතර, එහිදී එක්සත් ජාතික පක්ෂය සමඟ සමගි පෙරමුණ මුහුණට මුහුණලා සටන් කරනු දැකිය හැකි විය. සමගි පෙරමුණට අයත් පක්ෂ තුන එකිනෙකා අතර ගැටීමක් ඇතිනොවන ආකාරයට පාර්ලිමේන්තු ආසන තෝරා බේරා ගනිමින් අපේක්ෂකයින් පත්කොට තිබූ අතර, එක්සත් ජාතික පක්ෂය ද තනි පක්ෂයක් ලෙස ආසන 127ක් තරග කොට ඇත. සමගි පෙරමුණ නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්පාදනය සඳහා තුනෙන් දෙකක ජනවරමක් පැතූ මෙම මැතිවරණයේදී තමන් ජයගතහොත් ජනතාවට දැනට නොමිලේ ලැබෙන හාල් සේරු එක වෙනුවට සියලු රටවැසියන් සඳහා එක් වැසියකුට හාල් සේරු දෙකක් බැගින් ලබාදෙන බවට වූ ඓතිහාසික දේශපාලන පොරොන්දුව ද ජනතාව ඉදිරියේ තබන ලදී. සේරු දෙක බැගින් එක් රටවැසියකුට දීමට හාල් සපයා ගන්නේ කෙළෙසක දැයි යන පැනයට සමගි පෙරමුණේ නායිකාව දී ඇතැයි පවසෙන ක්ෂණික පිළිතුර වී ඇත්තේ තම රජයක් බිහිවූ විට ලංකාවේ හාල් නිෂ්පාදනය ප්‍රමාණවත් නොවුවහොත් හඳෙන් හෝ ගෙනැවිත් මැතිවරණ පොරොන්දුව ඉටුකරන බවයි.

1969 ජූලි මාසයේදී මිනිසා සඳ තරණය කිරීමේ ඓතිහාසික සිදුවීමෙන් මාස කිහිපයකට පසු මැතිවරණ වේදිකාවේ දිගහැරුණු හඳෙන් හාල් ලක්දෙරණට ගෙනැවිත් දීමේ කතාන්දරය ඡන්දදායකයින්ගෙන් තුනෙන් දෙකක් එහෙම පිටින්ම ගිලදැමීමේ දැයි සාධාරණ වූ සැකයක් මතුවෙන්නේ 1970 මැයි 27 වෙනිදා මධ්‍යම රාත්‍රියේ සිට ලංකා ගුවන් විදුලියෙන් ප්‍රචාරය කෙරුණ මහ මැතිවරණ ප්‍රතිඵලවලට සවන් දෙමින් සිටින විටය. කෙසේ වුවද 1970 මැතිවරණයේදී සමගි පෙරමුණ ආසන 105ක් ජය ගනිමින් පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක බලයක් ඉතිහාසයේ ප්‍රථමවරට තහවුරු කර ගත් අතර, පාලක එක්සත් ජාතික පක්ෂයට ජයගත හැකි වූයේ ආසන 17ක් පමණි. එක්සත් ජාතික පක්ෂ අමාත්‍ය මණ්ඩල සාමාජිකයින් එකොළොස්දෙනෙකු සිය ආසනවලින් පරාජයට පත්වූ මෙම මැතිවරණයේදී ස්වකීය ආසන ජයගත හැකි වූයේ ඇමැතිවරුන් පස්දෙනෙකුට පමණි.

මෙරට වාමාංශික ව්‍යාපාරයේ ආරම්භකයකු වූ පිලිප් ගුණවර්ධන මහතාත්, සභානායක ධුරය දරමින් සිටි ජ්‍යෙෂ්ඨ දේශපාලනඥයකු වූ සී. පී. ද සිල්වා මහතාත් පරාජය වූ මන්ත්‍රීන් අතර කැපී පෙනෙන දේශපාලන ප්‍රබලයන් වූ අතර, පිලිප් ගුණවර්ධන මහතා පරාජයට පත්කරන ලද්දේ දේශපාලනයට නවකයකු වූ බොනී ජයසූරිය මහතා වීම ද විශේෂත්වයකි. සමගි පෙරමුණේ හා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායිකා සිරිමා බණ්ඩාරනායක මැතිනිය දෙවන වරටත් ලංකාවේ අග්‍රාමාත්‍ය ධුරයට පත් වූ අතර, ලංකා සමසමාජ පක්ෂයට අමාත්‍ය ධුර තුනක් හා නියෝජ්‍ය අමාත්‍ය ධුරයක් ද, ලංකාවේ කොමියුනිස්ට් පක්ෂයට අමාත්‍ය ධුරයක් හා නියෝජ්‍ය අමාත්‍ය ධුරයක් ද පිරිනැමිණ. අගමැතිනියගේ ආරාධනයෙන් 1970 ජූලි 19 වැනිදා කොළඹ රාජකීය විද්‍යාලයීය නව රඟහලට රැස්වූ සියලුම පාර්ලිමේන්තු මන්ත්‍රීවරු නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සකස්කොට සම්මත කිරීම සඳහා ආණ්ඩුක්‍රම සම්පාදක මණ්ඩලයක් ලෙස පත්කරනු ලැබූ අතර, ඒ අනුව ලංකාව බ්‍රිතාන්‍ය කිරීටයෙන් වෙන්වූ නිදහස්, ස්වෛරී, ස්වාධීන ජනරජයක් බවට 1972 මැයි 22 දින සිට පත් විය. ජනරජ ව්‍යවස්ථාව සම්මත වීමත් සමඟ ඉතා දීර්ඝ කාලයක් තිස්සේ පැවති 'පත්කළ මන්ත්‍රීවරුන්' පත්කිරීම ද අහෝසි විය. එමෙන්ම සෝල්බරි ව්‍යවස්ථාවට අනුව 1947දී ස්ථාපනය කරන ලද උත්තර මන්ත්‍රී මණ්ඩලය හෙවත් සෙනෙට් සභාව ද 1971දී අහෝසිකොට තිබුණි. 1970 අගදී මන්ත්‍රීවරුන් සඳහා විශ්‍රාම වැටුපක් ගෙවීමට තීරණය කර තිබුණි.



සමගි පෙරමුණු රජය පිහිටුවා අවුරුද්දක් පිරීමටත් පෙරාතුව 1971 අප්‍රේල්වලදී තරුණ නැගී සිටීම හේතුවෙන් ගැටලු රැසකට මුහුණදීමට රජයට සිදු විය. 1970 මහ මැතිවරණයෙන් අනතුරුව දිවයින පුරා අතුරු මැතිවරණ 13ක් පමණ වරින්වර පැවැති අතර, ඉන් දෙකක පමණ ජය රජයට හිමි වූ අතර, ඉතිරිය ජය ගත්තේ විපක්ෂය විසිනි. 1971 අප්‍රේල් සිද්ධියේදී රජය අනුගමනය කළ ක්‍රියා පිළිවෙළ පිළිබඳවත්, ඊට අදාළව රජය විසින් සම්මත කර ගැනුණ අපරාධ යුක්ති විනිශ්චය කොමිෂන් සභා පනතට විරුද්ධ වීම නිසාත් 1972 වසරේදී සමගි පෙරමුණේ පාර්ශ්වකරුවකු වන ලංකාවේ කොමියුනිස්ට් පක්ෂයේ නායක දොස්තර එස්. ඒ. වික්‍රමසිංහ මහතා ඇතුළු එහි මන්ත්‍රීවරු හතරදෙනෙකු ආණ්ඩු පක්ෂයෙන් ඉවත් කෙරුණ අතර, පක්ෂයෙන් පත්කොට තිබූ පීටර් කෙනමන් අමාත්‍යවරයාත්, බී. වයි. තුඩාව නියෝජ්‍ය ඇමැතිවරයාත් පමණක් පක්ෂය නියෝජනය කරමින් සමගි පෙරමුණු රජයේ රැඳී සිටියේය. මේ නිසා කොමියුනිස්ට් පක්ෂයේ යම් දෙකඩවීමක් සිදුවූ බැව් ද කියනු ලැබේ.

1973 වසරේදී පුවත්පත් මණ්ඩල පනත සම්බන්ධයෙන් ස්ටැන්ලි තිලකරත්න කථානායකවරයා ලබා දුන් තීන්දුවක් විපක්ෂයට වාසිදායක වූයේ යැයි පවසමින් සමගි පෙරමුණ තුළම හැලහැප්පීම් සිදුවන්නට වූ අතර, කථානායකවරයාට විරුද්ධව කොළඹ හයිඩ් පිටියේ පැවැති රැස්වීමකදී ලංකා සමසමාජ පක්ෂයේ නායක ඇන්. ඇම්. පෙරේරා, කොල්වින් ආර්. ද සිල්වා වැනි ඇමැතිවරුන්, කොමියුනිස්ට් පක්ෂයේ ඇම්. ජී. මැන්ඩිස් මන්ත්‍රීවරයා ද කතා කළ බැව් වාර්තා විය. ලංකා සමසමාජ පක්ෂයට අනුබද්ධිත ලංකා කම්කරු සම්මේලනයේ තිස්නව වැනි සංවත්සරය නිමිත්තෙන් 1974 නොවැම්බර් 16දා පැවැත්වීමට සූදානම් කළ පෙළපාලියට හා රැස්වීමට තහංචියක් ලෙස එදින දහවල් එකේ සිට පසුදා උදෑසන හය දක්වා කොළඹ දිස්ත්‍රික් බලප්‍රදේශයට රජය විසින් ඇඳිරි නීතිය ප්‍රකාශයට පත්කිරීම ද ලංකා සමසමාජ පක්ෂය ප්‍රකෝප කරවන්නක් විය.

මේ අතර ශ්‍රී ලංකා නිදහස් පක්ෂය හා ලංකා සමසමාජ පක්ෂය අතර තීරණාත්මක අර්බුදය සඳහා මුලපිරුණේ ලංකා සමසමාජ පක්ෂය 1975 අගෝස්තු 12 වෙනිදා පැවැත්වූ හර්තාල් දින සමරු රැලියකදී එහි නායක ආචාර්ය ඇන්. ඇම්. පෙරේරා මුදල් ඇමැතිවරයා විසින් කරන ලදැයි කියන ප්‍රකාශයකි. මේ පිළිබඳව මලල්ගොඩ බන්ධුතිලකගේ ඇන්. ඇම්. කෘතියට අනුව 1975 අගෝස්තු 15 දිනැතිව පුවත්පත්වලටද පිටපත් නිකුත් කරමින් අගමැතිනිය, තම මුදල් ඇමැතිවරයාට යැවූ ලිපියේ සඳහන් කර තිබුණේ හර්තාල් සමරු රැලියේදී ලංකා සමසමාජ පක්ෂයේ නායකවරයා කර ඇති කතාව අවලාද සහගත එකක් වන හෙයින් සමගි පෙරමුණු රජය ඉදිරි වසර දෙක සඳහාත් ආණ්ඩුවක් ලෙස පවත්වාගෙන යාමට නම් මෙවන් අවලාද සහගත දේශපාලනය නවතා දැමිය යුතු බවයි. ඒ පිළිබඳව සහතිකයක් ලබා දෙන ලෙස දැනුම් දෙන සමගි පෙරමුණු නායිකාව වැඩිදුරටත් සඳහන් කර තිබුණේ පොදු රාජ්‍ය මණ්ඩලීය මුදල් ඇමැතිවරුන්ගේ සාකච්ඡාවත්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සහ ලෝක බැංකුවේ සම්මේලනයත් සඳහා පිටත්ව යාම පිළිබඳ මුදල් ඇමැතිවරයා දැනට යොදා ඇති වැඩපිළිවෙළ මේ අතර නවතා තබාගන්නේ නම් කෘතඥ වන බවයි. මුදල් ඇමැතිවරයා අගමැතිනියට යැවූ පිළිතුරු ලිපියේ සඳහන් වූයේ 'දිවංගත අග්‍රාමාත්‍ය ඇස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක මහතා ගැන මා කියූ දෙයින් ඔබේ සිත රිදී ඇති බවක් පෙනී යන හෙයින් ඔබට ඒ ගැන කුමක් වාර්තා වී ඇත්දැයි නොදනිතත් සිත් රිදීම පිළිබඳව කනගාටුව නොවලහා ප්‍රකාශ කරන බවයි. කෙසේ වෙතත් 'දේශපාලන අවලාද' යනුවෙන් ඔබ හඳුන්වන දෙයක් මා නොකී බව මට සහතික යයි, ඇන්. ඇම්. පෙරේරා ඇමැතිවරයා ස්වකීය ලිපියේ දක්වා ඇති බැව් සඳහන් වේ.

අනතුරුව 1975 අගෝස්තු 20 දිනැති අගමැතිනියගේ ලිපිය ඇතුළු ලිපි කිහිපයක් දෙපාර්ශ්වය අතර හුවමාරු වී ඇති අතර, ඇන්. ඇම්. පෙරේරා හා ලෙස්ලි ගුණවර්ධන මහතුන්ට වෙනත් අමාත්‍යාංශ කිහිපයක් යෝජනා කර තිබුණි. සමසමාජ මධ්‍ය කාරක සභා තීරණ මත එම යෝජනා ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් 1975 සැප්තැම්බර් 02 එවකට ජනාධිපති විලියම් ගොපල්ලව මහතා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන මත සමසමාජ අමාත්‍යවරුන් තිදෙනා එනම් ඇන්. ඇම්. පෙරේරා, කොල්වින් ආර්. ද සිල්වා හා ලෙස්ලි ගුණවර්ධන මහත්වරුන් ස්වකීය අමාත්‍ය ධුරවලින් නෙරපනු ලැබූ අතර, 1975 සැප්තැම්බර් 3දා ලංකා සමසමාජ පක්ෂයේ මන්ත්‍රීවරුන් 19 දෙනා අතුරින් 17 දෙනෙකු ජාතික රාජ්‍ය සභාවේ විපක්ෂයේ අසුන්වල වාඩි වූහ.

මෙය පාර්ලිමේන්තු ඉතිහාසයේ එක්වර වැඩිම මන්ත්‍රීවරුන් සංඛ්‍යාවක් ආණ්ඩු පක්ෂයෙන් ඉවත් වී විපක්ෂයට එක්වූ අවස්ථාව ලෙස වාර්තාගත වේ. සමසමාජ පක්ෂයේ සිටි නීල් ද අල්විස් නියෝජ්‍ය අමාත්‍යවරයා හා මංගල මුණසිංහ මන්ත්‍රීවරයා ආණ්ඩු පක්ෂය සමඟ රැඳී සිටිනු දක්නට ලැබිණ. සමගි පෙරමුණේ අනෙක් පාර්ශ්වකරුවා වූ ලංකා කොමියුනිස්ට් පක්ෂය 1977දී ආණ්ඩුවෙන් ඉවත් වුණු අතර, එය සමගි පෙරමුණේ සෝදාපාළුව වේගවත් කරනු දක්නට හැකි විය. මේ වන විට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ජ්‍යෙෂ්ඨයින් කිහිපදෙනෙකු ඇතුළු මන්ත්‍රීවරුන් රැසක් ද විවිධ හේතු පාදක කර ගනිමින් ආණ්ඩු පක්ෂයෙන් ඉවත්ව සිටි තත්ත්වයන් තුළ ජනාධිපතිවරයාගේ විශේෂ නිවේදනයකින් 1977 මැයි 18 ජාතික රාජ්‍ය සභාව විසුරුවා හරින ලද අතර, ඊළඟ මහ මැතිවරණය සඳහා 1977 ජූලි 21 දිනය නියම විය.

මෙම මැතිවරණය වාර්තාගත මැතිවරණයක් ලෙස ඉතිහාසගත වන අතර, විපක්ෂයේ සිටි එක්සත් ජාතික පක්ෂය, ජේ. ආර්. ජයවර්ධන මහතාගේ නායකත්වයෙන් ජාතික රාජ්‍ය සභාවේ ආසන 140ක් තනි පක්ෂයක් ලෙස දිනා ගනිමින් හයෙන් පහක බලයක් ජාතික රාජ්‍ය සභාව තුළ තහවුරු කර ගන්නා ලදී. පාලක ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට ආසන 8ක් පමණක් හිමිවූ අතර, ලංකා සමසමාජ පක්ෂයට හෝ කොමියුනිස්ට් පක්ෂයට පාර්ලිමේන්තු ඉතිහාසයේ ප්‍රථම වතාවට එකදු අසුනක්වත් දිනා ගැනීමට නොහැකි විය. මේ අයුරින් ලංකාවේ තවත් වමේ යයි කියාගත් සන්ධානයක් තම ගමනක අවසානය සනිටුහන් කළේය.

අතුල ජයසිංහ

# කතුන්ට අඩු ඉඩක් ලැබුණ කළුතර දේශපාලන කරළිය

**ශ්‍රී ලංකාවේ මැතිවරණ දිස්ත්‍රික්ක 24 අතුරින් කළුතර වමේ බලය ශක්තිමත් පෙදෙසක් ලෙස දේශපාලන නිරීක්ෂකයෝ සඳහන් කරති. 1947 සිට 2018 මහ මැතිවරණ 16ක් පවත්වා ඇත. මෙම මැතිවරණවලදී කළුතර දිස්ත්‍රික්කයේ වමේ බලය ඉතා ඉහළින් සටහන් වන බැව් නිරීක්ෂකයෝ විග්‍රහ කරති. ඒ සමගම 1977 මහ මැතිවරණයේදී කළුතර වමේ බලය සෝදාපාළු වී ගිය වග ද අපි පෙන්වා දෙමු. 1989 සමානුපාතික මැතිවරණ ක්‍රමයේ ආරම්භයේදීම විවිධාකාර හේතූන් නිසා වමේ බලය ගිලිහී ගියේය.**

අනෙක් මැතිවරණවලදී පාර්ලිමේන්තු ධුර ගණන වෙනස් වුවත් සමස්තයක් වශයෙන් එජාප විරෝධී ඡන්ද ප්‍රමාණය අයත් වන්නේ වමටය. 1947 පටන් 2018 දක්වා පත්වූ සමසමාජ - ශ්‍රී ලංකා නිදහස් - මළුපෙ - ජවිපෙ සහ සමූහාණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ නාමාවලියේ වමේ නායකයින්ගේ චරිත ඉතා ඉහළින් සටහන් වේ. ශ්‍රී. ල. නි. පක්ෂය නියෝජනය කරමින් කළුතර දිස්ත්‍රික්කයේ පළමුවරට අගමැතිවරයෙක් පත්වූ වග ද විශේෂයෙන් සඳහන් කරමු.

එහෙත් 1947 - 2018 කාලසීමාව තුළ කේවල හෝ සමානුපාතික ඡන්ද ක්‍රමය යටතේ කළුතර දිස්ත්‍රික්කයෙන් පාර්ලිමේන්තුවට තේරී පත්ව ඇත්තේ සුමිත්‍රා ප්‍රියංගනී අබේවීර මහත්මිය පමණි. මේ කාලසීමාව තුළ කිනම් පක්ෂයකින් හෝ කළුතර දිස්ත්‍රික්කයේ දේශපාලන මහ මැතිවරණ සටනට ඉදිරිපත් වූ කාන්තාවන් ගණන ද ඉතා සීමිතය. පළාත් සභාවට සහ පළාත් පාලන මැතිවරණයට ඉදිරිපත් වන සංඛ්‍යාව ද අනෙක් දිස්ත්‍රික්කවලට සාපේක්ෂව අඩු මට්ටමක පවතී. එහෙත් පක්ෂයේ පොදු ජයග්‍රහණයන් උදෙසා කළුතර දිස්ත්‍රික්කයේ කාන්තාවන් ඉතා ඉහළ මට්ටමකින් පෙරමුණ ගන්නා වග කිවයුතු නැත. පුරුෂ පක්ෂය අභිභවා යන අවස්ථා ද අපි දුටුවෙමු.

කළුතර දිස්ත්‍රික්කයේ මහ මැතිවරණ සටනට ඉදිරිපත් වූ පළමුවන කාන්තාව වශයෙන් එස්මි පෙරේරා මහත්මිය හඳුන්වා දෙමු. එස්මි පෙරේරා, කළුතර දිස්ත්‍රික්කයේ ප්‍රධාන මුළුමහත් ශ්‍රී ලංකාව පුරා චිර ප්‍රසිද්ධියක් දැරූ හොරණ ශ්‍රීපාලියේ ආදි කර්තෘ විද්වත් දේශපාලනඥ විල්මට් ඒ. පෙරේරා මහතාගේ බිරින්දෑය. 1952 මහ මැතිවරණයේදී කළුතර දිස්ත්‍රික්කයට මහජන සමූහාණ්ඩු පක්ෂයෙන් අපේක්ෂකයෝ දෙදෙනෙක් ඉදිරිපත් වූහ. ලංකාවේ අන් කිසිදු ඡන්ද කොට්ඨාසයකට සමූහාණ්ඩු පක්ෂයෙන් අපේක්ෂකයෝ ඉදිරිපත් නොවූ වග ද සටහන් කරමු.

මතුගම කොට්ඨාසයට 1947දී මැතිවරණයට ඉදිරිපත් වූ විල්මට් ඒ. පෙරේරා මහතා ස්වාධීන අපේක්ෂකයෙක් වශයෙන් තරග කළේය. විල්මට් පෙරේරා මහතා වෙතින් 1931 සහ 36 රාජ්‍ය මන්ත්‍රණ සභාව නියෝජනය කළ නිදහස් අධ්‍යාපන පනතේ නිර්මාතෘ සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර මහතා වැඩි ඡන්ද 3614න් 1947දී පරාජයට පත් විය. 1952 මහ මැතිවරණයේදී මහජන සමූහාණ්ඩු පක්ෂයෙන් විල්මට් ඒ. පෙරේරා මතුගමටත්, එස්මි පෙරේරා මහත්මිය ම.එ.පෙරමුණෙන් හොරණටත් තරග කළාය. දෙදෙනාගේම ඡන්ද සලකුණ වූයේ කුඩයයි.



සුමිත්‍රා ප්‍රියංගනී අබේවීර

අධිනීතිඥ ඇම්. ඩී. එච්. ජයවර්ධන (එජාප), ආරියදාස ජයවර්ධන (වි.ල.ස.ස.ප.), විල්ප්‍රඩ් සේනානායක (ල.ස.ස.ප.), එස්මි පෙරේරා (ම.එ.පෙ.) හොරණට තරග වැදුනහ. එස්මි පෙරේරා ඡන්ද 5145 ක් ලබා ගත්තාය. ඇම්. ඩී. එච්. ජයග්‍රහණය කළේය. හොරණ වමේ බලය තුනට බෙදී ගියේය.

1965 මහ මැතිවරණයට පානදුර කොට්ඨාසය සඳහා ලෙස්ලි ගුණවර්ධන (ලං.ස.ස.ප.) සමඟ ජේන් ඇම්. ද ෆොන්සේකා මහත්මිය (එජාප) තරග කළ ද පරාජයට පත් වූවාය. 1994 අගෝස්තු 16 පැවැති මහ මැතිවරණය සමානුපාතික මැතිවරණ ක්‍රමය යටතේ පැවැත්විණි. කළුතර දිස්ත්‍රික්කයට එජාපය නියෝජනය කරමින් පළාත් සභා මන්ත්‍රිනි දම්මිකා හඳුවල, සිරිමා කාරියවසම් මහත්මිය තරග කළහ. මනාප ඡන්දවලින් පරාජයට පත්වූහ.

1965න් පසු 1989 දක්වා කළුතර දිස්ත්‍රික්කයෙන් මහ මැතිවරණය සඳහා කිනම් පක්ෂයකින් හෝ කාන්තාවක් ඉදිරිපත් වී නැත. 1989 මහ මැතිවරණයේද ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නියෝජනය කරමින් සුමිත්‍රා ප්‍රියංගනී අබේවීර අනපේක්ෂිත ආකාරයෙන් ජයග්‍රහණය කළාය. අපි එම ජයග්‍රහණය ගැන කතා කරමු.

1989 පැවැති පාර්ලිමේන්තු මහ මැතිවරණය සමානුපාතික ඡන්ද ක්‍රමය අනුව පවත්වන ලද පළමුවැන්න වූවා සේම ඡන්ද බලය හා ඡන්ද විමසීම පිළිබඳ සර්වපාක්ෂික තේරීම් කාරක සභාව මගින් කරන ලද නිර්දේශයන්ට අනුව පැවැත්වූ ප්‍රථම මැතිවරණය ද වන්නේය. 1983 ජූලි මස 8 වන දින පත් කරන ලද මෙම තේරීම් කාරක සභාව විසින් පාර්ලිමේන්තු ව්‍යුහය සහ ඡන්ද විමසීම් ක්‍රියාපටිපාටියේ වැදගත් වෙනස්කම් රාශියක් හඳුන්වා දෙන ලදී. (ශ්‍රී ලංකාවේ මැතිවරණ පුරාණය - මලල්ගොඩ බන්ධුතිලක - පළමුවන මුද්‍රණය 484 සහ 485 පි.)

1988 දෙසැම්බර් 19 වන දින පවත්වන ලද ජනාධිපතිවරණයෙන් පසුව ද රට පුරා පැවැති විවිධ මට්ටමේ භීෂණයන් අඩුවක් නොවීය. දෙපැත්තකින් සිදුවූ කලබලකාරී නොසන්සුන්තාවය පාර්ලිමේන්තු මැතිවරණ කාලය තුළ සහ ඉන් ඔබ්බට ද පැවතුණි. මැතිවරණ කාලසීමාව තුළ පැවැති භීෂණකාරී තත්ත්වය උත්සන්න වෙමින් පැවතුණි. ඉදිරිපත් වූ අපේක්ෂකයින් කිහිපදෙනකු භීෂණ කාලය තුළ ඝාතනය කරනු ලැබීය. ඔවුන් අයත් වූයේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය, එක්සත් වාමාංශික පෙරමුණ සහ සමස්තලංකා ද්‍රවිඩ සංගමයටය.

කළුතර දිස්ත්‍රික්කයට ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නියෝජනය කරමින් කළුතර ආසනයේ ශ්‍රී.ල.නි.ප. ප්‍රධාන සංවිධායක ඉන්ද්‍රපාල අබේවීර මහතා ඉදිරිපත්ව සිටියේය. 1989 ජනවාරි මාසය තුළදී ඝාතනය කරන ලද අපේක්ෂකයන් අතරට අබේවීර ද අයත් වේ. වෘත්තියෙන් ගුරුවරයෙකු වූ අබේවීර මහතා 1977 මහ මැතිවරණයට කළුතර ශ්‍රී.ල.නි. පක්ෂයෙන් ඉදිරිපත්ව පරාජයට පත් විය. 1982 මැයි 18 වෙනිදා ජනමත විචාරණයෙන් පසු පැවැති අතුරු මැතිවරණයට ඉන්ද්‍රපාල අබේවීර මහතා ද ඉදිරිපත් විය. එහිදී ද ඔහු පරාජයට ලක්විය. ප්‍රතිඵල මෙසේය.

| | |
|---|---|
| **වී. එල්. විජේමාන්න එජාප** | *22810* |
| **ඉන්ද්‍රපාල අබේවීර ශ්‍රී. ල. නි. ප.** | *19109* |
| **ධර්මසේන ප්‍රනාන්දු ල.ස.ස.ප.** | *6013* |
| **වැඩි ඡන්ද** | *3701* |

ලං.ස.ස. පක්ෂ අපේක්ෂකයා නොසිටියේ නම් ඉන්ද්‍රපාල අබේවීර මහතා වැඩි ඡන්ද 2312න් ජයග්‍රහණය කිරීම අනිවාර්ය බව ප්‍රතිඵල අනුව පෙන්නුම් කෙරේ.

කළුතර මැතිවරණ බලප්‍රදේශයෙහි අබේවීර මහතාට ශක්තිමත් ඡන්ද පදනමක් තිබූ හෙයින් ඔහු 1989 මහ මැතිවරණයට ඉදිරිපත් වූයේය. අබේවීර මහතා 1989-01-10 වන දින ඝාතනය කිරීම නිසා දියණිය සුමිත්‍රා ප්‍රියංගනී අබේවීර ඡන්ද සටනට ඉදිරිපත් වූවාය.

කැලණිය පිලපිටියේ රෝමානු කතෝලික බාලිකා විදුහලේ ද ඉන්පසු කොළඹ ආනන්ද බාලිකා විදුහලේ ද අධ්‍යාපනය හැදෑරූ සුමිත්‍රා ප්‍රියංගනී අබේවීර හොරණ අරුන්දතියෙන් තවදුරටත් සංගීත ශිල්පය හැදෑරුවාය. ඇය හාත්කණ්ඩේ සංගීත විභාගයට පෙනී සිටියදී අනපේක්ෂිත ආකාරයෙන් පියා වන ඉන්ද්‍රපාල අබේවීර ඝාතනයට ලක්වීමෙන් ඇගේ මුළු ජීවිත රටාවම උඩු යටිකුරු විය.

1989 මහ මැතිවරණ ප්‍රතිඵල අනුව කළුතර දිස්ත්‍රික්කයේ (ශ්‍රී.ල.නි.ප.) මැතිවරණ ජයග්‍රාහක ප්‍රතිඵල මෙසේ සනිටුහන් වේ.

| | |
|---|---|
| **තිලක් කරුණාරත්න** | 54439 |
| **සුමිත්‍රා ප්‍රියංගනී අබේවීර** | 51494 |
| **නෙවිල් ප්‍රනාන්දු** | 40977 |
| **අනිල් මුණසිංහ** | 40320 |
| **මංගල මුණසිංහ** | 28522 |

ජයග්‍රහණයෙන් පසු ශ්‍රී. ල. නි. පක්ෂයේ ඉදිරි පෙළෙහි දක්ෂ සංවිධායිකාවක් වූ සුමිත්‍රා කළුතර දිසාවේ ප්‍රගතිශීලී කඳවුරට යෝධ ශක්තියක් වූවාය. වෘත්තියෙන් ගුරුවරයෙකු වූ තාත්තාගේ අඩිපාරේම ගමන් ගත් සුමිත්‍රාට උපතින්ම ලද චතුර කථිකත්වය ජවබලයක් විය.

එක්සත් ජාතික පක්ෂයේ වසර 17 ක පාලනයෙන් පසු නියමිත වූ තීරණාත්මක මහ මැතිවරණය 1994 අගෝස්තු 16 වනදා පැවැත්විණි. සමානුපාතික මැතිවරණ ක්‍රමය අනුව පවත්වන ලද දෙවන මහ මැතිවරණයයි ඒ.

පොදුජන එක්සත් පෙරමුණෙන් කළුතරට පත්වූ පිරිස මෙසේය.

| | |
|---|---|
| **රත්නසිරි වික්‍රමනායක** | 88,213 |
| **සුමිත්‍රා ප්‍රියංගනී අබේවීර** | 85,661 |
| **රෙජිනෝල්ඩ් කුරේ** | 85,297 |
| **එස්. කේ. වෙල්ගම** | 79,056 |
| **එදිරිවීර ප්‍රේමරත්න** | 70,041 |
| **අනිල් මුණසිංහ** | 56,071 |

1997 ජූනි මස 9 වැනි දින දිවුරුම් දුන් නව ඇමැති මණ්ඩලයේ වාණිජ සහ වෙළෙඳ නියෝජ්‍ය ඇමැතිවරියක් වශයෙන් සුමිත්‍රා අබේවීර පත් වූවාය. කළුතර දිස්ත්‍රික්කයෙන් පත්වූ පළමුවන නියෝජ්‍ය ඇමැතිවරිය වනුයේ ද සුමිත්‍රා අබේවීර මහත්මියයි. 2000 ඔක්තෝබර් 10 වැනිදා 11 වැනි මහ මැතිවරණය පැවැත්විණි.

රත්නසිරි වික්‍රමනායකගේ ප්‍රධානත්වයෙන් පො. එ. පෙ. කණ්ඩායම ඡන්දයට ඉදිරිපත් විය. කළුතර ශ්‍රී. ල. නි. ප. සංවිධායිකා සුමිත්‍රා ප්‍රියංගනී අබේවීර මහත්මිය ද ඉදිරිපත් වූවාය. මනාප ඡන්ද 31751 ක් ලබා ගත් නමුත් ඇය ජයග්‍රහණය නොකළාය. රත්නසිරි වික්‍රමනායක - රෙජිනෝල්ඩ් කුරේ - ටියුඩර් දයාරත්න - කුමාර වෙල්ගම - එදිරිවීර ප්‍රේමරත්න - පරාක්‍රම බන්දුල ගුණවර්ධන ජයග්‍රහණය කළහ.

11 වැනි පාර්ලිමේන්තු මහ මැතිවරණයෙන් පො. ජ. එ. පෙරමුණ පාර්ලිමේන්තු බලය ලබාගත් නමුත් වසරකට වැඩි කාලයක් බලය රඳවා තබා ගැනීම ආණ්ඩු පක්ෂය ඇතුළේම හටගත් ගැටුම් නිසා නොහැකි විය.

නැවතත් 2001 දෙසැම්බර් 05 දා යළිත් මහ මැතිවරණයක් පැවැත්විණි. මෙම මැතිවරණයට සුමිත්‍රා ප්‍රියංගනී අබේවීර මහත්මිය ඉදිරිපත් නොවීය. කළුතර ඡන්ද කොට්ඨාසය නියෝජනය කරමින් පො. ජ. එ. පෙරමුණෙන් සුමිත්ලාල් මෙන්ඩිස් ඉදිරිපත් විය. ඔහු පරාජයට පත් විය.

2004 පැවැති මහ මැතිවරණයටත් 2010 පැවැති මැතිවරණයටත් සුමිත්‍රා ප්‍රියංගනී අබේවීර ඉදිරිපත් නොවූවාය. පො. එ. පෙ. සහ එ. ජ. නි. ස. සහයෝගය දැක්වූවාය. 2015 ඡන්ද සටනට ද ඉදිරිපත් නොවූවාය. 2020 අගෝස්තු 05 ඡන්ද සටනට ඉදිරිපත් නොවූවද ශ්‍රී. ල. නි. ප. ය නියෝජනය කරමින් කණ්ඩායමට සහයෝගය දැක්වූවාය.

1994 අගෝස්තු මහ මැතිවරණයට ඉදිරිපත්ව පරාජය වූ එජාපයේ හිටපු පළාත් සභා මන්ත්‍රීවරියක් වූ සිරිමා කාරියවසම්, දම්මික හඳුවල ඉන්පසු මහ මැතිවරණවලට ඉදිරිපත් නොවූහ. එපමණක් නොවේ, එ. ජා. ප. නියෝජනය කළ හොරණ ශීලා ජයකොඩි, ශ්‍රී. ල. නි. ප. ය නියෝජනය කළ සිරිමා විජේසිරි ද එජාප සහ ජවිපෙ නියෝජනය කළ ඉදිරිපෙළ කාන්තාවන් ද මහ මැතිවරණයට අදාළ පක්ෂ නියෝජනය කරමින් ඉදිරිපත් නොවීමත්, එහෙත් මැතිවරණයේදී පෙරමුණේ සිටීමත් සුවිශේෂව සටහන් කළ යුතුය.

කළුතර දිස්ත්‍රික්කය තුළ පළාත් පාලන ක්ෂේත්‍රයෙන් පෙරමුණට පැමිණි පිරිසක් වෙති. විශේෂයෙන් ජවිපෙ දේශපාලනයෙන් ඇට්ටරවුණු කාන්තා චරිත කිහිපදෙනෙක් ද වෙති. විවිධ මතවාදයන් දැරූ ස්ත්‍රී දේශපාලන ක්‍රියාකාරීහු වෙති. විශේෂයෙන් මීවනපලානේ ලීනා හපුතන්ත්‍රි බඳු ජවිපෙ ක්‍රියාකාරී කාන්තාවෝ වූහ.

හොරණ නගර සභාවට තේරී පත්වූ කමලා ෆොන්සේකා විශේෂයෙන් සිහිපත් කළ යුතු වේ. 1968 පළාත් පාලන ඡන්ද සටනේදී කමලා ෆොන්සේකාට එරෙහිව වැඩ තහනමට ලක්ව සිටි නගර සභා සෞඛ්‍ය අංශයේ සේවිකාවක් වූ ටී. ඒ. සොපිහාමි ඉදිරිපත් වූ වග ද අමතක නොකරමු. වැඩ තහනමට ලක්ව සිටි සොපිහාමි ඇත්ත, දිනකර, ජනදින පුවත්පත් නගරය තුළ අලෙවි කළාය. ජීවිතය ගෙන යමින් ප්‍රචාරක කටයුතු ද සිදු කළාය. ඡන්ද පරාජයෙන් පසු රැකියාව හිඟ පඩිත් සමඟ ලැබුණි.

බන්ධුල ආර්. ගුලවත්ත



# ලෙයින් යකඩින් පණ ගැන්වුණු




**එදා අමෙරිකාවේ කම්කරුවන් වහලුන් මෙන් දිවා රෑ වැඩ කළ අතර ඔවුන්ගේ සේවා මුරය පැය 16ක් විය. මෙම අසාධාරණ සේවා කාලයට විරුද්ධ වූ කම්කරුවන් පැය 8ක සේවා මුරයක් ලබා ගැනීම සඳහා අමෙරිකාවේ කම්කරු සටන් මධ්‍යස්ථානය වූ චිකාගෝ නුවර මැක්නොටික් කර්මාන්ත ශාලා භූමියට රැස්ව වැඩ වර්ජනයක් දියත් කළහ.**

ජීවත් වීමේ අයිතිය උදෙසා ඔවුන් දියත් කළ අරගලය මැඩපැවැත්වීමට ඉලිනොයිස් ජනපදයේ ආණ්ඩුකාරවරයා පොලිසියට නියෝග කළ අතර, පොලිසිය යොදවා අරගලය මර්දනය කිරීමට කටයුතු කළහ. එහිදී සටන් පාඨ කියමින් පැමිණි කම්කරුවන්ට පොලිසිය විසින් වෙඩි තබන ලද අතර, ඒ නිසා කම්කරුවන් හතර දෙනෙකු ඝාතනයට ලක් වූහ. තවත් බොහෝ පිරිසක් තුවාල ලැබූහ.

පොලිසියේ මෙම මිනීමරු ක්‍රියාවට විරුද්ධව කම්කරුවන් චිකාගෝ හි හේමාර්කට් චතුරශ්‍රයේ 1886 මැයි මස 4 වැනි දින දැවැන්ත රැලියක් ආරම්භ කළ අතර, එම රැලිය ඇල්බර්ට් පාර්සන්ට්, ඔගස්ට් ස්පයිස් යන කම්කරුවන්ගේ මූලිකත්වයෙන් සිදුවිය. කම්කරු රැලිය ෆීඩ්ල් නම් කම්කරු නායකයා අමතමින් සිටින අවස්ථාවේදී එම ස්ථානයට පැමිණි පොලිස් බල ඇණියක් විසින් කම්කරුවන් හට වෙඩි ප්‍රහාරයක් එල්ල කරන ලදි. එම වෙඩි ප්‍රහාර වලින් කම්කරුවන් දස දෙනකු මිය ගිය අතර දෙසීයකට අධික පිරිසක් තුවාල ලැබූහ. මෙම සිදුවීමට අදාළව නඩු විභාගයක් 1886 අගෝස්තු 20 වන දින පැවැත්වූ අතර ඉන් වැරදිකරුවන් ලෙස හඳුන්වමින් කම්කරුවන් හත් දෙනකු එල්ලා මැරීමට තීරණය කරන ලදි. පාර්සන්ට්, ඔගස්ට් ස්පයිස් එන්ගල් යන කම්කරු නායකයන් 1887 නොවැම්බර් මස 11 වැනිදා එල්ලා මරනු ලැබීය. ඉන් වසර පහමාරකට පසු මිය ගිය කම්කරු විරුවන් වෙනුවෙන් 1893 ජූනි 25 දින චිකාගෝ නුවර ස්මාරකයක් ඉදි කරන ලදි.

1889 ප්‍රංශ විප්ලවය සමරමින් රැස් වූ පළමු වන ජාත්‍යන්තරය මැයි පළමුවන දින ජගත් කම්කරු දිනය ලෙස නම් කරන ලදි. ඒ අනුව 1890 මැයි මස පළමුවන දින සිට ජගත් කම්කරු දිනය ලොව පුරා කම්කරුවන් සමරනු ලබති. එදා චිකාගෝ නගරයේ වෙඩි වැදි කම්කරුවන්ගේ ලෙයින් තෙත් වූ රක්ත වර්ණ කමිස ධජය ලෙස භාවිතා කළ අයුරු සිහිකරවමින් ලොව පුරා කම්කරුවන් රතු ධජයක් යටතේ කම්කරු දිනය සමරති.




## ශ්‍රී ලංකාවේ කම්කරු දින ඉතිහාසය

ශ්‍රී ලංකාවේ කම්කරු දින ඉතිහාසය 1927 වර්ෂය දක්වා දිව යයි. එහිදී හමුවන සුවිශේෂී චරිතයක් වන්නේ කම්කරු නායක ඇලෙක්සැන්ඩර් ඒකනායක ගුණසිංහ මහතාය. ශ්‍රී ලංකාවේ කම්කරු දිනය සැමරීමට මූලිකත්වය ගෙන ක්‍රියාකරන්නේ කම්කරු නායකයකු වූ ඒ.ඊ. ගුණසිංහ මහතාය. මැයි මස පළමු වනදාකම උපත ලබා ඇති ඒ.ඊ. ගුණසිංහ මහතා 1927 වසරේ කම්කරු දින සැමරුම චාම් ලෙස පැවැත්වූ බවට ඉතිහාසයේ සඳහන් වේ. මෙරට පළමු සංවිධානාත්මක කම්කරු දින රැලිය 1933 දී පවත්වා ඇත්තේ ද ඒ.ඊ. ගුණසිංහ මහතාගේම නායකත්වයෙනි. මෙහිදී පිරිමින් සුදු සරම් හා රතු ඉරි සහිත කමිසවලින් ද කාන්තාවන් රතු චීත්ත හා සුදු හැට්ටවලින් ද සැරසී පෙළපාලියේ ගමන්කර ඇති අතර බෙරකරුවන්, නැට්ටුවන් සහ ගීත ගායනාවන්ගෙන් ද සමන්විත වූ මෙම පෙළපාලිය ගාලු මුවදොර තෙක් ගමන් කිරීමෙන් අනතුරුව ඒ.ඊ. ගුණසිංහ මහතා විසින් කම්කරුවන් ඇමතීමෙන් පසුව විසිර ගොස් තිබෙන බව සඳහන් වේ. 1934 වසරේදී කොළඹ තරුණ සංගමය කම්කරු දින රැලියක් පවත්වා ඇති අතර 1935 දී ලංකා සමසමාජ පක්ෂය බිහිවීම මෙරට දේශපාලන ගමන් මඟෙහි හැරවුම් ලක්ෂ්‍යක් ලෙස හැඳින්විය හැකිය. ඒ අනුව සමසමාජ පක්ෂය බිහිවීමත් සමඟම 1936 දී සිය ප්‍රථම කම්කරු දින රැලිය සෝවියට් ආකෘතියකට අනුව සැමරීම ශ්‍රී ලංකාවේ ද ආරම්භ විය. වඩාත් සටන්කාමී හා විප්ලවීය මුහුණුවරකින් එය පැවැත්වීමට ඔවුහු කටයුතු කළහ. දෙවැනි ලෝක මහා සංග්‍රාමය පිළිබඳව ඇතිවූ මතභේදය හේතුවෙන් සමසමාජ පක්ෂයෙන් ඉවත් කරනු ලැබූ උඩකැන්දවල සිරි සරණංකර හිමි, දොස්තර ඇස්.ඒ. වික්‍රමසිංහ, ඇම්.ජී. මැන්දිස් හා කේ. රාමනාදන් යන පිරිස කොමියුනිස්ට් පක්ෂය පිහිටුවා ගන්නා ලද අතර එම පක්ෂය විසින් වෘත්තීය සමිති බලයක් ද සහිතව කම්කරු දිනය පැවැත්වීමට යොමුවීම හඳුනාගත හැකිය.

1956 වසරේදී අගමැති එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක මහතාගේ නායකත්වයෙන් යුත් මහජන එක්සත් පෙරමුණු ආණ්ඩුව කම්කරු අමාත්‍ය ටී.බී. ඉලංගරත්න මහතාගේ යෝජනාවක් අනුව කම්කරු දිනය වන මැයි මස පළමු වනදා රජයේ නිවාඩු දිනයක් බවට පත්කරන ලදි. තවද 1958 අංක 15 දරන පනතින් සේවක අර්ථ සාධක අරමුදල ද එම රජය මඟින්




ස්ථාපනය කරන ලදි. 1956 වසරේදී ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සහ සම සමාජ පක්ෂයේ එකතුවෙන් සමරනු ලැබූ ඒ කම්කරු දිනයේදී රතු වර්ණය මෙන්ම නිල් වර්ණයෙන් යුතු ධජ භාවිතා කොට ඇති බව සඳහන් වේ. කම්කරුවන්ට මුල් තැන දුන් කම්කරු දිනය ක්‍රම ක්‍රමයෙන් දේශපාලඥයන් යටතට යෑම ඇරඹුණේ එතැන් පටන් බවත් ඇතැමුන්ගේ මතය වී ඇත .

1977 එක්සත් ජාතික පක්ෂ රජය බලයට පත්වීමෙන් පසුව 1978 වසරේ සිට එක්සත් ජාතික පක්ෂය කම්කරු දින සැමරුම ජාතික සංස්කෘතික උලෙළක ස්වභාවයෙන් පවත්වනු ලැබූ අතර, ඒ වන විට ලංකාවේ විප්ලවවාදී වාමාංශික පක්ෂයක් වූ ජනතා විමුක්ති පෙරමුණ ද තම කම්කරු දින සැමරුම ඉතා නිර්මාණාත්මකව ඉතා ආකර්ෂණීය ලෙසින් පවත්වන ලදි. මෙසේ ජනතා විමුක්ති පෙරමුණ තහනමට ලක්වන තුරු එනම් 1983 වසර මැයි දක්වා කම්කරු දින සැමරුම ඉතා උත්කර්ෂවත් අයුරින් සිදු කරන ලදි. සමසමාජ පක්ෂය, කොමියුනිස් පක්ෂය සහ මහජන එක්සත් පෙරමුණ වැනි පක්ෂවල සහභාගිත්වයෙන් එක්සත් කම්කරු දින රැලියක් 1984 වසරේදී පැවැත්වීම ද විශේෂ අවස්ථාවක් ලෙස සඳහන් කළ යුතුය.

## 1987 කම්කරු දින තහනම

1987 අප්‍රේල් මාසයේදී කොළඹට දරුණු එල්.ටී.ටී.ඊ ත්‍රස්ත ප්‍රහාරයක් එල්ල වන අතර ඉන් එක් ප්‍රහාරයකින් හමුදා සෙබළුන් 75 දෙනෙකු ඇතුළුව 120 දෙනෙකුට පමණ දිවි අහිමි වේ. ඉන් දින හතරකට පසුව එල්ල කරන ලද කාර් බෝම්බ ප්‍රහාරයකින් තවත් සියයට අධික ප්‍රමාණයක දිවි අහිමි වේ. මේ හේතුවෙන් එවක පැවති ජේ.ආර්. ජයවර්ධන එක්සත් ජාතික පක්ෂ රජය මැයි 1 වැනිදාට පවත්වන්නට නියමිත කම්කරු දින පෙළපාලි තහනම් කොට මැයි 22 වැනිදා තෙක් කල් දමන ලෙස ඉල්ලා සිටින ලදි. කෙසේ වුවද මෙම මැයි 1 දින තහනම නොතකා කම්කරු දින රැස්වීම පවත්වන්නට පක්ෂ කිහිපයක්ම කටයුතු කරන ලදි. ඒ අතර සමසමාජ පක්ෂය, කොමියුනිස්ට් පක්ෂය, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ආදි පක්ෂ විසින් ආරම්භ කරන ලද කම්කරු දින රැස්වීම් හා පෙළපාලි ආරම්භ කරන ලදි. ඒ අනුව මර්දන නීති නොතකා වැඩ කරන ජනතාව පෙරටු කරගත් මැයි පෙළපාලිය පැවැත්වුණේ කොළඹ යූනියන් පෙදෙසේ මහා මාර්ගයේය. පෙළපාලිය කොම්පඤ්ඤ වීදියේ සිට ඉබ්බන්වල හන්දිය දක්වා පැමිණියේ පොලිස් බාධක ද නොතකමිනි. හදිසි




නීතිය උපයෝගි කර ගනිමින් කම්කරු දින පෙළපාලි තහනම් කිරීමට කටයුතු කළ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව ඇඳිරි නීතිය ද පැනවීමට කටයුතු කරන ලදි.

මව්බිම සුරැකීමේ ව්‍යාපාරය මඟින් සංවිධානය කරන ලද කම්කරු දින රැස්වීම නාරාහේන්පිට අභයාරාමයේදී මුරුත්තෙට්ටුවේ ආනන්ද හිමි සහ මාදුළුවාවේ සෝභිත හිමිගේ මූලසුනෙන් පවත්වන ලද අතර එය ඉතා සටන්කාමී කම්කරු දින පෙළපාලියක් හා රැලියක් විය. කම්කරු දින තහනමට විරෝධය පළ කරමින් සටන් පාඨ රැගත් විරෝධතාකරුවන් හට පොලිසියෙන් බැටන් පොලු ප්‍රහාරයක් එල්ල කරන ලද අතර අනතුරුව පොලිස් වෙඩි ප්‍රහාරයක් ද එල්ල කරන ලදි. මෙම වෙඩි ප්‍රහාරයට ලක්ව ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවේ කම්කරුවකු වූ ලෙස්ලි ආනන්දලාල් සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සිසුවකු වූ කිත්සිරි මෙවන් රණවක මිය ගියහ. මෙම ඝාතන වලට එරෙහිව දිවයින පුරා විශ්වවිද්‍යාල පාසල්වල ද කම්කරුවන් අතරින් ද විරෝධතා ව්‍යාපාර පැන නැඟුණි. මෙය ලාංකේය තරුණ ශිෂ්‍ය හා කම්කරු ව්‍යාපාරයේ සාම්ප්‍රදායික ගමන් මඟ වෙනස් කළ තීරණාත්මක සිදුවීමක් ලෙස හැඳින්විය හැකිය.



## 1993 ආර්.ප්‍රේමදාස ජනාධිපති ඝාතනය

ජනාධිපති ප්‍රේමදාස ඝාතනයත් කම්කරු දිනය හා බැඳී තිබෙන අඳුරු මතකයකි. 1993 වසරේ මැයි පළමු වන දින කම්කරු පෙළපාලියට සහභාගි වෙමින් සිටියදී ආමර් වීදියේ සිදුවුණ මරාගෙන මැරෙන එල්.ටී.ටී.ඊ ත්‍රස්තවාදී බෝම්බ ප්‍රහාරයකින් ඝාතනයට ලක්විය. ජනාධිපති ප්‍රේමදාසට අමතරව මෙම බෝම්බ ප්‍රහාරයෙන් ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි රොනී ගුණසිංහ ඇතුළු තවත් 13 දෙනෙකුගේ දිවි අහිමි විය.

## 1996 කම්කරු දින තහනම

මෙරට ඉතිහාසය තුළ දෙවැනි වරට කම්කරු දිනය තහනම් වන්නේ 1996 දීය. චන්ද්‍රිකා කුමාරතුංග මහත්මියගේ රජය විසින් 1996 වසරේදී පැවැත්වීමට නියමිතව තිබූ මැයි පෙළපාලිය තහනම් කෙරෙන හදිසි නීති නියෝගයේ ලොකුම විහිළුව දිස්වූයේ ලංකා වෙළඳ සේවක, බැංකු සේවක හා තැපැල් පෙරමුණු ඒකාබද්ධ පෙළපාලියේය. හදිසි නීති නියෝග ක්‍රියාත්මක කිරීම සඳහා නීති නියෝග ක්‍රියාත්මක කිරීම සඳහා පොලිසිය ද එම පෙළපාලියේ පෙළපාලිකරුවන් අතර ගමන් කිරීම පොලිස් භටයෝ ද තහනම් කම්කරු දිනය සැමරීමට ආණ්ඩුවේ නීති කඩාගෙන පෙළපාලි යාමක් බඳුවිය. හදිසි නීතිය යටතේ පෙළපාලි තහනම් කළේ ආරක්ෂක හේතූන් මත යැයි රජය නිදහසට කී කරුණුය. එහෙත් මේ පෙළපාලිකරුවන් ගෙන ගිය බැනරයක් ගලවා සටන් පාඨ පුවරු ද බලහත්කාරයෙන් උදුරා විනාශ කරන ලදි. පෙළපාලිකරුවන් සටන් පාඨ කීමද නතර කළේය. පෙළපාලිකරුවන් හා පොලිස් භටයන් ද ගමන් කිරීම චන්ද්‍රිකා රජයේ ජනතාව රැවටීමට කියූ බොරුව අතේ පැළ වෙන බොරුවක් බවට පත් විය.

මීට අමතරව 2018 වසරේදී කම්කරු දින සැමරුම මැයි පළමුවැනිදා නොව 7 වැනිදා පවත්වනු ලැබූවේ, ඒ වසරේදී වෙසක් පොහොය අප්‍රේල් මස 29 වැනිදාට යෙදී තිබීම නිසාය. 2019 වසරේ අප්‍රේල් 21 සිදුවූ පාස්කු ප්‍රහාරය හේතුවෙන් රටතුළ පැවති අනාරක්ෂිත තත්වය නිසා කම්කරු දින පෙළපාලි හා රැස්වීම් නොපැවැත්වූ අතර සැමරුම් පමණක් සිදුකෙරිණ.

2020 වසරේ ගෝලීය කොවිඩ් වසංගතයේ බලපෑම තුළ කම්කරු දින පෙළපාලි රැස්වීම් පමණක් නොව සැමරුම් පවා පැවැත්විය නොහැකි තත්වයක් මතුව තිබුණේ වයිරසයේ ව්‍යාප්තිය පාලනය කිරීමට පුද්ගල දුරස්ථභාවය අනිවාර්ය සාධකයක් බවට පත්ව තිබෙන නිසාය. කෙසේ වුවද 2021 මෙම වර්ෂයේ ද එම තත්ත්වයම උද්ගතව ඇති බව විශේෂයෙන් සඳහන් කළ යුතුය. කෙසේ වුවද කම්කරු දිනය පිළිබඳව අවධානය යොමු කිරීමේදී සැබෑ ලෙසම කම්කරු අයිතීන් වෙනුවෙන් සැමරෙන උත්සවයක්ද යන්න පිළිබඳ බොහෝ ගැටලු ඇත. ඒ අනුව එය හුදෙක්ම දේශපාලන පක්ෂවල බලය රැක ගැනීම වෙනුවෙන් මත්පැන් ල දී පිරිස් ගෙන්වා ගන්නා මැතිවරණ රැලියක් බවට පත් වී තිබීම වර්තමානයේ හඳුනා ගත හැකිය.

**එම්. තාරික්**

---

# වැඩිම කාලයක් බලය ඉසිලූ හලාවත කොරයාවරු


එස්. සී. ෂර්ලි කොරයා


හරින්ද්‍ර කොරයා


ජී. සී. එස්. කොරයා

**1931 සිට 1977 දක්වා පාර්ලිමේන්තු මහ මැතිවරණ පවත්වා ඇත්තේ ආසන මට්ටමින්ය. හලාවත ආසනයේ වසර 35ක් පාර්ලිමේන්තුව නියෝජනය කිරීමට කොරයාවරුන් සමත් වී ඇත.**

1931 පාර්ලිමේන්තු (1) වැනි රාජ්‍ය මන්ත්‍රණ සභාව සඳහා වූ මැතිවරණයේදී ජී.සී.එස්. කොරයා මහතා ජයග්‍රහණය කර ඇත.

1931 මැතිවරණයේදී හලාවත ආසනයට හලාවත - නාත්තණ්ඩිය, වෙන්නප්පුව යන ආසන තුනම අයත්ව තිබුණි. ජී. සී. එස්. කොරයා මහතා වෘත්තියෙන් නීතිඥයෙකි. කොංග්‍රස් පක්ෂයේ සාමාජිකයකු ලෙස එම මැතිවරණයට ඉදිරිපත්ව ඇත.

1936 පාර්ලිමේන්තු (2) වැනි රාජ්‍ය මන්ත්‍රණ සභාව සඳහා වූ මැතිවරණයේදී ජී.සී.එස්. කොරයා මහතා නිතරගයෙන් තේරී පත්ව ඇත. එම කාලය තුළ ඒ මහතා කම්කරු කර්මාන්ත හා වෙළෙඳ අමාත්‍ය ධුරය දරා ඇත. 1946 සැප්තැම්බර් මස 24 වැනි දින තානාපති සේවය සඳහා යාමට හෙතෙම ඉල්ලා අස් විය.

1952 පාර්ලිමේන්තු (2) වැනි නියෝජිත මන්ත්‍රී මණ්ඩලය සඳහා වූ මැතිවරණයේදී එස්.සී. ෂර්ලි කොරයා මහතා ජයග්‍රහණය කිරීමට සමත් විය. හෙතෙම තරග කර ඇත්තේ එක්සත් ජාතික පක්ෂයෙනි.

1953 ඔක්තෝබර් මාසයේදී ෂර්ලි කොරයා මහතා වාණිජ, වෙළෙඳ හා ධීවර නියෝජ්‍ය ඇමැති ලෙස ද එම අමාත්‍ය ධුරය දැරූ ආර්. ජී. සේනානායක මහතා ඉල්ලා අස්වීමෙන් පසුව 1954 වර්ෂයේදී වාණිජ, වෙළෙඳ හා ධීවර ඇමැති ධුරයට පත්විය.

නැවතත් 1965.03.22 දින පැවති පාර්ලිමේන්තු (6) වැනි නියෝජිත මන්ත්‍රී මණ්ඩලය සඳහා වූ මැතිවරණයේදී ජයග්‍රහණය කිරීමට ෂර්ලි කොරයා මහතා සමත් විය. නියෝජ්‍ය කථානායක ලෙස කටයුතු කළ ඒ මහතා එවකට කථානායක ලෙස කටයුතු කළ ඇල්බට් එෆ්. පීරිස් මහතාගේ අභාවයෙන් පසු කථානායක ධුරයට නිතරගයෙන් පත්ව 1967 සැප්තැම්බර් මස 27 වෙනි දින සිට 1970.03.25 දක්වා එම උත්තරීතර පදවිය දැරූහ. 1974 මාර්තු මස 04 වෙනි දින ෂර්ලි කොරයා මහතා දැයෙන් සමු ගත්තේය.

1977.07.21 පාර්ලිමේන්තු (2) වැනි ජාතික රාජ්‍ය සභාව සඳහා වූ මැතිවරණයේදී හරීන්ද්‍ර කොරයා මහතා හලාවත ආසනය ජයග්‍රහණය කිරීමට සමත් විය. හෙතෙම ඉදිරිපත් වූයේ ද එක්සත් ජාතික පක්ෂයෙනි.

1980.02.14 සිට 1989.01.09 දක්වා රාජ්‍ය පරිපාලන නියෝජ්‍ය අමාත්‍ය ධුරය 1989.02.18 සිට 1989.03.28 දක්වා තැපැල් හා විදුලි සංදේශ රාජ්‍ය අමාත්‍ය ධුරය 1990.03.30 සිට 1994.08.16 දක්වා විදුලි සංදේශ සංවර්ධන ව්‍යාපෘති අමාත්‍ය ධුරය හරීන්ද්‍ර කොරයා මහතා දරා ඇත.

එක්සත් ජාතික පක්ෂයෙන් ඉවත්ව පොදුජන එක්සත් පෙරමුණට එක්ව ජාතික ලැයිස්තුවෙන් පත්වූ මන්ත්‍රීවරයකු ලෙස 2000.10.18 සිට 2001.12.07 දක්වා විදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍ය ලෙස හරීන්ද්‍ර කොරයා මහතා කටයුතු කළේය.

හරීන්ද්‍ර කොරයා මහතා ජී.සී.එස්. කොරයා මහතාගේ පුත්‍රයෙකි. පිය පුතු දේශපාලනයේදී හරීන්ද්‍ර කොරයා මහතා ද ඉතිහාසයට එක්වෙයි.

**ඒ.පී. ගුණරත්න**

# දේශවංශය
දේශයේ පාලන මාවත




සමානුපාතික ඡන්ද ක්‍රමය යටතේ මුල්ම මහ මැතිවරණය පැවැත්වුණේ 1989 ජනවාරි මාසයේදීය. ඒ ප්‍රේමදාස පාලන යුගයයි. අගමැතිවරයා වූයේ ඩී. බී. විජේතුංග මහතාය. දිස්ත්‍රික් මට්ටමින් පත් වූ ඇමැතිවරුන්, මන්ත්‍රීවරුන් විශාල පිරිසක් එදින පාර්ලිමේන්තු සභා ගර්භය තුළ අසුන් ගෙන සිටියහ. න්‍යාය පත්‍රයට අනුව පෙරවරුවේ පනත් කෙටුම්පත් පිළිබඳව සාකච්ඡා කිරීමට නියමිතව තිබිණි.

# ගුටිකෙළි මැද වාසු කථානායක අසුනට

**ශ්‍රී ට වසර තිහකට පෙර එනම් 1991 පෙබරවාරි 21 වැනිදා පාර්ලිමේන්තුවේ අසුන් ගෙන සිටි මැති ඇමැතිවරුන්ට අමතක නොවන දිනයක් විය. ඒ, පාර්ලිමේන්තු සභා ගැබ තුළදී වෙනදාට වඩා වෙනස් සුවිශේෂ සිදුවීම් කිහිපයකටම මැති ඇමැතිවරුන්ට මුහුණදීමට සිදුවීමය.**

මන්ත්‍රීවරයකු කථානායක අසුනේ හිඳ ගැනීම, ඒ හේතුවෙන් පක්ෂ, විපක්ෂ මැති ඇමැතිවරුන් අතර ගුටි බැට හුවමාරුවක් සිදුවීම, මේ උණුසුම් වාතාවරණය මැද ආණ්ඩු පක්ෂය විසින් පනත් කෙටුම්පත් විස්සකට වැඩි ගණනක් සම්මත කර ගැනීම, සභාව කල් තැබීමෙන් පසු විපක්ෂය සභාව වර්ජනය කිරීම එකී සිදුවීම් අතර වෙයි.

සභානායක රනිල් වික්‍රමසිංහ මහතා පෙර දින පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබිණි. ඒ ගොවිජන සේවා (සංශෝධන) පනතය. කථානායක අසුනේ සිටියේ කාරක සභා නියෝජ්‍ය සභාපති ආරිය බී. රැකව මහතාය. න්‍යාය පත්‍රයට අනුව එය එදින සාකච්ඡාවට ලක් කිරීම සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සියලුදෙනාම කාරක සභාවක් බවට පත්කෙරිණි. අනතුරුව කාරක සභා නියෝජ්‍ය සභාපතිවරයා කථානායක අසුනින් බැස ඊට පහළින් තිබූ තමන්ට හිමි අසුනේ හිඳ ගත්තේය.

එවිටම විපක්ෂ කණ්ඩායමේ පසු පෙළක සිටි රත්නපුර දිස්ත්‍රික් මන්ත්‍රී වාසුදේව නානායක්කාර මහතා (එක්සත් සමාජවාදී පෙරමුණ) සිය අසුනින් නැඟී සිටියේය. මන්ත්‍රීවරුන් ඔහු දෙස බැලුවේ වාසුදේව මන්ත්‍රීවරයා යම් ප්‍රකාශයක් කිරීමට නැඟී සිටින්නට ඇතැයි කියාය. එහෙත් මන්ත්‍රීවරයා තම ඉදිරි අසුන් පසුකොට කාරක සභා නියෝජ්‍ය සභාපතිවරයා අසුන්ගෙන සිටි දෙසට වේගයෙන් ගමන් කළේය.

ඒ අවස්ථාවේ මන්ත්‍රීවරුන් සිතා ඇත්තේ ඔහු යම් විරෝධයක් පෑම සඳහා උත්සාහයක් දරන බවය. එහෙත් සිදුවූයේ කිසිවකුත් අපේක්ෂා නොකළ දෙයකි. කාරක සභා නියෝජ්‍ය සභාපතිවරයාගේ අසුනත් පසු කර ගිය වාසුදේව මන්ත්‍රීවරයා එකවරම කථානායක අසුනේ වාඩි වූයේ පාර්ලිමේන්තුව මෙහෙයවීමට මෙනි.

මෙම දර්ශනයෙන් මැති ඇමැතිවරු මඳකට වික්ෂිප්ත වූහ. එකෙනෙහිම ඇමැති වීරසිංහ මල්ලිමාරච්චි, රාජ්‍ය ඇමැති ගාමිණී ලොකුගේ, ඇමැති ෆෙස්ටස් පෙරේරා මහත්වරු වහා දුව ගොස් වාසුදේව මන්ත්‍රීවරයාගේ ඇඳුමින් අල්ලා කථානායක පුටුවෙන් බිම හෙළන්නට තැත් කළහ. එහෙත් වාසුදේව මන්ත්‍රීවරයා කථානායක අසුන තදින් අල්ලාගෙන සිටීම නිසා ඔහු බිම ඇද වැටුණේ අසුනත් පෙරළාගෙනය.

සිද්ධියෙන් කෝපයට පත්ව සිටි මේ තුන් දෙනාම බිම පෙරළී සිටි මන්ත්‍රීවරයාට වට වී පහර දෙන්නට පටන් ගත්හ. මේ අවස්ථාවේ හේමකුමාර නානායක්කාර මන්ත්‍රීවරයා (ශ්‍රීලනිප) තම සහෝදරයාට පහර දෙනු දැකීමෙන් ඒ දෙසට වහා දුව ගොස් වාසුදේව මන්ත්‍රීවරයාගේ හිසෙන් අල්ලාගෙන සිටි ඇමැති ගාමිණී ලොකුගේ මහතාගේ පිටට වැරෙන් පහරක් දුන්නේය.

---

**ඒ අවස්ථාවේ මන්ත්‍රීවරුන් සිතා ඇත්තේ ඔහු යම් විරෝධයක් පෑම සඳහා උත්සාහයක් දරන බවය. එහෙත් සිදුවූයේ කිසිවකුත් අපේක්ෂා නොකළ දෙයකි. කාරක සභා නියෝජ්‍ය සභාපතිවරයාගේ අසුනත් පසු කර ගිය වාසුදේව මන්ත්‍රීවරයා එකවරම කථානායක අසුනේ වාඩි වූයේ පාර්ලිමේන්තුව මෙහෙයවීමට මෙනි.**

---

මේ කලබලය නිසා ක්‍රමයෙන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් කිහිපදෙනෙකුම එදෙසට දුවන්නට වූහ. පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරු පිරිසක් එක පොදියට එකිනෙකාට ප්‍රහාර එල්ල කරන්නට පටන් ගත්හ. මහජන එක්සත් පෙරමුණේ ජාතික ලැයිස්තු මන්ත්‍රී ගීතාංජන ගුණවර්ධන මන්ත්‍රීවරයාත් මේ කලබගැනියට මැදි වී සිටියදී ඇමැති නන්ද මැතිව් මහතා දුන් පා පහරක් ඔහු දෙසට එල්ල විය. ඒ අවස්ථාවේ ඇමැති නන්ද මැතිව් මහතා පසෙකට තල්ලු කර දැමුවේ විපක්ෂයේ සිට එදෙසට දුව ආ එස්. බී. දිසානායක මන්ත්‍රීවරයාය.

විපක්ෂයේ මන්ත්‍රීවරුන් කිහිපදෙනෙකු ද ඇමැති ගාමිණී ලොකුගේ මහතාට ප්‍රහාර එල්ල කරන්නට පටන් ගත්හ. මේ නොසන්සුන්තාවය අතරේ ආණ්ඩු පක්ෂයේ ඉදිරි පෙළ අසුන් ගෙන සිටි රංජන් විජේරත්න සහ සිරිසේන කුරේ ඇමැතිවරුන් ද නැඟිට දුව ගොස් වාසුදේව මන්ත්‍රීවරයාට එල්ල වන ප්‍රහාරවලින් බේරා ගැනීමටත්, තම මැති ඇමැතිවරු රණ්ඩුවෙන් බේරා ගැනීමටත් උත්සාහ කළහ. එහෙත් එය අසීරු කරුණක් විය.

අවසානයේ ඇමැති රංජන් විජයරත්න මහතා කලබලය මැදට පැන වාසුදේව මන්ත්‍රීවරයා ආණ්ඩු පක්ෂ ග්‍රහණයෙන් හා ප්‍රහාරයෙන් බේරා ගන්නට ක්‍රියා කළේය. ඒ අතර ආණ්ඩු පක්ෂයේ ඇතැම් මන්ත්‍රීවරු විපක්ෂය දෙසට වාග් ප්‍රහාර ද එල්ල කරමින් සිටියහ.

විපක්ෂයේ බර්ටි ප්‍රේමලාල් දිසානායක මන්ත්‍රීවරයා සභා ගැබ දෙසට දුවද්දි එය වැළැක්වීමට එජාපයේ තරුණ මන්ත්‍රීවරයෙක් ඔහුට කකුල් මාට්ටුවක් දැම්මේය. ගුටි බැට හුවමාරුවට මැදි වී සිටි හලීම් ඉෂාක් මන්ත්‍රීවරයාට (ශ්‍රීලනිප) එල්ල කළ පහරක් එජාපයේ රාජ්‍ය ඇමැතිවරයකු වූ රොහාන් අබේගුණසේකර මහතා විසින් වළක්වනු ලැබීය.

මේ කලබලය අස්සේම කාරක සභා නියෝජ්‍ය සභාපති ආරිය බී. රැකව මහතා එදින සභාවට ඉදිරිපත් කර තිබූ පනත් කෙටුම්පත් කිහිපයක් සභා සම්මත කර ගැනීමට උත්සාහ දැරුවේය. ආණ්ඩු පක්ෂයේ ඇමැතිවරු, මන්ත්‍රීවරු එකී පනත්වලට අත් ඔසවමින්, ශබ්ද නගමින් වාචිකව ඡන්දය ප්‍රකාශ කළහ. ඒ අනුව එදින පනත් කෙටුම්පත් විසි ගණනක් සම්මත කර ගත් බව පසුව අසන්නට ලැබිණි.

වාසුදේව මන්ත්‍රීවරයා කථානායක අසුනේ වාඩිවීමෙන් ඇරඹුණ කලබගැනියට විනාඩි 5 ක් 10 ක් ගතවෙද්දි මන්ත්‍රීවරියන් කිහිපදෙනා හැර මුළු විපක්ෂයම සිටියේ සභා ගැබ මැදය. රිචඩ් පතිරණ (ශ්‍රීලනිප) මන්ත්‍රීවරයා කලබගැනිය මැදට පැන කලහකාරීව හැසිරෙන මන්ත්‍රීවරුන් නිහඬ කිරීමට උත්සාහ දැරුව ද ඔහු හැඳ සිටි රෙද්ද (සරම) ඊට හරස් වී තිබෙනු දක්නට ලැබිණි. වීරසිංහ මල්ලිමාරච්චි සහ සරත්චන්ද්‍ර රාජකරුණා මහත්වරුන්ටත් සිදුවී තිබුණේ එයමය.

ආණ්ඩු පක්ෂයේ මනෝ විජේරත්න, ඇලික් අළුවිහාරේ මෙන්ම විපක්ෂයේ කේ. බී. රත්නායක යන මන්ත්‍රීවරුන් ද කලහය සමථයකට පත් කරන්නට උත්සාහ ගන්නා අයුරු දක්නට ලැබිණි.

පාර්ලිමේන්තුව මෙලෙස උණුසුම් වෙද්දීම කාරක සභා නියෝජ්‍ය සභාපති ආරිය බී. රැකව මහතා විසින් එදින පාර්ලිමේන්තු කටයුතු නැරඹීම සඳහා මහජන ගැලරියට පැමිණ සිටි සිසුන් ඇතුළු පිරිසක් ඉන් ඉවත් කිරීමට පියවර ගෙන තිබිණි.

සිද්ධියෙන් තුවාල ලැබූ වාසුදේව නානායක්කාර මන්ත්‍රීවරයා වටකරගෙන විපක්ෂයේ මන්ත්‍රීවරුන් විශාල පිරිසක් සෝෂා කරමින් සිටි අතර මේ කලබලකාරී තත්ත්වය විනාඩි විස්සක පමණ කාලයක් පැවතිණි.

පැවති තත්ත්වය කෙමෙන් නිවී යද්දි කාරක සභා නියෝජ්‍ය සභාපතිවරයා පාර්ලිමේන්තුව තාවකාලිකව පැය භාගයක කාලයක් සඳහා අත්හිටු වූයේය.

ඉන් අනතුරුව පාර්ලිමේන්තු සභා වාරය යළි ආරම්භ කිරීමේ සීනුව නාද වුවද විපක්ෂයේ කිසිදු මන්ත්‍රීවරයකු එදින යළි පාර්ලිමේන්තු සභා ගැබේ අසුන් නොගත්තේය.

බන්ධුල ගුණරත්න

